# ඉගැන්වීමේ ක්‍රමවේදයන්

# ඉගැන්වීමේ

# ක්‍රමවේදයන්

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදි මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . IV

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . V

හැඳින්වීම . . . . . . . . . . VI

පාඨමාලාවේ අරමුණු . . . . . . . . VII

1. ඉගැන්වීම සඳහා හැඳින්වීමක් . . . . . . . 1

2. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක් : මෙහෙය. . . 11

3. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: පණිවුඩය-I වන කොටස . 23

4. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්:පණිවුඩය-II වන කොටස . 29

5. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: ක්‍රමවේදයන්-I වන කොටස. 46

6. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: ක්‍රමවේදයන් - II වන කොටස 58

7. ඉගැන්වීමේ ආධාරක . . . . . . . . 76

8. ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම . . . . . . . 83

9. අරමුණු සඳහන් කිරීම . . . . . . . . 97

10. පාඩම සැලසුම් කිරීම . . . . . . . . 105

11. ඇගයීමක් කිරීම . . . . . . . . . 117

12. අධ්‍යයන විෂය මාලාව තෝරාගැනීම සහ දියුණු කිරීම . . . . 123

13. අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීම . . . . . 131

14. ගුරුවරුන් පුහුණු කිරීම . . . . . . . . 136

15. දේශනා කිරීම සඳහා හැඳින්වීමක්. . . . . . . 146

16. දේශනාවක් සැලසුම් කිරීම . . . . . . 153

ප්‍රතිඵල ලබා ගැනීම සඳහා දේශනා කරන්න . . . . . . 166

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . . 168

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ'

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වුයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකාල** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය** : ගුණනය

**පාඨමාලාව** : ඉගැන්වීමේ ක්‍රමවේදයන්

# හැඳින්වීම

මෙම පාඨමාලාවේ විෂය වන්නේ "ඉගැන්වීම් ක්‍රමවේදයන්" වේ. ඉගැන්වීම යනු තවත් කෙනෙකුට උපදෙස් දීමේ ක්‍රියාවකි. බයිබලයට අනුව "ඉගැන්වීම" තුළ දැනුම බෙදා ගැනීම සහ එම දැනුම පෞද්ගලිකව ජීවිතයට හා සේවයට අදාල කරගන්නා අන්දම පැහැදිලි කිරීම යන දේවල් ඇතුළු වේ. "ක්‍රමවේදයන්" යනු ඉලක්කයක්, අරමුණක් හෝ බලාපොරොත්තුවක් අත්පත් කරගැනීම උදෙසා යොදා ගන්නා ක්‍රමයයි. යුද්ධමය කටයුතු වලදී "ක්‍රමවේදයන්" පිළිබඳ විෂය තුළින් සතුරන්ට එරෙහිව වාසිදායක අවස්ථා ළඟා කරගත හැකිවීමට තම අවි ආයුධ භාවිත කරන ආකාරය පිළිබඳව සොල්දාදුවන්ට උගන්වයි. එය ආත්මික ලෝකය තුළද සත්‍යයකි. අප දෙවියන් වහන්සේගේ ක්‍රමය හෙවත් "ක්‍රමවේදයන්" යොදා ගතහොත්, ලෞකිකත්වය, මාංශය සහ සාතන් හා ඔහුගේ සියලු බලයන් යන අපගේ ආත්මික සතුරන් පරාජය කිරීමට අපට හැකිවනු ඇත.

"ඉගැන්වීමේ ක්‍රමවේදයන්" තුළින් අනර්ඝ ආත්මික ආයුධයක් භාවිත කරන අන්දම ඔබට ඉගෙන ගතහැකිවනු ඇත. එම ආයුධය නම් දේව වචනය නැමැති ආත්මික කඩුවයි. (එපීස 6:17) සතුරා පරාජය කිරීමේ අරමුණ උදෙසා දේව වචනය දේශනාකරන හා උගන්වන ආකාරය ඔබට ඉගෙන ගත හැකි වනු ඇත. මෙම පාඨමාලාව තුළ දෙවියන්වහන්සේගේ වචනය, ශුද්ධ බයිබලය සියලු ඉගැන්වීම් සඳහා පදනම් වන එලිදරව්ව ලෙස භාවිත කර ඇත. බයිබලයට අනුකූලව ඉගැන්වීම් තුළ ගුරුවරයා, විෂය හා ක්‍රමවේදයන් යන සියල්ල බයිබලය සමඟ එකඟ විය යුතුය.

ඉගැන්වීම් යනු ධර්මය හෝ තොරතුරු සන්නිවේදනය කිරීම පමණක්ම නොවේ. ශිෂ්‍යයන් දෙවියන් වහන්සේ පිළිබඳ තොරතුරු දැනගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔවුන් දෙවියන්වහන්සේව අත්දැකිය යුතුය. ඉගැන්වීම යනු ජීවිතය හා ජීවන ක්‍රමය යන දෙකම බෙදාදීමකි. ශිෂ්‍යයන්ට ලබා දිය හැකි ජීවනය නම් ආත්මිකව නැවත ඉපදීම මඟින් යේසුස්වහන්සේ තුළ ලබන නව ජීවනයයි (යොහාන් 3). ලබා දිය යුතු ජීවන ක්‍රමය නම් දේව රාජ්‍යයේ ජීවන ක්‍රමයයි. මෙම රාජ්‍යයේ "පුරවැසියන්" ලෙස ජීවත් විය යුතු අන්දම සහ මෙම තත්වය නිසා තමාට ලැබී ඇති විශේෂ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව ශිෂ්‍යයන් ඉගෙන ගත යුතුය.

සමහර අවස්ථාවලදී, අප ඉගැන්වීම් පිළිබඳව දේව වචනයේ එළිදරව් කරන දේ ඉගෙනගැනීම හා අදාල කරගැනීම වෙනුවට මිනිසා විසින් නිර්මාණය කරන ලද අධ්‍යාපනික ක්‍රම යොදාගැනීම තුළින් සෑහීමට පත්වේ. මෙම පාඨමාලාව කේන්ද්‍රගත වී ඇත්තේ බයිබලීය පණිවුඩය හා එහි ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳව වේ. ශ්‍රේෂ්ඨ ගුරුවරයානන් වන යේසුස්වහන්සේගේ ක්‍රමවේදයන් ඔබට ඉගෙන ගැනීමටත්, යොදාගැනීමටත් අවස්ථාව ලැබෙනු ඇත. ඔබේ ඉගැන්වීම් තුළ පියාණන්ද, පුත්‍රයාණන්ද, ශුද්ධාත්මයාණන්ද වන දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය ඔබට තේරුම්ගත හැකි වනු ඇත.

අසා සිටින පිරිස විශ්ලේෂණය කිරීම, අරමුණු සඳහන් කිරීම, පාඩම සැලසුම් කිරීම, වෙනස් ඉගැන්වීමේ ක්‍රම භාවිතය, සහ ඔබේ ඉගැන්වීම් වල සාර්ථකත්වය මැනීම ආදිය පිළිබඳව උපදෙස් දී තිබේ. ඉගැන්වීම් හා දේශනා කිරීම අතර ඇති සම්බන්ධතාව පරීක්ෂා කර ඇති අතර බයිබලීය පණිවුඩ දේශනා කිරීම පිළිබඳව උපදෙස් දී තිබේ. අනෙක් ගුරුවරු පුරුදු කරන ආකාරය පිළිබඳවත්, ලිවීමේ හෝ කියවීමේ හැකියාවක් නොමැති පුද්ගලයන්ට ගැලපෙන පරිදි ඔබේ ඉගැන්වීම් සකස් කරගන්නා ආකාරය පිළිබඳවත් ඔබට ඉගෙන ගත හැකි වනු ඇත.

ඔබ හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ පාඨමාලා ඔවුන් යෝජනා කර ඇති ආකාරයට ඉගෙන ගන්නේ නම්, "ගුණනය" යන මොඩියුලය යටතේ ඇති දෙවන පාඨමාලාව මෙයයි. මෙම මොඩියුලය තමා ඉගෙන ගෙන ඇති ආත්මික සත්‍යයන් අන්‍යයන් සමඟ බෙදා ගැනීම තුළ වැඩි වර්ධනය වියහැක්කේ කෙසේද? යන්න විස්තර කරයි. මෙම මොඩියුලය තුළ ඇති අනෙක් පාඨමාලාවන් නම්, "බයිබලීය කෝණයකින් ලෝකය දැකීම", "ගුණනය පිළිබඳ ක්‍රමවේද" හා "බලය පිළිබඳ මූලධර්ම" යන ඒවාය.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් :

- ගුරුවරයෙකුගේ ස්ථානය, ඉගැන්වීමේ දීමනාව හා සියලු ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට දී ඇති ආඥාව අතර වෙනස පැහැදිලි කිරීමට,
- ශ්‍රේෂ්ඨ ගුරුවරයාණන් වන යේසුස්වහන්සේගේ සේවය සහ ක්‍රමවේද සාරාංශගත කිරීමට,
- ඉගැන්වීම තුළින් පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් ක්‍රියාකාරිත්වය විස්තර කිරීමට,
- ඉගැන්වීම් පිළිබඳ බයිබලිය ක්‍රමවේදයන් භාවිත කිරීමට,
- ගුරුවරුයෙකුගේ සේවය විස්තර කිරීමට,
- ගුරුවරයෙකු සතු වියයුතු බයිබලිය සුදුසුකම් ලැයිස්තුගත කිරීමට,
- තමා ඉදිරියේ සිටින ශ්‍රවක පිරිස විෂ්ලේෂනය කිරීමට,
- උපදේශාත්මක අරමුණු සඳහන් කිරීමට,
- බයිබල් පාඩමක් ඉගැන්වීමට,
- ඉගැන්වීම හා දේශනාකිරීම අතර සම්බන්ධය පැහැදිලි කිරීමට,
- බයිබල් පණිවුඩයක් දේශනා කිරීමට,
- ශ්‍රව්‍ය-දෘෂ්‍ය ආධාරක යොදා ගැනීමට හා වර්ධනය කිරීමට,
- ඔබේ ඉගැන්වීම හා දේශනාකිරීම ඇගයීම,
- ඉගැන්වීම සඳහා ගුරුවරු පුහුණු කිරීමට,
- බයිබලිය අධ්‍යයන විෂය මාලාවක් තෝරාගැනීමට සහ/හෝ ගොඩනැගීම,
- කියවීමට හා ලිවීමට නොහැකි පුද්ගලයන්ට ගැලපෙන පරිදි ඔබේ ඉගැන්වීම් සකස් කර ගැනීමට ඔබට හැකි වනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## ඉගැන්වීම සඳහා හැඳින්වීමක්

### අරමුණු :-

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්:

- සියලු ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට අණකරන නව ගිවිසුමේ ඇති නි¾දේශය හඳුනාගැනිමට,
- "උගන්වනවා", "ගුරුවරයා" හා "ඉගැන්වීම" යන පද අර්ථ දැක්වීම,
- අපට ගුරුවරු අවශ්‍ය ඇයිද යන්න තේරුම් කිරිමට,
- ගුරුවරයෙකු සතු නායකත්වයේ ස්ථානය හා ඉගැන්වීම සඳහා කතා කිරීමේ දීමනාව අතර වෙනස විස්තර කිරිමට,
- ඉගැන්වීම් ලැබිය යුත්තේ කවුද යන්න හඳුනාගැනිමට,
- ඉගැන්වීමේ ප්‍රධාන අරමුණු දෙකක් හඳුනාගැනිමට,
- බයිබලය තුළ ගුරුවරුන්ට ලබාදී ඇති අනතුරු ඇඟවීම් ලැයිස්තුගත කිරීමට, ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :-

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:19-20)**

## හැඳින්වීම

ඔබ කෙදිනක හෝ තවත් කෙනෙකුට ඔවුන් නොදැන සිටි යමක් තේරුම් කර දී තිබේද? සමහර විට කිසියම් කාර්යයක් කරන ආකාරය ඔබ ඔවුන්ට පෙන්වා දෙන්නට ඇත. එසේ නම් ඔබ දැනටමත් ඉගැන්වීම අත්දැක ඇත.

"මා මෙම පාඩම ඉගෙන ගතයුත්තේ ඇයි?" "ඉගැන්වීමේ ක්‍රමවේදයන්" පිළිබඳ පාඨමාලාවක් මා හදාරන්නේ ඇයි? " වැනි ප්‍රශ්න ඔබ ඔබෙන්ම අසනවා ඇත. මෙම පරිච්ඡේදය තුළින් සැම ඇදහිලිවන්තයෙක්ම උගන්වන්න දැනගත යුත්තේ ඇයිදැයි ඔබට ඉගෙන ගැනිමට ලැබෙනු ඇත. ඉගැන්වීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? ඉගැන්වීමේ ප්‍රධාන පරමාර්ථ, ගුරුවරුන් අවශ්‍ය වන්නේ ඇයි සහ උගන්වනු ලැබිය යුත්තේ කා හටද? යන්න පිළිබඳව ඔබට ඉගෙන ගැනිමට ලැබෙනු ඇත.

නායකයෙකු ලෙස ගුරුවරයෙකුගේ ස්ථානය, ඉගැන්වීමේ දීමනාව හා සියලු ඇදහිලිවන්තයන්ට ඉගැන්වීම පිළිබඳ දෙන ලද පොදු වූ ආඥාව අතර වෙනස ඔබට ඉගෙන ගැනිමට ලැබෙනු ඇත. විශේෂ බයිබලිය අනතුරු ඇඟවීම් අධ්‍යයනය තුළින් ඉගැන්වීමේදී ඇති බරපතල වගකීම පිළිබඳවද ඔබට ඉගෙන ගැනීමට ලැබෙනු ඇත.

## ඉගැන්වීම සඳහා වූ ආඥාව

බයිබලිය ඉතිහාසයේ ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේ තම වචනය උගන්වන ලෙස උන්වහන්සේගේ ජනතාවට අණ කළ සේක.

**මා විසින් අද නුඹට අණ කරන මේ වචන නුඹේ සිතේ තිබේවා. ඒවා නුඹේ දරුවන්ට හොඳාකාරයෙන් උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග යන කලද, නුඹ සයනය කරන කළද, නැගිටින කලද ඒවා ගැන කතා කරපන්න. (ද්විතිය කථාව 6:6-7)**

පරණ ගිවිසුම් කාලය තුළ දෙවියන්වහන්සේගේ වචනය ඉගැන්වීම පිළිබඳ වගකීම සෑම ඇදහිලිවන්තයෙකුටම පැවරිණි.

යේසුස්වහන්සේ තම මරණයෙන් හා නැවත නැගිටීමෙන් අනතුරුව නැවත ස්වර්ගයට යාමට පෙර තම අනුගාමිකයන්ට වැදගත් උපදෙස් කිහිපයක් දුන් සේක.

**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරපල්ලා: මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:19-20)**

යේසුස්වහන්සේගේ සෑම අනුගාමිකයෙක්ම "සියලු ජාතීන්ට" ඉගැන්වීම කළ යුතු විය. මිනිසුන් පසුතැවිලිවීම වෙතට හා ක්‍රිස්තුස්වහන්සේ තුළ බෞතීස්ම වීම වෙතට ගෙන යාමත්, ඉන් අනතුරුව යේසුස්වහන්සේ ඉගැන්වූ "සියල්ල" තුළ ඔවුන්ට උපදෙස් දීමත් ඔවුන්ගේ කාර්ය විය.

දෙවියන්වහන්සේට සේවය කරන සියලු දෙනා අන් අයට ඉගැන්වීමට "හැකි" හෙවත් "සමර්ථ" අය විය යුතුය.

**ස්වාමීන්වහන්සේගේ දාසයා ඩබර නොකර, සියල්ලන් කෙරෙහි ගුණවන්තවූ උගන්වන්ට සමර්ථ වූ, ඉවසිලිවන්තවූ කෙනෙක්ව සිට,... (2 තිමෝති 2:24)**

සියලු පරිණත ඇදහිලිවන්තයන් අන් අයට ඉගැන්වීමෙහි නියැලිය යුතුය. ආත්මික නොමේරූ බව නිසා ඉගැන්වීමට අසමත් වූ ඇතැම් ඇදහිලිවන්තයන්ම පාවුල් නිවැරදි කළේය.

**මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්නට යුතුව තිබියදීත්, දෙවියන්වහන්සේගේ වාක්‍ය වල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ. නුඹලා දෘඩ ආහාර නොව කිරි ඕනෑකරන අයව සිටින්නෝය. (හෙබ්‍රෙව් 5:12)**

මෙම ඇදහිලිවන්තයන් අන් අයට ඉගැන්විය හැකි වන ලෙස ආත්මිකව වැඩී සිටියේ නැත. ඔවුන්ට තවදුරටත් මූලික ඉගැන්වීම් (දේව වචනයේ කිරි) අවශ්‍ය විය. සෑම ඇදහිලිවන්තයෙක්ම ඉගැන්විය යුතුය. ඉගැන්වීම පිළිබඳ විෂය සියලුම කිතුනුවන්ගේ සැලකිල්ලට භාජනය විය යුත්තේ එබැවිනි.

## ඉගැන්වීම අර්ථ දැක්වීම

"උගන්වනවා" යන වචනයෙන් තවත් කෙනෙකුගේ අධ්‍යයනයන්ට උපදෙස්දීම, පෙන්වාදීම, පැහැදිලිකරදීම, කියාදීම, දැනුම බෙදාගැනීම, පුහුණු කිරීම සහ මඟ පෙන්වීම යන දේ අදහස් වේ. "ගුරුවරයා" යනු ඉගැන්වීම කරනු ලබන පුද්ගලයා වේ. "ඉගැන්වීම" යනු අන් අයට උපදෙස් දීම හා පුහුණු කිරීම පිළිබඳ ක්‍රියාවයි.

## අපට ගුරුවරුන් අවශ්‍ය වන්නේ ඇයි ?

ශුභාරංචිය ජාතීන් වෙතට ගෙනයාම සඳහා දෙවියන්වහන්සේ තෝරාගත් ක්‍රමය වන්නේ ඇදහිලිවන්තයන් මගින් ඉගැන්වීම හා දේශනා කිරීමයි. ක්‍රියා 8:26-40 සඳහන් ඉතියෝපියානු නපුංසකයා (නායකයෙකි) පිළිබඳ කතාව කියවන්න. මෙම මනුෂ්‍යයා සිටියේ නිවැරදි ආත්මික ස්ථානයේය. ඔහු සිටියේ නමස්කාරය සඳහා වූ දේවමාලිගාව පිහිටි යෙරුසෙලම් නගරයේය (ක්‍රියා 8:27). ඔහු එතැන සිටියේ නිවැරදි අරමුණක් සඳහාය. ඔහු පැමිණ සිටියේ නමස්කාර කිරීමටය (ක්‍රියා 8:27). ඔහු කියවමින් සිටියේද නිවැරදි පොතය. ඔහු කියවමින් සිටියේ යෙසායා 53:7 සඳහන් දේව වචනයේ කොටසකි(ක්‍රියා 8:30). නමුත් තවදුරටත් ඔහුට එය තේරුම් කිරීම සඳහා තවත් කෙනෙකුගේ සහය අවශ්‍ය විය. ඔහුට ගුරුවරයෙකු අවශ්‍ය විය. දෙවියන්වහන්සේ ඔහුට

මඟ පෙන්වීම සඳහා පිලිප් යැවූ සේක. නපුංසකයා ශුභාරංචිය පිළිගත් අතර වතුරින් බෞතිස්ම කරනු ලැබුවේය.

ගුරුවරුන් නොමැතිව, ගැලවීමට නොපැමිණ ජනයා එඬේරෙකු නොමැති බැටලුවන් වැනිය. ඔවුන් යා යුතු මාර්ගය කුමක්ද යන්න ඔවුන්ට තේරුම්ගත නොහැකිය.

**උන්වහන්සේ ගොඩබැස්ස කල මහත් සමූහයක් දැක, ඔවුන් එඬෙරෙකු නැති බැටලුවන් මෙන් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පා කොට ඔවුන්ට බොහෝ කාරණා ඉගැන්වූ සේක. (මාර්ක් 6:34)**

ඇදහිලිවන්තයන්ට පවා නියම ඉගැන්වීම නොමැති නිසා ප්‍රශ්න ඇතිවේ.

**මාගේ සෙනග දැනගැන්ම නැතිකමේන් නාස්ති වී සිටිති. (හොෂෙයා 4:6)** යි දෙවියන්වහන්සේ කීසේක

## ප්‍රධාන අරමුණු

බයිබලිය දේශනාකිරීම හා ඉගැන්වීම පිළිබඳ ප්‍රධාන අරමුණු දෙකකි. එනම් එවැන්ජලිස්ත සේවය හා ගෝලත්වයයි. දෙවියන්වහන්සේ මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා තම සභාවේ කොටස් කරුවන් වන ඇදහිලිවන්තයන් පාවිච්චි කරන සේක.

සභාව යනු දෙවියන්වහන්සේගේ වචනය අසා ඊට ප්‍රතිචාර දක්වා යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල නිසා එක්සත් කරනු ලැබූ පුද්ගලයන් පිරිසකි. සභාව සකස් වී ඇත්තේ පාපයෙන් පසුතැවිලි වී යේසුස්වහන්සේ ගැලවුම්කරු ලෙස පිළිගත් නියම ඇදහිලිවන්තයන්ගෙනි.

ප්‍රාදේශිය සභාවක් යනු, නිශ්චිත ප්‍රදේශයක් තුළ එම ප්‍රජාව තුළ දෙවියන්වහන්සේගේ අරමුණු ඉටුකරගැනීම සඳහා සංවිධානය වූ ඇදහිලිවන්තයන් පිරිසකි. සෑම ප්‍රදේශිය සභාවක්ම නව ගිවිසුමේ සඳහන් “ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ” කොටසකි. “ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය” යනු, ලෝකයේ සෑම ප්‍රදේශයක් තුළම සියලූ කාලවල සිටි හා සිටින ඇදහිලිවන්තයන්ගෙන් සැදුනු සභාවයි.

සභාව “ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය” ලෙස හඳුන්වනු ලබනුයේ වර්තමාන ලෝකය තුළ දෙවියන්වහන්සේ තම අරමුණු ඉටුකරගනු ලබන්නේ එය තුළින් වන බැවිනි. සභාවේ හිස යේසුස්වහන්සේය. ඇදහිලිවන්තයන් යනු දෙවියන්වහන්සේගේ අරමුණු පෘථිවිය තුළ ක්‍රියාවට නංවන යේසුස්වහන්සේගේ ශරීරයයි.

ලෝකය තුල දෙවියන්වහන්සේගේ ප්‍රධාන අරමුණ එපීස පොතේ විස්තර කර ඇත.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශි කරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)**

**ඒ ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ, දෙවියන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය. (එපීස 1:7)**

දෙවියන්වහන්සේගේ අරමුණ වන්නේ, සෑම පුද්ගලයෙක්ම යේසුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ සමග පුද්ගලික සම්බන්ධතාවයකට ගෙන එනු ලැබීමයි. මෙම අරමුණු ඉටුකරගැනීම සඳහා උන්වහන්සේ යොදා ගන්නා ක්‍රමය වන්නේ සභාවයි.

**එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට ස්වර්ගිය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයේ සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:10-11)**

සෑම ඇදහිලිවන්තයෙකුගේම කාර්යය යේසුස්වහන්සේ පිළිබඳ ශුභාරංචිය බෙදා ගැනීම සහ අන් අයව දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවයකට ගෙන ඒමයි. "ධර්මදූත සේවය" ලෙස හැඳින්වෙන්නේ මෙයයි.

නමුත් මෙම පාඩමේ ප්‍රධාන පදය නැවත කියවන්න

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:19-20)**

ශුභාරංචි පණිවුඩය පිළිගැනීමෙන් පසුව නව ඇදහිලිවන්තයන්ට යේසුස්වහන්සේ අණකල "සියල්ල" ඉගැන්විය යුතුය. ඔවුන් දැන් කොටස්කාරීත්වය ලබා ඇති දේව රාජ්‍යයේ ජීවත් වන ආකාරය ඔවුන් උගත යුතුය. මේ ආකාර ඉගැන්වීම "ගෝලත්වය" ලෙස හැඳින්වේ. බයිබලිය දේශනා කිරීමේ හා ඉගැන්වීමේ ප්‍රධාන අරමුණු වන්නේ ධර්මදූත සේවය හා ගෝලත්වයයි.

## අප ඉගැන්විය යුත්තේ කාටද?

අප ප්‍රධාන වශයෙන් කාණ්ඩ දෙකක පුද්ගලයන්ට උගන්වනු ලබනවා ඇත.

### සියලු ජාතීන්ට :

අප නොඇදහිලිවන්තයන්ට ඉගැන්විය යුතුය. සෑම ජාතියකටම අයත් සෑම පුද්ගලයෙක්ම ශුභාරංචිය ඇසිය යුතුව ඇත. අප මෙය ඉටු කරගන්නේ දේව වචනය ඉගැන්වීම හා දේශනා කිරීම තුළිනි.

> **එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. (මතෙව් 28:19)**

### විශ්වාසවන්ත මිනිසුන්ට :

යේසුස්වහන්සේ තුළ ඇදහිලිවන්තයන් බවට පත්වූ "විශ්වාසවන්ත" පුරුෂයන්ට හා කාන්තාවන්ටද අප ඉගැන්විය යුතුය.

> **මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි. (මතෙව් 28:20)**

මෙම පුද්ගලයන් අන් අයට ඉගැන්වීම තුළින් ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා යුතුය.

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියේ නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ම භාර දීපන්න (2 තිමෝති 2:2)**

ඉගෙනුම ලබන සෑම පුද්ගලයෙක්ම ඉගැන්වීමට සමත් තවත් අයට ඉගැන්විය යුතුය. ශුභාරංචිය ලොව පුරා පැතිරීම වේගයෙන් වර්ධනය කරන්නා වූ දිගින් දිගට කරනු ලබන ඉගැන්වීමේ ක්‍රමය මෙයයි.

> **වාක්‍යය ඉගෙන ගන්නා උගන්වන්නාට සියලු යහපත් දෙයින් දේවා. (ගලාති 6:6)**

## ගුරුවරු වර්ග

ලෝකය තුළ විවිධ වර්ගයේ ගුරුවරු සිටිති. පොදු පාසල් වල ළමා වියේ පටන් විද්‍යාලිය මට්ටම දක්වා ඒ සෑම මට්ටමකම ගුරුවරු සිටිති. සෑම රැකියාවකම විශේෂ කාර්යයක් හෝ සේවයක් ඉටු

කරන ආකාරය ඉගැන්විය හැකි ගුරුවරු සිටිති. නමුත් මෙම පාඩමාලාව තුළ ගුරුවරු පිළිබඳව කතා කරන විට අප කතා කරනුයේ ලෝකයේ අධ්‍යාපන පද්ධතිය තුළ සිටින ගුරුවරු පිළිබඳව නොවේ. අප කතා කරනුයේ සභාව තුළ දෙවියන්වහන්සේ නියම කළ ගුරුවරු පිළිබඳව හා ඇදහිලිවන්තයන්ගේ ඉගැන්වීමේ කාර්ය පිළිබඳවය.

සියලු ඇදහිලිවන්තයන් අන් අයට ශුභාරංචිය ඉගැන්වීම (ධර්මදූත සේවය) හා නව ඇදහිලිවන්තයන්ට ඉගැන්වීම (ගෝලත්වය) සිදු කළ යුතු බව ඔබ දැනටමත් ඉගෙන ගෙන ඇත. ඉගැන්වීම් පිළිබඳව වූ මෙම පොදු ආඥාවට අමතරව දෙවියන්වහන්සේ ඇතැම් ඇදහිලිවන්තයන්ට ඉගැන්වීම පිළිබඳ දීමනාවක් දුන් සේක.

> **මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද, දෙවනුව අනාගතවක්තෘවරුන්ද, තෙවනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්යකරන්නන්ද පසුව සුවකිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුද නානා වර්ග භාෂාද පිහිටවූ සේක. (1 කොරොන්ති 12:28)**
>
> **උන්වහන්සේ සමහරු ප්‍රේරිතයන්ද සමහරුන් අනාගත වක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක. (එපීස 4:11)**

“ආත්මික දීමනා” ලෙස හඳුන්වන දෙවියන්වහන්සේ විසින් දෙනු ලබන විශේෂ හැකියාවන් රාශියක් තිබේ. මෙම හැකියාවන් සේවය තුළ දෙවියන්වහන්සේගේ අරමුණු ඉටු කරගැනීමේ හැකියාව ඇදහිලිවන්තයන්ට ලබා දේ. ඉගැන්වීම සඳහා වූ ආත්මික දීමනාවන් දෙකක් තිබේ. එනම් ගුරුවරයක් ලෙස නායකත්වයේ දීමනාව හා ඉගැන්වීම සඳහා කථා කිරීමේ දීමනාවයි. මෙම දීමනා සහිත පුද්ගලයන්ට දෙවියන්වහන්සේගේ වචනය බලපෑමක් ඇති කළ හැකි අයුරින් සන්නිවේදනය කිරීමේ විශේෂ හැකියාවක් ඇත. ඒ අනුව, අන් අය ඔවුන් විසින් උගන්වනු ලැබූ දේ ඉගෙන ගෙන අදාල කරගනී. ඔවුන්ගේ ඉගැන්වීමේ හැකියාව සෑම ඇදහිලිවන්තයෙකුටම තිබිය යුතු ධර්මදූත සේවය හා ගෝලත්වය සඳහා වූ හැකියාවන්ගෙන් ඔබ්බට යනු ලබයි. ඔවුන්ට ආලේපයක් ඇති අතර දේව වචනය ඉගැන්වීම හා දේශනාකිරීම සඳහා “කැඳවීමක්” හෝ පෙළඹවීමක් හැඟෙනු ඇත.

සභාවේ කටයුතු වලට මඟ පෙන්වීම උදෙසා දෙවියන්වහන්සේ ඇතැම් ගුරුවරු නායකයන් ලෙස පත් කරන සේක. ක්‍රියා 13:1-4 ඉගැන්වීමේ නායකත්ව ස්ථානය විස්තර කරයි. අනෙකුත් ගුරුවරු සභාවේ නායකත්වයක් නොදරන අතර ඔවුන් ඉගැන්වීම සඳහා දෙවියන්වහන්සේ විසින් විශේෂයෙන් ආලේප කළ අය වේ. ඔවුන් උගන්වනවා පමණි. සභාවේ කටයුතු වලට මඟපෙන්වන්නේ නැත.

සෑම කෙනෙකුටම ගුරුවරයෙකුගේ නායකත්ව තත්ත්වය නැත. සෑම කෙනෙකුටම ඉගැන්වීම සඳහා වූ ආත්මික දීමනාවද නැත. පාවුල් මෙසේ ලිවේය.

> **සියල්ලෝම ප්‍රේරිතයෝද? සියල්ලෝම අනාගතවක්තෘවරුද? සියල්ලෝම ගුරුවරුද? (1 කොරින්ති 12:29)**

මෙම ප්‍රශ්න සඳහා පිළිතුර වන්නේ “නැත” යන්නයි. මෙම ආත්මික දීමනා සෑම කෙනෙකුටම නැත. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය මනුෂ්‍ය ශරීරයට සමාන වේ. ඔබේ සිරුරේ සෑම සාමාජිකයෙකුටම වෙනස් කාර්යයක් ඇත්තේ යම් සේද ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සෑම පුද්ගලයෙකුටම වෙනස් තත්ත්වයක් ඇත.

> **මක්නිසාද යම් සේ අපට එකම ශරීරයෙහි බොහෝ අවයව තිබෙන නමුත් ඒ සියලු අවයවයන්ට එකම ක්‍රියාවක් නැතුවාක් මෙන්, බොහෝ දෙනෙක් වූ අපිත් ක්‍රිස්තුස්වහන්සේ තුළ එසේම එක ශරීරයක්ව වෙන් වෙන් වශයෙන් ඔවුනොවුන්ගේ අවයවයෝ වෙමුව. එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු. උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත්, (රෝම 12:4-7)**

දෙවියන්වහන්සේගේ අරමුණු ඉටුවන්නේ එක් එක්කෙනා තමාගේ ස්ථානයේ සිටිමින් මුළු ශරීරයම නියම ලෙස ක්‍රියාකාරී වන විට බැවින් ඔබ ඔබේ ආත්මික දීමනාව හඳුනාගැනීමට අත්‍යවශ්‍ය වේ.

**උන්වහන්සේගෙන් මුළු ශරීරය එකට සන්ධි කරනු ලැබ සවිවී එක එක කොට්ඨාශයේ ප්‍රමාණයේ ක්‍රියාකිරීමේ හැටියට සහකාරවූ එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය. (එපීස 4:16)**

නමුත් මෙම කරුන මතක තබාගන්න. ඔබට මෙම ආත්මික දීමනා නොමැති වුවත් ධර්මදූත සේවය තුළ සියලු ජාතීන්ට ශුභාරංචිය ඉගැන්වීමටත්, ගෝලත්ව ක්‍රියාවලිය තුළ නව ඇදහිලිවන්තයන්ව පුහුණු කිරීමටත්, දෙවියන්වහන්සේ සියලු ඇදහිලිවන්තයන් කැඳවා තිබේ.

## අප ඉගැන්විය යුත්තේ මොනවාද ?

සියලුම බයිබලීය ඉගැන්වීම සඳහා පදනම වී ඇති ආධිපත්‍ය වන්නේ දේවවචනයයි. දෙවියන්වහන්සේගේ වචනයේ ඇති මුළු එළිදරව් කිරීම උගන්වනු ලැබිය යුතුය. ඔබ දේව වචනය උගන්වන විට දේවධර්මය හා කරුණු පිළිබඳ තොරතුරු පමණක් ඉගැන්වීම නොකළ යුතුය. ඔබ ජීවිතයක් හා ජීවන ක්‍රමයක් පිළිබඳව තොරුතුරු හුවමාරු කළ යුතුය. ඔබ යේසුස්වහන්සේගේ ජීවිතය ගැන බෙදා ගනිමින් සියලු මනුෂ්‍යයන් උන්වහන්සේ සමඟ සහභාගිකමකට ගෙන ඒමට වෙහෙසිය යුතුය. නව ඇදහිලිවන්තයන් කොටස් කරුවන් බවට පත්වන දේව රාජ්‍යයේ ජීවන ක්‍රමය ඔබ ඉගැන්විය යුතුය. ඉගැන්වීම සඳහා වෙනත් පොත් පත් භාවිත කළ හැකිය. නමුත් ඒවා බයිබලය සමඟ එකඟ විය යුතුය.

පසුකාලීනව මෙම පාඩමාලාව තුළ, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ හා උන්වහන්සේගේ ස්වර්ගස්ථ වීමෙන් පසු මුල් කාලීන සභාවේ නායකයන් ඉගැන්වූ දේවල් ඉගෙන ගැනිම තුළින් බයිබලීය ඉගැන්වීම පිළිබඳව ඔබට තවත් විස්තර දැනගත හැකි වනු ඇත.

### අනතුරු ඇඟවීමේ වචන

දෙවියන්වහන්සේ ඉගැන්වීම සම්බන්ධයෙන් ලබා දුන් බයිබලීය අනතුරු ඇඟවීම් තුනකි.

### ඉගැන්වීම් මනුෂ්‍යන්ගේ ධර්ම නියාම මත නොව දේව වචනය මත පදනම් විය යුතුය:

**මනුෂ්‍යයන්ගේ ශික්ෂාවන් ගුරුකම්කොට උගන්වමින්, නිරර්ථකයේ මට නමස්කාර කරති (මාර්ක් 7:7)**

මනුෂ්‍යයන්ගේ නීති, ආඥා සහ ධර්ම නියාම ඉගැන්වීම "නිරර්ථකය"' මෙහි අදහස නම් එය අසාර්ථක වන අතර කිසිඳු යහපත් අරමුණක් ඉටු නොකරන බවයි. බයිබලීය ඉගැන්වීම මනුෂ්‍යයාගේ ප්‍රඥාව මත පදනම් වී නැත

**අප විසින් ඒ දේවල් කතාකරන්නේත්, මනුෂ්‍ය ප්‍රඥාව කරණකොටගෙන උගන්වනලද වචන වලින් නොව ආත්මික දේවල් ආත්මික දේ සමඟ සමාන කර බලමින්, ආත්මයාණන්වහන්සේ විසින් උගන්වනලද වචන වලින්ය. (1 කොරින්ති 2:13)**

දෙවියන්වහන්සේගේ ප්‍රඥාව උගන්වන අයගේ ජීවිත තුළ උන්වහන්සේගේ අරමුණු ඉටු කරයි.

**.... තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේය. අපි නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණකොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද, උන්වහන්සේ ප්‍රකාශ කරමුව. (කොලොස්සි 1:27-28)**

### ගුරුවරු තමන් උගන්වන දේ ක්‍රියාවට නැඟිය යුතුය:

**අනිකෙකුට උගන්වන්නා වූ නුඹ නුඹටම උගන්වාගන්නේ නැද්ද? සොරකම් නොකළ යුතුයැයි දේශනා කරන්නා වූ නුඹ සොරකම් කරනවාද ? කාමමිථ්‍යාචාරය නොකළ යුතු යැයි කියන්නා වූ නුඹ කාමමිථ්‍යාචාරය කරනවාද ? දේවරූප වලට පිළිකුල් කරන්නා වූ නුඹ දේව ගෘහයන් කොල්ලකනවාද? (රෝම 2:21-22) (මතෙව් 5:19 ද බලන්න)**

ගුරුවරුන්ව තමන් ඉගැන්වූ දේවල් මත පදනම්ව විනිශ්චය කරන බැවින් ඔවුන් උගන්වන දේ ක්‍රියාවට නැඟිය යුතුය.

> **මාගේ සහෝදරයිනි, ගුරුවරු වන අපට වඩා බරපතළ විනිශ්චය පැමිණෙන බව දැන බොහෝ දෙනෙක් ගුරුවරු වෙන්ට නොසොයල්ලා (යාකොබ් 3:1)**

ගුරුවරුන්ට දේවවචනය පිළිබඳව අත්දැකීමෙන් ලද දැනුමක් තිබිය යුතුය. මෙහි අදහස නම් ඔවුන් උගන්වන දේ ඔවුන් අත්දැකීම තුළින් තේරුම්ගෙන තිබිය යුතුය යන්නය (මනසින් පමණක් නොවේ). පාවුල් මෙබඳු අය පිළිබඳව කතා කරමින්,

> **තමුන් කියන්නේ කිමෙක්ද කියාවත් නිසැකකොට සහතික කරන්නේ කුමන දේ ගැනද කියාවත් තේරුම් නොගෙන සිටින නුමුත්, ඔවුහු ව්‍යවස්ථාවේ ගුරුවරු වෙන්ට කැමැත්තෝය. (1 තිමෝති 1:7)** යි කිවේය.

තේරුම් ගැනීම පැමිණෙන්නේ ඔබගේම ජීවතය තුළ දේව වචනය අත්දැකීමෙන් හා අදාල කර ගැනීමෙන්ය.

## බොරු ගුරුවරු සිටිනු ඇත:

> **නමුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්ම භේද රහසින් උපදවමින්ද, තමුන්ම මිලේට ගත් ආචාරීන්වහන්සේව එපා කරමින්ද, නමුත් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නා වූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය. (2 පේත්‍රුස් 2:1)**

මෙම බොරු ගුරුවරුන්ගෙන් සමහරෙක් විශාල ජනකායක් තමන් වෙත ආකර්ශනය කරගනී. මන්ද ඔවුන් ජනතාව ඇසීමට කැමති දේ දේශනා කරන බැවිනි.

> **මක්නිසාද ඔවුන් සාරවත් ඉගැන්වීම් නොඉවසා කසන කන් ඇතිව තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ටම ගුරුවරු රැස්කරගෙන, සත්‍යයට කන් නොදී ප්‍රබන්ධ වලට හැරීයන කාලය පැමිණෙන්නේය.** (2 තිමෝති 4:3-4)

බොහෝමයක් බොරු ගුරුවරුන්ට ඇත්තේ වැරදි අභිප්‍රායකි. ඔවුන් මුදලේ වාසි උදෙසා උගන්වනු ඇත.

> **ඔවුන්ගේ කට පියවන්ට ඕනෑය. ඔවුහු නිච ලාභය නිසා යුතු නැති දේ උගන්වමින් මුළු පවුල් පෙරළති (තීතස් 1:11)**

ඔබ බොරු ගුරුවරුන්ගේ ධර්මනියාම පිළිගතයුතු නැත.

> **නමුත් අපි විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේව දූතයෙක්වත් නුඹලාට ප්‍රකාශකරතොත් ඔහු ශාප ලද්දෙක් වේවා. නුඹලා පිළිගත් ශුභාරංචිය හැර වෙන ශුභාරංචිය යමෙක් නුඹලාට දේශනා කරතොත් ඔහු ශාපලද්දෙක් වේවයි අප වරක් කී හැටියටම මම දැන් නැවතත් කියමි. (ගලාති 1:8-9)**

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________________________________

______________________________________________________________________

2. ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට අණ කරන, නව ගිවිසුමේ සටහනක් ලියන්න

______________________________________________________________________

3. පහත වචන අර්ථ දක්වන්න

උගන්වනවා: ______________________________________________________

ගුරුවරයා: ______________________________________________________

ඉගැන්වීම:______________________________________________________

4. අපට ගුරුවරු අවශ්‍ය වන්නේ ඇයි?

______________________________________________________________________

5. ගුරුවරයෙකුගේ නායකත්ව ස්ථානය හා ඉගැන්වීම සඳහා වූ කතා කිරීමේ දීමනාව අතර වෙනස පැහැදිලි කරන්න.

______________________________________________________________________

6. මෙම ප්‍රකාශය සත්‍යද? අසත්‍යද? "සෑම ඇදහිලිවන්තයෙකුටම ගුරුවරයෙකුගේ නායකත්ව තත්ත්වය පිළිබඳ දීමනාව නැත. නමුත් සෑම ඇදහිලිවන්තයෙකුම ඉගැන්විය යුතුය." මෙම ප්‍රකාශය ______________________________________________________

7. අප ඉගැන්විය යුත්තේ කාටද ?

______________________________________________________________________

8. බයිබලිය ඉගැන්වීමේ ප්‍රධාන අරමුණු 2 මොනවාද ?

______________________________________________________________________

9. පාඩම තුළ සාකච්ඡා කරන ලද ගුරුවරුන් සඳහා වූ බයිබලීය අනතුරු ඇඟවීම් තුනක් ලියන්න.

______________________________________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 2 පේත්‍රුස් 2 වන පරිච්ඡේදයේ හා යුද් පොතේ අපට බොරු ගුරුවරු හඳුනාගත හැකි පෞද්ගලික චරිත ලක්‍ෂණ සමහරක් දක්වා තිබේ.

2. දෙවියන්වහන්සේ ඔබට දී තිබෙන ආත්මික දීමනා මොනවාදැයි ඔබ දන්නේ නැතිනම්, හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ, "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නැමැති පාඨමාලාව හදාරන්න. ඔබේ ආත්මික දීමනා හඳුනා ගැනීමට එය ඔබට උපකාර වනු ඇත.

3. හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ "මුහුන් වැනි වූ ධර්ම දූත සේවය" නැමැති පාඨමාලාව තුළින්, පාන් ගෙඩියක් තුළ මුහුන් පැතිර යන ආකාරයට, ආත්මික උත්පාදනය දිගින් දිගට සිදුවන අයුරින් ධර්මදූත සේවයේ යෙදෙන ආකාරය විස්තර කරයි.

4. හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ "ගුණනය පිළිබඳ ක්‍රමවේද" නැමැති පාඨමාලාවේ නව ඇදහිලිවන්තයන් ගෝලත්වය කරා ගෙන යන ආකාරය පිළිබඳව සඳහන් වේ.

5. පහත සඳහන් නව ගිවිසුමේ ගුරුවරු පිළිබඳ උදාහරණ අධ්‍යයනය කරන්න. ඔබ සිතන ආකාරයට ගුරුවරයෙකුගේ නායකත්ව තත්ත්වය තිබෙන්නට ඇත්තේ කාටද? ඉගැන්වීම සඳහා වූ කථා කිරීමේ දීමනාව පමණක් තිබෙන්නට ඇත්තේ කාටද ?

   - අපොල්ලොස් - ක්‍රියා 18:24-25
   - අකීලා සහ ප්‍රිස්කිලා - ක්‍රියා 18:26
   - පාවුල් - ක්‍රියා 20:20-21, 27,21:28
   - නම් නොකරන ලද - ක්‍රියා 13:1
   - පේත්‍රුස් - ක්‍රියා 5:28-29

6. බයිබලීය ඉතිහාසයේ ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේ තම ජනතාවට උන්වහන්සේගේ වචනය උගන්වන ලෙස උපදෙස් දුන් බව මෙම පාඩමෙන් ඔබ ඉගෙන ගන්නා ලදී. ඔබගේ බයිබලයේ පහත සඳහන් පද සළකා බැලීමෙන් පැරණි ගිවිසුමේ "ඉගැන්වීම" යන විෂය පිළිබඳව ඇති දේ තවදුරටත් අධ්‍යයනය කරන්න.

   ද්විතිය කතාව 4:9, 10, 14, 6:9, 20, 5:31, 11:19, 17:11. 20:18, 24:8, 31:19, 33:10
   නික්මයාම 4:12, 15, 18:20, 24:12, 35:34
   ලෙවී කතාව 10:11, 14:57
   ගීතාවලිය 119:99
   හිතෝපදේශ 9:9, 16:23
   මීකා 3:11
   11 ලේකම් 17:7
   එස්රා 7:10
   විනිශ්චයකාරයන්ගේ පොත 3:2, 13:8
   1 සාමුවෙල් 12:23
   11 සාමුවෙල් 1:18
   1 රාජාවලිය 8:36
   11 රාජාවලිය 17:27

7. දෙවියන්වහන්සේ අපට ඉගැන්වීමට තැත් කරන සමහරක් දේ

   ගීතා 18:34, 25:4-12, 27:11, 32:8, 34:11, 45:4, 51:13, 71:17, 86:11, 90:12, 94:10, 12, 105:22, 119:12, 68, 99, 102, 104, 124, 135, 171, 143:10, 144:1
   2 සාමුවෙල් 22:35
   යෙසායා 2:3, 28:9, 26, 48:17
   1 ලේකම් 25:7
   මීකා 4:2

8. උපදෙස් ලබා දී ඇති පහත සඳහන් පද අධ්‍යයනය කරන්න

ගීතාවලිය 2:10
හිතෝපදේශ 5:13, 1:2-8, 4:1, 13, 6:23, 8:10, 33, 9:9, 10:17, 12:1, 13:1. 15:33, 19:20, 27, 21:11, 23:12, 23, 24:32
යෙසායා 8:11
ලූක් 1:4
රෝම 2:18
පිලිප්පි 4:12
2 තිමෝති 3:16

9. දෙවියන්වහන්සේගේ උපදෙස් ප්‍රතික්ෂේප කිරීම තුලින් භයානක ප්‍රතිඵල අත්වේ. පහත පද අධ්‍යයනය කරන්න.

හිතෝපදේශ 1:7, 5:12, 13, 23, 13:18, 15:5, 32, 16:22
යෙරමියා 17:23, 32:33
ගීතාවලිය 50:17

# දෙවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක් : මෙහෙය

### අරමුණු :-

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- ඉගැන්වීමේදී පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් ක්‍රියාකාරීත්වය විස්තර කිරීමට.
- යේසුස්වහන්සේ සියලු අනුගාමිකයන්ට ආදර්ශයක් වූ ශ්‍රේෂ්ඨ ගුරුවරුයාණන් ලෙස හඳුනා ගැනීමට
- ගුරුවරයෙකුගේ ජීවිතය තුළින් පැහැදිලි විය යුතු පෞරුෂත්ව ගුණාංග හඳුනා ගැනීමට
- දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙකු ලෙස යේසුස්වහන්සේගේ මෙහෙය විස්තර කිරීමට
- යේසුස්වහන්සේ විසින් ඉගැන්වූ ස්ථාන, අවස්ථා හා පුද්ගලයන් සාරාංශගත කිරීමට,
- දෙවියන්වහන්සේ යේසුස්වහන්සේව එවූ ආකාරයට යේසුස්වහන්සේ විසින් අපවද යවනු ලැබූ බව දැක්වෙන බයිබලීය සටහනක් ගෙනහැර දැක්වීමට
- දෙවියන්වහන්සේ වෙතින් පැමිනි ගුරුවරයෙකු ලෙස ඔබේ මෙහෙය හඳුනා ගැනීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :-

> **හෙතෙම රාත්‍රියේ උන්වහන්සේ ළඟට ඇවිත්, රබ්බි ඔබ දෙවියන්වහන්සේ කෙරෙන් ආවාවූ ගුරුවරයෙකුයැයි අපි දනිමුව, මක්නිසාද තමා සමග දෙවියන්වහන්සේ නැත්නම් ඔබ කරන්නාවූ මේ හාස්කම් කරන්න කිසිවෙකුට නුපුළුවනැයි කීවේය. (යොහාන් 3:2)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය තුළින් බයිබලීය ඉගැන්වීම තුළ පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් ක්‍රියාකාරීත්වය ඔබ ඉගෙන ගනු ඇත. යේසුස්වහන්සේගේ මෙහෙය පිළිබඳව සවිස්තරාත්මකව ඔබට ඉගෙන ගතහැකි වන අතර, "දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්" යන මේ අධ්‍යයනය තුළින් ගුරුවරයෙකු ලෙස ඔබේ සේවයේ දිව්‍යමය අරමුණු ඔබ විසින් සොයා ගනු ඇත.

## ඉගැන්වීමේ දිව්‍යමය නියෝජිතයන්

බයිබලය ඉගැන්වීම දිව්‍යමය නියෝජිතයන් විසින් බල ගන්වනු ලැබූවකි. මෙහි අදහස නම් එවැනි ඉගැන්වීමක් පසුපස ආත්මික බලවේග ඇති බවයි. එය මනුෂ්‍යයෙකුගේ ඉගැන්වීමක් පමණක් නොවේ. බයිබලීය ඉගැන්වීම තුළ සිටින දිව්‍යමය නියෝජිතයන් නම්, පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන්ය.

### පියවූ දෙවියන්වහන්සේ:

සභාවේ ඇදහිලිවන්තයන්ට ආත්මික දීමනා සහ ගුරුවරයෙකුගේ නිලය ලබා දෙනුයේ දෙවියන්වහන්සේ බව පසුගිය පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගත්තේය (එපීස 4:11). බයිබලීය ඉගැන්වීම තුළ උගන්වනු ලබන විෂය වන්නේ දේව වචනයයි. දෙවියන්වහන්සේගෙන් පැමිණි ගුරුවරකුගේ පණිවුඩය යන මීලඟ පරිච්ඡේදය අධ්‍යයනය කිරීම තුලින් මේ පිළිබඳව තවත් ඔබ ඉගෙන ගනු ඇත.

අපට දෙවියන්වහන්සේ පිළිබඳව ඉගැන්වීමටත්. සියලු මනුෂ්‍ය වර්ගයාට ගැළවීම ලබා දීමටත් යේසුස්වහන්සේව ලෝකයට එවන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි.

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි ඇදහන සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ලෝකයට එවුවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහාන් 3:16-17)**

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ:

දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියලු කාලවල සිටින ශ්‍රේෂ්ඨතම ආත්මික ගුරුවරයාය. යේසුස්වහන්සේව ලෝකයට එවන ලද්දේ පියවූ දෙවියන්වහන්සේ විසිනි.

> **හෙතෙම රාත්‍රියේ උන්වහන්සේ ළඟට ඇවිත්, රබ්බි ඔබ දෙවියන්වහන්සේ කෙරෙන් අවාවූ ගුරුවරයෙකුයැයි අපි දනිමුව, මක්නිසාද තමා සමග දෙවියන්වහන්සේ නැත්නම් ඔබ කරන්නාවූ මේ හාස්කම් කරන්න කිසිවෙකුට නුපුළුවනැයි කීවේය. (යොහාන් 3:2)**

දෙවියන්වහන්සේව නියෝජනය කරන ගුරුවරයෙකු වශයෙන් යේසුස්වහන්සේව ලෝකයාට එවනු ලැබූ බැවින් සියලු බයිබලීය ගුරුවරුන්ට අනුගමනය කළ හැකි වූ ආදර්ශය උන්වහන්සේය. ඇදහිලිවන්තයන්ව ගුරුවරු ලෙස ලෝකයට යවනුයේ යේසුස්වහන්සේය.

> **... පියාණන්වහන්සේ මා එවුවාක්මෙනම් මමත් නුඹලා යවමියි කීසේක. (යොහාන් 20:21)**
>
> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට, ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

## ශුද්ධාත්මයාණන්වහන්සේ:

යේසුස්වහන්සේගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් පසු උන්වහන්සේ ස්වර්ගයට යෑමෙන් අනතුරුව දෙවියන්වහන්සේ ඇදහිලිවන්තයන් තුළ වසන ගුරුවරයා ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේව එවූසේක. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන් තුල වාසය කරමින් දෙවියන්වහන්සේගේ වචනය උගන්වන සේක.

> **නමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක. (යොහාන් 14:26)**

ඉගැන්වීම තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ අතිරේක ක්‍රියාකාරීත්වයන් පහත පාඨ වලින් එළිදරව් කර ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේ:-

1. යේසුස්වහන්සේ ඉගැන්වූ "සියල්ල" පිළිබඳව උපදෙස් දෙන සේක (යොහාන් 14:26)
2. ඔබ උගත් දේ මතක තබා ගැනීමට උපකාරවනසේක. (යොහාන් 14:26)
3. සියලු සත්‍ය වෙතට ඔබව මඟ පෙන්වන සේක. (යොහාන් 16:13)
4. දේව සැළැස්මේ ඇති අනාගත සිදුවීම් දැනුම් දෙන සේක. (යොහාන් 16:33)
5. දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් එළිදරව් කරන සේක. (1කොරින්ති 2:10)
6. බයිබලීය ඉගැන්වීම් පසුපස ඇති ප්‍රඥාවයි. (1 කොරින්ති 2:13)
7. අර්බුදකාරී අවස්ථාවලදී පැවසිය යුතු දේවල් ඔබට උගන්වන සේක. (ලූක් 12:12)
8. ඉගැන්වීමට හා සේවය සඳහා ඔබව ආලේප කරන සේක. (ලූක් 4:18, 1 යොහාන් 2:27)
9. ශිෂ්‍යයන්ට යාච්ඤාව සඳහා ශක්තිය දෙන සේක. (රෝම 8:26)

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ විසින් උගන්වනු ලබන අයගේ ජීවිත තුළද ක්‍රියා කරන සේක.

1. ඔබ උගන්වන විට, පව්කාරයන්ට ඔවුන්ගේ පාපය පහදා දී ශුභාරංචි පණිවුඩයට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට ඉඩ සලසන ආත්මික බලවේගය ශුද්ධාත්මයාණන්වහන්සේය. (යොහාන් 16:7-11)
2. ඔවුන්ට ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එළිදරව් කරනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. (යොහාන් 16:14)
3. ඔවුන්ව "නැවත ඉපදීම" නැමැති අත්දැකීම වෙත ගෙන එන්නේ ශුද්ධාත්මයා-ණන්වහන්සේය. (යොහාන් 3:5, 6, 8)
4. මාංශයේ ජීවිතය වෙනුවට ආත්මයේ ජීවිතයක් වෙතට උන්වහන්සේ ඔවුන්ව ගෙනෙන සේක. (ගලාති 5:16)
5. උන්වහන්සේ දේව වචනය පිළිබඳව ඔවුන්ගේ හදවත් වලට සාක්ෂි දෙන සේක (ක්‍රියා 5:29-32)

## ශ්‍රේෂ්ඨ ගුරුවරයාණෝ

ක්‍රිස්තියානි ගුරුවරුන්ට අනුගමනය කිරීමට ඇති ආදර්ශය යේසුස්වහන්සේය. බයිබලීය ඉගැන්වීම් සඳහා වූ ආදර්ශය උන්වහන්සේය' මේ හේතුවෙන්, ගුරුවරයෙකු ලෙස ඔබට උන්වහන්සේ ගැන ඉගෙන ගත හැකි සියල්ලම ඉගෙන ගැනීම වැදගත්ය. ප්‍රථමයෙන්, කිතුණු ගුරුවරුන්ගේ ජීවිත තුලින් ප්‍රත්‍යක්ෂ විය යුතු යේසුස්වහන්සේගේ ජීවිතයේ පැවති ගුණාංග දෙස බලමු.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල:

යේසුස්වහන්සේගේ ජීවිතය තුලින් ශුද්ධාත්මයාණනවහන්සේගේ "ඵල" ප්‍රත්‍යක්ෂව පෙනුණි. ශුද්ධාත්ම "ඵල" යනුවෙන් හැඳින්වෙන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේට ඇදහිලිවන්තයන්ගේ ජීවිත තුළ දියුණු කිරීමට අවශ්‍ය ධනාත්මක ගුණාංගය.

> **... ආත්මයාණන්වහන්සේගේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සාමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත.** (ගලාති 5:22-23)

මතෙව්, මාර්ක්, ලූක් හා යොහාන් පොත් කියවා යේසුස්වහන්සේගේ ජීවිතය තුලින් මෙම ගුණාංග ප්‍රත්‍යක්ෂ වූ ආකාරය හඳුනාගන්න. දේව වචනය උගන්වන සෑම "ආත්මයෙන් පිරුණු" ගුරුවරයෙකු තුළද මෙම ගුණාංග පැවතිය යුතුය. සේවයේ සැබෑ පරීක්ෂණය වන්නේ ආත්මික ඵල මිස ආත්මික දීමනා නොවේ.

> **සියලු සමූහයෝ විශ්මපත් වී මුන්වහන්සේ දාවිත්ගේ පුත්‍රයාණෝදැයි ඇසුවෝය. (මතෙව් 12:23)**

### යේසුස්වහන්සේගේ ආකල්ප :-

ශුද්ධාත්ම ඵල වලට අමතරව, දේව වචනය උගන්වන ගුරුවරුන්ගේ ජීවිත තුළ තිබිය යුතු නිවැරදි ආකල්ප වලටද යේසුස්වහන්සේ ආදර්ශයක් විය. පහත බයිබල් පද මෙම ආකල්ප ඉදිරිපත් කරයි.

- යේසුස්වහන්සේට මිනිසුන් කෙරෙහි හා ඔවුන්ගේ අවශ්‍යතා කෙරෙහි විශාල අනුකම්පාවක් තිබුනි. මතෙව්15:32, මාර්ක් 1:32-35, 8:2-3, ලූක් 10:54-56, 19:41

- මෙම අනුකම්පාව, උන්වහන්සේ ඉගැන්වූ අය උදෙසා මැදිහත්කාරකම් කිරීම පිනිස උන්වහන්සේව යොමු කල සේක. මතෙව් 11:21-24, 23:37-39

- මෙය පියාණන්වහන්සේගේ රාජකාරිය පිළිබඳ සැළකිලිමත් වීමට යොමු කලසේක. ලූක් 2:49, 4:43, යොහාන් 4:34, 9:4

- තමන් උගන්වන අයට දෝෂාරෝපණය නොකිරීමේ ආකල්පය යේසුස්වහන්සේ තුළ විය: (මාර්ක් 2:17, යොහාන් 8:1-11). උන්වහන්සේ මනුෂ්‍යයින් සිටින තත්වයෙන් ඔවුන් පිළිගත් අතර ඉන්පසුව

ඔවුන් සිටිය යුතු ඇඳහිල්ලේ මට්ටමට ගෙන ගිය සේක. තෝමස් සැක කළ අවස්ථාවේදී උන්වහන්සේ ඔහුට දෝෂාරෝපණය කළේ නැත. (යොහාන් 20:24-29). යේසුස්වහන්සේ තමාගේ නිවසට ඇවිත් තම දියණියට යාච්ඤා කිරීම අවශ්‍යයැයි දැනුනු මුලාදෑණියාව උන්වහන්සේ වරදට පත් කළේ නැත (මතෙව් 9:18-26). එසේ කිරීම අනවශ්‍යයැයි පෙන්වා දී තිබුණු විට පවා (මතෙව් 8:5-13) උන්වහන්සේ ඔහුට දෝෂාරෝපණය කළේ නැත.

- යේසුස්වහන්සේ දෝෂාරෝපණය නොකළ නමුත්, පාපය සමඟ සම්මුතියකට පැමිනියේ නැත. එනම් උන්වහන්සේ කිසිඳු අයුරකින් එය අනුමත කළේවත්, එය නොදැක්කා සේ සිටියේවත් නැත. මතෙව් 11:21-24, 15:3-9, 12:12-13, මාර්ක් 10:17, ලූක් 5:31-32, 19:45-46

- සාමාන්‍ය ලෙස සිදුවිය නොහැකි දේවල් වලදී දෙවියන්වහන්සේව විශ්වාස කරන ආකාරය යේසුස්වහන්සේ පෙන්නුම් කළ සේක. මාර්ක් 10:17, 11:22-24, ලූක් 18:27

- උන්වහන්සේ ඉගැන්වීම් තුළ උන්වහන්සේ නිර්භිතබව හා අධිකාරීත්වය පෙන්නුම් කළ සේක. මතෙව් 21:23-27, මාර්ක් 8:38, 11:24-33, ලූක් 5:24

- ඉතාම වැදගත් දෙයනම් උන්වහන්සේගේ සේවය ලැබූ අය කෙරෙහි උන්වහන්සේට සේවකයෙකුගේ ආකල්පයක් පැවතිමයි. මතෙව් 20:25-28, 23:2-12, මාර්ක් 10:42-45, ලූක් 22:25-27

## ස්වාමීන්වහන්සේගේ මෙහෙය

යේසුස්වහන්සේගේ "මෙහෙය" පිළිබඳව කතා කිරීමේදී අප පහත සඳහන් දේ සලකා බලනවා ඇත.

යේසුස්වහන්සේ ඉගැන්වූයේ ඇයි.
උන්වහන්සේ ඉගැන්වූයේ කවර අවස්ථා වලදීද කොතැනදීද.
උන්වහන්සේ ඉගැන්වූයේ කාටද.
උන්වහන්සේ ඉගැන්වූයේ මොනවාද.
උන්වහන්සේ ඉගැන්වූයේ කෙසේද.

අපි උන්වහන්සේ ඉගැන්වූයේ ඇයි, කවර අවස්ථා වලදීද, කොතැනදීද, සහ කාටද යන්න පරීක්ෂා කර බලමු. ඉදිරියට ඇති පරිච්ඡේද උන්වහන්සේගේ මෙහෙයේ පණිවුඩය (මොනවාද) හා ක්‍රමවේද (කෙසේද) යන්න පිළිබඳව යොමු කරනවා ඇත.

### උන්වහන්සේ ඉගැන්වූයේ ඇයි:

යේසුස්වහන්සේ ඉගැන්වූයේ දෙවියන්වහන්සේ උන්වහන්සේට එය කරන්න නියම කර තිබූ නිසාය. යේසුස්වහන්සේගේ මෙහෙය (හේතුව හෝ අරමුණ) පහත බයිබල් පාඨ වල සාරාංශගත කර ඇත.

**ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගු කරන පිණිස මම ආවෙමියි නොසිතල්ලා. සම්පූර්ණ කරන්නට මිස අවලංගු කරන්ට නාවෙමි. (මතෙව් 5:17)**

**.... මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්නට නාවෙමියි කීසේක (මතෙව් 9:13)**

**පොළොවෙහි සමාදානය දෙන්ට මම ආවෙමියි නොසිතල්ලා. සමාදානය නොව කඩුවක් දෙන්ට ආවෙමි. (මතෙව් 10:34)**

(යේසුස්වහන්සේ අදහස් කළේ උන්වහන්සේගේ පණිවුඩය නිසා බෙදීමක් ඇතිවිය හැකි බවයි, ඇතැම් අය එය පිළිගනු ඇති අතර ඇතමුන් පිළි නොගනී)

**... ඉශ්‍රායෙල් වංශයේ නැතිවණු බැටළුවන් වෙතට මිස අන්‍යයන් වෙතට මම එවනු නොලද්දෙමියි කීසේක. (මතෙව් 15:24)**

**මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ ගලවා ගන්ට ආයේය. (මතෙව් 18:11) (ලූක් 19:10 ද බලන්න)**

**... මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමියි ඔවුන්ට කීසේක. (මාර්ක් 2:17)**

**... වෙන තැන්වලත් මා විසින් දේශනා කරනු පිණිස අසල නුවර වලට යමු, ඒ සඳහාම පිටත්ව ආවෙමි..... (මාර්ක් 1:38)**

**මක්නිසාද, මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ සොයන්ටද ගළවාගන්ටද ආයේයයි කීසේක. (ලූක් 19:10)**

**ඔවුන්ට කියනසේක්, මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැඟිටින්නත්, යෙරුසෙලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද, උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේ වලට සාක්ෂිකාරයෝය. (ලූක් 24:46-48)**

**යේසුස්වහන්සේද, මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ඨ කිරීමය. (යොහාන් 4:34)**

**මක්නිසාද, මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය... (යොහාන් 6:38-39)**

**... ඒ පිණිස මම ඉපදී සිටිමි. මා ලෝකයට ඇවිත් සිටින්නේ සත්‍යයට සාක්ෂි දෙන පිණිසය (යොහාන් 18:37)**

**මා කෙරෙහි අදහාගන්න කවරෙක් නමුත් අන්ධකාරයෙහි නොසිටින පිණිස මම ලෝකයට ආලෝකයක්ව ආවෙමි. (යොහාන් 12:46)**

**මාගේ පියාණන්වහන්සේ ළඟදී දුටුදේ මම කියමි... (යොහාන් 8:38)**

**... මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)**

## උන්වහන්සේ ඉගැන්වූයේ කවර අවස්ථා වලදීද, කොතැනදීද:

යේසුස්වහන්සේ සබත් දින වලදී ඉගැන්වූ සේක:

**ඔවුහු කපර්ණවුමට පැමිණියෝය. එකෙණෙහිම සබත් දවසේ උන්වහන්සේ සිනගෝගයට ඇතුළු වී ඉගැන්වූ සේක. (මාර්ක් 1:21) (ලූක් 4:31, 6:6, 13:10 ද බලන්න)**

යේසුස්වහන්සේ දිනපතා ඉගැන්වූ සේක:

**උන්වහන්සේ දවස්පතා දේව මාළිගාවේ ඉගැන්වූ සේක... (ලූක් 19:47)**

උන්වහන්සේ නගර වල හා ගම් වල ඉගැන්වූ සේක:

**එවිට උන්වහන්සේ : වෙන තැන්වලත් මා විසින් දේශනා කරන පිණිස අසල නුවර වලට යමු, ඒ සඳහාම පිටත්ව ආවෙමියි ඔවුන්ට කීසේක. (මාර්ක් 1:38)**

**යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද ... සියලු නුවර වලද ගම් වලද ඇවිද්ද සේක' (මතෙව් 9:35) (මතෙව් 11:1, මාර්ක් 1:38, 6:6, ලූක් 13:22 ද බලන්න)**

ආගමික නමස්කාර මධ්‍යස්ථාන වල උන්වහන්සේ ඉගැන්වූ සේක:

**තවද යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද..... ගලීලය මුළුල්ලේ ඇවිද්ද සේක. (මතෙව් 4:23) (මතෙව් 13:54, මාර්ක් 1:21, 6:2, ලූක් 4:15, 6:6, 13:10, යොහාන් 6:59, 18:20 ද බලන්න)**

**උන්වහන්සේ දේවමාළිගාවට ඇතුල්ව උගන්වමින් සිටියදී. නායක පූජකයෝද සෙනඟගේ වැඩිමහල්ලෝද උන්වහන්සේ ළඟට ඇවිත්,...(මතෙව් 21:23) (මතෙව් 26:55, මාර්ක් 12:35, 14:49, ලූක් 19:47, 20:21, 21:37, යොහාන් 7:14, 28, 8:2, 20 ද බලන්න.&**

උන්වහන්සේ ඕනෑම තැනකදී සහ සෑම තැනකදීම ඉගැන්වූ සේක:

**උන්වහන්සේ පිටත්ව මුහුද අයිනේ ගියසේක. මුළු සමූහයා උන්වහන්සේ වෙතට ආවෝය. උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූසේක. (මාර්ක් 2:13) (මාර්ක් 4:1, 10:1, ලූක් 5:3 ද බලන්න)**

## උන්වහන්සේ ඉගැන්වූයේ කාටද:

යේසුස්වහන්සේ ජන සමූහයන්ට ඉගැන්වූ සේක:

**උන්වහන්සේ සමූහයන් දැක කන්දකට නැගුණ සේක.... උන්වහන්සේ මුඛය හැර ඔවුන්ට උගන්වමින් මෙසේ කී සේක. (මතෙව් 5:1-2)**

(සමූහයන් උදෙසා යේසුස්වහන්සේගේ සේවය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය සඳහා මෙම පරිච්ඡේදයේ " තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස බලන්න.)

යේසුස්වහන්සේ තනි පුද්ගලයන්ට ඉගැන්වූ සේක:

යේසුස්වහන්සේ තනි පුද්ගලයන් උදෙසා සිදුකළ සේවය පිළිබඳ සටහන් සඳහා යොහාන් 3 හා 4 පරිච්ඡේද සහ මෙම පරිච්ඡේදයේ " තවදුරටත් අධ්‍යයනය සඳහා " කොටස බලන්න.

යේසුස්වහන්සේ සමාජයේ සෑම තරාතිරකම පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට ඉගැන්වූ සේක:

- උන්වහන්සේ පොහොසත් මිනිසුන්ට ඉගැන්වූ සේක : මාර්ක් 10:17-22

- උන්වහන්සේ දුප්පතුන්ට ඉගැන්වූ සේක : ලූක් 4:18

- උන්වහන්සේ සමාජයේ සෑම තරාතිරමකටම ඉගැන්වූ සේක : සමාරිය ස්ත්‍රිය පහත්ම පංතියේ වූ අතර (යොහාන් 4) නිකදේමුස් මූලාදෑනියෙක් මෙන්ම ඉහළම පංතියේ සාමාජිකයෙක්ද විය (යොහාන් 3)

- උන්වහන්සේ තමන්ගේම ජාතියට අයත් අයට ඉගැන්වූ සේක

**නමුත් උන්වහන්සේ උත්තර දෙමින් : ඉශ්‍රායෙල් වංශයේ නැතිවුණු බැටලුවන් වෙතට මිස අන්‍යයන් වෙතට මම එවනු නොලද්දෙමියි කීසේක. (මතෙව් 15:24)**

**... මොහු ගලීලයේ පටන් මෙතැන දක්වා යුදය මුළුල්ලේ උගන්වමින් ... (ලූක් 23:5)**

- උන්වහන්සේ අනෙක් ජාතීන් වලට අයත් අයටද ඉගැන්වූ සේක' යේසුස්වහන්සේ සමාරිය ස්ත්‍රියට ඉගැන්වීම සඳහන් යොහාන් 4 බලන්න.

- උන්වහන්සේ ආගමික නායකයන්ට ඉගැන්වූ සේක:

**ඒ දවස්වලින් එකක දී උන්වහන්සේ උගන්වන කල, ගලීලයේ යා යුදයේ සෑම ගම් වලින්ද, යෙරුසෙලමෙන්ද ආවාවූ ඵරිසිවරුන් ව්‍යවස්ථාව උගන්වන්නොත් එහි හිඳගෙන උන්නෝය. සුවකරන පිණිස ස්වාමීන්වහන්සේගේ ආනුභාවය උන්වහන්සේ සමඟ වුයේය. (ලූක් 5:17)**

- උන්වහන්සේ සෑම වයසකම අයට ඉගැන්වූ සේක: උන්වහන්සේ තරුණ මුලාදෑනීන්ට ඉගැන්වූ සේක (මාර්ක් 10:17-22) එසේම උන්වහන්සේ අවුරුදු 38 ක් හාස්කමක් වෙනුවෙන් බලා සිටි මිනිසෙකුටද ඉගැන්වූ සේක (යොහාන් 5: 1-16) .

- උන්වහන්සේ ඉගැන්වීමේ මෙහෙය මුළු ලෝකයම උදෙසා විය' සෑම සංස්කෘතියකට, ගෝත්‍රයකට හා භාෂාවකට අයත් මිනිසුන් උදෙසා විය :

**නමුත් උන්වහන්සේ : මා විසින් අනෙක් නුවර වලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනා කරන්ට ඕනෑය. මක්නිසාද, ඒ පිණිස එවන ලද්දෙමියි ඔවුන්ට කී සේක. (ලූක් 4:43)**

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට විශේෂ ආකාරයෙන් ඉගැන්වූ සේක :

**උන්වහන්සේ බොහෝ කාරණා උපමාවලින් ඔවුන්ට ඉගැන්වූසේක. උන්වහන්සේ තමන් ඉගැන්වීමේදී ඔවුන්ට කියන සේක්: (මාර්ක් 4:2)**

**එවිට උන්වහන්සේ සමූහයන් යන්ට හැර ගෙට ගිය සේක. ගෝලයෝ උන්වහන්සේ ළඟට ඇවිත්: කෙතේ කිරිඳිවල උපමාව අපට තෝරාදුන මැනවයි කීවෝය. (මතෙව් 13:36)**

යේසුස්වහන්සේගේ ගෝලයන් සභාවේ නායකත්වය දරණ පිණිස උන්වහන්සේ විසින් පුහුණු කළ අය නිසා උන්වහන්සේ ඔවුන්ට විශේෂ පාඩම් ඉගැන්වූ සේක.

ඇතැම් විට යේසුස්වහන්සේ කණ්ඩායම් එකතු කර ඔවුන්ට එකට ඉගැන්වූ සේක : ලූක් 15:1-17:11 බලන්න.

## "මමත් නුඹලා යවමි"

යේසුස්වහන්සේ තම අනුගාමිකයන් අමතා සියලු ඇදහිලිවන්තයන්ට අදාල වන විශේෂ ප්‍රකාශයන් කළ සේක.

**යේසුස්වහන්සේ: ... පියාණන්වහන්සේ මා එවූවාක්මෙන්ම මමත් නුඹලා යවමියි කීසේක. (යොහාන් 20:21)**

මෙහි අදහස නම්, ඇදහිලිවන්තයන් යේසුස්වහන්සේගේ මෙහෙයට සමාන මෙහෙයක් උදෙසා ලෝකයට යවන බවයි. යේසුස්වහන්සේ මෙන්ම අපද "දෙවියන්වහන්සේ වෙතින් පැමිණි" ගුරුවරුය. ඉගැන්වීම් තුළ අපගේ මෙහෙය පහත ප්‍රකාශය මඟින් අපට කෙටියෙන් සාරාංශ කර දැක්විය හැකිය: පියාණන්වහන්සේ යේසුස්වහන්සේ එවූ ලෙසම එම අරමුණම ඉටුකර ගැනීම සඳහා අපවද එවා තිබේ. උන්වහන්සේගේ මෙහෙය අපගේද මෙහෙයයි. අපේ මෙහෙයද යේසුස්වහන්සේගේ මෙහෙයම වන බැවින් ඉගැන්විය යුත්තේ කාටද? කොහිද්ද? හා කවර අවස්ථාවලදීද යන කරුණු පිළිබඳව අප උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළ යුතුය. අපගේ මෙහෙය සියලු මිනිසුන් උදෙසා, ඕනෑම තැනකදී, ඕනෑම වේලාවකදී ඉටු විය යුතුය. යේසුස්වහන්සේගේ ජීවිතයේ පැවති ගුණාංග මෙන් අප ජීවිත තුළද ආත්මික ගුණාංග වර්ධනය කිරීමට අප දෙවියන්වහන්සේට ඉඩ දිය යුතුය. යේසුස්වහන්සේගේ මෙහෙය පිළිබඳව සළකමින් මෙම පාඩම නැවත කියවන්න. එසේ කරන විට ඔබවද ඒ හා සමාන මෙහෙයක් උදෙසා නැති වූ ලෝකයක් වෙත යවා ඇති බව මතකයේ තබාගන්න.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ඉගැන්වීම තුළ පිය වූ දෙවියන්වහන්සේගේ කාර්ය කුමක්ද?

3. ඉගැන්වීම තුළ යේසුස්වහන්සේගේ කාර්යය කුමක්ද?

4. ඉගැන්වීම තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ කාර්යයන් මොනාවාද?

5. නිවැරදි වචන යොදා හිස්තැන් පුරවන්න

______________ ______________ සියල්ලන් අනුගමනය කළ යුතු, ශ්‍රේෂ්ඨ ගුරුවරයාණෝය.

6. ගුරුවරයෙකුගේ ජිවිතය තුළ වර්ධනය විය යුතු ධනාත්මක පෞරුෂත්ව ගුණාංග සමහරක් ලියන්න.

7. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙකු ලෙස යේසුස්වහන්සේගේ මෙහෙය සාරාංශගත කරන්න.

8. උන්වහන්සේගේ මෙලොව සේවය තුළ පහත සඳහන් එක් එක් මාතෘකාව පිළිබඳ කෙටි සාරාංශයක් ලියන්න.
යේසුස්වහන්සේ ඉගැන්වූයේ කොහේදීද?

යේසුස්වහන්සේ ඉගැන්වූයේ කවර අවස්ථාවලදීද?

යේසුස්වහන්සේ ඉගැන්වූයේ කාටද?

9. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ එවූ ලෙසම උන්වහන්සේ අපව යවන බව සහතික කරන බයිබල් පදය කුමක්ද?

10. දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙකු ලෙස ඔබේ මෙහෙය කෙටියෙන් සාරාංශ කොට දක්වන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

01. සමූහයන් සඳහා යේසුස්වහන්සේගේ මෙහෙය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.

**මතෙව්** : 5:1-2, 7:28-29, 8:1-2 (සමූහයක් මැද සිටි තනි පුද්ගලයන්) 8:16-17, 34, 9:1-8, 36-38, 11:7, 13:1-9, 14:13-23, 15:30-39, 17:14, 19:2, 20:29-34, 21:8-11, 22:23, 26:47

**මාර්ක්** : 1:33-35, 45, 2:1-5, 7-15, 20-21, 32-35, 4:1-36, 5:14-17, 21-43, 6:2-5, 33-46, 55-56, 7:24, 31-37, 8:1-9, 9:14-27, 10:1, 46-52, 11:8-10, 14:43-52, 15:8

**ලූක්** : 2:45-52, 4:16-30, 40-44, 5:1, 15-16, 18-26, 6:17-7:1, 7:11-18, 8:1, 37, 40, 56, 9:12-18, 37, 12:1, 13:11-17, 18:35-43, 19:1-10, 36-40, 22:47, 23:1

**යොහාන්** : 2:1-11, 4:39-42, 5:1, 13: 6:5-15, 22, 7:40, 8:1-9, 12:9, 12-13

02. තනි පුද්ගලයන් උදෙසා යේසුස්වහන්සේගේ මෙහෙය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා පහත බයිබල් පද අධ්‍යයනය කරන්න.

**මතෙව් :** 8 වන පරිච්ජේදය (කුෂ්ඨ රෝගියා, සේවකයා, පේත්‍රුස්ගේ භාර්යාවගේ මව, ලියන්නෙක්): 9 වන පරිච්ජේදය (අංශභාග රෝගියා, රෝගී කාන්තාව, දරුවෙක්): 12:9-13 (වියළි අතක් ඇති මිනිසෙක්): 12:22 (යක්ෂාවේශ වූවෙක්): 15:21-28 (යක්ෂාවේශ වූ දියණියක් ඇති කාන්තාවක්): 17:17-18 (යක්ෂාවේශ වූ පුතෙක් ඇති මිනිසෙක්): 19:16-22 (පොහොසත් තරුණයෙක්): 22:34-40 (ව්‍යවස්ථාව උගන්වන්නෙක්): 26:6-13 (සුවඳ තෙල් අතැතිව සිට කාන්තාව)

**මාර්ක් :-** 1:23-26 (සිනගෝගයේ සිටි අශුද්ධ ආත්මය සහිත මිනිසා):1:40 (කුෂ්ඨ රෝගියා) 5:1-20 ("ලෙගියොන්"):8:22-26 (අන්ධ මිනිසා), 10:46-52 (අන්ධ බර්තෝලමෙව්ස්)

**ලූක් :-** 7:11-17 (මැරී සිටි මිනිසා), 8:2 (මද්ගලේනා නම් මරියා), 9:57-62 (ගෝලයන් වන්න උත්සාහ කළ පුද්ගලයන්), 10:25-37 (ව්‍යවස්ථාව උගන්වන්නෙක්), 10:38-42 (මාර්තා), 12:13-15 (උරුමය ගැන සැළකු සහෝදරයා), 13:10-17 (දුර්වල කමේ ආත්මයක් සහිත කාන්තාව), 13:23-30 (හඳුනානොගත් ප්‍රශ්න කරන්නෙක්), 14:1-6 (දිය උදර රෝගියා), 19:1-10 (සාකෙවුස්)

**යොහාන් :-** 1:47-51 (නතානියෙල්), 3 පරිච්ජේදය (නිකදේමුස්), 4:4-42 (සමාරිය ස්ත්‍රිය), 5:1-16 (බෙත්සයිදාවේ කොර වූ මිනිසා), 8:1-11 (අනාචාර ස්ත්‍රිය), 9 වන පරිච්ජේදය (උපතින්ම අන්ධව සිටි මිනිසා), 11 වන පරිච්ජේදය (ලාසරස්, මාර්තා), 13:1-10, 21:15-25 (පේත්‍රුස්), 19:25-27 (උන්වහන්සේගේ මව), 20:11-18 (මරියා), 20:24-29 (තෝමස්)

3. ශුභාරංචි පොත් වල යේසුස්වහන්සේට "ගුරුවරයා" ලෙස 48 වතාවක් අමතා ඇත. ඔබේ බයිබලයේ එම අවස්ථා ලකුණු කරන්න.

4. භාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ "*ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය*" නැමති පාඨමාලාව ජිවිතය හා සේවය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැදගත්කම පිළිබඳව වැඩිදුර උපෙදස් සපයයි.

5. මෙම පාඩම තුළින් යේසුස්වහන්සේ ඕනෑම වේලාවක ඕනෑම තැනකදී ඉගැන්වූ ආකාරය ඔබ ඉගෙන ගත්තේය. මෙය ද්වීතිය කතාව 6:6-7 සඳහන් දෙවියන්වහන්සේ ලබා දුන් ප්‍රතිපත්තිය අනුව යැමකි' ඔබේ බයිබලයෙන් මෙම කොටස කියවන්න.

6. බයිබලිය ඉගැන්වීම පිටුපස සිටින දිව්‍යමය නියෝජිතයන් පිළිබඳව ඔබේ තේරුම් ගැනීම වැඩිකර ගැනීම සඳහා පහත වගු අධ්‍යයනය කරන්න.

## එළිදරව් කිරීමේ ස්වභාවය

## 1 කොරින්ති 2:9-13

| | |
|---|---|
| දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේමකරන්නන්ට සූදානම් කළ යම් දෙයක් ඇද්ද ඒ දේ ඇසට නොපෙනුණේය, කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමිණෙන්නේය. | එම තොරතුරු මනුෂ්‍ය අත්දැකීම් මත පදනම් වූ ඒවා නොවේ. |
| නමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්-වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළසේක. මක්නිසාද ආත්මයා-ණන්වහන්සේ සියලු දේ දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසනසේක. මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද? එසේම දෙවියන්වහන්සේගේ කාරණා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මිස වෙන කිසිවෙක් නොදනියි. | ශුද්ධාත්මයාණන්වහන්සේ අපට ඉගැන්වීමේ ඇති අරමුණු |
| නමුත් දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන්වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. | එළිදරව් කිරීමේ අරමුණු |
| අප විසින් ඒ දේවල් කතා කරන්නේත් මනුෂ්‍ය ප්‍රඥාව කරණකොටගෙන උගන්වන ලද වචන වලින් නොව ආත්මික දේවල් ආත්මික දේ සමඟ සමාන කර බලමින් ආත්මයාණන්වහන්සේ විසින් උගන්වන ලද වචන වලින්ය. | එළිදරව් කිරීම ප්‍රකාශ කරනු ලබන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් උගන්වනු ලබන වචන වලිනි. |

## 1 කොරින්ති 2:1-4:7

| අපගේ කොටස | දෙවියන් වහන්සේගේ කොටස |
|---|---|
| අපි කතාවේවත් ප්‍රඥාවේවත් උතුම්කමින් යුක්තව නාවෙමු. අපි අවධාරණය කරන්නේ යේසුස්වහන්සේව සහ උන්වහන්සේගේ කුරුසියයි | |
| අපි මනුෂ්‍ය බුද්ධිය මත රඳා නොපවතිමු, නමුත් ... | ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය පිළිබඳව ප්‍රකාශ කිරීම |
| පරිණත ඇදහිලිවන්තයන් අතරෙහි අපි ප්‍රඥාව කථාකරමුව | එය දෙවියන්වහන්සේ විසින් එළිදරව් කරන ලදි.<br><br>- ශුද්ධාත්මයාණන්වහන්සේ ස්වභාවික මිනිසා කිසිදා නොදත් දේවල් එළිදරව් කරනසේක.<br><br>- උන්වහන්සේ දෙවියන්වහන්සේගේ ගැඹුරු සත්‍යයයන් බෙදාගන්නාසේක.<br><br>- දෙවියන්වහන්සේගේ කාරණා තේරුම්ගත හැක්කේ උන්වහන්සේට පමණි. |

| | |
|---|---|
| | - දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද අනුග්‍රහය දැනගන්නා පිණිස |
| අපි මෙම ආත්මික සත්‍යයන් වචන වලින් කතා කරමුව ... | ශුද්ධාත්මයාණන්වහන්සේ උගන්වන ලද වචන වලින් |
| අපි ඒවා අගය කරන්නෙමු ...<br>අපට ඇත්තේ යේසුස්වහන්සේ සිතුවිලිය | ආත්මික ලෙස විමසීමෙන් |
| අපි හුදු සේවකයෝය ... | ස්වාමින්වහන්සේ කාර්යයක් භාරදුන් අය වේ. |
| අපි සමහරු හිටවමු, සමහරු වතුර දමමු ... | නමුත් වර්ධනය දෙන්නේ දෙවියන්-වහන්සේය. |
| අපේ ස්වරූපයෙන් අපි කිසිවක් නොවේ ... | වර්ධනය දෙන දෙවියන්වහන්සේය |
| සිටවන්නාත් වතුර දමන්නාත් එක අරමුණකින් යුක්තය ... | එක එක්කෙනා තම තමාගේ වැඩය හැටියට විපාක ලබන්නේය. |
| අපි දෙවියන්වහන්සේගේ හවුල් වැඩ කරන්නෝය. නුඹලා උන්වහන්සේගේ කෙතය, උන්වහන්සේගේ ගොඩනැගිල්ලය. | දේව අණට අනුව. |
| අත්තිවාරම දැමූ ගෘහ නිර්මාණ ශිල්පියා එකමය (ක්‍රිස්තුස්වහන්සේ). නමුත්, වෙනෙකෙකු ඒ පිට ගොඩනගයි. | |
| සෑම කෙනෙක්ම තමන් ගොඩනගන ආකාරය පිළිබඳව ප්‍රවේශම් විය යුතුය ... | විනිශ්චය දවසේදී සෑම මනුෂ්‍යයෙකුගේම කාර්යය ගින්නෙන් පරීක්ෂා කරනු ලබයි. පරීක්ෂාව තුළ කෙනෙකුගේ කර්මාන්තය පවතී නම් ඔහු විපාක ලබයි. |
| අපි දෙවියන්වහන්සේගේ මාලිගාවයි ... | ආත්මයාණන්වහන්සේගේ ස්ථිර වාසස්ථානය එයයි. |
| දෙවියන්වහන්සේ තුළ ලෝකයේ ප්‍රඥාව මෝඩකමය. අපට මනුෂ්‍යයන්ගැන පාරට්ටු කළ නොහැකිය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ල (ආත්මිකව) අයිති ඔබටය. දෙවියන්වහන්සේ තුළ අපි ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයෝය. සත්‍යයේ වටිනාකම ඔප්පු කළ යුතු වූ සත්‍යයේ ගබඩාකාරයෝය ... | |
| | අපේ එකම විනිශ්චයකාරයාණෝ දෙවියන්වහන්සේය. උන්වහන්සේ සැඟවුණුඅදහස් එළිදරව් කරනසේක. එසේම අනුකූල වන ලෙස ප්‍රශංසාව දෙනසේක. |
| | අපට ලැබී ඇති හැම දෙයක්ම ලැබී ඇත්තේ දෙවියන්වහන්සේගෙනි. එබැවින් පාරට්ටු කිරීම ඉවත දැමිය යුතුය. |

# තුන්වන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: පණිවුඩය - 1 වන කොටස

### අරමුණු :-

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට පහත සඳහන් දේ කිරීමට හැකිවනු ඇත.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ මූලික පණිවුඩය සංක්ෂිප්ත කිරීමට
- ශුභාරංචි පණිවුඩයේ මූලික සිද්ධාන්තයන් සංක්ෂිප්ත කරන බයිබලිය පාඨයන් උපුටා දැක්වීම
- ඇදහිලිවතුන් ඉගැන්විය යුත්තේ යේසුස්වහන්සේගේ ඉගැන්වූ පණිවුඩයම බව පිළිගැනිම
- දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කරමින් ඉගැන්වීම සහ දේශනා කිරීම සිදුවිය යුතු බව පිළිගැනිම
- දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීමේ පදනම "බයිබලය" බව පිළිගැනිම

### ප්‍රධාන පදය :-

**නුඹලා යමින් - ස්වර්ග රාජ්‍යය ලංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුව කරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරු කරපල්ලා' නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලේ දීපල්ලා' (මතෙව් 10:7-8)**

## හැඳින්වීම

අද දින ඇදහිලිවන්තයන්ගේ වගකීම වන යේසුස්වහන්සේගේ ඉගැන්වීමේ ධ¾මදූත සේවය ගැන මිට ඉහත පරිච්ඡේදයේදී ඔබ උගත්තෙහිය. ගුරුවරයෙකු ලෙස ඔබගේ ජිවිතයේ දක්නට ලැබිය යුතු උන්වහන්සේගේ ජිවන රටාවේ ගුණාංගයන් ඔබ ඉගෙනගත්තෙහිය. යේසුස්වහන්සේ ඉගැන්වූයේ කවදාද? කොහේදීද, කා වෙනුවෙන්ද කුමක් සඳහා ද යන්න ඔබ උගත්තෙහිය.

මෙම පරිච්ඡේදය සහ ඊලඟ පරිච්ඡේදයේදී යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඔබ ඉගෙන ගනු ඇත. යේසුස්වහන්සේට උන්වහන්සේගේ ගෝලයන් පුහුණු කිරීමට ජිවිත කාලයක් තිබුණේ නැත. උන්වහන්සේට තිබුණේ කෙටි වසර කිහිපයක් වූ බැවින් උන්වහන්සේ ඉගැන්වීම් වල වැදගත් සංකල්ප වලට අවධානය යොමු කළ සේක. ඔබගේ ඉගැන්වීම් සේවයේදී උන්වහන්සේගේ පණිවුඩයේ අඩංගු කරුණු වෙත ඔබ අවධානය යොමු කළ යුතුය.

## මූලික පණිවුඩය

යේසුස්වහන්සේගේ මූලික පණිවුඩය එක් වාක්‍යයකින් සංක්ෂිප්ත කළ හැකිය. දේව රාජ්‍යය පිළිබඳ සෑම දෙයක්ම උන්වහන්සේ ඉගැන්වූ සේක.

සෑම මිනිසෙක්ම ජිවත් වන්නේ මොලොව ලෞකික රාජ්‍යය තුළය. දේශයේ කොටසක් වන නගරයක හෝ ගමක ඔවුන් ජිවත් වේ. එම දේශය ලෞකික රාජ්‍යයකි. මෙලොව ස්වාභාවික රාජ්‍යයන්ට අමතර තවත් ආත්මික රාජ්‍යයන් දෙකක් ඇත. සෑම පුද්ගලයෙක්ම එම රාජ්‍ය දෙකකින් එකක පුරවැසියෙකි. සාතන්ගේ රාජ්‍යය හෝ දේව රාජ්‍යය වේ. නොඇදහිලිවන්තයන් සාතන්ගේ රාජ්‍යයේ කොටසකි. සාතන් ඔවුන්ගේ ජිවිත පාලනය කරයි. ඔවුන්ට ඇත්තේ භක්තියක්

නැති දුරාචාර ලෞකික පාපතර ජීවන රටාවකි. පාපයට පශ්චත්තාප වී යේසුස්වහන්සේ ඔවුන්ගේ පෞද්ගලික ගැලවුම් කාරයාණන් ලෙස පිළිගන්නාවූ අය දේවරාජ්‍යයේ කොටස් කරුවෝය. දෙවියන් වහන්සේ ඔවුන්ගේ රජ වන අතර ඔවුන්ගේ ජීවිත පාලනය කරන සේක.

ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ කේන්ද්‍රිය අරමුණු දේව රාජ්‍යයේ ශුභාරංචියයි. උන්වහන්සේගේ මෙලොව ධර්ම ප්‍රචාරය ආරම්භ කළේ දේව රාජ්‍යයේ පැමිණීම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමෙන්ය.

> **එතැන් පටන් යේසුස්වහන්සේ : පසුතැවිලිවෙයල්ලා, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ලංවී තිබේය කියා දේශනා කරන්ට පටන් ගත්සේක. (මතෙව් 4:17)**

උන්වහන්සේ "රාජ්‍යයට අදාල දේ" පිළිබඳව කථා කිරීමෙන් මෙලොව ධ¾ම දේශනය නිමා කළ සේක.

> **උන්වහන්සේ වධ වින්ද පසු සතළිස් දවසක් අතරතුරේ ඔවුන්ට පෙනෙමින්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන කාරණා කියමින්ද බොහෝ ඔප්පු සාක්ෂි වලින් තමන් ජීවමානව ඔවුන්ට ප්‍රකාශවූසේක (ක්‍රියා 1:3)**

උන්වහන්සේගේ මෙලොව සේවයේ ආරම්භය සහ අවසානය අතර දේව රාජ්‍යය වෙත උන්වහන්සේගේ ඉගැන්වීම් වල අවධානය යොමු කළ සේක උන්වහන්සේ මෙසේ වදාළ සේක.

> **නුමුත් උන්වහන්සේ : මා විසින් අනික් නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනැය. මක්නිසාද ඒ පිණිස එවනලද්දෙමියි ඔවුන්ට කීසේක. (ලූක් 4:43)**

යේසුස්වහන්සේගේ උපමා රාජ්‍යය වෙත අවධානය යොමු කළ සේක. උන්වහන්සේගේ හාස්කම් දේව රාජ්‍යයේ ක්‍රියාකාරී බව ප්‍රදර්ශනය කළේය. නැවත උත්පාදනය වීමේ අත්දැකීමෙන් රාජ්‍යයට ඇතුලුවන්නේ කෙසේදැයි යේසුස්වහන්සේ සෙනගට ඉගැන්වූ සේක (යොහාන් 3). මෙය ධර්ම ප්‍රචාරයයි. රාජ්‍යයේ ජීවන රටාවක් ගොඩනඟා ගැනීමෙන් දේව රාජ්‍යයේ කොටස් කරුවෙකු ලෙස ජීවත් වන්නේ කෙසේදැයි යේසුස්වහන්සේ සෙනගට ඉගැන්වූ සේක (නිදසුනකට මතෙව් 5-7 කියවන්න) මෙය ගෝලත්වය වේ.

දේව රාජ්‍යය නමැති මාතෘකාවේ වැදගත්කම නිසා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය "රාජ්‍යයේ ජීවත්වීම" නමින් පාඨමාලාවක් පිරිනමයි. ඔබ තවමත් මෙම පාඨමාලාව අධ්‍යයනය කර නැත්නම් ඔබ එය හැදෑරීම වැදගත්ය. රාජ්‍යයේ ශුභාරංචියේ විස්තරාත්මක ඉගැන්වීම එහි අන්තර්ගතය.

රාජ්‍යය පවතින මූලික සත්‍යතාවන් (ආත්මික "පදනම්") ඉගැන්වෙන "ඇදහිල්ලේ පදනම්" ලෙස හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය පිරිනමන තවත් පාඨමාලාවකි.

යෝජනා කර ඇති ආකාරයට ඔබ ආයතනයේ පාඨමාලාව හදාරන්නේ නම්, ඔබ දැනටමත් මෙම පාඨමාලා හදාරා ඇත. එවිට දේව රාජ්‍යයට ඇතුලු වී එහි කොටස් කරුවෙකු වශයෙන් ජීවත් වන්නේ කෙසේදැයි තේරුම් ගෙන ඇත්තේය. ඔබ උගන්වමින් අන්‍යයන් අතර ප්‍රචලිත කළ යුත්තේ මෙම පණිවුඩයයි.

## ශුභාරංචියේ මූලික සිද්ධාන්තයන්

මූලික ශුභාරංචි පණිවුඩය සංක්ෂිප්ත කරන එක් පාඨයක් නව ගිවිසුමේ ඇත'

> **තවද, සහෝදරයෙනි, මම නුඹලාට දේශනාකළාවූ නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ නුඹලා ගැලවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි. මා නුඹලාට ප්‍රකාශකළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහු නම්, කුමන වචන වලින් එය නුඹලාට දේශනා කෙළෙම්දැයි දන්වමි. නැත්නම් නුඹලා නිෂ්ඵල ලෙස ඇදහුවහුය. ඉතින් මාත් ලබා ගත් දේ සියල්ලන්ට පළමුවෙන් නුඹලාට භාර දුනිමි, එනම්, ලියවිලි වල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත්, ලියවිලි වල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්, (1 කොරින්ති 15:1-4)**

ශුභාරංචි පණිවුඩයේ මූලික සිද්ධාන්තයන් වන්නේ ශුද්ධ ලියවිල්ල පරිදි යේසුස්වහන්සේ අප පව් උදෙසා මැරුනු බවත් උන්වහන්සේ වැළලූ සේම නැවත නැගිටුනු බවත් ශුද්ධ ලියවිල්ලේ සඳහන්ය. රාජ්‍යයේ ශුභාරංචිය ඉගැන්වීමේදී හෝ දේශනා කිරීමේදී ඔබගේ පණිවුඩයේ මෙම මූලික කරුණු අන්තර්ගත විය යුතුය. ශුභාරංචි පණිවුඩයේ අවධානය යේසුස්වහන්සේය. බයිබලය ඉගැන්වීම් ධ¾ම දූත සේවය (දේව රාජ්‍යයට ඇතුලු වන්නේ කෙසේද) හෝ ගෝලත්වයේ (දේව රාජ්‍යයේ ජීවත් වන්නේ කෙසේදැයි) යන්න සෑම විටම අදාළ කරගත යුතුය.

## දේව වචනය

දෙවියන්වහන්සේගේ සත්‍යයේ පණිවුඩය යේසුස්වහන්සේ ඉගැන්වූ සේක.

> **ඔවුහු හෙරෝදිවරුන් සමඟ තමුන්ගේ ගෝලයන් උන්වහන්සේ ළඟට යැව්වෝය. ඔවුහුද: ආචාරීන්වහන්ස, ඔබ සැබෑ කෙනෙක් බවත් දෙවියන්වහන්සේගේ මාර්ගය සැබෑ ලෙස උගන්වන බවත් මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන බැවින් කිසිවෙකු නොසලකන බවත් දනිමු.** (මතෙව් 22:16)

උන්වහන්සේ ධර්ම සිද්ධාන්තයන් ඉගැන්වූ සේක.

> **උන්වහන්සේ බොහෝ කාරණා උපමා වලින් ඔවුන්ට ඉගැන්වූ සේක. උන්වහන්සේ තමන් ඉගැන්වීමේදී ඔවුන්ට කියන සේක්** ''' (මාක් 4:2)

යේසුස්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම හදාරන විට උන්වහන්සේ නිරතුරුවම පුරාණ ගිවිසුමේ ශුද්ධ ලියවිල්ල භාවිත කළ බව ඔබ ඉගෙන ගන්නවා ඇත. දේව වචනයේ සම්පූර්ණ එළිදරව්ව බයිබලිය ඉගැන්වීමේදී අන්තර්ගත විය යුත්තේ එය දේව රාජ්‍යයේ ජීවත් වන්නේ කෙසේදැයි අපට උගන්වන උපදේශනයේ පදනම වන නිසාය.

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව සියළු යහපත් ක්‍රියා වලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත්, හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ** (2 තිමෝති 3:16-17)

## ඇදහිලිවන්තයන් වෙත පැවරුම

එම පණිවුඩය ඉගැන්වීම සහ දේශනා කිරීමට යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට පවරා ඇත. එය දේව රාජ්‍යයේ ශුභාරංචිය වේ. අනුගාමිකයන් වෙත උන්වහන්සේ මෙසේ වදාළ සේක.

> **නුඹලා යමින් - ස්වර්ග රාජ්‍යය ලංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුව කරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරු කරපල්ලා' නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලේ දිපල්ලා'** (මතෙව් 10:7-8)
>
> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක් : නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. මාක්** (16:15)

යේසුස්වහන්ස්ගේ ඉගැන්වීම් වල සෑම විටම නැවත ඇතිකිරීමක් අන්තර්ගත විය. දේව රාජ්‍යයේ කොටස්කරුවන් වන්නන් හට නැවත උපදවීම තුළින් අන්‍යයන්ද රාජ්‍යය වෙත ගෙන ඒමේ වගකීම පැවරී තිබුණි. රාජ්‍ය වර්ධනය වීම ලොව පුරා ප්‍රචලිත විය හැක්කේ මෙසේය. ක්‍රිස්තුස්වහන්සේ වෙතට අලුතෙන් එන්නන් රාජ්‍යයේ ගෝලයන් විය යුතුය. ගෝලයෙක් යනු ගුරුවරයාගෙන් ඉගෙන ගෙන ඔහු ඉගෙන ගන්නා දේ ක්‍රියාවට නගන ශිෂ්‍යයෙකි. ගෝලයන් පසුව අපොස්තුළුවරයක් විය යුතුය. අපොස්තුළුවරයෙක් යනු විශේෂ මෙහෙයක් සඳහා යවන්නෙකු නියෝජනය කරන තැනැත්තාය.

ඔබ යේසුස්වහන්ස්ගේ ශුභාරංචිය නොමිලේ ලබාගත් බැවින් ඔබ එය අන්‍යයන් අතරේ නොමිලේ බෙදා ගත යුතුය. අපොස්තුළු පාවුළු තුමා මෙම රටාව සංක්ෂිප්ත කර ඇත.

**බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාර දෙන්න. (2 තිමෝති 2:2)**

ශුභාරංචිය ප්‍රචලිත කිරීමේ මෙහෙය කැපවීමෙන් කිරීම වැදගත් වන්නේ ඔබගේ කාර්යය සම්පූර්ණ වූ පසු මෙලොව රාජ්‍යයන් කෙළවර වන බැවිනි.

**රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය, එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

## බලය ප්‍රදර්ශනය කිරීම.

දේව රාජ්‍යයේ පණිවුඩය හුදෙක් වාචික පණිවුඩයක් නොවිය යුතුය. එහෙත් එය රාජ්‍යයේ බලය ප්‍රදර්ශනය කිරීම සමග කැටි විය යුතුය.

**ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය, මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක, වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද මඩනාලද්දවුන් නිදහස් කර හරින්ට (ලූක් 4:18)**

යේසුස්වහන්සේ ඉගැන්වූ ලෙස දේව රාජ්‍යය ප්‍රදර්ශනය විය.

**තවද යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරමින්ද සෙනඟ අතරෙහි සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද ගලීලය මුළුල්ලෙහි ඇවිද්ද සේක. (මතෙව් 4:23)**

**එබැවින් මේ ආඥා වලින් ඉතා සුළු එකක් වත් කඩකරන්නාවූ, කඩකරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා සුළු යැයි කියනු ලබන්නේය. නුමුත් ඒවා පවත්නාවූ උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ග රාජ්‍යයෙහි උතුම් යැයි කියනු ලබන්නේය. (මතෙව් 5:19)**

යේසුස්වහන්සේගේ අනුගාමිකයන් දේව රාජ්‍යය පැතිරවීමට යැවීමේදී යේසුස්වහන්සේ ඔවුන්ට ප්‍රකාශ කලේ

**රෝගීන් සුව කරපල්ලා, මළවුන් නැගිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරු කරපල්ලා' නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලේ දීපල්ලා'(මතෙව් 10:8)**

ජීවිත වෙනස් කරන බලය ප්‍රදර්ශනය කිරීම දේව රාජ්‍යයේ පණිවුඩය සමග එක් විය යුතුය. මාතෘකාවේ වැදගත්කම හේතුවෙන් හාවස්ටයිම් ආයතනය “බලයේ මූලධර්ම” නමැති පාඨමාලාව පිරිනමයි. මෙම පාඨමාලාවේදී ඔබ ඉගෙන ගන්නා “ඉගැන්වීමේ ක්‍රමවේද” බලය ප්‍රදර්ශනය සමග ඒකාබද්ධ විය යුත්තේ ඔබ මෙම පාඨමාලා දෙකම හදාරා ඉගෙන ගත් මූලධර්ම අදාල කර ගැනීම වැදගත් බැවිනි.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් ඉගැන්වූ මූලික පණිවුඩය කුමක්ද?

______________________________________________

______________________________________________

3. ශුභාරංචි පණිවුඩයේ මූලික සිද්ධාන්තයන් සංක්ෂිප්ත කරන බයිබලීය පාඨයක් උපුටා දක්වන්න.

______________________________________________

4. මෙම වාක්‍යය සත්‍යයද අසත්‍යයද : යේසුස්වහන්සේ ඉගැන්වූ පණිවුඩයම ඇදහිලිවතුන් ඉගැන්වීම හා දේශනා කිරීම කළ යුතුය.

   මෙම වාක්‍යය ______________________________________________

5. ශුභාරංචිය ඉගැන්වීම සහ දේශනා කිරීම දෙවියන්වහන්සේගේ ______________ ප්‍රදර්ශනය කිරීම සමඟ එක් විය යුතුය.

6. දේව රාජ්‍යය පිළිබඳ උගන්වන මූලික පොත කුමක්ද?

______________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යේසුස්වහන්සේ ඉගැන්වූ ආත්මික රාජ්‍ය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මෙහෙයවන "*රාජ්‍යයේ ජීවත්වීම*" නමැති පාඨමාලාව හදාරන්න.

2. දේව රාජ්‍යයේ ශුභාරංචිය පදනම් වූ මූලික සත්‍යතාවයන් හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය ඉදිරිපත් කරන "*ඇදහිල්ලේ පදනම්*" පාඨමාලාව විස්තර කරන්නේය. මෙම පාඨමාලාව හැදෑරීම වැදගත්ය'

3. ඉගැන්වීමට හා දේශනා කිරීමට බලයේ ප්‍රදර්ශනය ඒකාබද්ධ වන්නේ කෙසේදැයි තව දුරටත් ඉගෙන ගැනීමට හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*බලයේ මූලධර්ම*" පාඨමාලාව හදාරන්න.

# හතරවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක් : පණිවුඩය
## 11 වන කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට .

- යේසුස්වහන්සේ ඉගැන්වූ පණිවුඩය නොකඩවා හැදෑරීම
- අන්‍යයන් සමග යේසුස්වහන්සේගේ ඉගැන්වීම බෙදා ගැනිමට මෙම පාඩම යොදා ගැනිම කල හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

**අප විසින් උන්වහන්සේගෙන් අසා තිබෙන්නාවූ, නුඹලාට දන්වන්නාවූ පණිවිඩය නම්, දෙවියන්වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්‍ය. (1 යොහන් 1:5)**

## හැඳින්වීම

යේසුස්වහන්සේගේ පොදු පණිවිඩය වූයේ රාජ්‍යයේ ශුභාරංචියයි. නමුත් උන්වහන්සේගේ ඉගැන්වීම් වල විශේෂිත විස්තර මොනවාද?

## යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අධ්‍යයනය කරන්නේ කෙසේද@

1. මතෙව්" මාර්ක්, ලුක්, යොහාන් හා ක්‍රියා 1 කියවා යේසුස්වහන්සේගේ වචන සියල්ලම රතු පාටින් ලකුණු කරන්න'

2. නව ගිවිසුමේ ක්‍රියා සහ යැවුම් පත්‍ර (රෝම සිට යුද් දක්වා) අධ්‍යයනය කරන්න. යේසුස්වහන්සේ ඉගැන්වීම සඳහා ඔවුන්ට දුන්නාවූ නියෝගය සම්පූර්ණ කිරීමේදි මෙම ඇදහිලිවතුන් ඉගැන්වූ ආකාරය නිරීක්ෂණය කරන්න.

3. යේසුස්වහන්සේගේ ඉගැන්වීම්, අධ්‍යයනය කිරීමට සහ ඉගැන්වීමට පහත සැකිල්ල භාවිත කරන්න.

## යේසුස්වහන්සේගේ ඉගැන්වූ දේ ඉගැන්වීම

මෙම සැකිල්ල යේසුස්වහන්සේගේ මෙලොව සේවයේදී ඉගැන්වූ සියලුම මාතෘකා වලට පාඨයන් ලැයිස්තුවක් දී ඇත. පොදු විෂයන් කරුණු වලට සාපේක්ෂව ඉගැන්වීම් කාණ්ඩ කර ඇත.

යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වාර්තා කර ඇති ප්‍රධාන පොත් සතරක් බයිබලයෙහි ඇත්තේය. මේවා මතෙව්, මාර්ක්, ලූක් හා යොහන් යන පොත් වේ. යේසුස්වහන්සේගේ සමහර ඉගැන්වීම් මේ පොත් සතරෙහිම යළි යළිත් සඳහන් වේ. මෙම පරිච්ඡේදයේදී ඇති බයිබල් පාඨයන් සපයා දී ඇත්තේ සමාන සිදුවීම් එකට ගලපන පිණිසය.

යේසුස්වහන්සේ ඉගැන්වූ වැදගත් සත්‍යයන් ඉගැන්වීමට කටු සටහන ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. ලෝකයේ ජාතීන් සමඟ උන්වහන්සේගේ ශුභාරංචියේ පණිවුඩය බෙදා ගැනීම පිණිස එය ඔබ සන්නද්ධ කරනු ඇත.

සටහන : මෙම පරිච්ඡේදයේ බයිබල් පාඨවල සැකැස්ම නිසා, "ස්වයං පරීක්ෂණයක්" හෝ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසක් නැත්තේය.

# දේවත්වය

## පියාණන් වන දෙවියන්වහන්සේ :

මතෙව් 11:27; 19:17, 26; 22:32; 23:9
මාර්ක් 12:26-27, 29; 10:18, 27
ලූක් 10:22; 18:19, 27; 20:37-38
යොහන් 4:24; 5:17, 37; 6:46; 10:29; 14:28, 31; 15:8

## පුත්‍රයාණන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ :

### දිව්‍ය ස්වභාවය :

මතෙව් 9:5-6; 10:32-33; 11:4-6, 27; 12:6, 41-42; 16:13, 15, 17, 27; 21:42; 22:42-45; 23:10; 26:53, 64; 27:11; 28:18

මාර්ක් 2:9-11, 28; 8:27, 29; 12:10-11, 35-37; 14:62; 15:2

ලූක් 5:23-24; 6:5; 7:22-23; 9:18, 20; 10:22; 11:20, 31-32; 19:40; 20:17-18, 41-44; 22:69-70; 23:3

යොහන් 1:51; 3:13; 4:10, 26, 32; 5:17, 19-23, 26-27, 30-32, 34, 36-37, 39, 41; 6:27, 29, 35, 46, 51, 62; 7:17-18; 8:14, 16-19, 23, 25, 29, 42, 50, 54-56, 58, 9:35, 37; 10:25, 30, 34-38; 12:30, 44-45; 13:31-32; 14:1, 6, 7, 9-11, 20; 15:23; 16:15, 27-28; 17:1-3, 5, 8, 10-11, 21-24, 28-29; 18:36-37; 19:11

### මනුෂ්‍ය ස්වභාවය :

මතෙව් 3:15; 8:20; 11:19; 26:10-13, 38-39, 42, 45; 27:46
මාර්ක් 14:7-9, 26, 34, 36, 41; 15:34
ලූක් 7:34; 9:58; 22:28, 42; 24:39, 41
යොහන් 4:7; 12:7-8; 19:26, 28; 20:27; 21:5, 12

### උන්වහන්සේගේ දූත මෙහෙය :

මතෙව් 4:4; 5:17; 9:12-13; 10:34-36; 11:15; 15:26; 18:11-13; 21:33-40

මාර්ක් 1-38; 2:17; 4:21-22; 7:16, 27; 12:1-9

ලූක් 2:49; 4:18-19, 21, 23-27, 43; 5:31-32; 8:16, 17; 11:30, 33; 12:2-3, 14, 49, 51-53; 13:32-33; 19:10; 20:9-16

යොහන් 3:19-21; 4:13, 14, 34; 5:25, 28-30; 6:38-40, 50, 55, 56, 58; 7:7, 16; 8:12, 26, 9:3-5, 39; 10:1-5, 7, 9-18, 27-29; 11:4, 9, 10; 12:26, 27, 47-50; 13:20; 18:15, 16, 37

## උන්වහන්සේගේ සේවය :

මතෙව් 9:15, 37, 38; 12:25-30, 20:28
මාර්ක් 2:19; 3:23-27; 10:45
ලූක් 5:34; 11:17-23
යොහන් 2:4; 3:11; 4:35-38; 12:35. 36

## උන්වහන්සේගේ තනතුර :

මතෙව් 10:29-30; 11:28-31
ලූක් 4:18, 19; 8:52
යොහන් 6:37; 7:37; 10:9; 11:25, 26; 12:32; 14:1, 2, 6, 13, 14, 16, 27; 15:1, 2, 4-6, 9-11, 15-16, 18, 19; 16:1, 4, 23, 24, 33

## ශුද්ධාත්මයාණන්වහන්සේ :

මතෙව් 10:19, 20, 12:31, 32, 28:19
මාර්ක් 3:28, 29
ලූක් 12:10-12
යොහන් 3:8; 6:63; 16:7-11, 13, 14; 20:22
ක්‍රියා 1:8

## දේව රාජ්‍යය සහ ස්වර්ගරාජ්‍යය

මතෙව් 4:17; 5:20; 6:33; 7:21; 8:11; 10:7; 11:11-13; 13:3-8, 11, 18-33. 37-50, 52; 16:28; 22:2-14; 25:14-30; 26:29
මාර්ක් 4:3-8, 11-20, 26-29; 9:1; 14:25
ලූක් 8:5-15; 9:27; 10:11; 11:20; 12:31; 13:18-21, 29, 30; 17:20, 21; 19:12-27; 21:31; 22:18

## සභාව

මතෙව් 5:13-15; 12:48-50; 16:18, 19; 18:17-20; 21:13; 23:16-21; 24:22, 31
මාර්ක් 3:33-35; 11:17; 12:10; 13:20, 27
ලූක් 8:21; 11:23; 12:32; 19:26
යොහන් 2:16; 4:23, 24; 13:35; 17:20, 21; 20:23

## ව්‍යවස්ථාව, ශුද්ධ ලියවිලි, අනාගතවක්තෘවරු

මතෙව්. 5:17, 18; 7:12; 8:4; 11:13; 21:42; 26:54
මාර්ක් 1:44; 12:10, 11; 14:21, 29
ලූක් 5:14; 10:26, 28; 16:16, 17, 29-31; 17:14; 18:31; 21:22; 22:22, 37; 24:25, 26, 44, 46,
යොහන් 5:39, 45-47; 7:12, 19; 8:17, 18; 10:34-36; 15:25

## දේව වචනය

මතෙව් 4:4, 7:24-27, 10:27, 11:15, 13:3-9, 19-23, 28:19, 20
මාර්ක් 4:3-9, 14-20, 23, 24, 13:31
ලූක් 4:4, 18, 19, 43, 6:46-49, 8:5-8, 10-15, 18, 10:24
යොහන් 3:11; 5:24, 25, 28, 46, 47; 6:63; 7:17, 18; 8:14, 31, 32, 38, 45-57; 10:27; 12:47-50; 14:10, 21, 23-25; 15:7, 10, 12, 14, 15, 17, 20, 22; 16:12, 13, 25, 33; 17:6-8, 13, 14, 19, 20, 25, 26; 18:20, 37

# පැරණි සහ නව දේව නියෝග

“පැරණි දේව නියෝග” යන්න පරණ ගිවිසුමෙහි වාර්තාකර ඇති කාලය තුළ මිනිස් සංහතිය සමඟ දෙවියන්වහන්සේ ගනුදෙනු කළ ආකාරය වෙත යොමු කරයි' ව්‍යවස්ථාව මගින් පාලනය කිරීම හා ලෙවි කථාවෙහි සඳහන් වන පාපය සඳහා වන විවිධ පූජාවන් එයට ඇතුළත් වේ.

“නව දේව නියෝග” යන්න යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ භූමික සේවා කාලයේ දෙවියන්වහන්සේ මිනිසුන් සමඟ ක්‍රියාකළ ආකාරය වෙත යොමු කරයි. එය පාපය වෙනුවෙන් සදහටම එක්වරක් යේසුස්වහන්සේ කුරුසිය මත පූජාවූ කරුණාවේ කාලය ලෙසද හඳුන්වයි.

## අනාගතවක්තෘවරයා නව දේව නියෝග නිවේදනය කිරීම :

නව දේව නියෝග මනුෂ්‍යයන්ට නිවේදනය කිරීම සඳහා යොහන් බෞතිස්ත නම් මනුෂ්‍යයෙකු අනාගතවක්තෘවරයෙකු ලෙස දෙවියන්වහන්සේ විසින් එවනු ලැබිණි. පසුව එන පේදවල යේසුස්වහන්සේ ඔහු පිළිබඳ කථා කළ සේක.

මතෙව් 7:11; 11:7-11, 14, 18; 21:25
මාර්ක් 9:13; 11:30
ලූක් 7:24-28, 33; 20:4
යොහන් 5:33, 35

## දේව නියෝග පිළිබඳ ඉගැන්වීම් :

පැරණි හා නව දේව නියෝග පිළිබඳ යේසුස්වහන්සේ විසින් කරන ලද ඉගැන්වීම් පහත දැක්වෙන බයිබල් පේදවල සඳහන් වේ.

මතෙව් 5:17; 11:27; 26:27, 28
මාර්ක් 14:24
ලූක් 10:22; 16:16; 22:20
යොහන් 4:23; 5:25; 6:32, 33, 49, 58,
1 කොරින්ති 11:25

## ගෝලයෝ

යේසුස්වහන්සේ ස්වකීය භූමික සේවයේහි තම ගෝලයන් වන පිණිස පුරුෂයන් දොළොස් දෙනෙකු තෝරා ගත් සේක.

## පොදු ඉගැන්වීම් :

පහත දැක්වෙන ඉගැන්වීම් කණ්ඩායම් ලෙස ගෝලයන් හට දෙනු ලැබිණි.

මතෙව් 13:11, 16, 17, 51, 16:8-11, 17:7, 18:18, 21:2, 3, 23:10, 24:9, 26:38, 40, 45
මාර්ක් 4:11, 12, 35, 6:31, 8:17-20, 11:2, 3, 13:9, 11, 13, 14:27, 32, 34, 41, 16:15
ලූක් 8:10, 22, 10:23-24, 19:30, 31, 21:14-19, 22:28-30, 35, 36, 38, 24:49
යොහන් 6:61, 67, 70, 12:30, 14:25, 31, 15:12, 16-20, 27, 16:2, 3, 27, 32, 20:21-23

## විශේෂ ඉගැන්වීම් :

පහත දැක්වෙන ඉගැන්වීම් විශේෂ ගෝලයන් වෙත යොමු කරන ලදී

## පේදුරු හා අන්ද්‍රෑ :

මතෙව් 4:19
මාර්ක් 1:17

**මතෙව් :**

මතෙව් 9:9
මාර්ක් 2:14

**පේදුරු :**

මතෙව් 16:17-19, 23, 17:25-27; 26:34
මාර්ක් 8:33; 14:30, 37
ලූක් 5:4, 10; 22:31, 32, 34, 51
යොහන් 1:42; 13:7, 8, 10, 36. 38; 18:11; 21:15-19, 22

**තෝමස් :**

යොහන් 20:27,29

**පිලිප් :**

යොහන් 14:9

**යුදස් ඉස්කාරියොත් :**

යොහන් 13:27

## ගෝලයන් පිටත් කර හැරීම

රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරන පිණිස තම ගෝලයන් පිටත් කර හරින කල යේසුස්වහන්සේ විශේෂ වචන ප්‍රකාශ කළ සේක.

**ගෝලයන් දෙළොස්දෙනාට පැවසූ වචන :**

මතෙව් 10:5-42
මාර්ක් 6:10, 11
ලූක් 9:3-5

**සැත්තෑදෙනා හට පැවසූ වචන :**

ලූක් 10:3-12, 16, 19, 20

## යේසුස්වහන්සේගේ යාච්ඤාවන්

**මේ සඳහන් කිරීම් යේසුස්වහන්සේගේ යාච්ඤාවන් පිළිබඳ වාර්තාවන්ය. යාච්ඤාව පිළිබඳව යේසුස් වහන්සේ ඉගැන්වූ දෙය අධ්‍යයනය කරනවාට අමතරව උන්වහන්සේ ඉගැන්වූ දෙය ප්‍රායෝගිකව ස්වකීය ජීවිතයට අදාළ කරගත් ආකාරය සොයා බැලීම වැදගත් වන්නේය.**

මතෙව් 6:9-13; 11:25, 26; 26:36, 39, 42
මාර්ක් 14:36
ලූක් 10:21; 11:2-4; 22:42
යොහන් 11:41, 42; 17:1-26

# යේසුස්වහන්සේගේ ජිවිතයේ සිදුවීම්

යේසුස්වහන්සේ ස්වකීය ජිවිතයේ සිදුවීමට ඇති විශේෂ සිද්ධීන් පිළිබඳව ඉගැන්වූ අතර දෙවියන් වහන්සේගේ සත්‍යතාවයන් බෙදා ගැනීමට විශේෂ අවස්ථාවන් භාවිත කළ සේක. මේවා පහත සඳහන් දෑ ඇතුලත්ය.

## දුක් විඳීම සහ පරීක්ෂාව :

මතෙව් 17:12; 13:57; 26:38
මාර්ක් 6:4; 9:12; 14:34
ලූක් 4:24; 9:22; 17:25; 22:28; 24:46

## අන්තිම රාත්‍රි භෝජනය :

මතෙව් 26:18, 26-29
මාර්ක් 4:13-15, 22, 24, 25
ලූක් 22:8, 10-12, 15-20
1 කොරින්ති 11:24, 25

## පාවාදීම :

මතෙව් 17:22; 26:2, 21, 23-25, 46, 50, 55
මාර්ක් 14:18, 20, 21, 42, 48, 49
ලූක් 22:21, 22, 48, 52, 53
යොහන් 13:18, 19, 26, 18:4, 5, 7, 8, 23

## කුරුසිපත්වීම :

ලූක් 9:44, 22:37
යොහන් 3:14, 8:28, 12:31, 32

## කුරුසියේ වචන :

මතෙව් 27:46
මාර්ක් 15:34
ලූක් 23:34, 43, 46
යොහන් 19:26, 27, 28, 30

## මරණය, මළවුන්ගෙන් නැගිටීම සහ ස්වර්ගාරෝහනය :

මතෙව් 12:40; 17:19, 22, 23; 20:18, 19; 26:12, 31. 32
මාර්ක් 9:31; 10:33-34; 14:8, 27, 28
ලූක් 5:35; 9:22; 12:50; 18:31-33
යොහන් 2:19; 3:13; 6:62; 7:33, 34; 8:21; 10:17, 18; 12:7, 23, 24; 13:33; 14:19, 29; 16:5-7, 16, 19-22, 25, 26, 32; 20:17

## මළවුන්ගෙන් නැගිටි පසු ප්‍රකාශ කල වචන :

මතෙව් 28:9, 10, 18-20
මාර්ක් 16:15-18
ලූක් 24:17, 19, 25, 26, 36, 38, 39, 41, 44, 46-49
යොහන් 20:15-17, 19, 21-23, 26, 27; 21:5-6, 10, 12, 19, 22
ක්‍රියා 1:4, 5, 7, 8

## අනාවැකි

යේසුස්වහන්සේ අනාගත වාක්‍ය පිළිබඳව බොහෝ සේ ඉගැන්වූ සේක. අනාවැකියක් යනු තවමත් සිදුනොවූ දෙයක් පිළිබඳ එළිදරව්වීමකි. එය අනාගතය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේ කෙරෙන් එන පණිවිඩයකි. යේසුස්වහන්සේ ඉගැන්වූ අනාවැකි සම්බන්ධ විෂයයන් නම්

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම :

මතෙව් 24:6-47; 25:1-13; 26:64
මාර්ක් 2:20; 8:38; 13:7-36; 4:62

### යෙරුසලම :

මතෙව් 5:34,35, 23:37-39, 24:2
මාර්ක් 13:2
ලූක් 13:34, 35, 19:42-44, 21:20-24, 23:28-31
යොහන් 4:21

### යුදෙව්වෝ :

මතෙව් 8:11, 12; 10:6; 11:16-19; 15:24, 26; 21:31, 32; 22:2-7
මාර්ක් 7:27
ලූක් 7:31-35; 21:24; 22:67, 68
යොහන් 4:22; 7:19, 21; 8:37-47, 49; 9:41; 10:26, 32; 18:20, 36

### ලියන්නෝ, පරිසිවරු සහ සද්දුසිවරු :

මතෙව් 12:34; 15:7-9, 14; 16:6; 23:2-7, 13-15, 25-27, 29-36
මාර්ක් 7:6; 8:15; 12:38-40
ලූක් 11:39, 40-44, 46-52; 12:1, 20:46, 47
යොහන් 5:42

### අන්‍යජාතිකයෝ :

මතෙව් 8:11; 21:43; 22:8-10; 24:14; 28:19
මාර්ක් 13:10; 16:15
ලූක් 13:29; 24:46, 47
යොහන් 10:16

### බොරු දිව්‍යැසිවරු සහ බොරු ගුරුවරු :

මතෙව් 7:15-18, 20; 24:4, 5, 11, 23, 24, 26
මාර්ක් 13:5, 6, 21, 22
ලූක් 6:39, 43, 44; 17:1, 2, 22, 23; 21:8
යොහන් 10:1, 8

## පාපය

පාපය පිළිබඳ පැහැදිලි විස්තර කිරීමක් වන්නේ අපරාධය හෝ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව කැඩීමය, යේසුස්වහන්සේ පාපය සම්න්ධයෙන් ඉගැන්වූ සේක.

**සාතන් සහ පාපය :**

මතෙව් 4:10; 12:26, 27; 13:19; 16:23; 25:41
මාර්ක් 3:23, 26; 4:15; 8:33
ලූක් 4:8; 10:18; 11:18, 19; 22:31
යොහන් 8:34-36; 14:30

**දේව අපහාසය :**

මතෙව් 12:31, 32; 15:19
මාර්ක් 3:28, 29; 7:21, 22
ලූක් 12:10

**ඇදහිල්ල නොමැතිකම :**

මතෙව් 14:31; 17:17, 20
මාර්ක් 2:8; 9:19; 16:16
ලූක් 9:41
යොහන් 3:11, 12, 18; 4:48; 5:38, 40, 43-47; 6:64; 8:24, 45-47; 12:47, 48; 15:22, 24

**කෛරාටිකකම :**

මතෙව් 6:2, 16; 15:7, 8; 23:13-15, 25, 27-29
මාර්ක් 7:6; 12:40
ලූක් 11:44; 12:1; 20:47

**උඩඟුකම :**

මතෙව් 23:5-7, 12
මාර්ක් 7:21, 22; 12:38, 39
ලූක් 11:43; 14:11; 20:46

**කෝපය :**

මතෙව් 5:22

**මිනීමැරීම :**

මතෙව් 5:21, 15:19, 19:17, 18
මාර්ක් 7:21, 10:19
ලූක් 18:20
යොහන් 8:44

**කාමමිථ්‍යාචාරය. වේශ්‍යාකම, සල්ලාලකම :**

මතෙව් 5:27, 28, 32; 15:19; 19:9, 11, 12, 17, 18
මාර්ක් 7:21, 22; 10:11, 12, 19
ලූක් 16:18; 18:20

**දික්කසාදය :**

මතෙව් 5:31, 32; 19:8, 9
මාර්ක් 10:3, 5, 11, 12
ලූක් 16:18

**සොරකම් කිරීම :**

මතෙව් 15:19; 19:17, 18
මාර්ක් 7:21, 22; 10:19
ලූක් 18:20

**බොරු, සාක්ෂිකීම, වංචාව, මුලාකිරීම :**

මතෙව් 15:19; 19:17, 18
මාර්ක් 7:21, 22; 10:19
ලූක් 18:20
යොහන් 8:44

**නපුරු සිතුවිලි, නපුරු ඇස, දුෂ්ඨකම, අඥානකම :**

මතෙව් 6:23, 9:4, 15:19, 20:15
මාර්ක් 7:21, 22
ලූක් 11:34

**තෘෂ්ණාව :**

මාර්ක් 7:21, 22
ලූක් 12:15-21

**ද්‍රව්‍යවාදය සහ ලෞකිකත්වය :**

මතෙව් 6:19-21, 24, 12:39, 13:3, 22, 16:4, 24:38, 39
මාර්ක් 4:3, 7, 18, 19, 8-12
ලූක් 8:14, 9:60, 10:41, 42, 11:29, 14:16-24, 16:1-9, 13, 15, 17-26-29, 21:34
යොහන් 4:48, 6:27

**කල් දැමීම :**

කල් දැමීම යනු යමක් ඉටුකිරීම නොකඩවා ප්‍රමාද කිරීමය.

මතෙව් 24:45-51
ලූක් 12:42-47, 13:25-28, 14:16-20

**විනිශ්චය කිරීම :**

මතෙව් 7:1-5, 12:7
මාර්ක් 4:24
ලූක් 6:37, 41, 42
යොහන් 8:7, 10, 11, 15

**හදවතේ අන්ධභාවය :**

මතෙව් 13:13-15, 15:14, 16:2, 3
මාර්ක් 4:12, 8:18, 21
ලූක් 8:10, 12:54-56

**පසුබටවීම :**

පසුබටවීම යනු යේසුස්වහන්සේ අනුගමනය කිරීමෙන් ඉවතට හැරීම අදහස් කෙරේ'

මතෙව් 12:43-45
ලූක් 11:24-26

**ශුද්ධ දේ කෙළසීම :**

ශුද්ධ දේ කෙළසීම යනු ශුද්ධ දේ දූෂණය කිරීමයි. මතෙව් 7:6

**ප්‍රසිද්ධ තරවටු කිරීම් :**

මතෙව් 10:14, 15; 11:22, 23; 12:34, 41, 42; 13:13-15; 16:4; 18:7; 21:19; 23:13-15, 25, 27, 29, 33-36
මාර්ක් 6:11; 8:12; 11:14
ලූක් 6:24-26; 9:5; 10:10-15; 11:29, 32, 42, 44, 46, 47, 49-52

## ධර්මිෂ්ඨකම

යම් කෙනෙකු දෙවියන්වහන්සේ සමග අන්‍යයන් හා තමා සමඟ නිවැරදි සම්බන්ධතාවයක් ඇතිව ජීවත් වන්නේ කෙසේදැයි යන්න ඉගැන්වීමට යේසුස්වහන්සේ ස්වකීය භූමික සේවයේ වැඩි කාලයක් කැප කළ සේක.

**ධර්මිෂ්ඨකම සඳහා කැඳවීම :**

මතෙව් 4:19, 8:22, 9:9, 14:29
මාර්ක් 1:17, 2:14, 4:24, 10:21, 19:21
ලූක් 5:27, 9:59, 60, 18:22
යොහන් 1:38, 39, 43, 12:26, 21:19

**ඇදහිල්ල :**

මතෙව් 8:10, 13, 26, 9:22, 28, 29, 14:27, 15:18, 17:20, 21:22
මාර්ක් 4:40, 5:34, 36, 6:50, 7:29, 9:23, 10:52, 11:22-24, 16:16-18
ලූක් 7:9, 50, 8:25, 48, 50, 17:6, 19, 18:8, 42
යොහන් 3:18, 6, 20, 29, 7:38, 9:35, 11:15, 25, 26, 40, 42, 14:1, 12, 16:31, 20:27, 29

**ඇදහිල්ල තුළින් ගැළවීම :**

මාර්ක් 16:16
යොහන් 3:14-16. 18, 5:24, 6:40, 47, 11:25, 26

**පසුතැවිලිවීම :**

මතෙව් 4:17, 21:28-32
මාර්ක් 1:15
ලූක් 13:2-5, 15:4-32

**බෞතිස්මය :**

මතෙව් 21:25, 28:19
මාර්ක් 11:30, 16:16
ලූක් 20:4

යොහන් 3:5
ක්‍රියා 1:5

**නැවත ඉපදීම :**

මතෙව් 9:16, 17
මාර්ක් 2:21, 22
ලූක් 5:36-39
යොහන් 3:3, 5-8, 10

**ක්‍රියාවන් :**

මතෙව් 5:16, 7:16-27, 12:33, 13:3, 4, 8, 23, 21:19
මාර්ක් 3:33-35, 4:3, 4, 8, 20, 11:14
ලූක් 6:43, 44, 46-49, 10:30-37, 13:6-9
යොහන් 7:17, 10:37, 38, 15:8, 16

**රන් අණ :**

මතෙව් 7:12, 22:37-40
මාර්ක් 12:29-31
ලූක් 6:31

**ප්‍රේමය :**

මතෙව් 5:43-47, 7:12
ලූක් 6:27, 28, 32-35
යොහන් 13:34, 35, 14:23, 24, 15:12, 13. 17

**අන් අයට දීම:**

මතෙව් 5:42, 6:1-4, 19:21
මාර්ක් 10:21, 12:43, 44
ලූක් 6:30, 38, 11:41, 12:33, 34, 14:12-14, 16:9, 18:22, 21:3, 4

**සමාව දීම සහ සමගිවීම :**

මතෙව් 5:23-26, 6:14, 15, 9:2, 5, 6, 16:18, 19, 18:18, 22-35
මාර්ක් 2:5, 9-11, 11:25, 26
ලූක් 5:20, 23, 24, 6:37, 7:40-48, 12:58, 59, 17:3, 4, 23:34, 24:46, 47
යොහන් 20:23

**දයාව :**

මතෙව් 5:7, 9:13, 18:15-17, 27, 33
ලූක් 6:36

**තමකමට නැසීම :**

මතෙව් 10:37-39, 16:24-26
මාර්ක් 8:34-37
ලූක් 9:23-25, 14:26, 27-33, 17:33
යොහන් 12:25

**ශුද්ධකම සහ එක අරමුණකින් යුත් හදවතක් :**

මතෙව් 5:8, 27, 28, 6:22-24, 9:4, 12:34, 35, 15:10, 11, 16-20
මාර්ක් 7:18-23, 10:15
ලූක් 4:12, 6:45, 11:34-36, 41, 16:13, 18:17

**ශුද්ධකම සහ කථාව :**

මතෙව් 5:33-37, 12:36, 37, 23:20-22

**මාංශය මැඩපැවැත්වීම :**

මතෙව් 5:29, 30, 6:16-18, 17:21, 18:8, 9
මාර්ක් 9:29, 43-49

**කීකරුකම සහ යටහත්කම :**

මතෙව් 26:39, 42, 28:19, 20
මාර්ක් 14:36
ලූක් 22:42
යොහන් 7:17, 18, 8:29, 50, 14:15, 21, 15:14, 18:11

**ආධිපත්‍යයට යටත්වීම :**

මතෙව් 17:25-27, 22:19-21
මාර්ක් 12:15-17
ලූක් 20:24, 25

**විශ්වාසවන්තකම සහ පරීක්ෂාවෙන් සිටීම :**

මතෙව් 24:42-47, 25:13, 26:41
මාර්ක් 13:33-37, 14:38
ලූක් 12:35-40, 42-44, 47, 48, 16:10-12, 21:36, 22:40, 46

**ස්ථිරත්වය සහ නොපසුබට උත්සාහය :**

මතෙව් 5:13, 10:22, 13:3-9, 18-23, 24:13
මාර්ක් 4:3-9, 13-20, 9:50, 13:13
ලූක් 9:62, 14:34, 35
යොහන් 8:31, 32

**ඉවසීම :**

ලූක් 21:19
ක්‍රියා 1:7

**ධෛර්යය :**

මතෙව් 8:26, 14:27, 17:7
මාර්ක් 4:40, 5:36, 6:50
ලූක් 8:50
යොහන් 6:20

**විරුද්ධ නොවීම :**

මතෙව් 5:38-41, 43-45, 26:52

**යටහත් පහත්කම සහ සරලභාවය :**

මතෙව් 5:3, 5, 11:25, 26, 18:3, 4, 20:25-27, 23:8, 11, 12
මාර්ක් 9:33, 35, 10:15, 42-44
ලූක් 9:48, 14:8-11, 18:14, 17, 22:25-27
යොහන් 13:7, 8, 10, 12-17

**දෙවියන්වහන්සේගේ සැපයීම කෙරෙහි විශ්වාස කිරීම :**

මතෙව් 6:25-34
ලූක් 12:6, 7, 22, 24-32

**කෙළෙහිගුණ සැළකීම :**

මතෙව් 8:4
මාර්ක් 1:44, 5:19
ලූක් 5:14, 7:40-48, 50, 8:39, 17:17, 18

**අන්‍යයන් ගැන ඉවසීම :**

මාර්ක් 9:39-41
ලූක් 9:50

**යුතුකම :**

ලූක් 17:7-10

**ස¾ව සම්පූර්ණත්වය :**

මතෙව් 5:48, 7:13, 14, 19:21
මාර්ක් 10:21
ලූක් 6:40, 12:57, 13:24, 18:22

**ආශීර්වාද වාක්‍ය :**

මතෙව් 5:3-12, 11:6, 13:16
ලූක් 6:20-23, 7:23, 10:23, 11:28

## විශේෂ ඉගැන්වීම්

යේසුස්වහන්සේ ඉගැන්වූ අනෙකුත් වැදගත් විෂයයන් “විශේෂ ඉගැන්වීම්” යන මේ මාතෘකාව යටතේ කාණ්ඩ කොට ඇත්තේය.

**පාපයට වන්දි ගෙවා නිදහස් කිරීම :**

මතෙව් 17:12, 20:18, 19, 28, 26:24, 31, 39, 42

මාර්ක් 9:12, 10:33, 34, 45, 14:21, 24, 36

ලූක් 9:22, 56, 13:34, 35. 18:31-33, 19:10, 21:28, 22:19, 22, 37, 42, 24:26, 44, 46, 47

යොහන් 3:13-16, 18, 5:39, 6:38-40, 51, 8:24, 28, 56, 10:7, 9-11, 15-18, 36, 11:25, 26, 12:24, 27, 32, 47, 13:7, 8, 14:19, 15:13, 16:7, 20, 22. 33, 17:1-4, 19-21, 23 18:11, 19:30

1 කොරින්ති 11:24, 25

### වන්දි ගෙවා නිදහස් කිරීම යටතේ සියලු දෙනාටම ඇති සමාන බව :

මතෙව් 20:1-15

### යාච්ඤාව :

මතෙව් 6:5-13, 7:7-11, 18:19, 20, 21:22, 26:41
මාර්ක් 11:24, 14:38
ලූක් 11:2-13, 18:2-8, 10-14, 22:40, 46
යොහන් 4:24, 14:13, 14, 15:7, 16:23, 24

### නියෝග සහ ආත්මය :

මතෙව් 15:3-8, 10, 11, 16-20, 23:16-26, 28
මාර්ක් 7:6-8, 14, 15, 18-23
ලූක් 11:39, 40, 42, 44
යොහන් 6:63, 7:24

### පෙර තෝරාගැනීම :

මතෙව් 15:13, 20:23, 22:14, 24:22, 31
මාර්ක් 10:40, 13:20, 27
ලූක් 18:7
යොහන් 6:37, 43-45, 64, 65, 15:16

### ඇදහිල්ල ප්‍රකාශ කිරීම :

මතෙව් 10:32, 33
මාර්ක් 5:19, 8:38
ලූක් 8:39, 9:26, 12:8, 9

### පෞද්ගලික ගණන් දීම :

මතෙව් 13:12, 22:11-13
මාර්ක් 4:23-25
ලූක් 8:18, 12:47, 48
යොහන් 9:41

### වෙහෙස වී වැඩකිරීම සහ ස්වයං සංවර්ධනය :

මතෙව් 20:6, 25:14-30
ලූක් 19:12-26

### සබත් දිනය :

මතෙව් 12:3-5, 8, 11, 12

මාර්ක් 2:25-28, 3:4
ලූක් 6:3-5, 9, 13:15, 16, 14:3, 5

**විවාහය :**

මතෙව් 19:4-6, 22:30
මාර්ක් 10:6-9, 12:25
ලූක් 20:34, 35

**දරුවන් :**

මතෙව් 18:3-6, 10, 14, 19:14, 21:16
මාර්ක් 9:37, 42, 10:14, 15
ලූක් 9:48, 18:16, 17

**දිළින්දන් :**

මතෙව් 11:5, 19:21, 26:11
මාර්ක් 10:21, 14:7
ලූක් 4:18, 21, 6:20, 14:13, 14, 18:22
යොහන් 12:8

**ධනවතුන් :**

මතෙව් 19:23, 24
මාර්ක් 10:23-25
ලූක් 14:12, 16:19-31, 18:24, 25

**කණගාටුව :**

මතෙව් 5:4, 10:38, 11:28, 16:24, 23:38, 39, 24:7, 8, 26:38, 39, 42
මාර්ක් 4:16, 17, 8:34, 13:19, 14:34, 36
ලූක් 6:21, 9:23, 14:27, 21:22-26, 22:42, 23:28-30, 24:38
යොහන් 12:27, 14:1, 27, 16:5, 6, 20-22, 18:11

**සාමය සහ නිදහස :**

මතෙව් 9:22, 10:13, 11:28-30, 26:45
මාර්ක් 4:39, 5:34, 6:31, 9:50, 14:41
ලූක් 7:50, 8:48, 10:5, 6, 41, 42, 12:29, 19:42 24:36
යොහන් 14:1, 23, 27, 16:33, 20:19, 21, 26

**ප්‍රීතිය :**

මතෙව් 5:11. 6:17, 9:2, 13:44, 14:27, 18:12, 13, 25:21, 23
මාර්ක් 6:50
ලූක් 6:21-23, 10:20, 11:36, 15:4-10, 32
යොහන් 4:36, 8:56, 13:17, 15:11, 16:20-22, 24, 17:13

**ප්‍රඥාව :**

මතෙව් 7:24, 10:16, 11:15, 25, 13:51, 15:16, 16:2, 3, 21:16, 24:45-47
මාර්ක් 4:12, 7:14, 16, 8:17, 18, 21
ලූක් 6:47, 48, 8:10, 10:21, 12:42-44, 54-56, 16:1-8

යොහන් 8:12, 9:41, 12:46

**මරණය සහ පාරාදීසය :**

මතෙව් 8:22, 9:24, 10:8, 28, 16:38, 17:9, 23, 22::32
මාර්ක් 5:39, 9:1, 31, 10:34, 12:25-27, 14:34
ලූක් 7:22, 9:27, 60, 12:4, 5, 20, 16:31, 18:33, 20:35-38, 23:43, 24:46
යොහන් 5:21, 25, 28, 29, 6:39, 40, 49, 58, 10:17, 18, 11:4, 14, 12:24, 15:13

## තනිපුද්ගලයන්ට විශේෂ වචන

අවසාන ඉගැන්වීම් කාණ්ඩය වන්නේ යේසුස්වහන්සේ ස්වකීය භූමික සේවයේදී තනි පුද්ගලයන්ට කථාකළ වචනයන්ය.

එය පහත පද වල ඇතුළත් වේ:

**නතානියෙල් :**

යොහන් 1:47. 48. 50

**සමාරීය ස්ත්‍රිය** :

යොහන් 4:7 . 16-18

**අයබදු එකතු කරන්නාවූ සාකෙවුස් :**

ලූක් 19:5.9

**යෙරිකෝවේ අන්ධ මිනිසා :**

මතෙව් - 20:32

**ප්‍රශ්න නැගූ ලියන්නන් :**

මාර්ක් 9:16

**සෙබදීගේ පුත්‍රයන් :**

මතෙව් 20:21-23
මාර්ක් 10:36. 38-40

**යේසුස්වහන්සේගේ සහෝදරයන් :**

යොහන් 7:6-8

**ප්‍රශ්න නැගූ ලියන්නා** :

මාර්ක් 12:34

**මාර්තා :**

ලූක් 10:41-42

**නායක පූජකයා සහ වැඩිමහල්ලන් :**

මතෙව් 21:24, 25, 27
මාර්ක් 11:29.30.33
ලූක් 20:3.4.8

**හෙරෝදිවරුන් සමග පරිසිවරුන්ගේ ගෝලයන් :**

මතෙව් 22:18
ලූක් 20:23

**උත්තම පූජකයා :**

යොහන් 18:21

**පිලාත් :**

යොහන් 18:34

# පස්වන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: ක්‍රමවේදයන්
## I වන කොටස

### අරමුණු :

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමට පසු යේසුස්වහන්සේ පහත ඉගැන්වීම් ක්‍රමවේදයන් යොදාගත් ආකාරය පැහැදිලි කිරීමට ඔබට හැකි වනු ඇත.

- භාස්කම්
- ආධිපත්‍ය
- ප්‍රේමය සහ අනුකම්පාව
- සම්බන්ධතාවයන් සහ අනුකරණයන්
- ප්‍රතිචාරය
- පැවරීම
- පරිසරය
- දෘශ්‍ය නිරූපණය
- ක්‍රමික ඉගෙන ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය.
- ශිෂ්‍යයන් කණ්ඩායම් වලට වෙන් කිරීම.

### ප්‍රධාන පදය :-

> **යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද, රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරමින්ද, සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද සියලු නුවරවලද ගම් වලද ඇවිද්දසේක. (මතෙව් 9:35)**

## හැඳින්වීම

යේසුස්වහන්සේගේ මෙලොව සේවය තුළ උන්වහන්සේ ඉගැන්වූයේ, කවර අවස්ථා වලදීද, කොතැනදීද, ඉගැන්වීමට හේතුව සහ ඉගැන්වූයේ මොනවාද යන්න ඔබ ඉගෙන ගෙන තිබේ. මෙම පරිච්ඡේදය හා මීළග පරිච්ඡේදය තුළින් යේසුස්වහන්සේ ඉගැන්වූයේ කෙසේද යන්න ඔබ ඉගෙන ගනු ඇත. මෙම පාඩම් උන්වහන්සේ ඉගැන්වීමේදී යොදාගත් ක්‍රමවේදයන් පිළිබඳව කේන්ද්‍රගත කොට ඇත. ක්‍රමවේදයක් යනු, යමක් කිරීම පිළිබඳ සැළසුමක්, රීතියක්, පිළිවෙළක් ක්‍රමයක් වේ. යේසුස්වහන්සේගේ ඉගැන්වීමේ ක්‍රමවේදයන් තුළින් උන්වහන්සේ ඉගැන්වූයේ කෙසේද යන්න සඳහන් වේ.

බොහෝ විට, සභාව දේව වචනය තුළින් එළිදරව් කර ඇති. ඉගැන්වීමේ ක්‍රමවේදයන් වෙනුවට ලෞකික අධ්‍යාපනික ක්‍රමවේදයන් යොදා ගැනීමෙන් සෑහීමකට පත්වේ. බයිබලීය ඉගැන්වීම් සඳහා වූ හොඳම ක්‍රමවේදයන් නම් යේසුස්වහන්සේ භාවිත කළ ක්‍රම වන අතර ඒවා ප්‍රබල බව ඔප්පු කර ඇත. මෙම පරිච්ඡේදය තුළ සඳහන් වන්නේ යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වල පැවති සාමාන්‍ය ක්‍රමවේදයන් පිළිබඳව වේ. මීළග පරිච්ඡේදය වචන භාවිතයෙන් උපදෙස් දීම පිළිබදව වූ විශේෂ ක්‍රමවේදයන් පිළිබදව සළකා බලනු ඇත.

## හාස්කම්

ගුරුවරයෙකුගේ පණිවුඩයත් සමගම දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීමද සිදු විය යුතු බව ඔබ ඉගෙන ගෙන තිබේ. මෙම බලය විදහා දැක්වීම දේව වචනය ඇසීම කෙරෙහි මිනිසුන් ආකර්ශනය කරගනී.

> **සබත් දවස පැමිණි කල උන්වහන්සේ සිනගෝගයෙහි උගන්වන්ට පටන් ගත් සේක. බොහෝ දෙනෙක් ඒ අසා මවිතව: මොහුට මේ දේවල් කොයින්ද? මොහුට දී තිබෙන මේ ප්‍රඥාව කිමෙක්ද? මොහුගේ අතින් කරන ලද බලවත් ක්‍රියාවලින් හැඟෙන්නේ කිමෙක්ද?**
> **(මාර්ක් 6:2) (මතෙව් 13:54 ද බලන්න)**

යේසුස්වහන්සේ පණිවුඩය පිළිගැනීම සඳහා මිනිසුන්ගේ හදවත් සූදානම් කිරීම උදෙසා හාස්කම් යොදාගත් සේක. යොහන් 9 සඳහන් යේසුස්වහන්සේ උප්පත්තියේ සිටම අන්ධවූ මනුෂ්‍යයෙකුගේ සුවකිරීම පිළිබඳ පුවත කියවන්න. ඔහු සුව වීමේ ප්‍රතිඵලයක් ලෙස දේව බලය පිළිබඳ සාක්ෂිය ඔහුගේ අසල්වැසියන් (9:8), ආගමික නායකයන් (9:13) සහ ඔහුගේ පවුලේ අය (9:18) වෙතට ගෙන යනු ලැබීය. යොහන් 9:4-10 ආගමික නායකයන්ට දෙවියන්වහන්සේ වෙතින් වූ පණිවුඩය ඉගැන්වීමට යේසුස්වහන්සේ සුවකිරීම යොදාගත් සේක.

යේසුස්වහන්සේ ගේ හාස්කම් මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවයේදී ඔවුන්ට සේවය සැපයුවේය. මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේදී හාස්කම් පිළිබඳව තවත් අධ්‍යයනය කළ විට, යේසුස්වහන්සේගේ හාස්කම් ද්‍රව්‍යමය, භෞතික, හැඟීම්බර, ආත්මික, මානසික සහ ස්වාභාවික අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ ආකාරය ඔබ ඉගෙන ගනු ඇත. යක්ෂයන් දුරු කරනු ලැබීය, මළවුන් නැගිටුවනු ලැබීය, රෝගීන් සුව කරනු ලැබීය, කුසගිනි වූවන්ට ආහාර දෙනු ලැබීය. එසේම මිදීම අවශ්‍ය වූවන්ට එය ලැබිණි.

දේව බලය විදහා පෑමට අමතරව, බයිබලීය පණිවුඩය පැහැදිලි කළ හැකි සහ ස්ථිර කළ හැකි වෙනත් විශිෂ්ට ක්‍රමයක් නැත. මෙම බලය මානුෂික අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ජීවිත වෙනස් කරයි. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට ආත්මික බලය පවරා දෙනු ලැබුවේ මේ නිසාය.

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලය දී, (මාර්ක් 6:7)**

> **නුඹලා යමින් ස්වර්ගරාජ්‍ය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුව කරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)**

> **සැබවක් සැබවක් නුඹලාට කියමි... මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය. මා පියාණන්වහන්සේ ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය. (යොහන් 14:12)**

## ආධිපත්‍යය

යේසුස්වහන්සේ ආධිපත්‍යය ඇතිව ඉගැන්වූ සේක. "ආධිපත්‍යය" අණකිරීමේ බලය ක්‍රියාවට නැංවීමයි. හාස්කම් මෙන්ම, ආධිපත්‍යය ඇතිව ඉගැන්වීමද අසන්නන් ආකර්ශණය කරගත්හ.

> **උන්වහන්සේගේ ඉගැන්වීම ගැන ඔව්හු විස්මිතවූවෝය. මන්ද උන්වහන්සේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඉගැන්වූ සේක. (මාර්ක් 1:22) (මතෙව් 21:23 ද බලන්න)**

ඇතැම් නූතන අධ්‍යාපනවේදිහු ආධිපත්‍යය සහිතව උගන්වනවා වෙනුවට "කණ්ඩායමේ කෙනෙක්" බවට පත්වීමට ගුරුවරු ධෛර්යමත් කරති. නමුත් යේසුස්වහන්සේ ආධිපත්‍යය සහිතව ඉගැන්වූ සේක. යේසුස්වහන්සේට ආධිපත්‍යය දෙන ලද්දේ දෙවියන්වහන්සේ විසිනි. ස්වර්ගස්ථ වීමට පෙර, යේසුස්වහන්සේ අපට එම ආත්මික ආධිපත්‍යය දුන් සේක.

> **... මාගේ පියාණන්වහන්සේ මා එවූවාක්මෙන්ම මමත් නුඹලා යවමියි කීසේක. (යොහන් 20:21)**

යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට ශුභාරංචියේ සාක්ෂිකාරයන් ලෙස දේශනා කිරීමටත් ඉගැන්වීමටත් අවශ්‍ය ආධිපත්‍යය (බලය) ලබා දීමට පොරොන්දු වූ සේක.

**නමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නාහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

අධ්‍යාපනය, සමාජ තත්වය හෝ ස්වාභාවික හැකියාව බයිබලීය ආධිපත්‍යයේ පදනම නොවේ. ඉගැන්වීම් සඳහා වූ ආධිපත්‍යය අපට ලැබෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෙනි.

## ප්‍රේමය හා අනුකම්පාව

යේසුස්වහන්සේ කිසිදාක උන්වහන්සේ ඉගැන්වූ අයව වරදට පත් කළේ නැත. ඒ වෙනුවට, උන්වහන්සේ ඔවුන්ට ප්‍රේමයත් අනුකම්පාවත් පෙන්වූ සේක. අනාචාරයේ හැසිරුණු කාන්තාව හසුවූ විට උන්වහන්සේ ඇය වරදට පත් කළේ නැත (යොහන් 8:11). මරියා මිළ අධික සුවඳ විළවුන් වලින් උන්වහන්සේව ආලේප කළ විට, දුප්පතුන්ට උදව් කිරීම සඳහා යොදා ගත හැකිව තිබූ දෙයක් නාස්ති කිරීම පිළිබඳව උන්වහන්සේ ඇයට දොස් කීවේ නැත. උන්වහන්සේ ඇයගේ ක්‍රියාව පිටුපස වූ හේතුව තේරුම් ගත් අතර ඇයට ප්‍රේමයෙන් සැළකූ සේක. (මතෙව් 26:10-13)

තමන්වහන්සේගේම ගෝලයන් පවා නොසලකා හැරිය අවස්ථාවේදී යේසුස්වහන්සේ අන්ධ මිනිසා කෙරෙහි (මාර්ක් 10:46-62) හා කුඩා දරුවන් කෙරෙහි (මාර්ක් 10:13-16) අනුකම්පාව දැක්වූ සේක. උන්වහන්සේව අනුගමනය කිරීම වෙනුවට ධනවත් කම තෝරා ගත් තරුණයාට යේසුස්වහන්සේ ප්‍රේමය දැක්වූ සේක (මාර්ක් 10:17-22). උන්වහන්සේව අත්අඩංගුවට ගැනීමට පැමිණි සොල්දාදුවාගේ කණ යේසුස්වහන්සේ සුව කළ සේක (ලූක් 22:50-51). යේසුස්වහන්සේගේ අනුකම්පාව උන්වහන්සේ සේවය කළ මිනිසුන් (මාර්ක් 6:34) සහ ඔවුන්ගේ නගර (ලූක් 19:41) උදෙසා මැදිහත්කාරකම් කිරීමට උන්වහන්සේව යොමු කළ සේක.

1 කොරින්ති 13 එළිදරව් කරන ලෙස ඕනෑම සේවයක් (ඉගැන්වීමද ඇතුළුව) ප්‍රේමය නොමැතිව කිරීමෙන් බලපෑමක් ඇති නොවේ. ගුරුවරු තම ශිෂ්‍යයන්ට ප්‍රේමය, සැළකිල්ල හා අනුකම්පාව පෙන්විය යුතුය. නැතහොත් "එයින් කිසි ප්‍රයෝජනයක් නැත".

## සම්බන්ධතාවය හා අනුකරණය.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට කතා කළ අවස්ථාවේදී උන්වහන්සේට විශේෂිත අරමුණක් තිබිය:

> **උන්වහන්සේද තමන් සමග සිටින පිණිසත්, දේශනාකරන්ට පිටත් කර හරින පිණිසත්, යක්ෂයන් දුරු කිරීමේ බලය දරන පිණිසත්, දොළොස්දෙනෙකු නියමකළසේක. (මාර්ක් 3:14-15)**

ප්‍රථමයෙන් ගෝලයන් කැඳවන ලද්දේ යේසුස්වහන්සේ සමග සිටීමටත්, උන්වහන්සේ පෙන්වූ ආදර්ශය තුළින් උන්වහන්සේගෙන් ඉගෙන ගැනීමටත්ය. පැහැදිලි කිරීම තුළින් තේරුම් ගැනීමට පෙර සම්බන්දතාවයන් මගින් දැනුම ලබා ගන්නා ලදි. ගෝලයෝ, ක්‍රියාකාරී භූමිකාවක් තුළ යේසුස් වහන්සේ සමග සිටීමට තිබුනෝය. ඔවුන් කැඳවා ඇත්තේ කිසිවක් නොකොට, කියන දේ අසා සිටීමට පමණක් නොවේ. ඔවුන් යේසුස්වහන්සේගේ සේවය නිරීක්ෂණය කිරීමටත්, සහභාගි වීමටත් කැඳවා ඇත. යේසුස්වහන්සේ, ඉගැන්වූ දේ ජීවත් වීමෙන් උන්වහන්සේ පෙන්නුම් කළ සේක. ඉගැන්වූ දේ අනුව ජීවත් වීමේ උන්වහන්සේගේ ආදර්ශය ඔබට අනුගමනය කළ හැකි වඩාත් ප්‍රබල ඉගැන්වීමේ ක්‍රමයකි.

බයිබලීය සත්‍යයන් එදිනෙදා ජීවිතයට අදාල කර ගන්නා ආකාරය තම ශිෂ්‍යයන්ට යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. යාච්ඤාව පිළිබඳ පාඩම ඉගැන්වීම සඳහා උන්වහන්සේ යාච්ඤා කළ සේක. බයිබල් පාඨයන්ගේ වටිනාකම ඉගැන්වීම සඳහා උන්වහන්සේ ඉන් උපුටා දැක්වූ සේක. ශුභාරංචිය

පැතිරීමේ වැදගත්කම ඉගැන්වීම සඳහා උන්වහන්සේ එය පතුරුවා හැරිය සේක. දේව බලය පැහැදිලි කිරීම සඳහා උන්වහන්සේ එය ගෙනහැර පෑවේය.

ගුරුවරයෙකුගේ සෘජු ජීවන රටාව ඔහුගේ පණිවුඩයට විශාලම විශ්වාසය එකතු කරයි. සම්බන්ධතාවය තුළින් ඉගෙන ගැනීමට අවස්ථාව සැළසීම උදෙසා ගුරුවරයා එදිනෙදා ජීවිතයේදී හා සේවය කරන අවස්ථා වලදී තම ශිෂ්‍යයන් සමග සම්බන්ධතා පැවැත්විය යුතුය.

## ප්‍රතිචාරය

ප්‍රථම වරට "මා අනුව එන්න" යැයි උන්වහන්සේ තම ගෝලයන්ට පැවසූ අවස්ථාවේදී පටන්, යේසුස්වහන්සේ දිගින් දිගටම උන්වහන්සේ ඉගැන්වූ පණිවුඩයට ප්‍රතිචාර දැක්වීමට කැඳවූ සේක. උන්වහන්සේ පුරුෂයන්ට හා කාන්තාවන්ට උන්වහන්සේ වෙතට පැමිණ තම කුරුසිය රැගෙන යන ලෙස පැවසූ සේක (මාර්ක් 8:34-35). උන්වහන්සේ සාක්ෂි දීම සඳහා ඔවුන් තම පවුල් ඉදිරියටත් (මාර්ක් 5:19) ආගමික නායකයන් ඉදිරියටත් (ලූක් 5:14) යැවූ සේක. උන්වහන්සේ ඇතැම් අයට තම ධනය විකුණන ලෙස පැවසූ සේක (මාර්ක් 10:21). ඇතමුන්ට, ගොස් පොකුණෙන් සෝදා ගන්න (යොහන් 9:7) සහ තවත් එවැනි ආඥා දුන් සේක.

ඉගැන්වීම් අනුව ජීවත් නොවේ නම් ඉගැන්වීම සම්පූර්ණ නොවේ. තමන් ඉගෙනගත් දේ ක්‍රියාවට නගන ආකාරය ඔබ ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතුය. ඔවුන් අසන්නෝ පමණක් නොවී. වචනය ක්‍රියාවට නගන්නෝ විය යුතුය.

> **නමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙයල්ලා. මක්නිසාද යමෙක් වචනය අසන නමුත් එය පිළිපදින්නේ නැත්නම් ඔහු කැඩපතකින් තමාගේ ස්වාභාවික මුහුණ බලන මනුෂ්‍යයෙකුට සමානය. මක්නිසාද ඔහු තමාම බලාගනිමින් සිට අහක්ව ගිය කල තමා කෙබඳු මනුෂයෙක්ව සිටියේ දැයි එවලේම මතක නැති කරයි. නමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගෙන, මතක නැතිකරන අසන්නෙක් නොවී, ක්‍රියාකරන කෙනෙක්ව, එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ ක්‍රියා කිරීමෙහිදී ආශිර්වාද ලබන්නෙහිය. (යාකොබ් 1:22-25)**

ආත්මික වර්ධනය මනිනු ලබන්නේ ශිෂ්‍යයෙකු අසන දේ වලින් නොවේ. එහෙත් ඔහු අසන දේවලින් ක්‍රියාවට නගන දේ වලිනි. ඔබ ශිෂ්‍යයන්ට දිය යුත්තේ වචනය පිළිබඳ තොරතුරු පමණක් නොව එය අත්දකින ආකාරයද ඉගැන්විය යුතුය. ඔවුන් සැබවින්ම දෙවියන්වහන්සේ පිළිබඳ දැනගැනීමට පමණක් නොව දෙවියන්වහන්සේව දැන ගැනීමට පැමිණිය යුතුය. ඉගෙනීම තුළ "ඉගැන්වීම" මෙන්ම "ක්‍රියාවට නැංවීම" ද ඇතුළත් වේ. යේසුස්වහන්සේ මෙය උන්වහන්සේගේ සේවය තුළින්ම පෙන්වූ සේක.

> **එම්බා තෙයෝපිලස්නි... උන්වහන්සේ විසින් කරන්ටත් උගන්වන්ටත් පටන්ගත් සියල්ල ගැන ප්‍රථම පොත සම්පාදනය කළෙමි. (ක්‍රියා 1:2)**

යේසුස්වහන්සේ මෙසේ කී සේක:

> **එබැවින් මේ ආඥාවලින් ඉතා සුළු එකක්වත් කඩකරන්නාවූ, කඩකරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ගරාජ්‍යයේ ඉතා සුළුයයි කියනු ලබන්නේය. නමුත් ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ග රාජ්‍යයෙහි උතුම්යයි කියනු ලබන්නේය. (මතෙව් 5:19)**

උන්වහන්සේ තම ගෝලයන්ට "ඉගැන්වීමට" මෙන්ම "ක්‍රියාවට නැංවීමට" ත් ඉගැන්වූ සේක:

> **ප්‍රේරිතයෝ යේසුස්වහන්සේ වෙතට රැස්ව තමුන් විසින් කළාවූද ඉගැන්වූවාවූද සියල්ල උන්වහන්සේට දැන්නුවෝය. (මාර්ක් 6:30)**

ඔබ උගන්වන විටදී ශිෂ්‍යයන්ට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් සළසා දියයුතුය. "පාඩම සැළසුම් කිරීම" යන 10 වන පරිච්ඡේදයේදී ඔබ මේ පිළිබඳව තවත් දේ ඉගෙන ගනු ඇත. නමුත් ප්‍රතිචාරයක් දැක්වීමට කරනු ලබන කැඳවීම නොවැදගත් හැඟීම්බර ඉල්ලීමක් නොවිය යුතුය.

ශුභාරංචියට නියම ප්‍රතිචාරයක් දැක්වීමට අධික මිළයක් ගෙවිය යුතු බව යේසුස්වහන්සේ පැහැදිලිව දැක් වූ සේක:

> **එවිට උන්වහන්සේ සමූහයා තමන් ගෝලයන් සමග ළඟට කැඳවා ඔවුන්ට කියන සේක්: කවරෙක් නමුත් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාගේ කැමැත්ත අත්හැර, තමාගේ කුරුසිය රැගෙන මා අනුව ඒවා. මක්නිසාද තමාගේ ජීවිතය ගලවාගන්ට කැමති කවරෙකුට නමුත් ඒක නැතිවන්නේය. මා නිසාද ශුභාරංචිය නිසාද තමාගේ ජීවිතය නැතිකරගන්න කවරෙකු නමුත් ඒක ගළවා ගන්නේය. (මාර්ක් 8:34-35)**

# පැවරීම

ආරම්භයේ පටන්ම, දෙවියන්වහන්සේ මිනිසුන්ට වගකීම් පැවරූ සේක. උන්වහන්සේ ඔවුන්ට, සතුන් නම් කිරීම, නැව් සෑදීම, කූඩාරම් තැනීම, දේවමාළිගා තැනීම හා පවුරු ගොඩනැගීම වැනි කාර්යයන් පැවරූ සේක. යේසුස්වහන්සේද තම ගෝලයන්ට ආත්මික ව්‍යාපෘති පැවරූ සේක. උන්වහන්සේ සමූහයා පෝෂණය කරන්න යැයි ඔවුන්ට පැවසූ සේක (මතෙව් 14:16). ශුභාරංචිය දේශනා කිරීමටත්, රෝගීන් සුව කිරීමටත් උන්වහන්සේ ඔවුන් යැවූ සේක(මතෙව් 10:9-10). ආත්මික ලෙස නිරූපනය කිරීම උන්වහන්සේ ඔවුන්ගෙන් බලාපොරොත්තු වූ සේක (යොහන් 15).

යේසුස්වහන්සේ, උන්වහන්සේගේ ස්වර්ගස්ථ වීමෙන් පසුව තම ස්ථානය ගැනීමට ශිෂ්‍යයන් සූදානම් කළසේක. ක්‍රමානුකූලව උන්වහන්සේ සේවය, ඉගැන්වීම හා දේශනාකිරීම පිළිබඳ තමන්වහන්සේගේ වගකීම ඔවුන්ට පවරා දුන්සේක. සෑම ශිෂ්‍යයෙකුම ඔබේ ස්ථානය ලබා ගැනීමට සූදානම් කරන ලෙස ඔබ ඔවුන්ට ඉගැන්විය යුතුය. ඔවුන්ව නියම ලෙස සූදානම් කිරීම සඳහා, ඔබ ඔවුන්ට භාරදුන් වචනය පිළිබඳ වගකීම ඔවුන්ට පවරා දිය යුතුය.

ගුරුවරයෙකු වශයෙන්, ඔබේ ශිෂ්‍යයන් පිළිබඳ ආත්මික ඉලක්කයන් ඔබට තිබිය යුතුය. ඔවුන්ට මෙම ඉලක්කයන් ළඟා කර ගැනීමට උපකාරී වන පාඩම් සහ ව්‍යාපෘති ඔබ විසින් සංවිධානය කළ යුතුය. සේවය සඳහා වගකීම් පවරා දීම මෙම ක්‍රියාවලියේ වැදගත් කොටසකි.

# පරිසරය

යේසුස්වහන්සේ ආත්මික පාඩම් ඉගැන්වීම සඳහා මිනිසුන් සිටි ස්වාභාවික පරිසරයම යොදාගත් සේක. "පරිසරය" යන කෙනෙකු වටා ඇති. භෞතික, සමාජීය, සංස්කෘතික, සහ ආත්මික සාධක ඇතුළත් වේ. එය පුද්ගලයකු ජීවත් වන, වැඩ කරන හා සේවය කරන සමාජයයි.

යේසුස්වහන්සේ සෑම ඉගෙනීමේ අවස්ථාවක්ම සැබෑ ජීවිතයේ කොටසක් බවට පත් කළ සේක. උන්වහන්සේ මිනිසුන් ජීවත් වූ, වැඩ කළ හෝ සේවය කළ ස්ථාන වලදීම ඔවුන්ට ඉගැන්වූ සේක. සෑම දිනකම අප මුහුණ දෙන ප්‍රශ්න හා අභියෝග තුළින් දෙවියන්වහන්සේ ස්වාභාවික ජීවිතයේ අවස්ථා තුළින් අපට ඉගැන්වීම් දිගින් දිගටම සිදු කරන සේක. (මෙය හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ ක්‍රමයයි. ඔබ ජීවත් වන හා වැඩකරන ස්ථාන වලදී මෙම පාඩමාලාව ඔබ වෙතට ගෙන එන්නේ එම නිසාය).

යේසුස්වහන්සේ, දේශනා ශාලා, සබත් දින පංති, හෝ දේශනාකුඩු වැනි දේ කෙරෙහි පමනක් රැඳී සිටියේ නැත. ඔබ දෙවන පරිච්ඡේදයේදී ඉගෙන ගත් ආකාරයට, උන්වහන්සේ අහම්බෙන් සිදුවන සෑම හමුවීමකින්ම ඉගැන්වීමට අවස්ථාවක් කර ගත්සේක. උන්වහන්සේ සිටියේ කොතැනක වුවද, උන්වහන්සේ ඉගැන්වූ සේක. යේසුස්වහන්සේ ජීවිතයේ අවස්ථාවන් පාඩම් ඉගැන්වීම සඳහා යොදාගත් සේක. උන්වහන්සේ අවමංගල්‍ය පෙරහැරක් පසුකර යෑමට සිදු වූ අවස්ථාවේදී, උන්වහන්සේ මනුෂ්‍යයෙක් මරණයෙන් නැගිටවූ සේක(ලූක් 7:11-15). යේසුස්වහන්සේට පිපාස වූ විට, උන්වහන්සේ ජීවනයේ ජලය පිළිබඳ පාඩම ඉගැන්වූ සේක(යොහන් 3). උන්වහන්සේ දිළිඳු කාන්තාවක් දේව මාලිගාවට තම පඬුරු ගෙන එනවා දුටු විට උන්වහන්සේ දීම පිළිබඳ පණිවුඩය දේශනා කළ සේක(මාර්ක් 12:41-44).

මිනිසුන් හොඳින්ම ඉගෙන ගන්නේ එය ඔවුන්ගේ පරිසරයට සම්බන්ධ කළ විටය. ඔවුන් ඉගෙන ගන්නා දේ ප්‍රායෝගික මෙන්ම ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න වලට අදාල කරගත හැකි විය යුතුය. පණිවුඩය ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයන්ට සේවය කළ යුතුය. ඔබ දේව වචනය එදිනෙදා ජීවිතයට අදාල කරගත් විට එය "අදාළ කර ගැනීම" ලෙස හැඳින්වේ. ඔබ ඉගෙන ගත් දේ ඔබ සැබෑ ජීවිතයේ අවස්ථාවන්ට "අදාළ" කර ගනී.

එවැනි අවස්ථාවන් සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වනවාසේම අසන්නාවූ සෙනග මත තීරණය වේ. මේ නිසා වචනය ඔවුන්ගේ ජීවිත තුල ජීවත් කරවීම උදෙසා ඔබ ඔබගේ ශිෂ්‍යයන් පිළිබඳව දැන ගත යුතුයි. පසුව එන "ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම" හා "පාඩම සැළසුම් කිරීම" යන පාඩම් වලදී ඔබ මේ පිළිබඳව තවත් ඉගෙන ගනු ඇත.

## දෘශ්‍ය නිරූපණය

යේසුස්වහන්සේ තම ඉගැන්වීම් පැහැදිළි කිරීම සඳහා දෘශ්‍ය ආධාර යොදා ගත් සේක. "දෘශ්‍ය" ආධාරයක් යනු ඉගැන්වූ දේ පැහැදිලි කරන වස්තුවක්, සංකේතයක් හෝ ක්‍රියාවකි. උදාහරණයක් ලෙස, උන්වහන්සේව පිළිගැනීමට හා දේවරාජ්‍යයට ඇතුළු වීමට අවශ්‍ය ආකල්පයන් විස්තර කිරීමට යේසුස්වහන්සේට අවශ්‍ය වු විට ...

> **උන්වහන්සේ කුඩා දරුවකු ගෙන ඔවුන් මැද සිටුවා, ඔහු වඩා ගෙන, මෙබඳු කුඩා දරුවන්ගෙන් එක්කෙනෙකු මාගේ නාමයෙන් පිළිගන්නාවූ කවරෙක් නමුත් මා පිළිගන්නේය. මා පිළිගන්න කවරෙක් නමුත් මා පිළිගන්නවා නොව මා එවූ තැනන්වහන්සේ පිළිගන්නේයයි ඔවුන්ට කීසේක. (මාර්ක් 9:36-37)**

යේසුස්වහන්සේ තමන්ගේ මරණයේ අර්ථය පහදා දුන් අවස්ථාවේදී උන්වහන්සේ රොටි සහ මිදි යුෂ සංකේත ලෙස යොදා ගත් සේක (මාර්ක් 14:22-25). යේසුස්වහන්සේට යටහත්ව සේවය කිරීම පිළිබඳ පාඩම ඉගැන්වීමට අවශ්‍යය වු විට උන්වහන්සේ ගෝලයන් ගේ පාද සේදු සේක (යොහන් 13:1-17). යේසුස්වහන්සේ තමන්ට ඉගැන්වීමට අවශ්‍ය වු දේ පැහැදිලි කිරීම සඳහා මල් (මතෙව් 5:28) කුරුල්ලන් (මතෙව් 5:26) වැනි දෘශ්‍ය ආධාර යොදා ගත් සේක.

මෙම අත් පොතේ 7 වන පරිච්ඡේදයේ, "ඉගැන්වීමේ ආධාරක" යටතේ, ඔබේ සංස්කෘතිය, ආර්ථික තත්වය හා අමුද්‍රව්‍ය වල සුලභත්වය යන කරුණු අනුව ඔබට මිලදී ගත හැකි හෝ සාදා ගත හැකි දෘශ්‍ය ආධාරක පිළිබඳව යෝජනා ඉදිරිපත් කරයි. නමුත් ඔබට මුදල් හෝ එවැනි ආධාරක ලබා ගැනීමේ මාර්ගයක් නොමැති නම්, ඔබේ ඉගැන්වීම් පැහැදිළි කිරීම සඳහා ඔබට ඔබේ පරිසරයේම ඇති වස්තූන් යොදා ගත හැකිය. යේසුස්වහන්සේට දෘශ්‍ය ආධාරක සාදා ගැනීම සඳහා උපකරණ හෝ අමු ද්‍රව්‍ය සඳහා මුදල් තිබුනේ නැත. උන්වහන්සේ පරිසරයේ ඇති සරල වස්තු යොදාගත් සේක.

## ක්‍රමක්‍රමයෙන් ඉගෙන ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය

තම ශිෂ්‍යයන්ට වරකට ඉගෙන ගත හැක්කේ එක්තරා ප්‍රමාණයක් දක්වා පමණක් බව යේසුස්වහන්සේ තේරුම් ගත් සේක. මේ හේතුවෙන්, උන්වහන්සේ තම ඉගැන්වීම් ඔවුන්ට නියම ලෙස තේරුම් ගත හැකි මට්ටමකට සකස් කළ සේක.

> **ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කී සේක. (මාර්ක් 4:33)**

> **නුඹලාට කියන්ට තව බොහෝ දේවල් මට ඇත්තේය. නුමුත් දැන් ඒවා දරන්ට නුඹලාට බැරිය. (යොහන් 16:12)**

සෑම ශිෂ්‍ය කණ්ඩායමක්ම සහ සෑම පුද්ගලයෙක්ම ඉගෙන ගනු ලබන්නේ වෙනස් ප්‍රමාණයන්ගෙනි. ශිෂ්‍යයෙකුගේ ඉගෙනීමේ හැකියාවට විවිධාකාර දේවල් බලපානු ලබයි. "ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම" යන 8 වන පරිච්ඡේදයෙන් ඔබට මේ පිළිබඳ තවත් දේ ඉගෙන ගත හැකි වනු ඇත.

## ශිෂ්‍යයන් කණ්ඩායම් වලට වෙන් කිරීම

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීම් වෙනස් ශිෂ්‍ය කණ්ඩායම් වලට සරිලන පරිදි සකස් කර ගත් සේක.

### විශාල ජනකායන් :

විශාල ජනකායන්ට උගන්වන විට යේසුස්වහන්සේ දේශන ක්‍රමය යොදා ගත් සේක. උන්වහන්සේ පාඩම අවසන් වන තෙක් බාධා කිරීම් වලට හෝ ප්‍රතිචාර දැක්වීමට ආරාධනා කලේ නැත. මෙය විශාල කණ්ඩායම් සඳහා ඉතාම උචිත ක්‍රමය වේ. දේශනා කිරීම සාමාන්‍යයෙන් හැම විටම මෙම ක්‍රමය අනුව සිදු වෙයි. උදාහරණයක් සඳහා මතෙව් 5-7 බලන්න.

### කුඩා කණ්ඩායම් :

බොහෝවිට කුඩා කණ්ඩායම් වලදී යේසුස්වහන්සේ අසන පිරිසේ සහභාගීත්වයට ඉඩ දුන්සේක. උදාහරණ සඳහා මාර්ක් 8:10-12,14-21,27-30 බලන්න.

### තනි පුද්ගලයන් :

යේසුස්වහන්සේ තනි පුද්ගලයන් සඳහා සාකච්ඡාමය ක්‍රමය යොදා ගත්සේක. උන්වහන්සේ ඔවුන් සමග කථාකල අතර ප්‍රශ්න ඇසීමත්, පිළිතුරු දීමත් සිදු කළ සේක. ක්‍රමය බොහෝදුරට දෙදෙනකු අතර ඇතිවන සාමාන්‍ය සංවාදයකට සමාන විය. උදාහරණ සඳහා යොහන් 3 සහ 4 බලන්න.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

පහත සඳහන් දේවල් පිළිබඳව ඔබ ඉගෙන ගත් දේ සාරාංශ ගත කරන්න. යේසුස්වහන්සේ පහත දේවල් යොදා ගත්තේ කෙසේද...

2. හාස්කම් :

______________________________________________

______________________________________________

3. ආධිපත්‍යය :

______________________________________________

______________________________________________

4. ප්‍රේමය සහ අනුකම්පාව :

______________________________________________

______________________________________________

5. සම්බන්ධතාවය හා අනුකරණය :

______________________________________________

______________________________________________

6. ප්‍රතිචාරය :

______________________________________________

______________________________________________

7. පැවරීම :

______________________________________________

______________________________________________

8. පරිසරය :

______________________________________________

______________________________________________

9. දෘශ්‍ය නිරූපණය :

10. ක්‍රමික ඉගෙන ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය :

11. ශිෂ්‍යයන් කණ්ඩායම් වලට වෙන් කිරීම :

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මානුෂික අවශ්‍යතාවයන් උදෙසා සේවය කළ යේසුස්වහන්සේ ගේ හාස්කම් පිළිබඳව වැඩිදුරටත් අධ්‍යනය කරන්න.

## මළවුන් නැගිටවීමේ හාස්කම්

- සොහොන වෙත රැගෙන යමින් සිටි වැන්දඹුවගේ එකම පුත්‍රයා: ලූක් 7:11-16
- සිනගෝගයේ මූලාදෑනියෙකුවූ යායිරස්ගේ දියණිය : මාර්ක් 5:22-24,35-43, මතෙව් 9:18-26; ලූක් 8:41,42,49-56.
- මරණයට පත් වී සතර දවසක් ගතවී සිටි ලාසරස් : යොහන් 11:32-44,
- භූමිදානයෙන් තුන් දවසකට පසු තමන්වහන්සේගේම ශරීරය : ලූක් 24:1-7; යොහන් 19:42-20:14; මාර්ක් 16:9-11

## යක්ෂයන් දුරු කිරීමේ හාස්කම්

- අශුද්ධ ආත්මයක් ආවේශ වී සිටි මනුෂ්‍යයා: මාර්ක් 1:23-26; ලූක් 4:33-37
- යක්ෂාවේශ වූ අන්ධ ගොළුවා : මතෙව් 12:22-23; මාර්ක් 3:19-30; ලූක් 11: 14-23
- ඉතා දරුණු ලෙගියොන් ආවේශව සිටි මිනිසුන් දෙදෙනා: මතෙව් 8:28-34; ලූක් 8:26-39 මාර්ක් 5:1-20 සමග සසදන්න.
- යක්ෂ ආත්මයක් ආවේශ වී සිටි ගොළුවා : මතෙව් 9:32-35
- සිරෝපිනිසි ජාතික ස්ත්‍රියගේ දියණිය : මාර්ක් 7:24-30; මතෙව් 15:22-28
- ගෝලයන් අසමත් වූ මීමැස්මොර රෝගාකාර ළමයා : මතෙව් 17:14-21; මාර්ක් 9:14-39 ; හා ලූක් 9:37-34 සමග සසදන්න.
- ගොළුවූ යක්ෂයා : මාර්ක් 9:14-26.

## සුවකිරීමේ හාස්කම්

- උණ වැලඳී සිටි, ඇමතියාගේ පුත්‍රයා : යොහන් 4:46-54
- උණ වැළඳී සිටි, පේදුරුගේ භාර්යාවගේ මව : මාර්ක් 1:29-31; මතෙව් 8:14-17; ලූක් 4:38-39
- කුෂ්ඨ රෝගයෙන් පෙළුණු මිනිසා : මාර්ක් 1:40-45; මතෙව් 8:2-4; ලූක් 5:12-16
- සතරදෙනෙකු විසින් උසුලාගෙන එනු ලැබූ අංගභාගී රෝගියා : මාර්ක් 2:3-12; මතෙව් 9:1-8; ලූක් 5:17-26
- තිස් අට අවුරුද්දක් දුර්වල කමෙන් පීඩිතව සිටි මිනිසා : යොහන් 5:1-16.
- වියලි අතක් ඇති මිනිසා : මාර්ක් 3:1-5; ලූක් 6:6-10; මතෙව් 12:9-13 සමග සසඳන්න.
- අංගභාග රෝගියෙක්ව සිටි, ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13; ලූක් 7:1-10
- වසර දොළහක් මහලේ රෝගියෙන් පීඩා විඳි කාන්තාව : මාර්ක් 5:25-34; ලූක් 8:43-48; මතෙව් 9:20-22.
- පෙනීම ලැබූ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31.
- කතාකිරීමට හා ඇසීමට හැකියාව ලැබූ මිනිසා : මාර්ක් 7:32-37.
- පෙනීම ලැබූ මිනිසා : මාර්ක් 8:22-26.
- උපතින්ම අන්ධවූ මිනිසෙකුට පෙනීම ලබා දීම : යොහන් 9.
- දහ අට අවුරුද්දක් පීඩා විඳි කාන්තාව : ලූක් 13:11-17.
- දිය උදර රෝගී මිනිසා : ලූක් 14:1-6.
- කුෂ්ඨ රෝගීන් දස දෙනා : ලූක් 17:11-19.
- හිගන්නෙකුට පෙනීම ලබා දීම : ලූක් 18: 35-43.; මතෙව් 20:29-34 සමග සසඳන්න.
- බර්තිමේයුස්ට පෙනීම ලබා දීම : මාර්ක් 10:46-52; මතෙව් 20:29-34 සමග සසඳන්න.
- උත්තම පූජාකයාගේ මෙහෙකරු වූ මල්කස් (හෝ මාකස්) ගේ කණ සුව කිරීම : ලූක් 22:50-51.

## සැපයීමේ හාස්කම්

- වතුර වයින් බවට හැරවීම යොහන් 2:1-11.
- පේදුරුගේ දැළ මාළු විශාල ප්‍රමාණයකින් පිරවීම : ලූක් 5:1-11.
- කාන්තාවන් හා දරුවන් හැර පුරුෂයන් පන්දහසකට කන්න දීම : මතෙව් 14:15-21 ; මාර්ක් 6:35-44 ; ලූක් 9:12-17 ; යොහන් 6:5-14.
- කාන්තාවන් හා දරුවන් හැර පුරුෂයන් හාරදහසකට කන්න දීම : මතෙව් 15:32-39 ; මාර්ක් 8:1-10.
- බදු මුදල් සැපයූ මාළුවා : මතෙව් 17:27.
- මසුන් රාශියක් ගොඩට ගැනීම : යොහන් 21:6-14.

## විනිශ්චය පිළිබඳ හාස්කම්

- ප්‍රපාතය දිගේ මුහුදට දිවගොස් ජලයේ ගිලුණු ඌරු රැළ : මතෙව් 8:30-32.
- වියලුණු අත්තික්කා ගස : මතෙව් 21:18-21, මාර්ක් 11:12-14,20-24.

## මිදීමේ හාස්කම්

- උන්වහන්සේ තමන්ගේ සතුරන්ගෙන් තමන්වහන්සේව ගළවාගත්සේක: ලූක් 4:30
- සුළඟ සහ මුහුද උන්වහන්සේගේ වචනයට කීකරු විය : මාර්ක් 4:37-41; මතෙව් 8:23-27; ලූක් 8:22-25.
- යේසුස්වහන්සේ කළ ලෙස මුහුද මත ඇවිදීමට උත්සහ කළ පේත්‍රුස්ව බේරා ගැනීම : මතෙව් 14:28-31; මාර්ක් 6:45-52.
- සුළඟ නැවතීම සහ ඔරුව ක්‍ෂණිකවම ගොඩබිම වෙතට පැමිණීම : යොහන් 6:21; මාර්ක් 6:51-52.
- උන්වහන්සේව අල්ලා ගැනීමට පැමිණි අය පසුපසට ගොස් වැටීම : යොහන් 18:4-6

## ක්‍රිස්තුස්වහන්සේ විසින් සිදු නොකළ නමුත් උන්වහන්සේගේ දේවත්වය ඔප්පු කරනු ලබන හාස්කම්

- පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයන්ට තරුවක් මගින් බෙත්ලෙහෙමට මග පෙන්වීම : මතෙව් 2:1-9.
- උන්වහන්සේගේ බෞතිස්මයේදී පෙන්නුම් කළ ලකුණු : මතෙව් 3:16-17; මාර්ක් 1:9-12; ලූක් 3:21-23.
- උන්වහන්සේ අන්වෙසක්වූ අවස්ථාවේදී පෙන්නුම් කළ ලකුණු : මතෙව් 17:1-14; ලූක් 9:28-37; මාර්ක් 9:1-14.
- උන්වහන්සේගේ යාච්ඤාවට පිළිතුරු ලැබීම : යොහන් 12:28-30.
- උන්වහන්සේගේ මරණයේදී පෙන්නුම් කළ ලකුණු : මතෙව් 27:45-53.
- උන්වහන්සේ නැවත නැගිටීමේදී පෙන්නුම් කළ ලකුණු : මතෙව් 28:2 ; මාර්ක් 16:4
- උන්වහන්සේ ස්ව¾ගයට නැගිමේදී පෙන්නුම් කළ ලකුණු :මාර්ක් 16:19. ලූක් 24: 50-51; ක්‍රියා 1: 6-12

02. ඔබ ඉහත 01 හි සඳහන් ඇගයීම් සම්පූර්ණ කළෙහි නම් යේසුස්වහන්සේගේ ඉගැන්වීම් සමග සිදු කරන ලද සියලුම හාස්කම් ඔබ අධ්‍යනය කර ඇත. දැන් මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් යන පොත් කියවා යේසුස්වහන්සේගේ ඉගැන්වීම් තුළ වූ අනෙකුත් සාමාන්‍ය ප්‍රතිපත්තීන් අධ්‍යනය කරන්න. ඔබේ උදාහරණ පහත සඳහන් වගුව තුළ වාර්තා කරන්න.

**අධිකාරීත්වය: උදාහරණ ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**ප්‍රේමය හා අනුකම්පාව: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**සම්බන්ධතාවය හා අනුකරනය: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**ප්‍රතිචාරය: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**පවරාදීම: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**පරිසරය: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**දෘශ්‍ය නිරූපණය: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**ක්‍රමික ඉගෙන ගැනීමේ ප්‍රතිපත්තිය: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**ශිෂ්‍යයන් කණ්ඩායම් වලට වෙන් කිරීම: උදාහරණ...**

**මතෙව් මාර්ක් ලූක් යොහන්**

**තනිපුද්ගලයන්**

**කුඩා කණ්ඩායම්.**

**විශාල ජනකායන්.**

# හයවන පරිච්ඡේදය

# දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්: ක්‍රමවේදයන්
# II වන කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- යේසුස්වහන්සේ පහත සඳහන් ඉගැන්වීමේ ක්‍රමවේදයන් යොදාගත් ආකාරය කෙටියෙන් සාරාංශ කිරීමට ඔබට හැකිවනු ඇත.

  - දන්නා දෙයකින් නොදන්නා දෙයට
  - සාමාන්‍ය දෙයින් විශේෂ දෙයට
  - වස්තුවක් භාවිතයෙන් පාඩම් කියාදීම
  - ප්‍රශ්න සහ පිළිතුරු
  - උපමා
  - සිදුවීමක සවිස්තර වාර්තාව
  - බයිබල් පාඨ භාවිතය
  - වෙනස පෙන්වීම
  - ගැටලු වලින්
  - අවස්ථා භාවිතයෙන්

**ප්‍රධාන පදය :**

> **උන්වහන්සේ තමන්ගේ රටට පැමිණ, ඔවුන්ගේ සිනගෝගයෙහිදී ඔවුන්ට ඉගැන්වූ සේක. ඔව්හු විස්මපත්ව: මොහුට මේ ප්‍රඥාව සහ බලවත් ක්‍රියා කොයින්ද? (මතෙව් 13:54)**

## හැඳින්වීම

යේසුස්වහන්සේ ඉගැන්වීම් බොහොමයක් කට වචනයෙන් විය. උන්වහන්සේ තම පණිවුඩය ලිවීම පිළිබඳව ඇත්තේ එකම එක වාර්තාවක් පමණි (යොහන් 8:6). මෙම පරිච්ඡේදය යේසුස්වහන්සේ කතාකිරීම තුලින් උපදෙස් දීම සඳහා යොදා ගත් විශේෂ ක්‍රමවේදයන් පිළිබඳව වේ.

## දන්නා දෙයකින් නොදන්නා දෙයට

යේසුස්වහන්සේ නොදන්නා දෙයක් ඉගැන්වීම සඳහා දන්නා දෙය යොදා ගත් සේක. උන්වහන්සේ අළුත් දේ හඳුන්වාදීම සඳහා පරණ දෙය යොදාගත් සේක. උන්වහන්සේ ජනතාව දැන සිටි හා තේරුම් ගෙන සිටි සත්‍යයන්ගෙන් පටන් ගෙන ඒවා මත පදනම්ව ඔවුන් නොදැන සිටි සත්‍යයන් ගොඩනගා ඔවුන්ට ඉගැන්වූසේක.

උදාහරණයක් ලෙස, යේසුස්වහන්සේ සාමාන්‍යයෙන් පැරණි ගිවිසුම් ව්‍යවස්ථාවෙන් සත්‍යයක් පවසා, ඉන් පසුව නව සත්‍යයක් එළිදරව් කළ සේක. (මතෙව් 5:17-48 බලන්න).

ඉගැන්වීමේ ප්‍රතිඵලය විය යුත්තේ තේරුම් ගැනීමයි. අසන්නා දැනටමත් දැනගෙන සිටින දේවල් මත ගොඩනැගුනු නව සත්‍යයන් එළිදරව් කිරීම මෙම ඉලක්කය ලගාකර හැකි ඉතා යහපත් ක්‍රමවේදයකි. මිනිසුන් තම මනසින් පණිවුඩය තේරුම් ගැනීම වැදගත් වේ.

**මක්නිසාද තමාගේ සිතෙන් ගණන්ගන්නා ලෙසම ඔහු වන්නේය... (හිතෝපදේශය 23:7)**

## සාමාන්‍ය දෙයින් විශේෂ දෙයට

දෙවියන්වහන්සේ නිරතුරුව වර්ධනය වන එළිදරව් කිරීමකින් දැනුම එළිදරව් කරණ සේක. උන්වහන්සේ සාමාන්‍ය දැනුමේ සිට විශේෂ දැනුමට ගමන් කරන සේක. සාමාන්‍ය එළිදරව් වීමක් දෙන අතර ඉන්පසුව විශේෂ කරුණු එකතු කරනු ලැබේ. උදාහරණයක් ලෙස, ගැලවුම්කරුවකු පිළිබඳ ප්‍රථම සාමාන්‍ය එළිදරව්ව ලබාදෙන ලද්දේ උප්පත්ති 3:15 දිය. පසුව, පරණ ගිවිසුමේ දිවැසිවරු රචනා කළ ආකාරයට, දෙවියන්වහන්සේ එම ගැලවුම්කරු පිළිබඳව තවත් කරුණු එළිදරව් කළ සේක.

යොහන් 6:35 දී යේසුස්වහන්සේ, තමන්වහන්සේ ජීවනයේ කෑම වන බවට සාමාන්‍ය එළිදරව්වක් ලබා දෙන ලදි. යොහන් 6:51-58 හි යේසුස්වහන්සේ මෙම සත්‍ය විස්තර කළ සේක. සදාකාල ජීවනයේ අත්දැකීම් ලැබීම සඳහා කෙනෙකු විසින් අනුභව කළ යුතු ජීවනයේ කෑම තම ශරීරය බව දක්වමින් උන්වහන්සේ මේ පිළිබඳ තවත් විස්තර කළ සේක. ඔබට අනුගමනය කළ හැකි ස්ථිර ඉගෙන ගැනීමේ ප්‍රතිපත්තියක් වන මෙම ඉගැන්වීම් ක්‍රමය යේසුස්වහන්සේ යොදාගත් සේක.

## වස්තුවක් භාවිතයෙන් පාඩම් කියා දීම

යේසුස්වහන්සේ, බයිබලීය සත්‍යයන් ඉගැන්වීම සඳහා තම ශ්‍රාවකයන් හොඳින් දැන සිටි සුලභ වස්තූන් හා සංකේත යොදා ගත් සේක. දෙවියන්වහන්සේගේ සැලකිල්ල පිළිබද ඉගැන්වීම සඳහා උන්වහන්සේ කෙතේ මානෙල් හා කුරුල්ලන් යොදා ගත් සේක (මතෙව් 6:26-30). ගැලවීම නොලත් අයවෙත යෑම සඳහා සේවකයන් අවශ්‍ය බව විස්තර කිරීමට උන්වහන්සේ මසුන් ඇල්ලීම සහ අස්වැන්න නෙලා ගැනීම යොදා ගත් සේක (යොහන් 4:35 සහ මතෙව් 4:19).

යේසුස්වහන්සේ තම බිඳුණු ශරීරය සංකේතවත් කිරීමට කැඩූ රොටිද, තම රුධිරය සංකේතවත් කිරීමට මිදියුෂ ද යොදා ගත් සේක (ලූක් 22:19-20). නායකත්වයේ යටහත් සේවය විස්තර කිරීම සඳහා උන්වහන්සේ ගෝලයන්ගේ පාද සේදීම යොදා ගත් සේක( යොහන් 13:1-17). දේව රාජ්‍යයට ඇතුළු වීම සඳහා අවශ්‍ය යටහත් බව හා විශ්වාසය පිළිබඳ උදාහරණයක් ලෙස යේසුස්වහන්සේ කුඩා දරුවකු පෙන් වූ සේක(මාර්ක් 10:13-16). උන්වහන්සේ දේව රාජ්‍යය පිළිබඳව විස්තර කිරීම සඳහා දැළ, බීජ, කිරිඳි සහ තිරිඟු, මුහුන්, අබ ඇට ආදිය පිළිබඳ උපමා ඇතුළු සංකේත රැසක් යොදාගත් සේක.

වස්තුවකින් පාඩමක් කියා දෙන විට එම වස්තුව හෝ සංකේත ශිෂ්‍යයාට හොඳින් හුරු පුරුදු විය යුතුය.

## ප්‍රශ්න සහ පිළිතුරු

යේසුස්වහන්සේ තම ඉගැන්වීම තුළ බොහෝ අවස්ථා වලදී ප්‍රශ්න සහ පිළිතුරු යොදා ගත් සේක. බොහෝ අවස්ථා වලදී, යේසුස්වහන්සේ තම අසන්නන්ට සිතීමට ඉඩ හැරීම සඳහා ප්‍රශ්නයක් ඇසූ සේක. සමහර අවස්ථාවලදී උන්වහන්සේ පිළිතුරක් බලාපොරොත්තු වූසේක(මතෙව් 16:13-16). අනෙක් අවස්ථා වලදී උන්වහන්සේ පිළිතුරක් නොලැබුණු ප්‍රශ්ණ ඇසූ සේක. එම අවස්ථා වලදී උන්වහන්සේගේ අසන්නන්ට සිතීමට හා තමන්ගේම නිගමන වලට එළඹීම සඳහා විය (ලූක් 10:25-37; මාර්ක් 10:17-18).

සමහර අවස්ථාවලදී උන්වහන්සේගේ ප්‍රශ්න සිතා බැලිය යුතු වූ ගැටළු වැනි විය. (මතෙව් 21:25-27). ඇතැම් අවස්ථා වලදී උන්වහන්සේගේ ප්‍රශ්න" සිතීම උනන්දු කර විය. (මතෙව් 5:13). සමහර අවස්ථාවලදී උන්වහන්සේගේ මුළු සංවාදයම ප්‍රශ්න මාලාවක් විය. (මතෙව් 16:9-12). බොහෝවිට යේසුස්වහන්සේ මිනිසුන් විසින් අසන ලද ප්‍රශ්න වලට ප්‍රතිචාර දැක්වූයේ තවත් ප්‍රශ්නයකිනි.(මතෙව් 9:14-15; 12:10-11; 15:1-3; 21:23-25).

යේසුස්වහන්සේ විවිධ ආකාරයන්ට ප්‍රශ්න භාවිත කළ සේක. ඔබටත් මෙම ආකාරයට ඒවා පාවිච්චි කළ හැකිය.

- පාඩමක් හඳුන්වා දීමට : මතෙව් 21:28
- පාඩමකට පසුව : මතෙව් 21:40
- දන්නා දේ නැවත මතක් කිරීමට : මාර්ක් 2:25-26
- අසන්නන්ගේ හෘද සාක්ෂිය ස්පර්ශ කිරීමට : මතෙව් 23:17
- ඇදහිල්ල ඇති කිරීමට : මාර්ක් 8:29
- අවස්ථාවක් පැහැදිලි කිරීමට : මාර්ක් 10:3
- විවේචනයන්ට තරවටු කිරීමට : මාර්ක් 2:25-26
- වැඩිදුර සිතීමට හෝ විමසීමට පෙළඹවීමට : මතෙව් 6:25-31
- එකිනෙකට වෙනස් ක්‍රියාවන් සලකා බැලීමට : මතෙව් 9:5
- ශිෂ්‍යයන්ගේ තේරුම් ගැනීම ඇති කිරීමට : මතෙව් 16:15

ගුරුවරයාට :

- මුළු පංතියෙන්ම ප්‍රශ්න ඇසීමට
- එක ශිෂ්‍යයෙක්ගෙන් ප්‍රශ්න ඇසීමට
- අධ්‍යයනය හෝ ප්‍රශ්න පත්‍ර සඳහා ප්‍රශ්න ලිවීමට හැකිය.

ශිෂ්‍යයන්ට :

- ගුරුවරයාගෙන් ප්‍රශ්න ඇසීමට
- එකිනෙකාගෙන් ප්‍රශ්න ඇසීමට
- දේව වචනය පිළිබඳ තමන්ගේම පරීක්ෂණ වලින් ප්‍රශ්න මතු කිරීමට හැකිය.

## ඔබට හොඳ ප්‍රශ්න ඇසීමට උපකාරී වන යෝජනා කිහිපයක් පහත දැක්වේ :

- වරකට එක් ප්‍රශ්නයක් පමණක් අසන්න. ප්‍රශ්න එකකට වඩා ඇසීමෙන් ශිෂ්‍යයා වියවුලට පත් කරයි.

- ප්‍රශ්නයක් ඇසීමෙන් පසු, නිශ්ශබ්ද වන්න. ශිෂ්‍යයා ප්‍රතිචාර දක්වන තුරු රැඳී සිටින්න.

- පොදු ප්‍රශ්නයකට පසු එම විෂය පිළිබඳව විශේෂ ප්‍රශ්න අසන්න.

- ශිෂ්‍යයන් විසින් ලබාදෙන පිළිතුරු වලට ප්‍රතිචාර දක්වන්න. පිළිතුරු සාකච්ඡා කරන්න. වැරදි පිළිතුරු ලබා දෙන ශිෂ්‍යයන් ලැජ්ජාවට පත් නොකරන්න.

- "සංවෘත" ප්‍රශ්න වලට වඩා "විවෘත" ප්‍රශ්න අසන්න. "සංවෘත" ප්‍රශ්නයක් "ඔව්" හෝ "නෑ" ලෙස සරල පිළිතුරු බලාපොරොත්තු වන ප්‍රශ්නයි. සංවෘත ප්‍රශ්න ශිෂ්‍යයන් වැඩි දුර සිතීමට හෝ විමසීමට ධෛර්යමත් නොකරයි. සංවෘත ප්‍රශ්නයකට උදාහරණයක් පහත දැක්වේ:

  "යේසුස්වහන්සේ මැරුණේ කුරුසිය මතද?"

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන්නේ "ඔව්" යන පිළිතුර පමණි. විවෘත ප්‍රශ්නයක් සඳහා උදාහරණයක් පහත දැක්වේ:

  "යේසුස්වහන්සේ කුරුසියක් මත මැරුණේ ඇයි?"

මෙම ප්‍රශ්නය "ඔව්" හෝ "නෑ" යන පිළිතුරු වලට වඩා යමක් බලාපොරොත්තු වෙයි. එය යේසුස්වහන්සේගේ මරණය පිළිබඳව වැඩිදුර සිතීමට ශිෂ්‍යයන්ව පොලොඹවයි. ඔවුන් පිළිතුරු රැසකින් ප්‍රතිචාර දැක්විය හැකිය.

  "දෙවියන්වහන්සේ උන්වහන්සේව මේ ලෝකයට එවීමේ අරමුණ එය නිසා"
  "මුළු ලෝකය උදෙසා වූ උන්වහන්සේගේ ප්‍රේමය නිසා"
  "මිනිසුන් පාපයෙන් ගලවා ගැනීමට"

“අපගේ ගැලවීම උදෙසා මෙන්ම අපගේ සුවය උදෙසා”
“මගේ පුද්ගලික පාපයන් නිසා”

මෙම සෑම පිළිතුරකටම යේසුස්වහන්සේගේ මරණය පිළිබඳව වැඩිදුර සාකච්ඡාවක් වෙත ගෙන යාමේ හැකියාව ඇත.

මෙම පරිච්ඡේදයේ “තවදුරටත් අධ්‍යයනය සඳහා” කොටස යේසුස්වහන්සේගේ ප්‍රශ්න පිළිබඳව තවදුරටත් ඉගෙන ගැනීමේ අවස්ථාව ඔබට සපයන අතර ඔබ එය ඉගැන්වීම තුල ප්‍රශ්න පාවිච්චි කරන ආකාරයද උගන්වයි.

## උපමා

උපමාවක් යනු, ආත්මික සත්‍යයන් පිළිඹිබු කිරීම සඳහා ස්වාභාවික ලෝකයෙන් ගන්නා උදාහරණයකි. “උපමාවක්” යන පදයේ නියම අර්ථය නම් “සැසඳීම සඳහා ළඟින් තැබීම යන්නයි”. උපමා තුල යේසුස්වහන්සේ ස්වාභාවික උදාහරණයක් යොදා ගත් අතර එය ආත්මික සත්‍යයක් සමඟ සැසඳූ සේක. උපමාවක් යනු ස්වර්ගික තේරුමක් සහිත ලෞකික කතාවකි.

යේසුස්වහන්සේ ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස නිරතුරුව උපමා යොදාගත් සේක :

> **ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කීසේක. (මාර්ක් 4:33)**

උපමා තේරුම් ගැනීම සඳහා විස්තර කර දිය යුතුය :

> **උපමාවක් නැතිව උන්වහන්සේ ඔවුන්ට කතා නොකළසේක. නමුත් උන්වහන්සේ තමන්ගේම ගෝලයන්ට සියල්ල රහසේ තෝරාදුන්සේක. (මාර්ක් 4:34)**

එක් අවස්ථාවකදී යේසුස්වහන්සේ උපමා වලින් උගන්වන්නේ ඇයිදැයි ගෝලයෝ යේසුස්වහන්සේගෙන් ඇසුවෝය. උන්වහන්සේ පිළිතුරු දෙමින් :

> **... ස්වර්ගරාජ්‍යයෙහි රහස් දැනගැනීම නුඹලාට දී තිබේ. නමුත් ඔවුන්ට දීලා නැත. (මතෙව් 13:11) (ලූක් 8:10 ද බලන්න)**

ආත්මික මනසක් ඇති මිනිසුන් ආත්මික උපමා තේරුම් ගනී. ලෞකික මනසක් ඇති අය තේරුම් නොගනී.

> **නමුත් පම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

ආත්මික මනසක් ඇති පුද්ගලයෙක් යනු ආත්මික ලෙස නැවත උපත ලැබූ අයෙකි. “නැවත ඉපදීම“ පිළිබඳ පැහැදිලි කිරීම සඳහා යොහන් 3 අධ්‍යයනය කරන්න.

යේසුස්වහන්සේ උපමා ඉගැන්වීමේදී අසන්නන්ට හුරු පුරුදු කරුණු සැළකිල්ලට ගත්තේය. ඔබ උගන්වන විටදී, ඔබට යේසුස්වහන්සේ ඉගැන්වූ උපමා යොදාගත හැකි අතර ඔබව අසන්නන්ට හුරු පුරුදු කරුණු වලින් නව උපමා නිර්මාණය කර ගැනීමටද හැකිය.

සංස්කෘතීන් වෙනස් බැවින්, උතුරු ඇමෙරිකාවේ පුද්ගලයන්ට තේරුම් ගත හැකි උපමාවක් ඕස්ට්‍රේලියාවේ, අප්‍රිකාවේ, ආසියාවේ, ලතින් ඇමරිකාවේ හෝ යුරෝපයේ පුද්ගලයන්ට තේරුම් ගත නොහැකි විය හැකිය. සෑම වෙනස් පුද්ගල කණ්ඩායමකටම ඔවුන්ගේම අත්දැකීම් හා සම්බන්ද උපමා තිබිය යුතුය. මෙම උපමා පිළිබඳ අතිරේක අධ්‍යයනය සඳහා මෙම පාඩමේ “තවදුරටත් අධ්‍යයනය සඳහා“ කොටස බලන්න.

## සිදුවීමක සවිස්තර වාර්තාව

උපමා සේම, සිදුවීමක සවිස්තර වාර්තාව යනු ද බයිබලීය සත්‍යයන් විස්තර කරන කතා වේ. නමුත් සිදුවීමක සවිස්තර වාර්තාව යනු සැබවින්ම සිදුවූ සත්‍ය කතාවකි. උදාහරණයක් ලෙස ලාසරස් සහ ධනවත් මිනිසා පිළිබඳ කතාව සැබෑ සිදුවීමකි. ලාසරස් සහ ධනවත් මිනිසා යන දෙදෙනාම සැබෑ මිනිසුන් විය.

යේසුස්වහන්සේ ඉගැන්වීම් සඳහා යොදාගත් සිදුවීමක සවිස්තර වාර්තාව ඔබට යොදා ගත හැකිය. යේසුස්වහන්සේ විසින් යොදාගත් සිදුවීම් වල සවිස්තර වාර්තා පිළිබඳ වැඩිදුර උදාහරණ සඳහා මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න. ඔබට නූතන සිදුවීම් වල වාර්තා යොදාගත හැකිය. ඔබේම ආත්මික අත්දැකීම් උදාහරණ ලෙස යොදා ගන්න. බයිබලීය සත්‍යයන් විස්තර කිරීම සඳහා නූතන ආත්මික නායකයන් පිළිබඳ සිදුවීම් යොදාගන්න.

## බයිබල් පාඨ භාවිතය

යේසුස්වහන්සේ සේවය කළ කාලය වන විට ලේඛනගත වී තිබුණේ පරණ ගිවිසුම පමණි. යේසුස් වහන්සේ පැරණි ගිවිසුම් බයිබල් පාඨයන් දැන සිටි අතර තම ඉගැන්වීම් තුළ බහුලව පාවිච්චි කළ සේක. මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස පෙරළා යේසුස්වහන්සේ යොදාගත් පරණ ගිවිසුමේ සමහර ප්‍රකාශන නැවත සළකා බලන්න.

ඔබගේ ඉගැන්වීම් තුළ දේව වචනය යොදා ගැනීම වැදගත් වේ. මක්නිසාද ආත්මික අරමුණු ළඟා කර ගැනීමේදී වඩාත්ම බලපාන්නේ උන්වහන්සේගේ වචනය.

> **මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය සිදු කොට, මා නියමකළ කාරණය සඵල කරනවා ඇත. (යෙසායා 55:11)**

## වෙනස පෙන්වීම

යේසුස්වහන්සේ ඉගැන්වීමේදී වෙනස පෙන්වන්නාවූ කාරනා රැසක් යොදා ගත් සේක. වෙනස පෙන්විය හැක්කේ කිසියම් දේවල් දෙකක් එකිනෙකට විරුද්ධ හෝ වෙනස් වන විටය. උදාහරණ ලෙස යේසුස්වහන්සේ තමන් උගන්වමින් සිටි සත්‍යයන් පැහැදිලි කිරීම සඳහා යහපත හා නපුර, ආලෝකය සහ අන්ධකාරය, ධනවත්කම හා ඳිළිදුකම යන ඒවායේ වෙනස පෙන්නුම් කළ සේක.

ආත්මික වෙනස් කම් ඉගැන්වීම සඳහා වෙනස පෙන්වන්නාවූ කාරනා යොදා ගත හැකිය. ඔබට වෙනස පෙන්වන්නාවූ කාරනා සඳහා නව උදාහරණ යොදා ගැනීමට හෝ යේසුස්වහන්සේ තම ශිෂ්‍යයන් සමග බෙදා ගත් දේ යොදාගැනීමට හැකිය. මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ ඇති යේසුස්වහන්සේ යොදාගත් වෙනස පෙන්වන්නාවූ කාරනා අධ්‍යයනය කරන්න.

## ගැටලු

යේසුස්වහන්සේ පාඩම් ඉගැන්වීමට එදිනෙදා ජීවිතයේ ගැටලු යොදාගත් සේක. සැබෑ කල්පනා කිරීම් හා ඉගෙන ගැනීම බොහෝවිට ගැටලුවකින් ආරම්භ වේ. උදාහරණයක් ලෙස, පව් කමාව ලබාදීමේ අයිතිය ඇත්තේ කාටද යන්න ලියන්නෙකුට ගැටලුවක් විය. (මාර්ක් 2:7)

> **උන්වහන්සේ සුංගම් අයකරන්නන් හා පව්කාරයන් සමග කනවා ඒ්වරුන්ගේ ලියන්නෝ දැක, උන්වහන්සේ සුංගම් අයකරන්නන්ද පව්කාරයන් සමග කනබොනසේකැයි උන්වහන්සේගේ ගෝලයන්ට කීවෝය. (මාර්ක් 2:16)**

යේසුස්වහන්සේ මෙම සෑම ගැටලුවක්ම ආත්මික සත්‍යයන් ඉගැන්වීම සඳහා යොදා ගත්සේක. ඉගැන්වීම් සඳහා ගැටලු යොදාගැනීම පිළිබඳ උදාහරණ සඳහා මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.

## අවස්ථාවන්

යේසුස්වහන්සේ පාඩම් ඉගැන්වීම සඳහා, ජීවිතයේ සුලභ සිද්ධීන් ගේ කොටසක් වන අවස්ථාවන් යොදා ගත් සේක. උන්වහන්සේ ජීවනදායක ජලය පිළිබඳ පාඩම ඉගැන්වීම සඳහා කාන්තාවක් ළිඳකින් ජලය ලබා ගැනීමට එන අවස්ථාව යොදාගත් සේක (යොහන් 4). පරිසිවරයෙකු සමඟ ආහාර ගනිමින් සිටි අවස්ථාවේදී යේසුස්වහන්සේව විවේචනය කළ විට, උන්වහන්සේ එම විවේචනය ණය කාරයන් දෙදෙනා පිළිබඳ උපමාව ඉගැන්වීමට අවස්ථාව කරගත් සේක (ලූක් 7:36-50).

ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස අවස්ථාවන් යොදා ගැනීම පිළිබඳ උදාහරණ සඳහා මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

යේසුස්වහන්සේ විසින් යොදාගත් පහත සඳහන් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව කෙටි සාරංශයක් ලියන්න.

2. දන්නා දෙයකින් නොදන්නා දෙයට :

3. සාමාන්‍ය දෙයින් විශේෂ දෙයට :

4. වස්තුවකින් පාඩම් කියාදීම :

5. ප්‍රශ්න සහ පිළිතුරු :

6. උපමා :

7. යමක් පිළිබඳ සවිස්තර වාර්තාව :

8. බයිබල් පාඨ භාවිතය :

9. වෙනස පෙන්වන්නාවූ කාරණා :

10. ගැටලු :

11. අවස්ථාවන් :

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

පහත ක්‍රියාකාරකම් මෙම පාඩම තුළ සාකච්ඡා කළ කරුණු පිළිබඳව වැඩිදුර අධ්‍යයනයක් සපයනු ඇත.

## දන්නා දෙයින් නොදන්නා දෙයට

යේසුස්වහන්සේ නොදන්නා දෙයක් ඉගැන්වීම සඳහා දන්නා දෙයක් යොදාගත් අවස්ථාවන් පිළිබඳව පහත සඳහන් පද අධ්‍යයනය කරන්න.

**මතෙව් :** 5:17-48; 12:3-8; 38-42; 16:5-12

**මාර්ක් :** 2:23-28; 7:9-13; 8:17-21; 10:17-20

**ලූක් :** 4:16-21; 6:3-5; 11:29-32 13:1-5; 15-16; 24:44-48

**යොහන් :** 3:14-15; 5:33-36; 46-47; 6:32-33; 7:21-24; 8:39-59; 10:34-38

## සාමාන්‍ය දෙයින් විශේෂ දෙයට

සාමාන්‍ය දෙයින් විශේෂ දෙයක් ඉගැන්වීම පිළිබඳ හොඳම උදාහරණයක් යොහන් 6:35 හි දැක් වේ. යේසුස්වහන්සේ කුරුසිය මත තම මරණය පිළිබඳ පිළිබඳ සාමාන්‍ය සංකල්පය පැහැදිලි කළ සේක. යොහන් 6:35-58 දක්වා උන්වහන්සේ විශේෂ කරුණු ඉදිරිපත් කළසේක. මතෙව් පොත තුළ, මතෙව් 9:43-45 දක්වා යේසුස්වහන්සේ තම මරණය පිළිබඳ සාමාන්‍ය තොරතුරු ඉදිරිපත් කළ නමුත් ගෝලයන්ට තේරුම් ගත නොහැකි විය. මතෙව් 18:31-34 දක්වා උන්වහන්සේ තවත් කරුණු ඉදිරිපත් කළ අතර අවසානයේදී මතෙව් 22:15-23 දක්වා උන්වහන්සේ ඉගැන්වීම අවසන් කළ විට ඔවුන්ට තේරුම් ගියහ.

යේසුස්වහන්සේ මෙම ක්‍රමය යොදා ගත්තේ කෙසේද? යන්න පිළිබඳව ඔබට වෙනත් උදාහරණ සොයාගත හැකිද.

## වස්තුවකින් පාඩම් කියාදීම

යේසුස්වහන්සේ ආත්මික සත්‍යයන් කියාදීම සඳහා වස්තුවක් හෝ සංකේතයක් යොදාගත් අවස්ථා පිළිබඳ පහත සටහන් අධ්‍යයනය කරන්න. යේසුස්වහන්සේ ඉගැන්වූ ආත්මික සත්‍යයන් හඳුනාගැනීම සඳහා වගුවක් පිළියෙල කරන්න. ඔබේ වගුව සඳහා යෙදිය යුතු මාතෘකා පහත පරිදි විය යුතුය:

| වස්තුව/සංකේතය | සටහන | උන්වහන්සේ ඉගැන්වූ සත්‍යය |
|---|---|---|

ඔබේ වගුව සම්පූර්ණ කිරීම සඳහා පහත සටහන් යොදාගන්න :

**මතෙව් :** මසුන් ඇල්ලීම 4:19; ලුණු 5:13; ආලෝකය 5:14-16; පක්ෂීන් 6:26; මානෙල් 6:28-33; රොඩ්ඩ සහ දැවය 7:1-5; දොරටු 7:13-14; වෘකයන් සහ බැටළුවන් 7:15; ඵල 7:16-20; ගෙවල් දෙක 7:24:27; සිවලුන් සහ පක්ෂීන් 8:20; වස්ත්‍ර සහ මුද්‍රික පානය 9:16-17; අස්වැන්න 9:37-38; වෘකයන් සහ බැටළුවන් 10:16; ගේ කුරුල්ලෝ 10:29-31; වියගහ 11:28-30; බීජ සහ පස් 13:1-43; නිධානය 13:44-52; මුතුඇට 13:45-46; දැළ 13:47-50; පැළෑටි 15:10-14; කාළගුණය 16:1-4; දරුවා 18:1-6; බැටළුවා 18:12-14; ඔටුවා සහ ඉඳිකටුව 19:23-26; අත්තික්කා ගස 21:18-22; ගල 21:42-44; මස්සක් (කාසියක්) 22:15-22; මදුරුවා සහ ඔටුවා 23:24; කුසලාන සහ තැටි 23:25-26; සොහොන් ගෙය 23:27; බැටළුවන් සහ එළුවන් 23:31-33; රොටි සහ මුද්‍රික පානය 26:26-29.

**මාර්ක් :** මසුන් 1:16-18; බීජ සහ පස් 4; රොටි සහ බල්ලන් 8:25-30; ලුණු 9:50; ළමයින් 10:13-16; ඔටුවා සහ ඉඳි කටුව 10:23-27; මස්ස (කාසිය) 12:13-17; රොටි සහ මුද්‍රික පානය 14:22-25.

**ලූක් :** මසුන් 5:9-10; වස්ත්‍ර සහ මුද්‍රික පානය දමන සම් භාජන 5:36-39; ගස් 6:43-45; ගෙවල් දෙක 6:48-49; පස් සහ බීජ 8; අස්වැන්න 10:2; බැටළු පැටවුන් සහ වෘකයන් 10:3; ආලෝකය 11:33-36; 11:39-40; තැටි සහ කුසලාන, සොහොන් ගෙවල් 11:44; ගේ කුරුල්ලන් 12:6-7; කපුටුවන් 12:22-24; මානෙල් 12:27-31; කාලගුණය 12:54-57; අබ 13:17-19; මුහුන්13:20-21; යුද්ධ සහ කොත් 14:26-33; ලුණු 14:34-35; බැටළුවා 15:1-7; රිදී මිල 15:8-10; අබ ඇට 17:6; දරුවා 18:16-17; ගල 20:17-18; මස්ස (කාසිය) 20:20-26; රොටි සහ මිදි යුෂ 22:19-22; අත්තික්කා ගස 21:29-33.

**යොහන් :** සුළඟ 3:8; ජලය 4:13-14,7:37-38; අස්වැන්න නෙලීම 4:35; ආලෝකය 8:12,9:5; 12:46; එඬේරා 10; ගෝධුම බීජය 12:23-24; පවිත්‍ර කිරීම සහ අතු 15; වදන වේදනාවෙන් සිටින ස්ත්‍රිය 16:19-21; බැටළුවන් පෝෂණය කිරීම 21:15-17; පාද සේදීම 13:1-17.

## ප්‍රශ්න සහ පිළිතුරු

යේසුස්වහන්සේ ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස ප්‍රශ්න සහ පිළිතුරු යොදා ගත් අවස්ථා පිළිබඳව පහත සටහන් අධ්‍යයනය කරන්න:

**මතෙව්:** 5:13,46,47; 6:25-31; 7:3,4,9-11,16,22; 8:26; 9:4,5,15,28; 10:25;29: 11:7-9,16; 12:4,5,11,12,26,27,29,34,48; 13:27,28,51: 14:31; 15:13,16,17,34; 16:3,8-11,13,15,26; 17:17,25; 18:12,33: 19:5,17; 20:6,13,15,21,22,32; 21:16,25,28,31,40,42; 22:12,18,22,31,32,42-45; 23:17,19,33; 24:2,45; 25:37-39,44; 26:10,40,50,53-55; 27:46

**මාර්ක් :** 2:8,9,19,25,26; 3:4,23,33; 4:13,21,30,40; 5:30,39; 6:38; 7:18,19; 8:5,12,17-21,27,29,36,37; 9:16,19,21,33,50; 10:3,18,36,38,51; 11:3,17,30: 12:9-11,15,16,24,26,35,37; 13:2: 14:6,14,37,48; 15:34

**ලූක් :** 2:49; 5:22,23 ;6:4,9,32-34,39,41,42,46; 7:24-26,31,42,44: 8:25,30,44; 9:18,20,25,41; 10:26,36; 11:5; 6:11-13,18,19,40; 12:6,14,17,20,24-26,28,42,49,51,56,57; 13:2,4,7,15,16,18,20; 14:3,5,28,31,34; 15:4,8; 16:2,3,5,7,11,12; 17:7-9,17; 18:7,8,19,41; 19:31; 20:3,4,13,15,17,23,24:41,44; 22:11,27,35,46,48,52;
23:31; 24:17,19,26,38,41

**යොහන් :** 1:38,50; 2:4 ;3:10,12; 5:6,44,47; 6:5,61,62,67,70; 7:19,23; 8:10,43,46; 9:35; 10:32,34,36; 11:9,26,34,40; 12:27;13:12,38;14:9,10;16:5,19,31,18:4,7,11,23,34;20:15;21:5,15-17,22,23

## උපමා

| විෂය | බයිබල් පාඨ |
|---|---|
| රොඩ්ඩ සහ දැවය | ලූක් 6:37-43 |
| අත්තිවාරම් දෙක | මතෙව් 7:24-27; ලූක් 6:47-49 |
| වෙළඳාම් පොළේ සිටින දරුවන් | මතෙව් 11:16; ලූක් 7:32 |
| ණයකාරයන් දෙදෙනා | ලූක් 7:41 |
| අශුද්ධ ආත්මය | මතෙව් 12:43-45; ලූක් 11:24-26 |
| පොහොසත් මෝඩයා | ලූක් 12:16 |
| ඵලනැති අත්තික්කා ගස | ලූක් 13:6-9 |
| වපුරන්නා | මතෙව් 13:3-8; මාර්ක් 4:3-8; ලූක් 8:5-8 |
| කිරිඳි | මතෙව් 13:24-30 |
| බීජය | මාර්ක් 4:26 |
| අබ ඇටය | මතෙව් 13:31,32; මාර්ක් 4:31,32; ලූක් 13:19 |

| | |
|---|---|
| මුහුන් | මතෙව් 13:33; ලූක් 13:21 |
| පහන | මතෙව් 5:15; මාර්ක් 4:21; ලූක් 8:16; 11:33 |
| දැල | මතෙව් 13:47,48 |
| සැඟවුණු වස්තුව. | මතෙව් 13:44 |
| ඉතා අනර්ඝ වූ මුතු ඇටය | මතෙව් 13:45,46 |
| ගෙදර ස්වාමියා | මතෙව් 13:52 |
| විවාහ මංගල්‍යය. | මතෙව් 9:15; මාර්ක් 2:19,20;ලූක් 5:34,35. |
| පරණ වස්ත්‍රය. | මතෙව් 9:16; මාර්ක් 2:21; ලූක් 5:36. |
| මුද්‍රික පානය දමන භාජන. | මතෙව් 9:17; මාර්ක් 2:22; ලූක් 5:37. |
| අස්වැන්න. | මතෙව් 9:37; ලූක් 10:2. |
| විරුද්ධකාරයා. | මතෙව් 5:25; ලූක් 12:58. |
| ණය ගෙවිය නොහැකි වූ ණයකාරයන් දෙදෙනා. | මතෙව් 18:23-35. |
| යහපත් සමාරිතයා. | ලූක් 10:30-37. |
| රොටි 3. | ලූක් 11:5-8. |
| සැබෑ එඬේරා. | යොහන් 10:1-16. |
| පටු දොරටුව. | මතෙව් 7:14; ලූක් 13:24. |
| ආගන්තුකයා. | ලූක් 14:7-11. |
| මංගල්‍ය කෑම. | මතෙව් 22:2-9; ලූක් 14:16-23. |
| මංගල්‍ය වස්ත්‍රය. | මතෙව් 22:10-14. |
| කොත. | ලූක් 14:28-30. |
| යුද්ධය සඳහා යන රජු. | ලූක් 14:31. |
| නැතිවූ බැටළුවා. | මතෙව් 18:12,13; ලූක් 15:4-7. |
| නැති වූ රිදී කාසිය. | ලූක් 15:8,9. |
| අකීකරු පුත්‍රයා. | ලූක් 15:11-32. |
| අධර්මිෂ්ඨ ගබඩා කාරයා. | ලූක් 16:1-9. |
| නිතර කන්නලව් කරාවූ වැන්දඹුව. | ලූක් 18:2-5. |
| පරිසියා හා ආදායම් අයකරන්නා. | ලූක් 18:10-14. |
| දාසයාගේ කාර්යය | ලූක් 17:7-10. |
| මිදි වත්තේ සේවකයෝ. | මතෙව් 20:1-16. |
| තලෙන්ත. | මතෙව් 25:14-30; ලූක් 19:11-27 |
| පුත්‍රයන් දෙදෙනා. | මතෙව් 21:28. |
| නපුරු ගොවීන්. | මතෙව් 21:33-43; මාර්ක් 12:1-9; ලූක් 20:9-16. |
| අත්තික්කා ගස. | මතෙව් 24:32; ලූක් 21:29,30. මාර්ක් 13:28. |
| සූදානම්ව සිටි ගෙයි ස්වාමියා. | මතෙව් 24:43; ලූක් 12:39. |
| දුරගමනක් යන මිනිසෙක්. | මාර්ක් 13:34. |
| සේවකයන් දෙදෙනාගේ චරිතය. | මතෙව් 24:45-51; ලූක් 12:42-46. |
| කන්‍යාවන් දසදෙනා. | මතෙව් 25:1-12. |
| සූදනම්ව සිටි සේවකයන්. | ලූක් 12:36-38. |
| මිදිවැල සහ එහි අතු. | යොහන් 15:1-6. |

දැන් නූතන උපමා කීපයක් නිර්මාණය කරන්න :

1. ඔබට ඉගැන්වීමට අවශ්‍ය බයිබලීය සත්‍යයක් හෝ ඔබ කැමති පාඩමක් තෝරා ගන්න.

2. අසන්නාට තේරුම් ගත හැකි අවස්ථාවන්, තත්වයන් හෝ උදාහරණ පිළිබඳව සිතන්න.

3. එම උදාහරණ යොදාගනිමින් ඔබට ඉගැන්වීමට අවශ්‍ය බයිබල් සත්‍යයන් පැහැදිලි කරන්න. උපමාවක් (කතාවක්) නිර්මාණය කරන්න.

මතක තබාගන්න : උපමාව ඉගැන්වීමට අවශ්‍ය සත්‍ය පැහැදිලි කළ යුතුය. කතාවක් කීමට ඇති අවශ්‍යතාවය හේතුවෙන් කියන කතාවකින් බලපෑමක් ඇතිනොවේ. එය දේව වචනයට සම්බන්ධ විය යුතු හෝ පැහැදිලි කළ යුතුයි.

## සිදුවීමක සවිස්තර වාර්තාව

පහත පෙන්නුම් කරන සිදුවීම් වල සවිස්තර වාර්තා අධ්‍යයනය කරන්න. යේසුස්වහන්සේ ඉගැන්වීම් තුළ ඔබට මෙයට අමතරව තවත් ඒවා සෙවිය හැකිද?

| සිදුවීමක සවිස්තර වාර්තාව | බයිබල් පාඨ |
|---|---|
| යොහන් බෞතිස්ත. | මතෙව් 11:7-19; ලූක් 7:24-25. |
| ලාසරස් සහ පොහොසත් මිනිසා. | ලූක් 16:19-31. |

දැන් ඔබම සිදුවීමක සවිස්තර වාර්තාවක් නිර්මාණය කරන්න. බයිබලිය සත්‍යයක් පැහැදිලි කරන්නා වූ සැබෑවටම සිදුවූ සිදුවීමක් පිළිබඳව සිතන්න. උදාහරනයක් ලෙස හදිස්සියේ මරණයට පත්වීමට ප්‍රථම යේසුස්වහන්සේව අදහාගත් කිසිවෙකු ගැන ඔබ දන්නවාද? ඔබට එම සිදුවීම "ගැළවීමේ දවස අදයි" යන පණිවුඩය පහැදිලි කිරීමට යොදාගත හැකිය.

බයිබල් සත්‍යයන් පැහැදිලි කරන ඔබේ පෞද්ගලික අත්දැකීම් මොනවාද? ඔබේම පෞද්ගලික "සිදුවීම් වල සවිස්තර වාර්තාවක්" (පෞද්ගලික සාක්ෂි) යොදාගන්න. සිදුවීම් වල සවිස්තර වාර්තාවක් ලෙස නූතන ලෝකයේ සිටින ආත්මික නායකයන්ගේ ජීවිත යොදාගන්න. ඔවුන්ගේ ජීවිත දේව වචනයේ සත්‍යයන් පෙන්නුම් කරන්නේ කෙසේද?

## බයිබල් පාඨ භාවිතය.

යේසුස්වහන්සේ තම ඉගැන්වීම් තුළ බයිබල් පාඨ භාවිතා කළ අවස්ථාවන් පිළිබඳව පහත සටහන් අධ්‍යයනය කරන්න.

| නව ගිවිසුමේ අවස්ථාව | පරණ ගිවිසුම් යොදාගත් නි¾දේශය |
|---|---|
| මතෙව් 4:4 | ද්විතිය කතාව 8:3 |
| මතෙව් 4:7 | ද්විතිය කථාව 6:16 |
| මතෙව් 4:10 | ද්විතිය කතාව 6:13 |
| මතෙව් 5:21 | නික්මයාම 20:13; ද්විතිය කතාව 5:17 |
| මතෙව් 5:27 | නික්මයාම 20:14; ද්විතිය කතාව 5:18. |
| මතෙව් 5:31 | ද්විතිය කතාව 24:1,3 |
| මතෙව් 5:33 | ලෙවිකතාව 19:12; ගණන් කතාව 30:2; ද්විතිය කතාව 23:21 |
| මතෙව් 5:38 | නික්මයාම 21:24; ලෙවි කතාව 24:20; ද්විතිය කතාව 19:21 |
| මතෙව් 5:43 | ලෙවි කතාව 19:18 |
| මතෙව් 9:13,12:7 | හොෂෙයා 6:6 |
| මතෙව් 11:10 | මලාකි 3:1 |
| මතෙව් 13:14,15 | යෙසායා 6:9,10 |
| මතෙව් 15:4 | නික්මයාම 20:12; ද්විතිය කතාව 5:16 |
| මතෙව් 15:4 | නික්මයාම 21:17; ලෙවි කතාව 20:9 |
| මතෙව් 15:8,9 | යෙසායා 29:13 |
| මතෙව් 19:4 | උප්පත්ති 1:27,5:2 |
| මතෙව් 19:5 | උප්පත්ති 2:24 |
| මතෙව් 19:18,19 | නික්මයාම 20:12-16; ද්විතිය කතාව 5:16-20. |

| | |
|---|---|
| මතෙව් 21:16 | ගීතාවලිය 8:2 |
| මතෙව් 21:42 | ගීතාවලිය 118:22. |
| මතෙව් 21:13 | යෙසායා 56:7; යෙරමියා 7:11 |
| මතෙව් 22:32 | නික්මයාම 3:6 |
| මතෙව් 22:37 | ද්විතිය කතාව 6:5 |
| මතෙව් 22:39 | ලෙවි කතාව 19:18 |
| මතෙව් 22:44 | ගීතාවලිය 110:1 |
| මතෙව් 26:31 | සෙකරියා 13:7 |
| මතෙව් 27:46 | ගීතාවලිය 22:1. |
| ලූක් 22:37 | යෙසායා 53:12 |
| ලූක් 23:46 | ගීතාවලිය 31:5 |
| ලූක් 4:18 | යෙසායා 61:1,2 |
| යොහන් 10:34 | ගීතාවලිය 82:6 |
| යොහන් 13:18 | ගීතාවලිය 41:9 |
| යොහන් 15:25 | ගීතාවලිය 35:19,69:4 |

## වෙනස පෙන්වීම

යේසුස්වහන්සේ තම ඉගැන්වීම් සඳහා වෙනස පෙන්වීමට යොදාගත් අවස්ථා පිළිබඳව පහත සටහන් අධ්‍යයනය කරන්න.

### මතෙව් :

5 වන පරිච්ඡේදයේ සිට 7 වන පරිච්ඡේදය දක්වා කන්ද උඩ දේශනාව තුළ වෙනස පෙන්නුම් කිරීම් රැසක් යොදා ගෙන ඇත.

| | |
|---|---|
| 9:12 | නිරෝගීන්/ලෙඩුන් |
| 9:13 | ධර්මිෂ්ඨයන්/පව්කාරයන් |
| 9:16 | පැරණි වස්ත්‍ර/නව වස්ත්‍ර |
| 9:17 | පැරණි මිදි යුෂ/අලුත් මිදියුෂ |
| 10:26 | වැසී ඇති දේ/එළිදරව් කළ දේ. |
| 10:27 | අන්ධකාරය/ආලෝකය |
| 10:28 | ශරීරය/ආත්මය |
| 10:32-33 | පිළිගැනීම/ප්‍රතික්ෂේප කිරීම. |
| 10:34 | සමාදානය/කඩුව. |
| 12:33 | යහපත් ගස/නරක ගස. |
| 12:35 | යහපත් මනුෂ්‍යයා/නපුරු මනුෂ්‍යයා. |
| 12:37 | නිදොස් කරනු ලබන වචන/වරදට පත්කරනු ලබන වචන. |
| 13:12 | ඇති අය/නැති අය. |
| 13:13 | අසන හා දකින අය/නොඇසෙන හා නොපෙනෙන අය. |
| 13:30 | තිරිඟු/කිරිඳි : හොඳ/නරක පස්. |
| 13:47-50 | හොඳ/නරක්වූ මාළුන් : දුෂ්ඨයන්/ධර්මිෂ්ඨයන්. |
| 15:25 | ජීවිතය ගළවා ගැනීම/නැතිකර ගැනීම. |
| 18:23-35 | සමාව ලැබූ අය/නොලැබූ අය. |
| 16:19-18:18 | බැඳ තැබීම/නිදහස් කිරීම |
| 19:30 | ප්‍රථමයා/අන්තිමයා. |
| 20:16 | කැඳවනු ලැබූවන්/තෝරාගනු ලැබූවන්. |
| 20:25-28 | ප්‍රධානියා/දාසයා. |
| 21:28-30 | වැඩ කළ පුත්‍රයා/ වැඩ නොකළ පුත්‍රයා. |
| 21:42 | එපා කළ ගල/කොනේ ප්‍රධාන ගල. |
| 23:11 | ඉතා උත්තම සේවකයාය. |
| 23:12 | උසස්කර ගැනීම/පහත් කරනු ලැබීම. |
| 23:24 | මදුරුවා/ඔටුවා. |
| 23:25-28 | තැටියේ පිට පැත්ත සහ ඇතුළු පැත්ත. |

| | |
|---|---|
| 24:40-41 | ගනු ලබන කෙනා සහ අත්හරිනු ලබන කෙනා. |
| 25:1-4 | නැණවත් කන්‍යාවන්/අනුවණ කන්‍යාවන්. |
| 25:29 | ඇති තැනැත්තා දීම/නැති තැනැත්තාගෙන් ඇතිදේත් ගැනීම. |

## මාර්ක් :

| | |
|---|---|
| 2:17 | නිරෝගීන්/රෝගීන් : ධර්මිෂ්ඨයන්/පව්කාරයන්. |
| 2:19-20 | නිරාහාරව සිටින්නන්/නිරාහාරව නොසිටින්නන්. |
| 2:21 | පැරණි වස්ත්‍ර/නව වස්ත්‍ර. |
| 2:22 | පැරණි මුද්‍රික පානය/අලුත් මුද්‍රික පානය. |
| 2:27 | මනුෂ්‍යයන් උදෙසා සබත/සබත උදෙසා මනුෂ්‍යයන්. |
| 3:4 | සබත් දවසේදී යහපත හෝ නපුර කිරීම. |
| 4:4 | යහපත් බිම/පුරන් වූ බිම. |
| 4:12 | දැකීම සහ ඇසීම/නොපෙනීම හා නොඇසීම. |
| 4:22 | වැසුණු දේ/එළිදරව් වූ දේ. |
| 4:25 | ඇති තැනැත්තාට දීම/නැති තැනැත්තාගෙන් ඇති දේත් ගැනීම. |
| 4:31-32 | කුඩාම බීජය/විශාලම ශාකය. |
| 4:40 | භය/ඇදහිල්ල. |
| 7:6-13 | ධර්මය/සම්ප්‍රදායන්. |
| 7:14-15 | ඇතුළත/පිටත. |
| 8:33 | දෙවියන්වහන්සේගේ දේවල්/ මනුෂ්‍යයන් ගේ දේවල් |
| 8:35 | ජීවිතය ගළවා ගැනීම/ජීවිතය නැතිකර ගැනීම. |
| 9:40 | අපට විරුද්ධ අය/අපේ පක්ෂයට සිටින අය. |
| 9:50 | හොඳ ලුණු/නරක ලුණු |
| 10:43-44 | උතුම් තැනැත්තා/පහත් තැනැත්තා, ප්‍රධානියා දාසයා වේ. |
| 11:27-33 | යොහන්ගේ බෞතිස්මය ස්වර්ගයෙන්ද නොහොත් මනුෂ්‍යයන්ගෙන්ද? |
| 12:17 | කායිසර්/දෙවියන්වහන්සේ. |
| 12:27 | මළවුන්ගේ දෙවියන්වහන්සේ/ ජීවතුන්ගේ දෙවියන්වහන්සේ. |
| 12:44 | වැඩිමනත් දෙයින් දීම/හිඟකමෙන් රක්ෂාවීමට ඇති දේ දීම. |
| 14:38 | ආත්මය/මාංශය. |

## ලූක් :

| | |
|---|---|
| 5:31 | නිරෝගීන්/රෝගීන්. |
| 5:32 | ධර්මිෂ්ඨයන්/අධර්මිෂ්ඨයන්. |
| 5:36 | අළුත් වස්ත්‍ර/පැරණි වස්ත්‍ර. |
| 5:37-38 | අළුත් මුද්‍රික පානය/පැරණි මුද්‍රික පානය. |
| 6 වන පරිච්ඡේදය | මෙම පරිච්ඡේදයේ එකිනෙකට වෙනස පෙන්වා දෙන කරුණු රැසක් ඇත. |
| 7:20-21 | යොහන් බෞතිස්ත/ යේසුස්වහන්සේ. |
| 7:47 | බොහෝකොට ප්‍රේම කිරීම./ ස්වල්පකොට ප්‍රේම කිරීම. |
| 8:17-18 | රහස/ප්‍රකාශ කිරීම, ඇති තැනැත්තා /නැති තැනැත්තා. |
| 9:24 | ජීවිතය ගළවා ගැනීම/ජීවිතය නැතිකර ගැනීම. |
| 9:48 | ඉතා කුඩා අය/උතුම් අය. |
| 9:56 | විනාශ කිරීම/බේරා ගැනීම. |
| 10 වන පරිච්ඡේදය. | ඔබව පිළිගන්නා/ නොපිළිගන්නා නගර වලදී ක්‍රියා කරන අන්දම. |
| 11:23 | උන්වහන්සේ සමඟ සිටීම/ උන්වහන්සේට විරුද්ධ වීම. |
| 11:34 | යහපත් ඇස/නරකව තිබෙන ඇස. |
| 11:35 | ආලෝකය/අන්ධකාරය. |
| 11:39 | පිටතින් පිරිසිදුව සිටීම/ඇතුලතින් එසේ නොවීම. |
| 12:2-3 | වැසුනු දේ/එළිදරව් වූ දේ. |

| | |
|---|---|
| 12:8-9 | පිළිගැනීම/ නොපිළිගැනීම |
| 12:47-48 | බොහෝ පහර ලැබීම/ස්වල්පයක් පහර ලැබීම. |
| 12:51 | සමාදානය/භේද ඉපදවීම. |
| 13:9 | යහපත් ඵල/අයහපත් ඵල. |
| 13:30 | අන්තිමයා/ප්‍රථමයා. |
| 14:8-11 | උසස් කරනු ලැබීම/පහත් කරනු ලැබීම. |
| 14:12-14 | ධනවත් අය/දිළිඳු අය. |
| 14:30 | පටන් ගන්නා නමුත් අවසාන නොකරයි. |
| 14:34-35 | ලුණු/ලුණු රස නොමැති ලුණු. |
| 15:4-10 | නැතිවීම/සම්භවීම. |
| 15:11-32 | යහපත් පුත්‍රයා/අයහපත් පුත්‍රයා. |
| 16:10-12 | කුඩා දෙයට විශ්වාසවන්ත වීම/විශාල දෙයට විශ්වාසවන්ත වීම. |
| 16:13 | ස්වාමිවරුන් දෙදෙනා. |
| 16:15 | දෙවියන්වහන්සේ ඉදිරියේ නොව මනුෂ්‍යයන් ඉදිරියේ උතුම් කොට සැළකීම. |
| 16:19-20 | ධනවත් මිනිසා/දිළිඳු මිනිසා. |
| 17:33 | ජීවිතය ලබා ගැනීමට සෙවීම/ජීවිතය නැති කර ගැනීම. |
| 17:34-36 | ගනු ලැබූ තැනැත්තා/අත්හරිනු ලැබූ තැනැත්තා. |
| 18:10-14 | යාච්ඤා කරමින් සිටි තැනැත්තන් දෙදෙනකු සැසඳීම. |
| 19:12-27 | තම හැකියාවන් පාවිච්චි කර මිනිසුන් සැසඳීම. |
| 19:46 | යාච්ඤා ගෘහය/සොරුන්ගේ ගුහාව. |
| 20:17-18 | එපා කළ ගල/කොණෙහි ප්‍රධාන ගල |
| 20:38 | මළවුන්ගේ දෙවියන්වහන්සේ/ජීවතුන්ගේ දෙවියන්වහන්සේ. |
| 21:1-4 | දිළිඳු අයගේ/පෝසතුන්ගේ පඬුරු. |
| 22:25-30 | උත්තමයා/බාලයා. |
| 23:31 | අමුගස/වියළි ගස. |

**යොහන් :**

| | |
|---|---|
| 3:6 | මාංසයෙන් උපදින දේ/ආත්මයෙන් උපදින දේ. |
| 3:12 | පොළවේ දේ/ස්වර්ගික දේ. |
| 3:17 | විනිශ්චය කිරීමට නොව/ගැළවීමට. |
| 3:19-21 | ආලෝකය/අන්ධකාරය. |
| 4:13-14 | ජීවනයේ ජලය/ස්වාභාවික ජලය. |
| 5:24 | මරණය කෙරෙන් ජීවනයට. |
| 5:29 | ජීවනය/විනිශ්චයේ නැවත නැඟිටීම. |
| 6:32-33 | මෝසස්ගේ කෑම/දෙවියන්වහන්සේගේ කෑම. |
| 6:63 | ආත්මය/මාංශය. |
| 7:18 | අපගේ ගෞරවය/තැනන්වහන්සේගේ ගෞරවය. |
| 7:24 | විනිශ්චයන් දෙක. |
| 8:12 | ආලෝකය/අන්ධකාරය. |
| 8:23 | මේ ලෝකයෙන් වන දේ/මේ ලෝකයෙන් නොවන දේ. |
| 8:35 | වහලා/පුත්‍රයා. |
| 8:47 | ඇසීම/නොඇසීම. |
| 9:39 | අන්ධවීම/පෙනීම. |
| 10:1-18 | යහපත් එඬේරා/සොරා. |
| 10:25-29 | මගේ බැටළුවන්/අනෙක් බැටළුවන්. |
| 10:37-38 | ක්‍රියා කරන්නා/නොකරන්නා. |
| 12:24-35 | ජීවිතය ගළවා ගැනීම/ජීවිතය නැති කර ගැනීම. |
| 12:35-36,46 | ආලෝකය/අන්ධකාරය. |
| 12:47 | විනිශ්චය කිරීම/ගළවා ගැනීම. |
| 13:16 | දාසයා/ස්වාමියා. |
| 14:12 | ක්‍රියා/මහත් ක්‍රියා. |
| 14:23-24 | වචනය රක්ෂා කිරීම/ නොකිරීම. |

| | |
|---|---|
| 14:27 | දෙවියන්වහන්සේගේ සමාදානය/ලෝකයේ සමාදානය. |
| 15:2 | ඵලදරන මිදිවැල/ඵලනොදරන මිදි වැල. |
| 15:15 | සේවකයන්/මිත්‍රයන්. |
| 15:19 | ලෝකයට අයත් දේ/ලෝකයේ නොවන දේ. |
| 16:20-22 | ශෝකය ප්‍රීතියට හැරීම. |
| 20:27 | අවිශ්වාස කරන්නා/විශ්වාස කරන්නා. |
| 20:29 | දුටු සහ විශ්වාස කල අය/නොදුටු අය. |
| 21:18 | ප්‍රේතෲස්ගේ තරුණ විය සහ මහළු විය සංසන්දනය කිරීම. |

# ගැටලු

යේසුස්වහන්සේ තම ඉගැන්වීම තුළදී ගැටලු යොදාගන ඉගැන්වූ අවස්ථා පිළිබඳව පහත සඳහන් සටහන් අධ්‍යයනය කරන්න.

| **පුද්ගලයන්** | **ඔවුන්ගේ ගැටලු** |
|---|---|
| ලියන්නන් (මාර්ක් 2:7) | පව්කමාව ලබාදිය හැක්කේ කාටද? |
| ලියන්නන් හා ඵරිසිවරු (මාර්ක් 2:16) | සුංගම් අයකරන්නන් හා පව්කාරයන් සමඟ යේසුස්වහන්සේගේ ඇසුර |
| “ඔවුන්” (මාර්ක් 2:18) | ගෝලයන් උපවාස නොකරන්නේ ඇයි. |
| ඵරිසිවරු (මාර්ක් 2:24) | සබත් දිනයේ පිළිවෙත්. |
| ලියන්නන් (මාර්ක් 3:22) | යේසුස්වහන්සේ යක්ෂ ආත්ම දුරු කරන්නේ කෙසේද? |
| උන්වහන්සේගේම ගම් වැසියන් (මාර්ක් 6:2,3) | යේසුස්වහන්සේගේ බලයේ මූලය. |
| ලියන්නන් සහ පරිසිවරු (මාර්ක් 7:5) | ගෝලයන් සාම්ප්‍රදායික පිළිවෙත් නොපවත්වන්නේ ඇයි. |
| පරිසිවරු (මාර්ක් 8:11) | ඔවුන්ට සලකුණක් අවශ්‍ය විය. |
| පේත්‍රුස්,යාකොබ්,යොහන් (මාර්ක් 9:11) | එළියාගේ පැමිණීම. |
| ගෝලයන් (මාර්ක් 9:34) | “උත්තමයා කවුද?” |
| යොහන් සහ අනෙක් අය (මාර්ක් 9:38) | අනෙක් සේවකයන්ගේ ක්‍රියා ඉවසීම. |
| පරිසිවරු (මාර්ක් 10:2) | දික්කසාදය. |
| පොහොසත් තරුණ මුලාදෑනියා (මාර්ක් 10:17) | සදාකාලික ජීවනය උරුමකර ගැනීම. |
| යාකොබ් සහ යොහන් (මාර්ක් 10:37) | උන්වහන්සේගේ දකුණු පස හා වම්පස හිඳ ගැනීම. |
| උත්තම පූජකයා,ලියන්නන් සහ වැඩිමහල්ලන් (මාර්ක් 11:28) | යේසුස්වහන්සේගේ ආධිපත්‍ය. |
| පරිසිවරු සහ හෙරෝඩිවරු (මාර්ක් 12:14) | කායිසර්ට ආදායම් දීම. |
| සද්දුසිවරු (මාර්ක් 12:23) | නැවත නැඟිටීම. |

| | |
|---|---|
| ලියන්නෙක් (මාර්ක් 12:29) | ප්‍රධාන ආඥාව. |
| පේත්‍රුස්,යාකොබ්,යොහන් සහ ඇන්ඩෲ (මාර්ක් 13:4) | "ඒ දේ කොයිකාලයකදී සිද්ධ වන්නේද?" |
| සිමොන්ගේ නිවසේ රාත්‍රි භෝජනයට සහභාගි වූ සමහරුන් (මාර්ක් 14:4) | සුවඳ තෙල් නාස්ති කිරීම. |
| උත්තම පූජකයා (මාර්ක් 14:61) | යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ කියා කිවේද. |

## අවස්ථාවන්

යේසුස්වහන්සේ පාඩම් ඉගැන්වීම සඳහා යේසුස්වහන්සේ යොදාගත් ජිවිතයේ අවස්ථා අධ්‍යයනය කරන්න.

| අවස්ථාව | යොදාගැනිම | බයිබල් පාඨ |
|---|---|---|
| දේව මාලිගාවේදී වෙළඳුන් හමුවීම. | දේවමාලිගාව පවිත්‍ර කිරීම. | මතෙව් 21:12-13.<br>මාර්ක් 11:15-17 |
| නිකදේමුස් උන්වහන්සේ වෙත පැමිණීම. | නව උපත ඉගැන්වීම. | යොහන් 3:1-21. |
| සමාරිය කාන්තාවක් මුණගැසීම. | ජිවිතයක් වෙනස් කිරීම. | යොහන් 4:1-42. |
| උන්වහන්සේ වෙතට කුෂ්ඨ රෝගියෙකු පැමිණීම. | ශරීරය පිරිසිදු කිරීම. | මතෙව් 8:1-4<br>මාර්ක් 1:40-45<br>ලූක් 5:12-14. |
| අංශභාග රෝගියෙකු ගෙන ඒම. | ආත්මික සහ ශාරීරික සුවය. | මතෙව් 8:5-13;<br>ලූක් 7:1:10 |
| උන්වහන්සේ බෙත්සයිදාවේ පොකුණ අසල නිදා සිටි මිනිසා දුටු සේක. | ශාරීරික සුවය. | යොහාන් 5:1-9. |
| ගෝලයන් සබත් දවසේදී කරල් ගැසීම පිළිබඳව පරිසිවරුන් කෙඳිරීම. | මිනිසා සහ සබත් දවස අතර සැබෑ සම්බන්දතාව ඉගැන්වීම. | මතෙව් 12:1-8<br>මාර්ක් 2:23-28;<br>ලූක් 6:1-5. |
| "මහත් ජන සමූහයා දැකීම." | කන්ද උඩ දේශනාව. | මතෙව් 5 සිට 7දක්වා. |
| ඵරිසියෙකු වූ සිමොන් සමඟ ආහාර ගැනීම. | ණයකාරයන් දෙදෙනා. | ලූක් 7:41. |
| උන්වහන්සේගේ මෑණියන් සහ සහෝදරයන් පැමිණීම. | ආත්මික ඥාතීත්වයේ ලෝකෝත්තර බව ඉගැන්වීම. | මතෙව් 12:46-50;<br>මාර්ක් 3:31-35;<br>ලූක් 8:19-21. |
| "උන්වහන්සේ ඔවුන්ට උපමා වලින් කතා කරන්නේ මන්ද?" යැයි ගෝලයෝ ප්‍රශ්න කිරීම. | රාජ්‍යයේ රහස් ගැන සැළකිලිමත් වීම පිළිබඳව ඉගැන්වීම. | මතෙව් 13:10-17. |
| කිරිඳි උපමාව තෝරා දෙන ලෙස ගෝලයන් ඉල්ලීම. | නපුරේ පුත්‍රයන් ගැන සැලකිලිමත්වීමට | මතෙව් 13:36-43. |

| | | |
|---|---|---|
| | ඉගැන්වීම. | |
| “නුඹලාගේ ආචාරීන්වහන්සේ සුංගම් අයකරන්නන්ද පව්කාරයන්ද සමඟ කන්නේ මක්නිසාද?” | නිරෝගීන් සහ රෝගීන් ගැන සැලකිලිමත් වීමට ඉගැන්වීම. | මතෙව් 9:10-13. |

# හත්වන පරිච්ඡේදය

## ඉගැන්වීමේ ආධාරක

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්:

- "ඉගැන්වීමේ ආධාරක" යන්න අර්ථ දැක්වීම,
- ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක යනු මොනවාදැයි පැහැදිලි කිරීමට
- ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක වල වැදගත්කම පැහැදිලි කිරීමට
- ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක නිර්මාණය කිරීමට
- ඉගැන්වීම් ආධාරක වල වටිනාකම විශ්ලේෂණය කිරීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පද :**

> **උන්වහන්සේ කුඩා දරුවෙකු ගෙන ඔවුන් මැද සිටුවා, ඔහු වඩාගෙන, මෙබඳු කුඩා දරුවන්ගෙන් එක්කෙනෙකු මාගේ නාමයෙන් පිළිගන්නාවූ කවරෙක් නුමුත් මා පිළිගන්නේය. මා පිළිගන්න කවරෙක් නුමුත් මා පිළිගන්නවා නොව මා එවූ තැනන්වහන්සේ පිළිගන්නේ යයි ඔවුන්ට කී සේක. (මාර්ක් 9:36-37)**

## හැඳින්වීම

මෙම පාඩම තුළින් ඔබ උගන්වන විට යොදාගත හැකි විවිධ ආධාරක පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත. ඔබ ජීවත් වන භූගෝලීය පරිසරය හා ඔබේ මුදල් තත්වය මත මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන සියලුම ඉගැන්වීම් ආධාරක ලබා ගැනීමට ඔබට නොහැකි විය හැකිය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන් විවිධ ස්ථාන වලදී යොදා ගන්නා බැවින් එවැනි මාධ්‍යයන් ලබාගත නොහැකි අය උදෙසා මෙම පරිච්ඡේදය ඇතුළත් කර තිබේ. වියදම් කිරීමෙන් හෝ විශේෂ උපකරණ වලින් තොරව ඔබට පාවිච්චි කළහැකි ඉගැන්වීම් ආධාරක පිළිබඳවද අප මෙහිදී යෝජනා ඇතුළත් කර තිබේ.

## ඉගැන්වීමේ ආධාරක

ඉගැන්වීම් ආධාරකයක් යනු, ඔබට පාඩමක් ඉගැන්වීමට උපකාර කරන දෙයකි. "ආධාරකයක්" වශයෙන් හඳුන්වනු ලබන්නේ මේ නිසාය. ඉගැන්වීමේ ආධාරකයක් යනු ශිෂ්‍යයන්ට කිසියම් බයිබලීය සත්‍යයක් අවබෝධ කරගැනීමට උපකාර වන ක්‍රියාකාරකමක් හෝ ව්‍යාපෘතියක් විය හැකිය. එසේම ඉගැන්වීමේ ආධාරකයක් දැකිය හැකි, ඇසිය හැකි හෝ ස්පර්ශ කළ හැකි යමක් ද විය හැකිය. එවැනි දෙයක් "ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරකයක්" ලෙස හැඳින්වේ.

"ශ්‍රව්‍ය" යන වචනයෙන් අදහස් වන්නේ ඇසීමයි. "දෘශ්‍ය" යන වචනයෙන් අදහස් වන්නේ දැකීමයි. "ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක්" යනු දැකිය හැකි,ඇසිය හැකි හෝ ස්පර්ශ කළ හැකි සහ ඉගෙන ගැනීමට උපකාර වන යම් කිසි දෙයකි. සමහර විට ආධාරකය ශ්‍රව්‍ය යමක් පමණක් විය හැකිය. උදාහරණ ලෙස කැසට් පටයක් හෝ පටිගත කිරීමක් දැක්විය හැකිය.

සමහර විට එය දෘශ්‍ය යමක් පමණි. උදාහරණයක් ලෙස සත්‍යයක් පැහැදිලි කරන පින්තූරයක් දැක්විය හැකිය. අනෙක් අවස්ථා වලදී ඉගැන්වීමේ ආධාරකය ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන මාධ්‍යය දෙකම එකතු වී තිබේ. මේ සඳහා උදාහරණ ලෙස චිත්‍රපටයක් හෝ ශබ්දය සහිත වීඩියෝ පටයක් දැක්විය හැකිය.

## ඉගැන්වීමේ ආධාරක වල වැදගත්කම

දැකීම, ඇසීම, හා ක්‍රියාවන් අප ඉගෙන ගන්නා ප්‍රධාන මාර්ග වන බැවින් ඉගෙන්වීමේ ආධාරක වැදගත් වේ. අපට මතක තිබෙන දේ එළිදරව් වන ආකාරය පිළිබඳව විශේෂ අධ්‍යයනයන් කර තිබේ : අපට මතක තිබෙන්නේ"

අප අසන දෙයින් , 10% ...
අප දකින දෙයින් , 50% ...
අප කරන දෙයින් , 70% ...
සහ අප අසන, දකින හා කරන දෙයින් 90% ...

මේ හේතුවෙන්, ගුරුවරු තම ඉගැන්වීම් තුළ ශ්‍රව්‍ය, දෘශ්‍ය හා ක්‍රියාකාරී ආධාරක මිශ්‍රව යොදාගැනීම වැදගත් වේ.

## ඉගැන්වීමේ ආධාරක වර්ග

ඔබට ඉගැන්වීමේදී යොදාගත හැකි ආධාරක සමහරක් පහත දැක්වේ:

### සුලභ වස්තූන් :

පාඩමක් විස්තර කිරීම සඳහා ඔබට පරිසරයේ ඇති සුලභ වස්තූන් යොදාගත හැකිය. යේසුස්වහන්සේ එවැනි ආධාරක රැසක් යොදාගත් සේක. උන්වහන්සේ පාඩම් විස්තර කිරීම සඳහා මල්, පහන්, කුරුල්ලන්,මාළු, බීජ, තිරිඟු, දරුවන් සහ පර්වත ආදිය යොදාගත් සේක.

### පිංතූර :

ඡායාරූප,පුවත්පත් වලින් කපාගත් කොටස්, පොත් වල හෝ සඟරා වල ඇති පිංතූර ආදී දේවල් යොදාගත හැක'

### විනිවිද කදාව : ( Slides)

විනිවිද කදාව යනු ප්‍රොජෙක්ටරයක ආධාරකයෙන් බිත්තියක් හෝ තිරයක් මත පෙන්විය හැකි කාඩ්බෝඩ් රාමුවක් සහිත විනිවිද පෙනෙන පිංතූර වේ. විවිධ කිතුණු මාතෘකා පිළිබඳ වූ විනිවිද කදා කට්ටල වෙළඳපොළේ ඇත. මේවා ප්‍රොජෙක්ටරයක් ආධාරයෙන් පෙන්විය හැකි ලෙස සූදානම් කර තිබේ. සමහර විනිවිද කදාවන් කට්ටල සමග හඬ පටයන් ද ලැබේ.

ඔබට නියමිත උපකරණ තිබේනම් ඔබේම විනිවිද කදාවන් නිර්මාණය කරගත හැකිය. ඔබට අවශ්‍ය වන්නේ කැමරාවක්, විනිවිද කදාවන් ලෙස සැකසීමට ඡායාරූප ගැනීමට සේයා පටයක්, සහ ඔබේම අවසන් නිෂ්පාදනය පෙන්වීම සඳහා ප්‍රොජෙක්ටරයක්ය.

### චිත්‍රපට සේයාපටල :

චිත්‍රපට සේයා පටලද විනිවිද කදාවන් වලට සමාන බැවින් ඒවා පිංතූර වල විනිවිද පෙනෙන කොල වලට සමාන වේ. නමුත් තනි තනිව රාමු වල සවිකර තිබෙනු වෙනුවට මේවා එක් දිගු පටලයක් තුළ එකතු කර තිබේ. මේවා චිත්‍රපට සේයාපටල ප්‍රොජෙක්ටරයක ආධාරයෙන් රාමුවෙන් රාමුව ප්‍රදර්ශනය කළ හැකිය. වෙළඳාම සඳහා නිර්මාණය කරන ලද චිත්‍රපට සේයාපටල සමග බොහෝවිට රූපයන් විස්තර කරන පටිගත කරන ලද ශ්‍රව්‍ය පටයක් ද ඇතුළත් වේ.

### චිත්‍රපට සහ වීඩියෝ කැසට්පට :

චිත්‍රපට සහ වීඩියෝ කැසට්පට, චලනය වන රූප රාමු සහ ශබ්ද සහිත ඒවා වන අතර ඒවා ප්‍රදර්ශනය කිරීම සඳහා විශේෂ ප්‍රොජෙක්ටරයක් අවශ්‍ය වේ. කිතුනු චිත්‍රපට හා වීඩියෝ කැසට්පට රැසක් වෙළඳපොළේ මිළදී ගැනීමට හැකි අතර ඔබට නියමිත උපකරණ තිබේ නම් ඔබේම චිත්‍රපටයක් හෝ වීඩියෝ කැසට්පටයක් නිර්මාණය කරගැනීම පිළිබඳව ඔබට අවධානය යොමුකළ හැකිය.

## පටිගත කිරීම හා කැසට් පට :

පටිගත කිරීම් සහ කැසට් පට යනු ශබ්දය පටිගත කිරීම සඳහා වු චුම්භක පටි විශේෂයකි. සංගීතය හා ඉගැන්වීම පිළිබඳ කැසට් පට රැසක් වෙළඳපොළේ පවතී. ඔබටත් පටිගත කිරීම් යන්ත්‍රයක් තිබේ නම් ඔබේම කැසට් පට නිර්මාණය කරගත හැකිය.

## බයිබලය පිළිබඳ පර්යේෂණ කළ හැකි ද්‍රව්‍යයන් :

බයිබල් සමපද අකාරාදීන්, විශ්වකෝෂ, සිතියම් පොත්, වචන අධ්‍යයනය සඳහා ඇති පොත් සහ විවරණයන් ආදිය ලබා ගැනීමේ හැකියාව ඇතිනම් ඒවා භාවිතා කිරීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න. ඒ තුළින් ඔබ උගන්වන පාඩම පිළිබඳව තවත් දේ ඔවුන් ඉගෙන ගන්නා අතරම වැදගත් බයිබල් අධ්‍යයන හැකියාවන්ද වර්ධනය කර ගනු ඇත.

## ප්‍රක්ෂේපය :( OverHead Projector)

ප්‍රක්ෂේපය යනු විනිවිද පෙනෙන පැහැදිලි කඩදාසි විශේෂයක් මත නිර්මාණය කරන ලද රූප සටහන් ප්‍රදර්ශනය කිරීම සඳහා යොදා ගන්නා යන්ත්‍රයකි. සිතියම්, කෙටි සටහන්, ගී පද සහ බයිබල් පද ආදිය විනිවිද පෙනෙන කඩදාසි මත සටහන් කර අධ්‍යයනය සඳහා තිරයක් මත ප්‍රදර්ශනය කළ හැකිය.

## ව්‍යාපෘති :

ශිෂ්‍යයන් ඉගෙන ගත් දේ වඩාත් ප්‍රබල කිරීම උදෙසා ඔවුන්ට ව්‍යාපෘති පවරන්න. ඔවුන්ට සිතියමක් හෝ පිංතූරයක් ඇඳීම, යමක ආකෘතියක් ගොඩ නැගීම (පැරණි ගිවිසුමේ මණ්ඩපය වැනි), වාර්තාවක් ලිවීම, හෝ වගුවක් හෝ ප්‍රස්ථාරයක් නිර්මාණය කිරීම ආදිය සිදු කළ හැකිය. අන් අයට සාක්ෂි දැරීම,රෝගීන් බැහැ දැකීම, කුසගිනිව සිටින අයට ආහාර ලබාදීම වැනි දේ ප්‍රායෝගික සේවා ව්‍යාපෘතින්ය. ව්‍යපෘති තුළින් වචනය අසා සිටින්නෝ පමනක් වෙනුවට “වචනය ක්‍රියාවට නැංවීමට” ශිෂ්‍යයන් උනන්දු කරයි.

## සිතියම් :

බයිබලිය සිදුවීම් සිදුවූ භූමිය පිළිබඳව ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා ගැනීමට සිතියම් උපකාරී වේ. ශිෂ්‍යයන්ට පාඩමට අදාලව සිතියම් අධ්‍යයනය කිරීමට හෝ සිතියම් ඇඳීමට හැකිය.

## අධ්‍යයන චාරිකා :

අධ්‍යයන චාරිකා යනු තවත් අනර්ඝ ඉගැන්වීමේ ආධාරකයකි. ශිෂ්‍යයන්ට තවත් අලුත් දේ ඉගෙන ගැනීමට සහ/හෝ දැනටමත් ඉගෙනගෙන ඇති දේ ක්‍රියාත්මක කිරීම සඳහා බයිබල් කෞතුකාගාරයක්, සිරගෙයක්, විශ්‍රාම ශාලාවක් ආදි ස්ථාන වල සංචාරය කළ හැකිය.

## වගු සහ ප්‍රස්ථාර :

පාඩම පැහැදිලි කිරීම සඳහා වගුවක් හෝ ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. වගුව තුළ පාඩමේ ප්‍රධාන කරුණු හෝ බයිබල් පද ලැයිස්තුගත කළ හැකිය. සන්සඳනය කිරීම සඳහා ප්‍රස්තාර යොදා ගත හැකිය.

## ක්‍රීඩාවන් සහ ප්‍රහේලිකා :

ක්‍රීඩාවන් සහ ප්‍රහේලිකා නිර්මාණය කිරීම දරුවන් සමග වැඩ කිරීමේදී ඉගැන්වීම් උදෙසා යොදා ගත හැකි අනර්ඝ අදහසකි. උදාහරණයක් ලෙස, බයිබල් පදයක එක් එක් තනි පද වෙන වෙනම කාඩ්පත් වල ලියා ඒවා මිශ්‍ර කරන්න. ශිෂ්‍යයන්ට ඒවා නිවැරදි අනුපිළිවෙලට සකස් කරන ලෙස පවසන්න. මෙය පදය මතක තබා ගැනීම උදෙසා උදව්වනු ඇත .

## නාට්‍ය :

ශිෂ්‍යයන්ට තමන් උගත් පාඩම රඟ දැක්වීමට (නාට්‍යයක් ලෙස) හැකිය. මෙවැනි දෙයක් සඳහා, ශිෂ්‍යයන් පාඩමේ චරිත බෙදාගෙන බයිබල් කතාව රඟ දක්වනු ඇත.

## රූකඩ :

රූකඩ යනු බයිබල් කථාවන් රඟ දැක්විය හැකි තවත් ක්‍රමයකි. රූකඩ යනු කථාවක්, නාට්‍යයක් ලෙස රඟ දැක්වීම සඳහා යොදාගත හැකි පුද්ගලයන්ගේ හෝ සතුන්ගේ කුඩා ප්‍රමාණයේ අනුරූපය. මේවා කාඩ්බෝඩ්, රෙදි හෝ වෙනත් මාධ්‍යයන්ගෙන් නිර්මාණය කළ හැක.

## ගල් ලෑලි හෝ සුදු ලෑල්ල :

ගල්ලෑලි හෝ සුදු ලෑල්ල යන, ඔබට ඒ මත ලිවීමට,එය මැකීමට සහ එම මතුපිට නැවත භාවිතා කිරීමට හැකිවන පරිදි විශේෂ ආලේපනයකින් වැසුණු ලෑල්ලකි. පාඩමේ ප්‍රධාන වාක්‍ය ඛාණ්ඩ, පද හෝ කෙටි සටහන් ආදිය ලිවීමට ගුරුවරයාට මේවා පාවිච්චි කළ හැකිය. එසේම ඉගෙන ගැනීමේ ක්‍රියාකාරකමක් වශයෙන් ඉහත කරුණු උදෙසා ශිෂ්‍යයන්ටද එය පාවිච්චි කළ හැකිය.

## ෆ්ලැනෙල් ලෑල්ල :

ෆ්ලැනෙල් ලෑල්ල යනු, පිටුපසට ෆ්ලැනෙල් රෙදි අලවන ලද රූප රඳවා තබා ගැනීමේ හැකියාව ඇති ෆ්ලැනෙල් රෙද්දෙන් ආවරණය කරන ලද ලෑල්ලකි. විවිධ ප්‍රකාශකයන් විසින් බයිබල් පාඩම් සඳහා අවශ්‍ය ෆ්ලැනෙල් රෙදි වලින් සාදා ඇති වචන, පද හා පින්තූර නිෂ්පාදනය කර ඇත. ඔබටත් ඔබගේම වචන, පද හා පින්තූර සාදා ගෙන ඒවා පිටිපස ෆ්ලැනෙල් රෙදි අලවා ෆ්ලැනෙල් බෝඩ් එකක් මත ප්‍රදර්ශනය කළ හැකිය.

## ෆ්ලෑෂ් කාඩ්පතක් :

ෆ්ලෑෂ් කාඩ් යනු, ඉගැන්වීමේ ආධාරකයක් ලෙස භාවිත කළ හැකි ශිෂ්‍යයන් ඉදිරියේදී ක්ෂණිකව එහා මෙහා හැරවිය හැකි කඩදාසි හෝ කාඩ්බෝඩ් කැබැල්ලකි. උදාහරණයක් ලෙස, ඔබට කටපාඩම් පද ෆ්ලෑෂ් කාඩ්පත් ලෙස සකස් කළ හැකිය. එක් පැත්තක ඔබට පදය ලිවිය හැකිය. අනෙක් පැත්තේ ඔබට බයිබලයේ එය සඳහන් ස්ථානය ලිවිය හැකිය. ඔබ බයිබලයේ එය සඳහන් ස්ථානය පෙන් වූ විට පංතියේ සිසුන්ට බයිබල් පදය පවසන්න යැයි කියන්න. ඔබ ඔවුන්ට බයිබල් පදය පෙන්වූ වි ඔවුන් එය සඳහන් ස්ථානය පැවසිය යුතුය.

## ගීතිකා :

ඉගැන්වීමේ ආධාරක වශයෙන් ගීතිකා යොදාගත හැකිය. පහත අරමුණු ඉටුකර ගැනිමට ගීතිකාවක් පාවිච්චි කරන්න.

- ඔබ ඉගැන්වූ පාඩමට සම්බන්ධ ගීතිකාවක්.
- පාඩම තුළින් ඔබ අපේක්ෂා කරන ආකාරයේ ප්‍රතිචාරයකට ඉඩ සලසන ගීතිකාවක්. උදාහරණයක් ලෙස, පාඩමේ විෂය ශුභාරංචිය නම් ශුභාරංචිය පිළිගැනීමට ආරාධනා කරන ගීතිකාවක්.
- පාඩම හා ගැළපෙන ගීතිකාවක් : එනම් ප්‍රීතිමත් හා ප්‍රමුදිත හෝ වේගය අඩු සහ නමස්කාරයට යෝග්‍ය.

## සාක්ෂි :

බයිබල් පාඩමක් පැහැදිලි කිරීම සඳහා ශිෂ්‍යයන්ගේ හෝ ආරාධිතයකුගේ සාක්ෂියක් යොදා ගත හැකිය. උදාහරණයක් ලෙස ගැලවීම පිළිබඳව සලකා සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

### කටපාඩම් කිරීම :

බයිබල් පද, කතාන්දර හා කරුණු ආදිය කටපාඩම් කිරීම ශිෂ්‍යයන්ට බයිබල් පාඩම් මතක තබාගැනීමට උපකාර කරන අනර්ඝ ආධාරකයකි..

### පරීක්ෂා කිරීම :

ඉගෙන ගත් දේ වඩාත් ප්‍රබල කිරීම උදෙසා ශිෂ්‍යයන් පරීක්ෂා කළ හැකිය. පරීක්ෂා කිරීම ලිඛිතව හෝ වාචිකව විය හැක. පරීක්ෂා කිරීමෙන් පසු ශිෂ්‍යයන් අපහසුතාවයන්ට මුහුණ දුන් ඕනෑම කරුණක් පිළිබඳව පුනරීක්ෂණය කරන්න.

### කතාන්දර පැවසීම සහ පුණරීක්ෂණය :

කුඩා දරුවන් සමග කටයුතු කිරීමේදී පාඩමෙන් පසුව ඔවුන්ට තමන්ගේම වචන වලින් කතාව පැවසීමට ඉඩ දෙන්න. වැඩිහිටියන්ට පාඩම සාරාංශගත කළ හැකිය. සාකච්ජා කිරීම, ප්‍රශ්න ඇසීම පිළිතුරු දීම තුළින් පාඩම පුණරීක්ෂණය කරන්න.

## ඉගැන්වීමේ ආධාරක සඳහා සම්පත්

ඇතැම් ඉගැන්වීමේ ආධාරක ඔබටම නිර්මාණය කර ගත හැකිය. අනෙක් ඒවා වෙළඳපොළෙන් මිළදී ගත හැක. ඔබට එවැනි ආධාරක ලබා ගැනීම සඳහා අරමුදල් නොමැති නම්, මුදල් වැය නොවන්නාවූ ඔබේම පරිසරයේ ඇති සරල වස්තූන් යොදාගන්න.

යේසුස්වහන්සේට ඉගැන්වීමේ ආධාරක නිර්මාණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීමට මුදල් නොතිබුණු නමුත්, උන්වහන්සේ තම පාඩම් විස්තර කිරීම සඳහා ස්වාභාවික පරිසරයේ ඇති දේ තෝරා ගැනීම තුළින් නිතරම ඒවා පාවිච්චි කළ සේක. ඔබටත් අවශ්‍ය ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක සහ උපකරණ, ඔබේ සභාවේ සාමාජිකයන්ගෙන්, වෙනත් සභාවන්ගෙන්, පුස්තකාලයන්ගෙන්, ප්‍රදේශයේ පොදු පාසල් වලින් හා නිකායේ මූලස්ථානයෙන් පාවිච්චිය සඳහා ඉල්ලා ගත හැකිය.

## ඉගැන්වීම් ආධාරක වල වටිනාකම මැනීම

ඉගැන්වීම් ආධාරක වල වටිනාකම මැනීම සඳහා පහත ප්‍රශ්න මාලාව යොදාගන්න :

1. ආධාරකය හෝ ක්‍රියාකාරකම පාඩමට සම්බන්ධ වේද? එය පාඩම වඩා පැහැදිලි ලෙස තේරුම් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට උදව් වේද?

2. එය අදහස් කරනු ලබන වයස මට්ටම සඳහා ගැලපේද ?

3. ඔබ මිළදී ගන්නේ නම් ඒ සඳහා ගෙවනු ලබන මිළට හා/හෝ ඔබ විසින් නිර්මාණය කරනවානම් ඒ සඳහා වැය වන කාලයට හා වැය කරන මුදලට සරිලන වටිනාකමක් එයට තිබේද?

4. ඔබ විසින් පාඩම වෙනුවෙන් සකස් කර ඇති අරමුණු අත්පත් කර ගැනීම සඳහා එයින් ලැබෙන දායකත්වය කෙසේද?

5. එය පැහැදිලි සහ තේරුම් ගැනීමට පහසු දෙයක්ද?

මතක තබා ගන්න : ඉගැන්වීම් ආධාරක යනු .... ආධාරක පමණකි. ඒවා මත පමණක් රැඳී සිටීමෙන් වළකින්න. අපගේ විශ්වාසය ශිෂ්‍යයන්ගේ ජීවිත තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියා ඉටු කිරීම සඳහා, දෙවියන්වහන්සේගේ ආත්මය විසින් පාවිච්චි කරනු ලබන දෙවියන්වහන්සේගේ වචනය පිළිබඳවය.

හොඳ ගොවියෙක් තම ගොයම් පැළකිරීම සඳහා හොඳම උපකරණ පාවිච්චි කරයි. නමුත් අස්වැන්න ලැබෙනුයේ බීජ නිසා මිස උපකරණ නිසා නොවන බව ඔහු දනී.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. ඉගැන්වීමේ ආධාරකයක් යනු කුමක්ද?

______________________________________________

______________________________________________

3. ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක යනු මොනවාද ?

______________________________________________

______________________________________________

4. ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක වැදගත් වනුයේ ඇයි?

______________________________________________

______________________________________________

5. යේසුස්වහන්සේ යොදාගත්තේ කවර ආකාරයේ ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරකද?

______________________________________________

______________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම ඉගැන්වීමට සැළසුම් කරන පාඩමක් සඳහා ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරකයක් නිර්මාණය කරන්න.

2. මෙම පාඩමේ සපයා ඇති ප්‍රශ්න මාලාව යොදා ගෙන ඔබ නිර්මාණය කළ ආධාරකයේ ඇගයිමක් කරන්න.

    1. ආධාරකය හෝ ක්‍රියාකාරකම පාඩමට සම්බන්ධ වේද? එය පාඩම වඩා පැහැදිලි ලෙස තේරුම් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට උදව් වේද?

    2. එය අදහස් කරනු ලබන වයස මට්ටම සඳහා ගැලපේද ?

    3. ඔබ මිළදී ගන්නේ නම් ඒ සඳහා ගෙවනු ලබන මිළට හා/හෝ ඔබ විසින් නිර්මාණය කරනවානම් ඒ සඳහා වැය වන කාලයට හා වැය කරන මුදලට සරිලන වටිනාකමක් එයට තිබේද?

    4. ඔබ විසින් පාඩම වෙනුවෙන් සකස් කර ඇති අරමුණු අත්පත් කර ගැනීම සඳහා එයින් ලැබෙන දායකත්වය කෙසේද?

    5. එය පැහැදිලි සහ තේරුම් ගැනීමට පහසු දෙයක්ද?

# අටවන පරිච්ඡේදය

# ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- "ශ්‍රාවක පිරිස විශ්ලේෂණය" යන්න අර්ථ දැක්වීමට,
- ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට,
- ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීමේ පියවර සාරාංශගත කිරීමට,
- විවිධ වයස් කාණ්ඩයන්ගේ චරිත ලක්ෂණ සාරාංශගත කිරීමට, ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නමුත් යේසුස්වහන්සේ සියල්ලන් දන්නා බැවින්ද, මනුෂ්‍යයා තුළ තිබෙන්නේ කුමක්දැයි දන්නා නිසා, මනුෂ්‍යයා ගැන යමෙකුගේ සාක්ෂියෙන් උන්වහන්සේට ඕනෑකමක් නැති බැවින්ද, තමන්ම ඔවුන්ට භාර නුවුසේක. (යොහන් 2:24-25)**

## හැඳින්වීම

ඔබගේ ඉගැන්වීම ආරම්භ කිරීමට පෙර ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම, අරමුණු සකස් කිරීම සහ පාඩම සැළසුම් කිරීම වැදගත් වේ. මෙම පාඩම ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න විස්තර කරයි. මීළඟ පරිච්ජේද දෙක අරමුණු සදහන් කිරීම හා පාඩම සැලසුම් කිරීම පිළිබඳ සළකා බලයි.

## ශ්‍රාවක පිරිස විශ්ලේෂණය

"ශ්‍රාවක පිරිස" යනු, ඔබ විසින් උගන්වනු ලබන පුද්ගල කණ්ඩායමයි. යමක් "විශ්ලේෂණය කිරීම" යනු, එය විස්තරාත්මකව අධ්‍යයනය කිරීම, එහි චරිත ලක්ෂණ ප්‍රවේශම් සහිතව පරීක්ෂා කිරීම හා කොටස් වශයෙන් සම්පූර්ණ දෙය අධ්‍යයනය කිරීමයි. ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම යනු, ඔබ ඉගැන්වීමට සැළසුම් කරන පුද්ගලයින් කණ්ඩායමේ චරිත ලක්ෂණ ප්‍රවේශම් සහිතව අධ්‍යයනය කිරීමයි.

## විශ්ලේෂණය කිරීමේ වැදගත්කම

ඉගෙනීම කෙරෙහි භාෂාව, අධ්‍යාපනය, සංස්කෘතිය, ශාරීරික හැකියාවන්, ආත්මික පරිණතභාවය, ලිංගිකත්වය, මානසික තත්වය, සාමාජීය හා ආර්ථික තත්වය, පෞද්ගලික අවශ්‍යතා සහ වයස වැනි විවිධ සාධක බලපෑම් ඇති කරන බැවින් ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

ඔබ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය නොකළහොත් ඔබ ඔවුන්ගේ අධ්‍යාපනික මට්ටම සහ/හෝ ආත්මික පරිණත බවට ඉහළින් හෝ පහළින් උගන්වනු ඇත. ඔබ ඔවුන්ට තේරුම්ගත හැකි භාෂාවක් යොදා නොගන්නවා විය හැකිය, ඔබ ඔවුන්ගේ සාමාජීය සහ ආර්ථික මට්ටම් වලට හෝ පෞද්ගලික අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පාඩම උගන්වනවා නොවිය හැකිය.

ඔබට ශ්‍රාවක පිරිසේ සිටින සෑම පුද්ගලයෙකු පිළිබඳ සෑම දෙයක්ම දැනගත නොහැකිය. නමුත් ඔබට ඔබේ ශ්‍රාවක පිරිසේ බහුතරයන් කුමන ආකාරයේදැයි සිතාගත හැකි අතර ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතාවයන් හදුනාගැනීමට උපකාරී වන ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ඉල්ලිය හැකිය.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස තේරුම්ගත් සේක. උන්වහන්සේ තම ශ්‍රාවකයන්ගේම සමාජයේ කෙනෙක් වූ බැවින් ඔවුන්ගේ චාරිත්‍ර හා ජීවන ක්‍රමය පිළිබඳව දැන සිටිසේක. යේසුස්වහන්සේට ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව දිව්‍යමය දැනගැනීමද විය.

**නමුත් යේසුස්වහන්සේ සියල්ලන් දන්නා බැවින්ද, මනුෂ්‍යයා තුළ තිබෙන්නේ කුමක්දැයි දන්නා නිසා, මනුෂ්‍යයා ගැන යමෙකුගේ සාක්ෂියෙන් උන්වහන්සේට ඕනෑකමක් නැති බැවින්ද, මෙන්ම ඔවුන්ට භාර නුවුසේක (යොහන් 2:24-25)**

දෙවියන්වහන්සේ ශ්‍රාවක පිරිස පිළිබඳ ඇතැම් දේ ඔබට පෙන්වා දිය හැකිය. නමුත් මෙම කාරණයේදී ඔබට උපකාර වීම සඳහා ඇතැම් ප්‍රායෝගික හැකියාවන්ද ඔබට වර්ධනය කරගත හැකිය. පාවුල් මෙය කළේය.

**එහෙත් පාවුල් සෙනඟගෙන් එක් කොටසක් සද්දුසිවරුන්ද අනෙක් කොටස ඵරිසිවරුද බව දැක, සභාවෙහි මොර ගසා: සහෝදරයෙනි මම ඵරිසියෙක්මි, ඵරිසිවරුන්ගේ පුත්‍රයෙක්මි. මළවුන්ගේ බලාපොරොත්තුවද නැවත නැගිටීමද ගැන විචාරනු ලබමියි කීවේය (ක්‍රියා 23:6)**

පාවුල් යුදෙව්වරුන්ට සේවය කරන විට, ඔහු තම යුදෙව් පසුබිම විශේෂ කොට දැක්වූයේය. ඔහු රෝම වරුන්ට හා අනෙකුත් ජාතිකයන්ට සේවය කරන විට ඔහුගේ ක්‍රමය වෙනස් කළේය. පාවුල්, ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම, ඔවුන්ගේම භාෂාවෙන් ඔවුන්ට කතා කිරීම, සහ ඔවුන්ට හඳුනාගත හැකි ක්‍රමයක් තෝරා ගැනීම යන ආදියේ වැදගත් කම දැන සිටියේය.

**නමුත් පාවුල්: මම නම් කීර්තිමත් නුවරක් වන කිලිකියේ තාර්සස් හි යුදෙව්වෙක්ය. සෙනඟට කථාකරන්ට මට අවසර දෙන මෙන් ඔබගෙන් ඉල්ලමි කීවේය. ඔහු හෙබ්‍රෙව් භාෂාවෙන් තමුන්ට කථා කරන බව ඇසූ විට ඔවුහු වඩාම නිශ්ශබ්දව සිටියෝය. ඔහු කථාකොට: ... (ක්‍රියා 21:39 සහ 22:2)**

## ශ්‍රාවක පිරිසක් විශ්ලේෂණය කරන්නේ කෙසේද?

ඔබ ඉගැන්වීමට සැලසුම් කරන ශ්‍රාවක පිරිසක් විශ්ලේෂණය කිරීටමේදී ඔබට උපකාරී වන පියවර කිපයක් පහත දැක්වේ:

1. ඔවුන්ගේ ආත්මික, හැඟීම්වල, මානසික, ශාරීරික සහ ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් ඔබට එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න:

   **නමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු නම්, වරද නොතබන්නාවූ, බොහෝ කොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා, එවිට ඔහුට එය දෙනු ලැබේ. (යාකොබ් 1:5)**

2. ආත්මික දීමනාවලට ආශාවන (සොයන ලෙස) ලෙස අපට පවසා තිබේ (1 කොරින්ති 12:31). ප්‍රඥාවේ හා දැන ගැනීමේ වචනයේ ආත්මික දීමනාව දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. මෙම දීමනාව මිනිසුන් හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ දැන ගැනීමද ඔවුන්ට උපකාර කිරීමට අවශ්‍ය ප්‍රඥාවේ වචනද සපයා දෙයි. ආත්ම විමසීමේ දීමනාවද උපකාරී වනු ඇත. (මෙම ආත්මික දීමනා පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා, හාවස්ටයිම් අන්තර් ජාතික ආයතනයේ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය"* නැමැති පාඨමාලාව බලන්න.)

3. ඔබේ ශිෂ්‍යයන්ව නිරීක්ෂණය කරන අතරම ඔවුන් සමග සම්බන්දතා පවත්වන්න. ඔවුන් දෙස බලාසිටීමෙන් හා ඔවුන් සමඟ සිටීමෙන් ඔබට තවත් බොහෝ දේ ඉගෙන ගත හැකි වනු ඇත. ශුභාරංචි පොත් කියවා යේසුස්වහන්සේ තම ගෝලයන් නිරීක්ෂණය කල ආකාරයත් එය උන්වහන්සේගේ ඉගැන්වීම් කෙරෙහි බලපෑම් කල ආකාරයත් හඳුනා ගන්න.

4. ඔබේ ජාතියට වඩා වෙනස් ජාතියකට ඔබ සේවය කරන්නේ නම්, ප්‍රශ්න ඇසීම, නිරීක්ෂණය හා සංස්කෘතිය පිළිබඳ පොත් කියවීම තුලින් ඔබට මිනිසුන් පිළිබඳ ඉගෙන ගත හැකි සියල්ලම ඉගෙන ගන්න.

5. හැකියාවක් තිබේ නම් ඔබේ ශිෂ්‍යයන් බැහැ දැකීමට යන්න. ඔවුන්ගේ පෞද්ගලික පරිසරය දැක ගැනීම තුලින් ඔබට බොහෝ දේ ඉගෙන ගත හැකිය.

6. ඔබ කුඩා දරුවන්ට සේවය කරන්නේ නම්, ඔවුන්ගේ දෙමාපියන් හඳුනා ගන්න. දරුවන්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව දෙමව්පියන්ගෙන් දැන ගෙන එම කරුණු සම්බන්දව දෙමාපියන් සමග ක්‍රියා කරන්න.
7. මෙම පාඩමේ මතක් කිරීම් කොටසේ සපයා ඇති ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීමේ මග පෙන්වීම පාවිච්චි කරන්න.

## ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීමට මග පෙන්වීම

ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම සඳහා පහත මග පෙන්වීම් යොදාගන්න. ඉගෙන ගැනීම කෙරෙහි පහත කරුණු බලපෑම් ඇති කරයි:

### භාෂාව :

පාඩම උගන්වනු ලබන භාෂාව ශිෂ්‍යයන්ට තේරුම් ගත හැකි විය යුතුය. නොඑසේනම් භාෂා පරිවර්තකයෙක් යොදා ගත යුතුය.

### ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

- ඔවුන් කථාකරන්නේත් ඔබ කතා කරන භාෂාවමද?
- ඔබේ භාෂාව කතා නොකරන අය ශ්‍රාවක පිරිස තුළ සිටීද? එසේ නම් පරිවර්තකයෙක් අවශ්‍ය වනු ඇත.

## අධ්‍යාපනය :

පාඩමේ ගැඹුරු බව ඔබේ ශ්‍රාවක පිරිසේ සිටින බහුතරයකගේ අධ්‍යාපන මට්ටමට අනුව සකස් කර ගත යුතුය. ඇතැම් ශිෂ්‍යයන් සාමාන්‍ය පරිදි අධ්‍යාපනය ලබා ඇති අතර ඇතමුන් එසේ නොවේ. ඇතැම් අය සෙමෙන් ඉගෙන ගන්නා අතර අනෙක් අය ඉක්මනින් ඉගෙන ගනී.

### ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

- ඔබේ ශිෂ්‍යයන්ගේ පොදු අධ්‍යාපන මට්ටම කුමක්ද? ඔවුන්ගේ සාක්ෂරතාවය, ප්‍රාථමික, ද්විතික හෝ විද්‍යාලීය මට්ටමේද? කියවීමට ලිවීමට පුලුවන්ද?
- ඔබට අධ්‍යපනික ප්‍රශ්න සහිත ශිෂ්‍යයන් සිටීද? එසේනම් ඒවා මොනවාද සහ ඔබ ඒවා සමග ගණුදෙනු කරන්නේ කෙසේද?

## සංස්කෘතිය :

ඉගෙනීමේ ක්‍රියාවලිය කෙරෙහි සංස්කෘතිය බලපෑම් ඇති කරයි. ගුරුවරයා සංස්කෘතිය තුළ තේරුම් ගත හැකි උදාහරණ යොදා ගත යුතුය. අප අවට ඇති ලෝකය පිළිබඳව අප සිතන ආකාරය හා ඒ පිළිබඳව අප තේරුම් ගන්නා ආකාරය කෙරෙහි සංස්කෘතිය බලපෑම් කරයි. මිනිසුන් හොඳින්ම ඉගෙන ගනුයේ පාඩම ඔවුන්ගේ පරිසරයට සම්බන්ද වූ විටය. සංස්කෘතිය මගින් සුදුසු ප්‍රතිචාරය තීරණය කරයි. උදාහරණයක් ලෙස. ඇතැම් සංස්කෘතීන් කිසිසේත් හැගිම්බර නොවන අතර අනෙක් ඒවා හැගිම්බර වෙයි. ශිෂ්‍යයන් ශුභාරංචියට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්නට බොහෝවිට සංස්කෘතිය බලපෑම් කරයි.

ඇතැම් සංස්කෘතීන් තුළ කාන්තාවක් පුරුෂයෙකුට ඉගැන්වීම හෝ පුරුෂයෙක් කාන්තාවකට ඉගැන්වීම් නොපිලිගනී. ඇතැම් සංස්කෘතීන් තුල ගුරුවරයා ඉගැන්වීමට පෙර වැඩිහිටියෙකුගේ හෝ ගෝත්‍ර නායෙකුගේ අනුමැතිය ලබා ගැනීම අපේක්ෂා කරයි. පිළිගැනීමට ලක්වීම සඳහා ඔබට ඔබේ ඇඳුම් විලාශය හෝ බාහිර පෙනුම වෙනස් කිරීමට සිදුවිය හැකිය.

බයිබලිය ප්‍රතිපත්තීන් කඩ නොවන තාක් කල් හෝ ශුභාරංචි පණිවිඩය ඉදිරිපත් කරන ආකාරයට බාධාවක් නොවන තාක්කල්, හැකි තරම් සංස්කෘතිය තේරුම් ගැනීම හා එතුල ජිවත්වීම වැදගත් වේ.

### ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

- ඔවුන් නියෝජනය කරන සංස්කෘතීන් මොනවාද?
- ඔබේ ඉගැන්වීම් ක්‍රමය කෙරෙහි සංස්කෘතිය බලපෑම් ඇති කරන ආකාර මොනවාද?
- ඔබේ පාඩම අදාල කරගැනීම කෙරෙහි සංස්කෘතිය බලපෑම් ඇති කරන්නේ කෙසේද?
- ශිෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රතිචාරය කෙරෙහි සංස්කෘතිය බලපෑම් ඇති කරන්නේ කුමන ආකාරයකටද?
- මෙම සංස්කෘතිය තුල පිළිගැනීමට ලක්වීම සඳහා, ඔබේ ඉගැන්වීම් ශෛලිය හා බාහිර පෙනුම සරිලන සේ වෙනස් කිරීමට ඔබට සිදු වේවිද?

## ශාරීරික හැකියාවන් :

ඉගෙනීම කෙරෙහි ශාරීරික හැකියාවන්ට බලපෑම් ඇති කළ හැකිය. උදාහරණයක් ලෙස ඇසීම හෝ පෙනීම නොමැති සිසුන්ගේ ගුරුවරයෙකුට ඔවුන්ට සරිලන පරිදි තම ඉගැන්වීමේ ක්‍රම සකස් කිරීමට සිදු වේ.

### ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

- ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ආබාද ඇති අය ඉදිරියට ගන්න.
- දෘෂ්‍ය ආධාර දැක ගැනීමට ප්‍රමාණවත් තරම් විශාල වන බව දැන ගන්න.
- හැකියාවක් තිබේ නම් ශ්‍රව්‍යාබාධිත අය උදෙසා පරිවර්තකයෙක් (සංඥා භාෂාව) යොදාගන්න.
- වෙනත් ශාරීරික බාධාවන් ඇති අය උදෙසා විශේෂ උපකාරයන් සූදානම් කිරීමට ඔබට සිදුවනු ඇත.
- දෙවියන්වහන්සේ සුවකිරීමේ බලයෙන් ඔවුන්ට සේවය කරන්න.

## ආත්මික පරිණත බව :

ඔබේ ශ්‍රාවක පිරිස නොඇදහිලිවන්තයන් ගෙන්, නව ඇදහිලිවන්තයන්ගෙන් පරිණත ඇදහිලිවන්තයන්ගෙන් හෝ මේ කොටස් තුනේම මිශ්‍රණයකින් සකස් විය හැකිය. ඇතැම් පුද්ගලයන් "වචනයේ මාංශය" සඳහා සූදානම් නැති බවට පාවුල් අනතුරු ඇඟෙව්වේය (ගැඹුරු ආත්මික සත්‍යයන්). ගැඹුරු බයිබලිය සත්‍යයන් වෙතට පියනැඟීමට පෙර මිනිසුන් "වචනයේ කිරි" (මූලික සත්‍යයන්) වලින් පෝෂණය කළ යුතුය (1 කොරින්ති 3:1-2).

### ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

- ඔබ බොහෝ දුරට නොඇදහිලිවන්තයන්ගෙන් සමන්විත වේද? මෙය බොහෝවිට එළිමහන් රැස්වීම් වලදී හෝ නගර වශයෙන් පවත්වන රැළියකදී සිදු විය හැකිය. ඔබේ පණිවිඩය නොඇදහිලිවන්තයන් ඉලක්ක කළ යුතුය.

- ශ්‍රාවක පිරිසෙන් බොහෝ දෙනෙක් නව ඇදහිලිවන්තයන්ද? ඇදහිල්ල පිළිබඳ මූලික ප්‍රතිපත්තීන් ඔවුන්ට අවශ්‍ය වනු ඇත.

- බොහෝ දුරට ඇදහිලිවන්තයන් වනු ඇතිද? මෙය යාච්ඤා කාලයක් හෝ සභාවේ සාමාජිකයන් උදෙසා වූ විශේෂ රැස්වීමකදී ඇතිවිය හැකි තත්වයකි. නමුත් කිසිදිනක හැම කෙනෙක්ම ඇදහිලිවන්තයෙකු ලෙස නොසලකන්න. සෑම විටම මනුෂ්‍යයන්ට පසුතැවිලි වීමට සහ යේසුස්වහන්සේ ගැලවුම්කරු ලෙස පිළිගැනීමට අවස්ථාව ලබා දෙන්න.

- ඔවුන්ගේ ආත්මික පරිණතභාවයේ මට්ටම ගැන ඔබ දන්නේ මොනවාද?

### ලිංගිකත්වය :

ශ්‍රාවක පිරිස සම්පූර්ණයෙන්ම පුරුෂයන්ද, සම්පූර්ණයෙන්ම කාන්තාවන්ද නැතහොත් මිශ්‍රණයක් ද යන්න ඉගැන්වීම් කෙරෙහි බලපෑම් ඇති කරයි. උදාහරණයක් ලෙස, භාර්යාවන් උදෙසා ස්වාමිපුරුෂයන්ගේ ආදරය පිළිබඳ බයිබලිය වගකීම ගැන පාඩමක් කාන්තාවන් පිරිසකට වඩා පුරුෂයන් පිරිසකට වඩාත් ගැළපෙනු ඇත.

**ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :**

- එහි සිටින්නේ පුරුෂයන් පමණද?
- එහි සිටින්නේ කාන්තාවන් පමණද?
- එය සියලු දෙනාගෙන් සමන්විත වේද?

## විවාහකභාවය :

අවිවාහක පුද්ගලයන්, දික්කසාද වූ අය සහ වැන්දඹුවන්ට ඇති ප්‍රශ්න වලට වඩා වෙනස් ආකාරයේ ප්‍රශ්න සහ අවශ්‍යතාවයන්ට විවාහක යුවල් මුහුණ දේ. දරුවන් නොමැති අය මුහුණ නොදෙන ඇතැම් අභියෝගවලට දරුවන් ඇති අය මුහුණ දේ.

**ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :**

- අවිවාහක
- විවාහක දරුවන් සහිත අය.
- විවාහක දරුවන් නොමැති අය
- දරුවන් සහිත වැන්දඹුවන්.
- දරුවන් නොමැති වැන්දඹුවන්.
- දික්කසාද වූ නැවත විවාහ නොවූ - තනිව දරුවන් හදාවඩා ගන්නා අය.
- දික්කසාද වූ නැවත විවාහ නොවූ, දරුවන් නොමැති අය.
- දික්කසාද වූ නැවත විවාහ වූ, දරුවන් ඇති අය.
- දික්කසාද වූ නැවත විවාහ වූ, දරුවන් නොමැති අය.

**සාමාජීය හා ආර්ථික මට්ටම් :**

ශ්‍රාවක පිරිසෙන් බහුතරයක් නියෝජනය කරන සාමාජීය හා ආර්ථික මට්ටමට ගැලපෙන පරිදි ඔබේ ඉගැන්වීම් සකස්කර ගන්න. යේසුස්වහන්සේ නිකදේමුස්ට සේවය කළ ආකාරයට (යොහන් 3) වඩා වෙනස් ආකාරයකට ළිඳ ළඟදී හමුවූ කාන්තාවට සේවය කළ සේක (යොහන් 4). කාන්තාව පහත් ආර්ථික පංතියක විය. නිකදෙමුස් ඉහළ පංතියක අයෙක් විය.

පාවුල් පැවසුවේ ශුභාරංචිය සන්නිවේදනය කිරීම උදෙසා සුදුසු පරිදි වෙනස් විමට සූදානමින් සිටිය යුතු බවයි.

> **... සියලු ආකාරයෙන්ම සමහරෙකු ගළවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුනෙමි. (1 කොරින්ති 9:22) (19-21 දක්වා පද ද බලන්න).**

**ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :**

- පොදු ආර්ථික මට්ටම කුමක්ද? ඔවුන් ඉහල පංතියේද,මධ්‍යම පංතියේද, පහළ පංතියේද, ඔවුන්ට විශාල මූල්‍යමය අවශ්‍යතාවයන් තිබේද?

- ඔවුන්ගේ රැකියාවන් මොනවාද? ශිෂ්‍යයන්ද, සේවය කරන්නන්ද, ව්‍යාපාරිකයන් සහ වෘතිකයන්ද, විශ්‍රාමිකයන්ද. ගෘහනියන්ද, කම්කරුවන්ද. සේවා වියුක්තිකයන්ද?

- ඔවුන් ජීවත් වන්නේ කොහේද? නගර වල,ගම්මාන වල, දුෂ්කර ප්‍රදේශ වල, දිළිඳු ප්‍රදේශ වල, මධ්‍යයම හෝ ඉහළ පංතියේ ප්‍රදේශ වල, ඔවුන් (නිතරම) පදිංචිය වෙනස් කරන්නේද? ඔවුන්ට නිවසක් නැතිද?

## පෞද්ගලික අවශ්‍යතා :

ඔබේ ශ්‍රාවක පිරිසේ ශාරීරික, මානසික, ආත්මික, හැඟීම්වල, සහ ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් හඳුනා ගැනීම වැදගත් වේ. අවධානය ලබා ගැනීමේදී, අදාල කරගැනීමේදී හා ප්‍රතිචාරයක් බලාපොරොත්තු වීමේදී මෙය වැදගත් වේ.

## ඔබේ ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

ඇතැම් පොදු මානුෂික අවශ්‍යතාවයන් සහ ගැටලු පහත දැක්වේ.

- ආත්මික අවශ්‍යතා :

  - ගැළවීම.
  - ගැළවීමේ ආරක්ෂාව.
  - පවිත්‍රත්වය / ශුද්ධකම.
  - වතුර බෞතීස්මය.
  - ශුද්ධාත්ම බෞතීස්මය.
  - සුවවීම හා මිදීම.
  - ආත්මික පරිණත භාවය : උදාහරණ ලෙස, ශුද්ධාත්ම දීමනා,ශුද්ධාත්ම ඵල, දේව කැමැත්ත දැනගැනීම. ජීවිතයේ අර්බුධයන් සමඟ ගණුදෙනු කිරීම, ආගාවන් සමඟ ගණුදෙනු කිරීම, ආත්මික සටන්,යාච්ඤාව,ආත්මිකව දිගටම ඵල දැරීම ආදිය වේ.

- හැගීම්වල අවශ්‍යතාවයන් :

  - බිය.
  - තනිකම.
  - පීඩනය හා අධෛර්‍යමත් වීම.
  - තිත්තකම.
  - සමාව නොදීම.
  - ස්වයං-අවබෝධය.
  - කෝපය,තරහව,වෙනත් හැඟීම් ආශ්‍රිත ප්‍රශ්න.
  - ද්වේශය.
  - සිත දොස් තැබීම.
  - ඊර්ෂ්‍යාව.
  - කැරලි ගැසීම.

- මුදල් වල අවශ්‍යතාවයන් :

  - මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට මුදල් ප්‍රමාණවත් නොවීම.
  - රැකියාවක් අවශ්‍ය වීම.

- ශාරීරික අවශ්‍යතාවයන් :

  - රෝගී තත්ත්වයන්
  - බර නිසා ඇති වන ප්‍රශ්න.
  - බාහිර පෙනුම පිළිබඳ ප්‍රශ්න.

- විශේෂ ප්‍රශ්න :

  - දික්කසාදය.
  - සියදිවි නසා ගැනීමට නැඹුරු වීම.
  - සදාචාර විරෝධීබව.
  - ගබ්සාවන්.
  - මත්ද්‍රව්‍ය.
  - දුම්වැටි.
  - මත්පැන්.
  - ගුප්ත බව.

- පක්ෂපාතකම
- යක්ෂාත්මයන්ගේ බලයට යටත්වීම / ආවේශය.
- ශෝකය / මරණයට මුහුණ දීම.
- ඕපාදූප කතා කිරීම,චෝදනා කිරීම,ශාප කිරීම, නුසුදුසු සේ දිවුරීම.
- වැරදි ඇදහිම්.
- නරක පුරුදු හා ක්‍රියාකාරකම්.
- ළමාවියේ හුරුපුරුදු කිරීම්.

## වයස :

පාඩමක සංදර්භය හා ගැඹුරු බව ශිෂ්‍යයන්ගේ වයස් මට්ටම් වලට සරිලන පරිදි සකස් කරගත යුතුය. අවධානය ලබා ගත හැකි මට්ටම් සහ ඉගෙනීමේ හැකියාව වයසින් වයසට වෙනස් වේ. මිනිසුන් මානසිකව, ශාරීරිකව,සාමාජීයව හා ආත්මික වැඩෙන හා දියුණු වන ආකාරය අධ්‍යයනය කරන මිනිසුන් වෙනස් වයස් මට්ටම් වලට අදාල චරිත ලක්ෂණ හඳුනා ගෙන තිබේ. මෙම චරිත ලක්ෂණ හෝ ගුණාංග නිශ්චිත වයස් මට්ටමක සිටින සිසුන්ට අදාල වන පොදු ගති ලක්ෂණ වේ. මෙම ගුණාංග සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් විය හැකිය.

## වයස අවු : 2-3 :

A. ශාරීරිකව :
1. අනුකරණය කරයි, උදව් කිරීමට කැමති.
2. ක්‍රියාකාරකම් තුළදී, ශාරීරික ක්‍රියාකාරකම් මෙන්ම විවේක කාලයන්ද අවශ්‍ය වේ.
3. ඉවසීම අඩුය, සංවේදී ස්නායු පද්ධතියක් සහිතය.
4. යම් යම් දේ මෙහෙය වීමට කැමතිය, ඉතා කුතුහලයෙන් යුතුය.
5. රිද්මයට සහ කවි වලට කැමතිය.
6. කුඩා මාංශ පේෂීන් සම්බන්දීකරණය කළ නොහැකිය, විශාල මාංශ පේෂීන් වර්ධනය වේ.
7. ක්‍රීඩා කරන අතරතුර වර්ධනය වීම හා ඉගෙනීම සිදු වේ.

B. මානසිකව :
1. සිතින් මවා ගත් මනසක් ඇත.
2. අවධානය රඳා පවතින්නේ මිනිත්තු 3 ක් හෝ 4 දක්වාය.
3. නැවත නැවත කීමට සහ හොඳින් දන්නා දේවල් වලට කැමතිය.
4. වාග්මාලාව සීමා සහිතය, සරල කතාන්දර වලට කැමතිය.
5. දැකීම, ඇසීම, ස්පර්ෂය, සුඟන්ධය, රස බැලීම ආදියෙන් ලැබෙන සංවේදයන් තුළින් ඉගෙන ගනී.
6. කතාන්දර අතර මඟදී බාදා කරයි, පහසු ගීත ගායනා කළ හැකිය.
7. විස්තර තදින් සිතෙහි තබා ගනී.
8. යමෙක් විසින් පැවසූ දේ විශ්වාස කරයි.
9. ඍජු අනුශාසනා තුළින් එතරම් හොඳින් ඉගෙන නොගනී.
10. පෞද්ගලික පෞරුෂත්වයක් වර්ධනය කරගනී.
11. අන් අයගේ හැඟීම් වලට සංවේදී වේ.

C. සාමාජීයව :
1. බයාදු බවක් පෙන්වයි, විශාල සමූහයන්ට බිය වේ.
2. සිතින් මවා ගත් බියක් පවතී.
3. පෞද්ගලිකව අවධානය අවශ්‍යය.
4. තනිව ක්‍රියාකරයි, අන්අය සමඟ ක්‍රීඩාකරන ආකාරය ඉගෙන ගත යුතුය.
5. ආත්මාර්ථකාමීය, බෙදාගැනීමට හා උදව් කිරීමට ඉගෙන ගත යුතුය.
6. කතාන්දර හෝ කොටස් රඟ දැක්වීමට කැමතිය.
7. අනුකරණය කරන්නෙකි.
8. යෝග්‍ය විනයක් අවශ්‍ය වේ.
9. පහසුවෙන් වෙහෙසට පත්වේ, වියවුල නිසා අධෛර්යට පත්වේ,
10. දෙමාපියන් හෝ ගුරුවරු සතුටට පත් කිරීමට කැමතිය.
11. ආදරය, තේරුම් ගැනීම සහ ආරක්ෂාව අවශ්‍යය.

D. ආත්මිකව :

1. දෙවියන්වහන්සේට ස්තුති කරන ආකාරය හා ප්‍රශංසා කරන ආකාරයත්, බයිබලය දෙවියන්වහන්සේගේ පොත බවත්, පල්ලිය දෙවියන්වහන්සේගේ ගෘහය ලෙසත් තේරුම් ගනී.
2. දෙවියන්වහන්සේ සත්‍ය සහ ආදරණීය පුද්ගලයෙකු ලෙස සිතයි.
3. දෙවියන්වහන්සේගේ පිළිබඳ ස්වභාධර්මය හා දෙවියන්වහන්සේ ගැන සඳහන් වන පොදු අත්දැකීම් තුළින් ඉගෙන ගනී.
4. තම ගුරුවරයා හා දෙවියන්වහන්සේ තමාට ආදරය කරන බව දැන ගැනීමට අවශ්‍ය වේ.
5. නියමාකාරයෙන් ඉගැන්වූවිට, විශ්වාසවන්තව දෙවියන්වහන්සේ මත යැපෙයි.
6. හැඟිම්බරව උනන්දු කළ විට යාච්ඤා කරයි.
7. තමා යේසුස්වහන්සේට ආදරය කරන බැවින් දීමට ඉගෙන ගනී.

## වයස අවුරුදු 4-5.

A. ශාරීරිකව:

1. තමාව බලා ගැනීමේ හැකියාවක් ඇත.
2. තනිව ඇඳුම් ඇඳීමට හැකිය.
3. ශාරීරික ක්‍රියාකාරකම් වලට කැමතිය.
4. බොහෝ ලෙස කතා කරයි.
5. ඉක්මනින් කෝපයට පත්විය හැකිය.
6. මාංශපේෂීන් තව දුරටත් වර්ධනය වේ.
7. ශාරිරිකව ඉවසීමේ ශක්තිය දුර්වලය.

B. මානසිකව :

1. විශාල වෙනස් කමක් නොමැති වැඩ සටහනක් හසුකර ගනී.
2. මිනිත්තු 10 ක පමණ කාලයක් පුරා අවධානය රඳා පවතී.
3. සිතීමේ ශක්තිය යහපත්ය.
4. කාලය හා අවකාශය පිළිබඳව ස්වල්ප ලෙස අවබෝධ කර ගනී.
5. ආදරයට හා අනුකම්පාවට පහසුවෙන් අවදි වේ.
6. මානසික හැකියාවන් වර්ධනය කර ගනී.
7. ඇති සැටියෙන්ම පිළිගනී.
8. කුඩා පද කටපාඩම් කළ හැකිය.
9. නව හැඟිම්බර හා බුද්ධිමත් අත්දැකීම් විඳ ගැනීමට සූදානම්ය.

C. සාමාජියව :

1. නව සාමාජිය අත්දැකීම් වලට මුහුණ දීමට සූදානම්ය.
2. සමහර ක්‍රීඩා හැකියාවන් අතින් යහපත්ය.
3. අන්‍යයන් සමඟ ක්‍රියා කිරීමේ හැකියාවෙන් වර්ධනය වේ.
4. සාමූහිකව ක්‍රීඩා කිරීමට කැමතිය.
5. විනය අතින් තරමක් යහපත්ය.
6. තමා ගැන සිතයිඃ බෙදාගැනීම හා දීම පිළිබඳ පුහුණුවක් අවශ්‍යය.
7. මිත්‍රශීලිභාවය වර්ධනය වේ.
8. නායකත්ව ගුණාංග වර්ධනය වේ.
9. තදින් ආදරය කරන අතර සතුටු කිරීමට කැමතිය.
10. කතාන්දර රඟ දැක්වීමට කැමතිය.

D. ආත්මිකව :

1. අවංකව දෙවියන්වහන්සේට නමස්කාර කළ හැකියඃ ස්වභාව ධර්මයේ විශ්මයන් තුළින් දෙවියන්වහන්සේව වර්ණනා කිරීමට මෙහෙය විය හැකිය.
2. දෙවියන්වහන්සේ පිළිබඳව පෞද්ගලික ආකාරයකින් කතා කරයි.
3. දෙවියන්වහන්සේ තමාට ආදරය කරන බවත් තමා ගැන සලකන බවත් තේරුම් ගනී.
4. හිතාමතා අකීකරු වීම පාපය බව දනී.

5. දෙවියන්වහන්සේගේ අභිමුඛය, සැළකීම,මඟපෙන්වීම, සැපයීම හා ප්‍රඥාව පිළිබඳ යථාර්ථය ඉගෙන ගත හැකිය.
6. ස්වාභාවිකව විශ්වාස කටයුතුය, නමුත් දෙවියන්වහන්සේව විශ්වාස කිරීමටත් උන්වහන්සේට කීකරු වීමටත් ඉගෙන ගත යුතුය.

## වයස අවුරුදු 6-8.

A. ශාරීරිකව :
1. වර්ධන වේගය ක්‍රමයෙන් අඩාල වේ.
2. ශක්තියේ හදිසි වේගවත් වීම් සිදු වේ.
3. පහසුවෙන් වෙහෙසට පත්වේ.
4. විවිධත්වයකින් යුත් ක්‍රියාකාරකම් අවශ්‍ය වේ.
5. ආරම්භ කර ඇති දේ අවසන් කිරීමට ඉගෙන ගත යුතු වේ.
6. යම් වස්තූන් අතපත ගෑමට කැමතිය.

B. මානසිකව :
1. ඉක්මනින් කලබලයට පත් වන අතර අනුකම්පා සහගතය.
2. විශේෂ දයාවට හා මඟපෙන්වීමට කැමතිය.
3. දියුණු කල්පනා ශක්තියක් ඇත, හේතු විචාරයි.
4. සංවේදයන්, අත්දැකීම් හා වචන තුළින් ඉගෙන ගනී.
5. දෙවියන්වහන්සේගේ බලය පෙන්වන බයිබල් කතාන්දර වලට කැමතිය.
6. මානසික ප්‍රශ්න වාචිකව විසඳීමට කැමතිය.
7. තේරීමට ඉගෙන ගනී.
8. සිතුවිලි වලට වඩා පහසුවෙන් වචන කටපාඩම් කරයි.
9. භූගෝලීය හා ඓතිහාසික පසුබිම් අගය කිරීමට පටන් ගනී.

C. සාමාජීයව :
1. නිවැරදි ක්‍රියාවන් සඳහා වූ ප්‍රශංසාවන් යටතේ වර්ධනය වේ.
2. උදව් කිරීම, සාමූහිකත්වය, පරාර්ථකාමීත්වය, සැළකිල්ල වැනි කරුණු පිළිබඳ පුහුණු කිරීමත් අවශ්‍ය වේ.
3. වැඩිහිටියන් අනුකරණය කරන අතර වැඩිහිටියන්ගේ අනුමැතිය අවශ්‍ය වේ.
4. තමන්ගේම වයසේ දරුවන් පිළිබඳ කතාන්දර ඇසීමෙන් ප්‍රීති වේ.
5. ඇතැම් විට හිතුවක්කාරය, දිගු කතාන්දර පවසයි.
6. තරඟකාරී නොවන කණ්ඩායම් ක්‍රියාකාරකම් වලට කැමතිය.
7. යහළුවන් තෝරාගනී, හොඳම යාළුවා නිරන්තරයෙන් වෙනස් කරයි.

D. ආත්මිකව :
1. පරිණත ආත්මික උදාහරණ වලින් ප්‍රයෝජන ගනී.
2. දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා කමාවදීම තේරුම් ගැනීමට සමත්ය.
3. උපදෙස් හා උදාහරණ තුළින් ගෞරවය දැක්වීමට ඉගෙන ගනී.
4. සාමාන්‍යයෙන් ක්‍රිස්තුස්වහන්සේ ගැලවුම්කරු ලෙස පිළිගැනීමට සූදානම්ය.
5. යාච්ඤා කිරීමට හා යේසුස්වහන්සේ උදෙසා ජීවත් වීමට ඉගෙන ගත හැකිය.
6. බයිබලය තුළින් ප්‍රශ්න විසඳිය හැකිය.
7. අප්‍රමාදව වරද ගැන පසුතැවිලිවීමට ඉගැන්විය යුතුය.
8. මරණය පිළිබඳව කුතුහලයක් ඇත.
9. සටන් හා මිෂනාරි කතාන්දර වලට කැමතිය.

## වයස අවුරුදු 9-11.

A. ශාරීරිකව :
1. ජීවිතයේ සෞඛ්‍ය සම්පන්නම අවධියේ සිටී.
2. ක්‍රියාකාරී සහ සමෘද්ධිමත්ය.
3. නිදහසේ වර්ධනය වේ.
4. ඉතා පිළිවෙළට වැඩ නොකරයි.
5. එළිමහනේ සිදු කරන ක්‍රියාකාරකම් වලට කැමතිය.

6. ක්‍රමිකව වර්ධනය වේ.

B. මානසිකව :

1. සටහන් හෝ පිළිතුරු සෙවීම සඳහා බයිබලය මෙන්ම සිතියම් සහ ශබ්දකෝෂ යොදාගත හැකිය.
2. හොඳට කටපාඩම් කිරීමේ හැකියාවක් ඇත. තමන්ගේ ක්‍රියා පිළිබඳව පරීක්ෂණාත්මක මෙන්ම විවේචනාත්මක වේ.
3. කාලය හා අවකාශය පිළිබඳ සංකල්පයන් වර්ධනය කරගනී.
4. ගැටලු පිළිබඳව උනන්දුවක් දක්වයි.
5. තොරතුරු සඳහා මහත් ඕනෑකමක් දක්වයි: ක්‍රියාශීලීය.
6. විවිධ දේ පිළිබඳ උනන්දුය: කවි සහ කතන්දර ලිවිය හැකිය.
7. ඔබේ කාලය, උනන්දුව හා තේරුම්කරදීම ලැබේනම් නිර්මාණශීලීය.
8. ස්වයං වර්ධනය පරීක්ෂා කර බැලීමට කැමතිය.
9. ස්වභාවධර්මය හා ධෛර්යසම්පන්න මිනිසුන් ගැන උනන්දුවක් දක්වයි.
10. අවධානය රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කරගෙන ඇත.

C. සාමාජීයව :

1. උසස් තත්ත්වයන් ලබා ගැනීමට උනන්දු වේ.
2. සාධාරණය පිළිබඳව උනන්දු වේ.
3. පංතියට සහභාගිවීමට කැමතිය.
4. තමන්ගේම යහළුවන්ට කැමතිය, විරුද්ධ ලිංගිකයන්ට අකමැතිය.
5. කණ්ඩායමට විශ්වාසවන්ත වේ.
6. නායකයන් අගය කරයි.
7. අධිකාරීත්වයට ගෞරව කිරීමට ඉගෙන ගත යුතුය.
8. බාල අවධියට වඩා ලජ්ජාශීලි භාවයෙන් අඩුය.

D. ආත්මිකව :

1. ගැළවීම සඳහා සූදානම්ය.
2. ක්‍රිස්තුස්වහන්සේ තුළ වර්ධනය වීම පිළිබඳ ඉගැන්වීම් වලට ප්‍රතිචාර දක්වයි.
3. දේව ධාර්මික සත්‍යයන් අවබෝධ කරගත හැකිය.
4. දිනපතා මෙනෙහිකිරීම් සඳහා දිරිමත් කිරීමක් අවශ්‍යය.
5. තමන්ගේම පවුලේ අය සහ අසල්වැසියන් දිනාගැනීමට උනන්දු විය හැකිය.

## වයස අවුරුදු 12-14.

A. ශාරීරිකව :

1. වේගයෙන් හා විෂම ආකාරයෙන් වර්ධනය වේ.
2. පිරිමි ළමුන්ට වඩා වේගයෙන් ගැහැණු ළමුන් වර්ධනය වේ.
3. විෂම වර්ධනය නිසා ඇතිවන අශෝබන කමින් ලජ්ජාවට පත්වේ.
4. වේගයෙන් ශක්තිය පිට කරයි තෙහෙට්ටුව නිසා පහත වැටේ.
5. බොහෝ විට ජීවිතයේ අසීරුම අවදියයි.

B. මානසිකව :

1. තියුණු මනසක් තිබේ: උනන්දුව අවදි කළ හොත් හොඳින් කට පාඩම් කළ හැකිවේ.
2. සිනහ උපදවන දේ කෙරෙහි විශාල ලෙස සංවේදී වේ.
3. දවල් සිහින දකී: තමා වීරයෙක් ලෙස සළකයි.
4. හැඟීම් සඳහා අධික ලෙස ප්‍රතිචාර දක්වයි.
5. තනිව, ජීවිතය පිළිබඳ තීරණ ගැනීමට කැමතිය.
6. සංවේදිය ,ඍජුය, හැගීම් හා සිතුවිලි වල අන්ත අවස්ථාවන්ට යයි, විවේචනාත්මකය, කැරලිකාරය.

C. සාමාජීයව :

1. විශ්වාසවන්තභාවය නිවසින් පාසලට, ගුරුවරයාට හෝ තමා උතුම් ලෙස සළකන කෙනෙකු කෙරෙහි මාරු විය හැකිය.
2. සමූහය අනුගමනය කරයි.

3. "අත්දැකීම්" උදෙසා දැඩිආශාවක් ඇත: නොසැලකිලිභාවයක් පෙන්නුම් කරයි.
4. ළමයෙකු ලෙස සැළකීම ගැන මහත් බියක් පෙන්නුම් කරයි: වැඩිහිටියෙකු සේ හැසිරීමට උත්සහ කරයි.
5. විරුද්ධ ලිංගිකයන්ට ආකර්ෂණවීම ආරම්භ කරයි.
6. වැදගත් ලෙස හැඟීමට ඉතා ආශා කරයි: යහළුවන් දිනාගන්නා අතර කල්ලියක කෙනෙකු වේ.

D. ආත්මිකව :
1. නායකත්වය උදෙසා වැඩිහිටි තරුණ අය දෙස බලයි.
2. ප්‍රශ්න අසන වයසකි.
3. ගැළවුම් කරුවෙකු උදෙසා පිළිගත් අවශ්‍යතාවයක් ඇති අතර ගැලවීම පිළිබඳ සහතිකයක් ඇත.
4. මගපෙන්වීම අවශ්‍ය වේ.

## වයස අවුරුදු 15-18 :

A. ශාරීරිකව :
1. ශාරීරික නොගැලපෙන බවින් ඉවත් වේ.
2. ශාරීරික පුරුදු ඇති කර ගන්නා අතර ස්ථිර කරගනී.
3. තම පෞද්ගලික පෙනුම ගැන සැළකිළිමත් වේ.
4. විරුද්ධ ලිංගිකයන්ට ආකර්ශනය වේ.

B. මානසිකව :
1. තර්කානුකුල බව දියුණු කරගෙන තිබේ.
2. වචන වලට වඩා සුලභව අදහස් මතක තබා ගනී.
3. කල්පනා කාරී වන අතර බොහෝ දුරට නිර්මාණශීලිය.
4. හේතු දැක්වීම සහ විනිශ්චයන් තුලින් සිතීමේ ශක්තිය පාලනය කරයි.

C. සාමාජියව :
1. සංවිධානමය හා නායකත්ව වගකීම් වලට කැමතිය.
2. කණ්ඩායමෙන් කෙනෙකු වීමට අවශ්‍ය වේ.
3. සමවයසේ අයගේ අනුමැතිය ලැබීමට කැමතිය.
4. අනාගතය ගැන දැන ගැනීමට කැමතිය.
5. අන් අයට උදව් කිරීමට වර්ධනය වන ආශාවක් ඇත.
6. හැඟීම් පාලනය කරගැනීමට වෙහෙසේ.
7. සතුටු විය හැකි දේ සොයයි.
8. හැගීම් වලට නැඹුරු වේ.
9. ආධිපත්‍යයට විරුද්ධව කැරළිගසයි.
10. ආරක්ෂාව කෙරෙහි බලාපොරොත්තු වේ.

D. ආත්මිකව :
1. ආත්මික දේවල් පිළිබඳව නිතර සැක ඇති වේ.
2. හැගිම්බර ඉල්ලීම් වලට ඉක්මනින් ප්‍රතිචාර දක්වයි.
3. "ක්‍රියාත්මක" වන පෞද්ගලික,ක්‍රියාකාරී කිතුනු දහමක් අවශ්‍ය වේ.

## වැඩිහිටියන් :

A. ශාරීරිකව :

වැඩිහිටියන් ශාරීරිකව ප්‍රමාණයෙන් හා උසින් පරිණත තත්වයට පත්ව තිබේ. තරුණ දරුවන්ට වඩා වැඩි කාලයක් හිඳගෙන සිටීමේ ශාරීරික හැකියාව ඔවුන්ට තිබේ. තරුණ වැඩිහිටියන්ට වඩා මහළු වැඩිහිටියන් සෞඛ්‍ය ගැටලු සමග පොරබැදිය හැකිය. තම සංස්කෘතිය තුළ සාමාන්‍ය ලෙස සළකන්නේ මොනවාද? යන්න පිළිබඳව දැනුවත් කිරීමක් නොලැබුණු විට වැඩිහිටියන් ඔවුන්ගේ ශාරීරික පෙනුම හා හැකියාවන් ගැන සැළකිල්ලක් දැක්විය හැකිය.

B. මානසිකව :

මානසික හැකියාවන්, ආකල්ප සහ අගයන් ස්ථිර ලෙස සිතට කාවැදී ඇත. වැඩිහිටියන් "තමන්ගේ මාවත් තුළ පිහිටා ඇති" අතර වෙනස් වීමට අපහසුය. ක්‍රමයෙන් වයස වැඩි වීමත් සමඟ අළුත් දේවල් ඉගෙන ගැනීමේ අපහසුතාවයක් පෙන්නුම් කරයි. අවධානය රැඳ පවතින කාලය දරුවන්ට වඩා වැඩිහිටියන්ගේ යහපත්ය. ඔවුන්ට දිගු පාඩමක් හා වෙනස් ක්‍රම ලබා ගත හැකිය. බොහෝ වැඩිහිටියන් තම භාෂාව හා සංස්කෘතිය පිළිබඳ හොඳ තේරුම් ගැනීමක් ඇත. බොහෝ වැඩිහිටියන් කටපාඩම් කිරීමේ ක්‍රම වලට වඩා ඉගෙනීම් ක්‍රම වලට කැමතිය.

C. සාමාජියව :

බොහෝ වැඩිහිටියන් සාමාන්‍යයෙන් නිශ්චිත සාමාජිය හා ආර්ථික මට්ටමක සිටී. ඔවුන්ගේ මිත්‍රයන්ගෙන් බහුතරයක් සාමාන්‍යයෙන් එම මට්ටමේ අයම වේ. ඇතැම් අය තම සාමාජිය හා ආර්ථික මට්ටම දියුණු කර ගැනීමට පොරබදිනවා විය හැකිය. බොහෝ අය තම සහකරු හෝ සහකාරිය තෝරාගෙන ඇති හෝ නුදුරේදීම තෝරාගනු ඇත.

D. ආත්මිකව:

වැඩිහිටියන් සඳහා විවාහය, සේවය, උසස් අධ්‍යාපනය සහ රැකියාවක් තෝරාගැනීම වැනි ජීවිතයේ ප්‍රධාන තීරණ ගැනීම සඳහා ආත්මික මගපෙන්වීම අවශ්‍ය වේ. ඔවුන්ට යුගල හා පවුල් සම්බන්ධතා පිළිබඳ මගපෙන්වීමද අවශ්‍ය වේ.

ඇදහිලිවන්තයන්ට ආත්මික පරිණත බව සඳහා සහ සභාවේ සේවයන්ට ක්‍රියාකාරීව සම්බන්ධ වීම සඳහා වැඩිදුර උපදෙස් අවශ්‍යවේ. ඔවුන්ට තම ආත්මික දීමනා සොයා ගැනීමටත් පාවිච්චි කිරීමටත් අවශ්‍ය වේ. නොඇදහිලිවන්තයන්ට ශුභාරංචිය ඇසීමටත් ගැළවීමට ගෙන ඒමටත් අවශ්‍ය වේ.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "ශ්‍රාවක පිරිස විශ්ලේෂණය" යනු කුමක්ද?

3. ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම වැදගත් වන්නේ ඇයි?

4. ශ්‍රාවක පිරිසක් විශ්ලේෂණය කිරීමේ පියවර සාරාංශගත කරන්න.

5. ඔබ දැනටමත් උගන්වන හෝ ඉගැන්වීමට බලාපොරොත්තු වන නිශ්චිත වයස් කාණ්ඩයක් තෝරා ගන්න. එම වයස් මට්ටම සඳහා මෙම පාඩමේ වූ චරිත ලක්ෂණ නැවත මතක් කරගන්න. එම වයස් කාණ්ඩය පිළිබඳව සාරාංශයක් ලියන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යේසුස්වහන්සේට ගෝලයන් දොළොස් දෙනෙක් සිටි සේක. මෙම පරිච්ඡේදය තුළ ඔබ ඉගෙන ගත් හැකියාවන් යොදාගෙන මෙම ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න. ගෝලයන් දොළොස් දෙනා පිළිබඳ තොරතුරු මතෙව්, මාර්ක්, ලූක්, යොහන් හා ක්‍රියා පොත් වල සඳහන්වේ.

2. ඔබ ඉගැන්වීමට සැළසුම් කරන ශ්‍රාවක පිරිසක් විශ්ලේෂණය කරන්න.

3. යේසුස්වහන්සේ යොහන් 3 දී නිකදේමුස්ට ඉගැන්වූ පාඩමත් යොහන් 4 දී ළිඳ ළඟ සිටි කාන්තාවට ඉගැන්වූ පාඩමත් අධ්‍යයනය කරන්න.

4. කෙනෙක් ඉහළ පංතියේ සහ බුද්ධිමත්විය. කෙනෙක් පහළ පංතියේ විය. ඉගැන්වීම් ක්‍රම සහ පාඩමේ අන්තර්ගතයන් වෙනස් වූයේ කෙසේද? ඔවුන් සමාන වූයේ කෙසේද?

# නවවන පරිච්ඡේදය

# අරමුණු සඳහන් කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- “අරමුණු” යන පදය අර්ථ දැක්වීමට,
- ඉගැන්වීමේදී අරමුණු වල වැදගත්කම පැහැදිලි කිරීමට,
- අරමුණු ලිවීමට,
- අරමුණු වල වැදගත්කම මැනීමට ප්‍රශ්න මාලාවක් යොදාගැනීමට,
- සාමාන්‍ය හා විශේෂිත අරමුණු අතර වෙනස පැහැදිලි කිරීමට,
- බයිබලීය ඉගැන්වීම් වල අවසාන ඉලක්කය හඳුනාගැනීමට, ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

> **අපි නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණ කොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශකරමුව. (කොලොස්සි 1:28)**

## හැඳින්වීම

සැබෑ ආත්මික වර්ධනය මනිනු ලබන්නේ ශිෂ්‍යයා අසන දෙයින් නොව, ඔහු අසන දේ වලින් ක්‍රියාවට නංවන දෙයින් බව ඉගෙන ගෙන තිබේ. උගන්වනු ලැබූ දේ ශිෂ්‍යයන් තේරුම් ගෙන තිබේද සහ ඔවුන් එය ක්‍රියාවට නංවන්නේද යන්න නිශ්චය කරගත හැකිවන ලෙස අරමුණු සඳහන් කරන ආකාරය මෙම පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගනු ඇත.

## අරමුණු

අරමුණක් යනු ඉලක්කයක් හෝ ක්‍රියාවක අවසානයකි. එය අත්කර ගැනීමට බලාපොරොත්තු වන අභිප්‍රායන්, ඉලක්කයක් හෝ තීරණය කරන ලද නිමැවුමකි. ගුරුවරයෙකු අරමුණක් සඳහන් කරන විට, ඔහු තම ශිෂ්‍යයන්ට ඉලක්කයන් උදෙසා පාඨයක් ලියා දක්වයි. මේවා, ශිෂ්‍යයන්ට පාඩම් අවසන් කළ පසු කළ හැකි දේවල් විස්තර කරනවා වැනිය. ඔබ මේ මොහොතේ අධ්‍යයනය කරන පාඩමටත් අරමුණු තිබේ. පාඩමේ මුලට නැවත ගොස් මෙම අරමුණ නැවත බලන්න.

## අරමුණුවල වැදගත්කම

අරමුණු වැදගත් වන හේතූන් :

1. ඒවා ගුරුවරයාගේ යාච්ඤාවන්, සැළසුම්, ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාකාරකම් විශේෂිත ඉලක්කයක් වෙත යොමු කරයි. සෑම පාඩමකින්ම අත්කර ගත යුතු දේ ඔබ දන්නා බැවින්, ඔබට ඒ අනුව යාච්ඤා කිරීමට, සැළසුම් කිරීමට, ඉගැන්වීමට හා ක්‍රියාකාරකම් සූදානම් කිරීමට හැකිය.

2. ඉගැන්වීමේ බලපෑම මැනීමට ඒවා යොදා ගත හැකිය. ඔබට ඉගැන්වීමට අවශ්‍ය වූ දේ ශිෂ්‍යයන් විසින් ඉගෙන ගෙන ඇති දැයි ඔබට පැවසිය හැකිය.

3. ඒවා ඔබේ ඉගැන්වීම වර්ධනය කරයි. ඔබට ඉගැන්වීම් වල බලපෑම මැනිය හැකි බැවින් ඔබ අසමත් වන අවස්ථා හා සාර්ථක වන අවස්ථා ඔබට මැනගත හැකිය. ඔබට සමත් වීම් හා අසමත් වීම් තුළින් ඉගෙන ගෙන ඔබේ ඉගැන්වීම් වර්ධනය කර ගත හැකිය.

4. ශිෂ්‍යයන්ට වචනය අසන්නෝ පමණක් නොවී එය ක්‍රියාවට නංවන්නන්ද වීම කෙරෙහි ඒවා උපකාරී වේ. ඉගැන්වීමට පෙර ඔබ අරමුණු සඳහන් කර ඒවා ශිෂ්‍යයන්ට පැහැදිලිව පැවසූ විට, ඔවුන්ගෙන් බලාපොරොත්තු වන්නේ මොනවාද යන්න පිළිබඳව ඔවුන් දැනගනු ඇත.

## අරමුණ සටහන් කරන්නේ කෙසේද?

### ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය අනුව අරමුණු සඳහන් කරන්න :

ඔවුන් කිරීමට සමත් වේ යැයි ඔබ අදහස්කරන දේ නිශ්චිතව පවසන්න. ශිෂ්‍යයන්ගේ ක්‍රියාවන් අනුව නියමයක් ලෙස පවසන ලද අරමුණක් පහත දැක්වේ :

> "මෙම පාඩම අවසානයේදී ශිෂ්‍යයන්ට යොහන් 3:16 පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

වැරදි ලෙස සඳහන් කරන අරමුණක් පහත දැක්වේ :

> "මම ශිෂ්‍යයන්ට යොහන් 3:16 උගන්වමි."

පළමු අරමුණ නිවැරදි ලෙස සඳහන් කර ඇත. පාඩම අවසානයේදී ශිෂ්‍යයන්ට කිරීමට හැකිවේ යැයි ඔබ බලාපොරොත්තු වන දේ එමගින් දක්වයි. ඔවුන්ට ඔබට යොහන් 3:16 විස්තර කරන්න යැයි පැවසීමෙන් ඔවුන් නිසි ලෙස ඉගෙන ගෙන තිබේදැයි ඔබට දැනගත හැකිය.

දෙවන අරමුණ වැරදි වේ. එමගින් ශිෂ්‍යයන්ට කිරීමට හැකිවේ යැයි ඔබ අපේක්ෂා කරන දේට වඩා ඔබ විසින් කරනු ලබන දේ පවසයි. ඔබ ඔහුට නිවැරදි ලෙස උගන්වා තිබේ දැයි ඔබ දැන ගන්නේ කෙසේද? මෙම අරමුණ තුළින් ඔබට මෙය නිශ්චය කර ගැනීමට හැකියාවක් නැත.

### සෑම අරමුණක්ම ක්‍රියාපදයක් සමඟ ආරම්භ කරන්න :

ක්‍රියා පදයක් යනු, අවසාන නිමැවුම කෙසේ විය යුතු දැයි දක්වන ක්‍රියාකාරී පදයකි. මෙවැනි ප්‍රකාශයක් ආරම්භයට යොදාගන්න :

> "මෙම පාඩම සම්පූර්ණ කිරීම තුළින් ඔබට පහත දේ හැකිවනු ඇත."

ඉන්පසු අරමුණු ලැයිස්තුගත කරන්න, හැම එකකටම ක්‍රියාවක් සම්බන්ධ කරන්න. මෙම පරිච්ජේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ අරමුණු සටහන් කිරීම සඳහා ඔබට යොදාගත හැකි ක්‍රියා පද ලැයිස්තුවක් තිබේ. ක්‍රියාවක් සම්බන්ධ කරන ලද අරමුණකට උදහරණයක් පහත දැක්වේ :

> "මෙම පරිච්ජේදය සම්පූර්ණ කිරීම තුළින් ශිෂ්‍යයන්ට ගැළවීමේ සැළස්ම පැහැදිලි කිරීමට හැකි වනු ඇත"

"පැහැදිලි කිරීම" යනු ක්‍රියාකාරී පදයකි. මෙම පාඩමේ ප්‍රතිඵලයක් ලෙස, ශිෂ්‍යයන්ට කිරීමට හැකි වේ යැයි ඔබ අපේක්ෂා කරන්නේ කුමක්දැයි පවසයි.

### සෑම අරමුණක්ම තනි තනිව සඳහන් කරන්න :

එක් අරමුණක් සඳහා ඉගෙනීමේ එක් ප්‍රතිපලයක් පමණක් සඳහන් කරන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

"මෙම පරිච්ජේදය සම්පූර්ණ කිරීම තුළින් ශිෂ්‍යයන්ට :

නිවැරදි: යොහන් 3:16 උපුටා දැක්වීමට හැකිවනු ඇත.

වැරදි: යොහන් 3:16 උපුටා දැක්වීමට හා පැහැදිලි කිරීමට හැකිවනු ඇත"

ඔබට ඔවුන් එය පැහැදිලි කිරීමද, අවශ්‍ය වේ නම්, ඔබ වෙන වෙනම අරමුණු දෙකක් සඳහන් කළ යුතුය:

"මෙම පාඩම යොහන් 3:16 උපුටා දැක්වීමට,

යොහන් 3:16 පැහැදිලි කිරීමට, හැකිවනු ඇත"

## අරමුණු පිළිවෙළින් සඳහන් කරන්න :

සෑම අරමුණක්ම ඉදිරියෙන් සහ/හෝ පසුපසින් ඇති ඒවා සමග සම්බන්ධ විය යුතුය. "යොහන් 3:16 උපුටා දැක්වීම" "යොහන් 3:16 පැහැදිලි කිරීම" යන්නට පෙර යෙදීමට සුදුසුය. ශිෂ්‍යයන්ට එය පැහැදිලි කිරීමට හැකි වීමට නම් ඔවුන් එය දැන සිටිය යුතුය.

## ඔබට නිරීක්ෂණය කළ හැකිවූ හැසිරීම් රටාවක් අනුව අරමුණු සඳහන් කරන්න:

උදාහරණ කිහිපයක් පහත දැක්වේ :

"මෙම පරිච්ජේදය සම්පූර්ණ කිරීම තුළින් ශිෂ්‍යයන්ට :

නිවැරදි :යොහන් 3:16 පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

වැරදි : යොහන් 3:16 තේරුම් ගැනීමට හැකිවනු ඇත."

ශිෂ්‍යයාට යොහන් 3:16 පැහැදිලි කළ හැකිනම් ඔහු එය තේරුම්ගෙන ඇති බව ඔබට දැනගත හැකිවනු ඇත. ඔබේ අරමුණ "යොහන් 3:16 තේරුම් ගැනීමට" ලෙස සඳහන් කළේ නම් එය මැනිය හැකි අරමුණක් **නොවේ.** ඔබේ අරමුණ සාර්ථක කරගත් බව ඔබට දැන්වීම සඳහා ශිෂ්‍යයන්ට කුමක් කළහැකි විය යුතුදැයි එමගින් සඳහන් නොවේ.

## සෑම අරමුණක්ම ළගා කරගත හැකි අරමුණක් බවට පත් කරන්න :

ඔබ ඉතා අසීරු අරමුණු සඳහන් කළ විට, ශිෂ්‍යයන් අධෛර්යයට පත්වනු ඇත.

# ප්‍රශ්න මාලාව

ඔබ ඔබේ ශිෂ්‍යයන් උදෙසා සටහන් කරන අරමුණු පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න මාලාව යොදා ගන්න :

1. එය ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය මැන ගත හැකි ලෙස සඳහන් කර තිබේද? එමගින් ඔබ විසින් කරනු ලබන දේවල් වෙනුවට ඔබ ශිෂ්‍යයන්ගෙන් බලාපොරොත්තු වන දේ සඳහන් කරයිද?

02. එය නිරීක්ෂණය කළ හැකිද? ඔබ ඔබේ ඉලක්කය ළගා කර ගෙන ඇතැයි නිරීක්ෂණය කළ හැකි පරිදි ඔබේ අරමුණු හැසිරීම් රටාවක් අනුව මැනගත හැකි ලෙස සටහන් කර තිබේද?

03. එය විශේෂිතද? එමගින්, ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂාකරන ද් පැහැදිලිවත් නිශ්චිතවත් විස්තර කරයිද?

04. එය තනිව සඳහන් කර තිබේද? එක් අරමුණකින් දක්වන්නේ එක් ඉගෙනුම් ප්‍රතිපලයක් පමණද?

05. එහි පිළිවෙළක් තිබේද? එය මුලින් හෝ පසුව ඇති අරමුණු සමඟ සම්බන්ධතාවක් පෙන්නුම් කරයිද?

06. එය ළඟා කරගත හැකිද? එය ශිෂ්‍යයන්ට ළඟා කර ගැනීමට ඉතා අසීරු නොවන බව දැනගන්න.

07. එය බයිබලයට අනුකූලද?

## සාමාන්‍ය හා විශේෂිත අරමුණු

ඔබේ ශිෂ්‍යයන් උදෙසා ඔබ සාමාන්‍ය හා විශේෂිත යන අරමුණු දෙකම සඳහන් කල යුතුය.

### සාමාන්‍ය අරමුණු :

සාමාන්‍ය අරමුණු යනු, සාමාන්‍ය ලෙස ඔබේ ඉගෙනීමට අදාල කර ගත හැකි ඉලක්කයන් වේ. ඒවා කාලපරිච්ඡේදයක් තුළදී ශිෂ්‍යයන් ළඟා කරගත යුතු වූ අරමුණු වේ. ඒ සෑම ගුරුවරයෙකුගේම මූලික ඉලක්ක විය යුතු පොදු අරමුණු කිහිපයක් පහත දැක්වේ. මෙම අරමුණු ඔබට නිරීක්ෂණය කළ හැකි පරිදි ශිෂ්‍යයන්ගේ හැසිරීම් රටාවන් සකස් කර තිබේ.

මා උගන්වන පාඩමේ ප්‍රතිඵලයක් ලෙස, ශිෂ්‍යයන් :

### ශුභාරංචියට ප්‍රතිචාර දක්වීම :

මෙම අරමනු පහසුවෙන් නිරීක්ෂණය කළ හැකිය. ශිෂ්‍යයා පසුතැවිලිවී පාපයෙන් හැරෙනවාද?

### ශුද්ධාත්ම බෞතිස්මය ලබා ගැනීම :

සෑම ශිෂ්‍යයෙකුම මෙම අත් දැකීම වෙත ගන යාම සඳහා ගුරුවරයා උදව් විය යුතුය. අන්‍ය භාෂා වලින් කතා කිරීමේ ලකුණ සහ සාක්ෂි දැරීමේ බලය ප්‍රකාශ වීම ආදිය තුළින් මෙම අරමුණු ළඟා කර ගත්තේ දැයි නිරීක්ෂණය කළ හැකිය.

### වතුර බෞතිස්මය ලබා ගැනීම :

නැවත ඉපදීම ලැබූ ශිෂ්‍යයන් යේසුස්වහන්සේව අනුගමනය කරමින් මෙම ප්‍රසිද්ධියේ තම ඇදහිල්ල පිළිගැනීම සඳහා ධෛර්යමත් කළ යුතුය.

### ආත්මික ඵල පෙන්නුම් කිරීම :

ක්‍රිස්තුස්වහන්සේ වැනි චරිත ගොඩනැගීම ඉගැන්වීමේ වැදගත් අරමුණකි. මේ තුළ ගලාති 5:22-23 සඳහන් ආත්මික ඵල ද ඇතුලත් වේ. ඒ තුළ යේසුස්වහන්සේ ඉගැන්වූ හා නවගිවිසුමේ යැවුම් පත්‍ර තුළ වැඩිදුර පැහැදිලි කරන ලද රාජ්‍යයේ ජීවන රටාව වර්ධනය කිරීමද අන්තර්ගත වේ.

### ආත්මික දීමනා සොයා ගැනීම :

සෑම ඇදහිලිවන්තයෙක් තුළම එක් ආත්මික දීමනාවක් හෝ ඇති බව බයිබලය එළිදරව් කරයි. ශිෂ්‍යයන්ට තම ආත්මික දීමනා සොයා ගැනීම සඳහා උදව් කිරීම කිතුණු ගුරුවරයෙකුගේ වගකීමකි.

### ආත්මික දීමනා පාවිච්චි කිරීම :

ආත්මික දීමනා හදුනා ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. සේවයේ කටයුතු තුළ මෙම දීමනා පාවිච්චි කිරීමට ශිෂ්‍යයන් උනන්දු කරවිය යුතුය.

### ආත්මිකව නැවත ඵල දැරීම :

ආත්මිකව නැවත ඵල දැරීමට ශිෂ්‍යයන්ට උගන්වන තුරු ඉගැන්නුම් චක්‍රය සම්පූර්ණ නොවේ. 2 තිමෝති 2:2 බලන්න.

### පෞද්ගලිකව බයිබල් අධ්‍යයනයන්හි යෙදීම :

පෞද්ගලික බයිබලය අධ්‍යයනය වැදගත් සාමාන්‍ය අරමුණකි. ඔබ බයිබලය උගන්වන ආකාරය ශිෂ්‍යයන්ට තනිව එය ඉගෙනීමට ධෛර්යමත් කළ යුතුය. ශිෂ්‍යයන්ට විවිධ පෞද්ගලික බයිබල් අධ්‍යයන ක්‍රමයන් ඉගැන්වීම සඳහා හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ *"නිර්මාණශීලි බයිබල් අධ්‍යයන ක්‍රම"* යන පාඨමාලාව ඔබට උපකාරී වනු ඇත.

### බයිබල් පර්යේෂණ ක්‍රම පාවිච්චි කිරීම :

ඔබ ශබ්දකෝෂ, සමපද අකාරාදිය වැනි බයිබල් පර්යේෂණ මාධ්‍ය පාවිච්චි කරන්නේ නම් ඒවා පාවිච්චි කරන ආකාරය ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතුය. ශිෂ්‍යයන්ට ඒවා පාවිච්චි කරන ආකාරය ඉගැන්වීම සඳහා හාවස්ටයිම් ජාත්‍යයන්තර ආයතනයේ *"නිර්මාණශීලි බයිබල් අධ්‍යයන ක්‍රම"* යන පාඨමාලාව උපකාරී වනු ඇත.

### නිරන්තරයෙන් යාච්ඤා කිරීම :

ප්‍රසිද්ධියේ හා පෞද්ගලිකව නිරන්තරයෙන් යාච්ඤා කරන ආකාරය ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතුය.

### සභාවේ සහභාගිකම් උදෙසා සහභාගි වීම :

ශිෂ්‍යයන් ප්‍රාදේශීය සභා සහභාගීත්වයක ක්‍රියාකාරී සාමාජිකයන් විය යුතුය.

### විශේෂිත අරමුණු :

විශේෂිත අරමුණු යනු, ඔබ ඉගැන්වීමට සැලසුම් කරන සෑම පාඩමක් උදෙසාම ඔබ ඇතිකරගන්නා අරමුණුය. මේවා විෂය කරුණු මත පදනම්ව පාඩමෙන් පාඩමට වෙනස් විය හැකිය. මෙම අත්පොතේ පාඩම් ආරම්භයේ සඳහන් අරමුණු නැවත බලන්න. පාඩමේ අඩංගු දේවල් මත පදනම්ව සෑම පරිච්ඡේදයකම විශේෂිත අරමුණු වෙනස් වන ආකාරය නිරීක්ෂණය කරන්න.

## අවසාන ඉලක්කය

සියලු බයිබලීය ඉගැන්වීම් වල අවසන් අරමුණ වන අවසාන ඉලක්කය බයිබලය එළිදරව් කරයි :

> **අපි නම්, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණකොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශකරමුව. (කොලොස්සි 1:28)**

ඉගැන්වීමේ හා දේශනා කිරීමේ අවසාන අරමුණ නම් ශිෂ්‍යයන් ක්‍රිස්තුස්වහන්සේ තුළ සම්පූර්ණ වී දෙවියන්වහන්සේ ඉදිරියේ සිට ගැනීමට සූදානම් කිරීමයි.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "අරමුණ" යන පදය අර්ථ දක්වන්න.

3. ඉගැන්වීම් තුළ අරමුණු වැදගත් වන්නේ ඇයි?

4. සාමාන්‍ය හා පොදු අරමුණු අතර ඇති වෙනස කුමක්ද?

5. මෙම අරමුණු වලින් නිවැරදිව දක්වා ඇත්තේ කුමක්ද?

   මෙම පාඩම අවසානයේ ශිෂ්‍යයන්ට :

   උදාහරණ 1 : යොහන් 3:16 දැන ගැනීමට හැකිවනු ඇත.

   උදාහරණ 2 : යොහන් 3:16 කටපාඩමෙන් කියා දීමට හැකිවනු ඇත.

   උදාහරණ ___________ නිවැරදි වේ.

6. බයිබලිය ඉගැන්වීම් වල අවසාන ඉලක්කය කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

01. අරමුණු ලිවීම සඳහා ක්‍රියාපද තෝරා ගැනීමේදී මෙම වගුව පාවිච්චි කරන්න.

## ක්‍රියාපද සඳහා උදාහරණ

ඉලක්කය වන්නේ :

| දැනුම | තේරුම්ගැනීම | හැකියාව |
|---|---|---|
| ... නම් මෙම ක්‍රියාපද ගන්න | නම් මෙම ක්‍රියාපද ගන්න | නම් මෙම ක්‍රියාපද ගන්න |
| නම් කරන්න | විශ්ලේෂණය කරන්න | උදව් කරන්න |
| නැවත සලකා බලන්න | වෙනස්කම් හඳුනා ගන්න | මඟපෙන්වන්න |
| ලැයිස්තු ගත කරන්න | අතර | උගන්වන්න |
| සඳහන් කරන්න | සසඳන්න | සැළසුම් කරන්න |
| ගණන් කරන්න | අතර වෙනස්කම් | අසන්න |
| කටපාඩමින් කියන්න | පහදන්න | පර්යේෂණ කරන්න |
| සිහිපත් කරන්න | අසමානතා පෙන්වන්න | අදාළ කරන්න |
| ලියන්න | වර්ගකරන්න | අභ්‍යන්තර ගත කරන්න |
| හඳුනාගන්න | තෝරන්න | නිෂ්පාදනය කරන්න |
| කටපාඩම් කරන්න | තෝරන්න | පාවිච්චි කරන්න |
| පිටපත් කරන්න | වෙන්කරන්න | ක්‍රියාවේ යොදන්න |
| පරීක්ෂාකාරී වන්න | පරීක්ෂා කරන්න | විසඳන්න |
| හඳුනාගෙන සිටින්න | විමසා බලන්න | අත්දකින්න |
| සමඟ | සොයා ගන්න | පැහැදිලි කරන්න |
| අර්ථ දක්වන්න | ගලපන්න | සන්නිවේදනය කරන්න |
| විස්තර කරන්න | නැවත උපදවන්න | උපකාරී වන්න |
| හඳුනාගන්න | සංවිධානය කරන්න | යාච්ඤා කරන්න |
| වර්ගීකරණය කරන්න | අර්ථ කථනය කරන්න | පෙන්නුම් කරන්න |
| කටු සටහනක් සකසන්න | ඇගයීමක් කරන්න | සංවිධානය කරන්න |
| උපුටා දක්වන්න | ස්ථානගත කරන්න | සංවිධානය කරන්න |
| සාරාංශ කරන්න | සාකච්ඡා කරන්න | විදහා දක්වන්න |
| | | වර්ධනය කරන්න |
| | | අධ්‍යයනය කරන්න |

02. ඉගැන්වීමට අදහස් කරන පාඩමක් සඳහා විශිෂ්ත අරමුණු කිහිපයක් ලියන්න. ඔබ ලියූ අරමුණු වල වැදගත්කම මැනීම සඳහා ප්‍රශ්න මාලාව යොදා ගන්න.

____ 1. එය ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය මැන ගත හැකි ලෙස සඳහන් කර තිබේද? එමගින් ඔබ විසින් කරනු ලබන දේවල් වෙනුවට ඔබ ශිෂ්‍යයන්ගෙන් බලාපොරොත්තු වන දේ සඳහන් කරයිද?

____ 2. එය නිරීක්ෂණය කළ හැකිද? ඔබ ඔබේ ඉලක්කය ළඟා කර ගෙන ඇතැයි නිරීක්ෂණය කළ හැකි පරිදි ඔබේ අරමුණු හැසිරීම් රටාවක් අනුව මැනගත හැකි ලෙස සටහන් කර තිබේද?

____ 3. එය විශේෂිතද? එමගින්, ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂාකරන දේ පැහැදිලිවත් නිශ්චිතවත් විස්තර කරයිද?

____ 4. එය තනිව සඳහන් කර තිබේද? එක් අරමුණකින් දක්වන්නේ එක් ඉගෙනුම් ප්‍රතිපලයක් පමණද?

____ 5. එහි පිළිවෙළක් තිබේද? එය මුලින් හෝ පසුව ඇති අරමුණු සමඟ සම්බන්ධතාවක් පෙන්නුම් කරයිද?

____ 6. එය ළඟා කරගත හැකිද? එය ශිෂ්‍යයන්ට ළඟා කර ගැනීමට ඉතා අසීරු නොවන බව සැක හැර දැනගන්න.

___ 7.   එය බයිබලයට අනුකූලද?

03. පහත කටු සටහන යොදාගන සේවයේ දීමනා සඳහා දෙවියන්වහන්සේ සඳහන් කරන අරමුණු අධ්‍යයනය කරන්න.

## එපීස 4:11-16

## "උන්වහන්ස්ගේ දීමනා ලෙස ඇතමුන්:

අ. විවිධ සේවයන් : සමහරු ප්‍රේරිතයන්, සමහරු අනාගතවක්තෘවරුන්, සමහරු ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සමහරු සභාපාලකයන්, සමහරු ගුරුවරුන් :

ආ. කාර්යය : ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා, සේවය කිරීමේ වැඩය පිණිසත්, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වීම පිණිසත්,

1. බලාපොරොත්තු වන ප්‍රතිඵල : ඇදහිමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උසමහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක්.

2. ඇතිවිය හැකි ආකල්ප : බාලයන් නොවන පිණිස,

   *අ.* නුසුදුසු දේ : මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නැමැති සුළඟින් ඇත මැත විසිවෙමින් ගෙනයනු ලැබීම.

   *ආ.* සුදුසු දේ : ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කතාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේ වලදී වැඩෙන පිණිසත්ය. උන්වහන්සේගෙන් මුළු ශරීරය එකට සන්ධි කරනු ලැබ සවිවී, එක එක කොට්ඨාසයේ ප්‍රමාණයේ ක්‍රියාකාරකමේ හැටියට සහකාර වූ එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේ ය.

# දහවන පරිච්ඡේදය

## පාඩම සැලසුම් කිරීම

### අරමුණු :

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- සෑම ඉගැන්වීම් අවස්ථාවකටම පොදු වූ කරුණු හඳුනා ගැනීමට,
- මූලික ඉගැන්වීමේ සැළැස්මක කොටස් හඳුනා ගැනීමට,
- පාඩමක් සැළසුම් කිරීමේ පියවර සාරාංශ ගත කිරීමට,
- පාඩමක් සැළසුම් කිරීමට ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :

**ප්‍රඥාවන්තයන්ගේ දිව දැනගැන්ම හරි ලෙස කියා දෙයි. (හිතෝපදේශය 15:2)**

### හැඳින්වීම

යේසුස්වහන්සේ ඉගැන්වූ පාඩම ඔබ අධ්‍යයනය කර තිබේ. ඉගැනුම් ක්‍රමවේද, ඉගැනුම් ආධාරක පාවිච්චි කරන්නේ කෙසේද, ශ්‍රාවක පිරිස විශ්ලේෂණය, සහ අරමුණු සඳහන් කරන්නේ කෙසේද යන්න ඔබ ඉගෙන ගෙන තිබේ. මෙම පරිච්ඡේදය තුළ ඔබ පාඩමක් සැළසුම් කිරීමේදී මේ සියලු හැකියාවන් පාවිච්චි කරනු ඇත.

### ඉගැන්වීමේ අවස්ථාවන්

ඔබ පාඩමක් සැළසුම් කරන විට, සෑම ඉගැන්වීමේ අවස්ථාවකම පහත පොදු කරුණු ඇති බව මතක තබා ගන්න.

### දිව්‍යමය කර්තෘන් :

බයිබලිය ඉගැන්වීම් පසුපස සිටින දිව්‍යමය ආත්මික කර්තෘන් නම් පියාණන්, පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන් ය. ගුරුවරයාට ඉගැන්වීමට හැකියාව ලබාදෙන සහ ශිෂ්‍යයන්ගේ තේරුම්ගැනීම විවර කරන්නා වූ බලවේගය ශුද්ධාත්මයාණන්වහන්සේය. (දෙවන පරිච්ඡේදය නැවත බලන්න.)

### ගුරුවරයා :

ගුරුවරයා යනු උගන්වනු ලැබිය යුතු සත්‍ය දන්නා පුද්ගලයාය :

**... ඔවුන්ට බොහෝ කාරණා උගන්වන්න පටන්ගත්සේක. (මාර්ක් 6:34)**

(පළමු සහ දෙවන පරිච්ඡේද නැවත බලන්න. "දෙවියන්වහන්සේ වෙතින් පැමිණි ගුරුවරයෙක්")

### ශිෂ්‍යයා :

ශිෂ්‍යයා යනු උගන්වන පාඩමට උනන්දුවකින් සහභාගි වන විශ්වාසවන්ත පුරුෂයෙක් හෝ ස්ත්‍රියකි. ශිෂ්‍යයා තමා දකින, අසන හා තේරුම්ගන්නා දේ වලට ප්‍රතිචාර දැක්වීමෙන් ඉගෙන ගනී.

**ඔවුන්ට දරන්න පුළුවන් ප්‍රමාණයට ... උන්වහන්සේ (යේසුස්වහන්සේ) වචනය ඔවුන්ට කී සේක. (මාර්ක් 4:33)**

ගුරුවරයා බයිබලීය කරුණ ඉගැන්වීමට වඩා යමක් කළ යුතුය. තනිව ගත් කළ කරුණු පමණක් ප්‍රයෝජනවත් නොවෙයි. ශිෂ්‍යයා කරුණු තේරුම් ගෙන අදාල කරගත යුතුයි. මතෙව් 13 දී වපුරන්නාගේ උපමාව තුළ, මග අසල වැටුණු බීජ ඩැහැගණු ලැබීය. මක්නිසාද අසන්නා තේරුම් ගත්තේ නැත (මතෙව් 13:19). ශිෂ්‍යයා උගන්වන ලබන දෙයෙහි අර්ථය තම පෞද්ගලික අත්දැකීම් තුළින් තේරුම්ගත යුතුය. (අටවන පරිච්ඡේදය නැවත බලන්න.)

**භාෂාව :**

උගන්වනු ලබන භාෂාව ශිෂ්‍යයාට තේරුම්ගත හැකි විය යුතු අතර නොඑසේ නම් පරිවර්තකයෙකු යොදා ගත යුතුය. (අටවන පරිච්ඡේදය නැවත බලන්න.)

**පරිසරය :**

මිනිසුන් හොඳින්ම ඉගෙන ගන්නේ පාඩම තම පරිසරයට සම්බන්ධ කළ විටය. ඔවුන් ඉගෙන ගන්නා දේ ප්‍රායෝගික විය යුතු අතර ඔවුන් ජීවිතයේ මුහුණ දෙන ප්‍රශ්න වලට අදාල කරගත හැකි විය යුතුය. පණිඩුඩය ඔවුන්ගේ නිවස, රැකියාව හා සේවය කරන පරිසරය ආදිය මගින් ඇති කරන අවශ්‍යතා වලට සේවය කළ යුතුය. (අටවන පරිච්ඡේදය බලන්න.)

**පාඩම :**

සන්නිවේදනය කළ යුතු පාඩම නම් දේව වචනයයි, බයිබලයයි. මඟපෙන්වීම සඳහා වූ මූලික ග්‍රන්ථය බයිබලයයි. අනෙකුත් පොත් සහ මාධ්‍යයන් පාවිච්චි කළ හැකිය, නමුත් අවසාන ආධිපත්‍ය නම් දේව වචනයයි. (තුන් වන සහ හතරවන පරිච්ජේද නැවත බලන්න.)

**අරමුණ :**

සෑම පාඩමක්ම සාමාන්‍ය හා විශේෂිත ආත්මික අරමුණු වලට සම්බන්ද විය යුතුය.
(නම වන පරිච්ඡේදය නැවත බලන්න.)

**ක්‍රමවේද :**

සෑම පාඩමක්ම උගන්වන්නේ ක්‍රමවේද යොදා ගෙනය.(පස්වන සහ හය වන පරිච්ජේද නැවත බලන්න.)

## උදාහරණයක්

සෑම ඉගැන්වීමේ අවස්ථාවකටම පොදු කරුණු පිළිබඳ උදාහරණයක් යොහන් 4 ආශ්‍රයෙන් පහත දැක්වේ.

**දිව්‍ය කර්තෘන් :** යේසුස්වහන්සේ ශුද්ධාත්ම බලයෙන් පූර්ණව, පියවු දෙවියන්වහන්සේගේ පණිවුඩය ප්‍රකාශ කරන ලදි.

**ගුරුවරයා :** යේසුස්වහන්සේ

**ශිෂ්‍යයා :** ළිද අසල සිටි කාන්තාව

**භාෂාව :** යේසුස්වහන්සේ ඇයට තේරුම් ගත හැකි වූ භාෂාවකින් කථා කළ සේක.

**පරිසරය :** පරිසරය වූයේ යාකොබ්ගේ ළිඳයි. යේසුස්වහන්සේ පාඩම ඉදිරිපත් කිරීම සඳහා පරිසරය පාවිච්චි කළ සේක.

**පාඩම :** දෙවියන්වහන්සේ ආත්මයකි' උන්වහන්සේව නමස්කාර කරන්නන් ආත්මයෙන්ද. සැබෑ කමෙන්ද උන්වහන්සේව නැමදිය යුතුය. යේසුස්වහන්සේ ජීවනදායක ජලයේ උල්පතයි.

**අරමුණ :** එම කාන්තාවගේ සැබෑ අවශ්‍යතාවය භෞතික ජලය උදෙසා නොව ජීවනදායක ජලය උදෙසා බව ඇයට තේරුම් කර දීම.

**ක්‍රමවේද :** යේසුස්වහන්සේ අවධානය ලබා ගැනීමේ ඉගැන්වුම් ආධාරකයක් ලෙස සුලභ වස්තුවක් (ජලය) යොදාගත් සේක. උන්වහන්සේ ඉගැන්වීමට අවස්ථාවක් ලෙස සුලභ අවස්ථාවක් (ළිඳෙන් වතුර ඇදීමට පැමිණීම) යොදා ගත්සේක. යේසුස්වහන්සේ භෞතික ජලය හා ජීවනදායක ජලය අතර වෙනස යොදා ගත් සේක. උන්වහන්සේ සංවාදය, ප්‍රශ්න ඇසීම හා සම්ප්‍රදායන් සඳහන් කිරීම යොදා ගත් සේක. උන්වහන්සේ පරණ ගිවිසුමෙන් උපුටා ගැනීම කළ අතර පවතින අවස්ථාව කාන්තාවගේ අවශ්‍යතාවයන් සමග සම්බන්ධ කිරීමට යොදා ගත් සේක. උන්වහන්සේ පාඩම ඇගේ ජීවිතයට සම්බන්ද කළ අතර පෞද්ගලික ප්‍රතිචාරයකට ඉඩ ලබා දුන්සේක.

## පාඩම සැලසුම් කිරීම

ඔබ දැන් පාඩමක් සැළසුම් කිරීමට සූදානම්ය. මෙම පියවර අනුගමනය කරන්න:

### පළමු පියවර - ආත්මිකව සූදානම්වන්න :

ඔබේ හදවත සූදානම් කර ගන්න :

> **සිත පිළියෙල කිරීම මනුෂ්‍යයාට අයිතිය. එහෙත් දිවේ උත්තරය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය. (හිතෝපදේශය 16:1)**

ඔබේ මනස සූදානම් කර ගන්න :

> **නමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩුනම්, වරද නොතබන්නාවූ, බොහෝකොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා, එවිට ඔහුට එය දෙනු ලැබේ. (යාකොබ් 1:5)**

දෙවියන්වහන්සේග් වචනය ලබා ගන්නා ලෙස ශිෂ්‍යයන්ගේ හදවත් සූදානම් කරන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ ඔබව ආලේප කර, උන්වහන්සේගේ වචනය ඉගැන්වීමට ඔබට හැකියාව දෙන මෙන් ඔබ වෙනුවෙන් යාච්ඤා කරන්න.

### දෙවන පියවර : පාඩම අධ්‍යයනය කරන්න

පාඩම සඳහා වූ බයිබල් කොටස කියවන්න. පාඩමේ පසුබිම සපයා දෙන අවට පරිච්ඡේද කියවන්න. සෙමින්, ආර්ථාන්විතව කියවීම තුළ පරිච්ඡේදය මෙනෙහි කරන්න. ඔබ උගන්වන විෂයට අදාලව බයිබලය පවසන සියලු දෙය අධ්‍යයනය කරන්න. සමපද අකාරදීන්, වචන අධ්‍යයනය කරන ග්‍රන්ථ, සහ අටුවාවන් ආදී බයිබල් අධ්‍යයනය මාර්ග ලබා ගැනීමේ හැකියාවක් ඔබට තිබේ නම් වැඩිදුර පර්යේෂණ සඳහා ඒවා යොදා ගන්න
.

> **සැබෑවේ වචනය හරි ආකාර පහදාදෙන්නාවූ ලජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තුවුණාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරපන්න. (2 තිමෝති 2:15)**

ඔබ අධ්‍යයනය කරන විට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබේ මනසට ගෙනෙන වැදගත් කරුණු සහ විශේෂ සිතිවිලි සටහන් කරගන්න. පාඩමේ කටු සටහනක් ගොඩනැගීම සඳහා ඔබට මෙම සටහන් යොදාගත හැක.

### තුන්වන පියවර - ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කරන්න :

ඔබ උගන්වන ශ්‍රාවක පිරිස විශ්ලේෂණ කිරීමට මෙම පාඩමාලාවේ අට වන පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගත් හැකියාවන් පාවිච්චි කරන්න.

## සතර වන පියවර - අරමුණු සටහන් කරන්න.

ඔබ සාදාගත් අධ්‍යයන සටහන් යොදාගෙන, ඔබේ ශ්‍රාවක විශ්ලේෂණය මනසේ තබා ගෙන පාඩම සඳහා අරමුණු සටහන් කරන්න. (මෙම පාඨමාලාවේ නව වන පරිච්ජේදය නැවත බලන්න, "අරමුණු සඳහන් කිරීම")

## පස්වන පියවර - පාඩමේ ප්‍රධාන අංශ වලින් කටු සටහනක් සකසා ගන්න.

බයිබලිය පාඩමක් ඉගැන්වීම සඳහා වූ සැළසුමක ප්‍රධාන කොටස් හතරකි : හැඳින්වීම, පාඩමේ ප්‍රධාන අංගය, අදාල කර ගැනීම සහ අවසානය. කටු සටහනක් තුළ, පාඩමේ සෑම කොටසකින්ම ඔබට ඉදිරිපත් කිරීමට අවශ්‍ය, වැදගත් සත්‍යයන් සාරාංශ කරන ලිඛිත ප්‍රකාශ ඇතුලත් විය යුතුය. කටු සටහන ඔබ උගන්වන විට විෂය තුළ රැඳී සිටීමට ඔබට උපකාර කරන බැවින් එය වටිනා ඉගැන්නුම් ආධාරකයකි. ඔබ ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතු වැදගත් සත්‍යයන් මතක තබා ගැනීමට ඔබට උපකාර කරනු ඇත. ඉගැන්වීමේ කටු සටහන දියුණු කිරීම සඳහා ඔබේ අධ්‍යයනයන් අතර තුර ඔබ සටහන් කළ සටහන් යොදාගන්න.

කටු සටහනක් රචනා කරන ආකාරය පහත දැක්වේ :

**මාතෘකාව :** පුද්ගලයන්ට කරුණු මතක තබා ගැනීමට මාතෘකා උපකාරී වේ. ගුරුවරයාට පාඩමේ අරමුණ නිශ්චිතව දැනගැනීමටද ඒවා උපකාරී වේ. පාඩමක් සඳහා වැදගත් සත්‍ය පෙන්නුම් කරන මාතෘකාවක් තෝරා ගන්න. "මෙම පාඩම තුළ මා කතාකරන්නේ කුමක් ගැනද?" යි ඔබෙන්ම අසන්න. ඔබේ කටු සටහනේ ආරම්භයේම මාතෘකාව ලියන්න.

**හැඳින්වීම :** හැඳින්වීම ශිෂ්‍යයන්ව උනන්දු කරවීම වැදගත්වේ. එසේ නොවුවහොත් ඔහු තව දුරටත් සවන් නොදෙනු ඇත.

යේසුස්වහන්සේට පිළිගත් හැඳින්වීමක් නොවීය. උන්වහන්සේ ක්‍රමවේද කිපයකින් තම ශ්‍රාවකයන්ගේ අවධානය ලබා ගත් සේක. සමහර අවස්ථා වලදී "සැබවක්, සැබවක්" යැයි පැවසූ විට එය "හොඳින් සවන් දෙන්නා ... මෙය වැදගත්" යි පැවසීම හා සමාන විය.

යේසුස්වහන්සේ තමන් කතා කරන පුද්ගලයාගේ උනන්දුව දනවන ප්‍රකාශයක් මගින්ද අවධානය ලබා ගත් සේක. උදාහරණයක් ලෙස, උන්වහන්සේ යොහන් 4 දී ළිඳ ළඟ සිටි කාන්තාව සමඟ සංවාදය ආරම්භ කළේ බීමට වතුර ඉල්ලීමෙන්ය.

> **සමාරියේ ස්ත්‍රියෙක් වතුර අදින්නට ආවාය. මට බොන්ට දියන්නැයි යේසුස්වහන්සේ ඇට කීසේක. (යොහන් 4:7)**

ඇය ළිඳ ළඟට පැමිණ සිටියේ වතුර ඇදීමටය, එබැවින් උන්වහන්සේ ඇගේ උනන්දුව පැවති තැනින් පටන් ගත් සේක. එම හැඳින්වීම ජීවනදායක ජලය පිළිබඳ ආත්මික සංවාදයක් වෙත ගෙන ගියේය.

ශ්‍රාවක පිරිස මෝසස්ගේ ව්‍යවස්ථාව පිළිබඳ උනන්දු වූයේ නම්, යේසුස්වහන්සේ මෙම කරුණ හැඳින්වීමක් ලෙස යොදාගත් සේක. ඔවුන් ඉශ්‍රායෙලය උදෙසා පොරොන්දු වූ රාජ්‍ය පිළිබඳ උනන්දු වූයේ නම්, උන්වහන්සේ මෙම කරුණ පිළිබඳව වූ ප්‍රකාශයකින් ආරම්භ කරනු ඇත. ඔබ ඔබේ ශ්‍රාවකයා උනන්දු කරවිය හැකි ප්‍රකාශයකින් පාඩම ආරම්භ කරන්නේ නම්, එය ඔබට ශුභාරංචිය ප්‍රකාශ කළ හැකිවන ලෙස ඔවුන්ගේ අවධානය ඔබ වෙත ලබා දෙනු ඇත.

අවධානය රඳවා ගැනීම සඳහා හැඳින්වීමක් ලෙස යේසුස්වහන්සේ පොදු වස්තූන්, ප්‍රශ්න සහ පිළිතුරු, උපමා, සිදුවීම් වල සවිස්තර වාර්තා, බයිබල් පද, සංසන්දනය කිරීම් සහ ගැටලු ද යොදාගත් සේක. උන්වහන්සේ ජීවිතයේ පොදු තත්වයන්ගේ අවස්ථාවන් යොදාගත් සේක. උන්වහන්සේ නොදත් දේ ඉගැන්වීමට දත් දෙයකින් පටන් ගත් අතර, ඔවුන්ව පොදු ඉගැන්වීම් වලින් ආරම්භ කර විශේෂ ඉගැන්වීම් වලට ගෙන ගිය සේක.

හැඳින්වීමක් පහත ආකාර විය යුතුය :

- කෙටි විය යුතුය : එය ප්‍රමාණයට වඩා දිගු වු විට, උනන්දුව නැතිවිය හැකිය.
- සිත් ඇදගන්නා සුළු විය යුතුය : එය ශ්‍රාවක පිරිසේ උනන්දුව ඇදගත යුතුය. ඇතැම් අවශ්‍යතාවයක් කේන්ද්‍රගත කර තිබිය යුතු හෝ යමකට අදාල විය යුතුය.
- මතක තබා ගත හැකි විය යුතුය : එය අසන්නාට පහසුවෙන් මතක තබා ගත හැකි විය යුතුය.
- උචිත විය යුතුය : හැඳින්වීම ඔබ උගන්වනු ලබන සත්‍යයන්ට සූදානම් කරයි: එය ශ්‍රාවකයන් වෙත පාඩමේ ප්‍රධාන අදහස ගෙනයයි.

ඔබේ ශිෂ්‍යයන්ගේ අවධානය ලබා ගන්නා හැඳින්වීමක් සූදානම් කරන්න. ඔබේ කටු සටහන තුළ ඔබ පාඩම හඳුන්වා දෙන්නේ කෙසේද යන්න පිළිබඳව හැඳින්වීමක් ලියන්න.

**පාඩමේ ප්‍රධාන අංගය :** පාඩමේ ප්‍රධාන අංගය යනු ඉගැන්වීමේ අඩංගු ප්‍රධාන දේවල් වේ. යේසුස්වහන්සේ ළිඳ ළඟ සිටි කාන්තාවට ඉගැන්වූ පාඩමේදී, උන්වහන්සේ ප්‍රධාන අංගය කේන්ද්‍රගත කළේ ජීවනයේ ජලය පිළිබඳවය. එය ජීවනදායක ජලයේ උල්පත, ජීවනදායක ජලය හා ස්වාභාවික ජලය අතර වෙනස, ජීවනදායක ජලය ලබා ගැනීමට අවශ්‍ය වූ ප්‍රතිචාරය, සහ ජීවනදායක ජලය පානය කිරීමේ ප්‍රතිඵල එළිදරව් කළේය :

- උල්පත :

  **යේසුස්වහන්සේ ඈට උත්තර දෙමින් : දෙවියන්වහන්සේගේ දීමනාවත්, මට බොන්ට දියන්නැයි නුඹට කිවේ කවුද කියාත්, නුඹ දැනගෙන සිටියානම්, නුඹ ඔහුගෙන් ඉල්ලනවා ඇත, එවිට ඔහු නුඹට ජීවනදායක වතුර දෙනවා ඇතැයි කී සේක... (යොහන් 4:10)**

- ජීවනදායක ජලය හා ස්වාභාවික ජලය අතර වෙනස :

  **... මේ වතුර බොන හැමදෙනාට නැවත පිපාසා වන්නේය. නමුත් මා දෙන වතුරෙන් බොන කවරෙකුට නමුත් කිසිකලෙක පිපාස නොවන්නේය. (යොහන් 4:13-14)**

- අවශ්‍ය වූ ප්‍රතිචාරය :

ඈ ආත්මික උල්පතෙන් ජලය පානය කළ යුතු විය :

**.... නුඹ ඔහුගෙන් ඉල්ලනවා ඇත, එවිට ඔහු නුඹට ජීවනදායක වතුර දෙනවා ඇත...මා දෙන වතුරෙන් බොන කවරෙකුට නමුත් නැවත පිපාසා නොවන්නේය... (යොහන් 4:10,14)**

- ප්‍රතිඵල :

  **...පිපාසා නොවන්නේය, මා ඔහුට දෙන වතුර ඔහු තුළෙහි සදාකාල ජීවනය නික්මවන්නාවූ වතුර උල්පතක් වන්නේය. (යොහන් 4:14)**

කටු සටහනක් තුළ ප්‍රධාන අංගය සංවිධානය කිරීමට පහසු ආකාරයක් පහත දැක්වේ :

1. පළමු ප්‍රධාන කරුණ.
   - A. පළමු ප්‍රධාන කරුණ පිළිබඳ අතිරේක ප්‍රකාශයක්.
     1. අනු කරුණ
     2. අනු කරුණ
   - B. පළමු ප්‍රධාන කරුණ පිළිබඳ අතිරේක ප්‍රකාශයක්.
     1. අනු කරුණ
   - C. පළමු ප්‍රධාන කරුණ පිළිබඳ අතිරේක ප්‍රකාශයක්.
2. දෙවන ප්‍රධාන කරුණ

(ඔබ පළමු ප්‍රධාන කරුණට සිදුකළ ආකාරයටම දෙවන ප්‍රධාන කරුණ පිළිබඳවද ප්‍රකාශ ලැයිස්තුගත කරන්න.)

පාඩම සඳහා වූ බයිබල් කොටස අනුගමනය කරන පරිදි කරුණ තර්කානුකූල පිළිවෙළකට සකස් වී ඇත්දැයි දැනගන්න. ප්‍රධාන කරුණු, ප්‍රධාන අදහසට සම්බන්ධතාවක් තිබිය යුතු අතර අනු කරුණු ප්‍රධාන කරුණු වලට සම්බන්ධතාවක් දැක්විය යුතුය. කරුණු මාරුවීමේදී සෑම කරුණක්ම පෙර කරුණට සම්බන්ධ කිරීමෙන් යහපත් ලෙස හුවමාරු වන්න. පාඩමේ සියලුම ප්‍රධාන කරුණු ආවරණය කරන තුරු කටු සටහන තව දුරටත් ඉදිරියට ගෙන යන්න. ඔබට ඇති කරුණු ගණන පාඩමෙන් පාඩමට වෙනස් විය හැකිය.

**අදාලකර ගැනීම :** ඔබ දේව වචනයේ සත්‍යයන් දෛනික ජීවිතයට සම්බන්ද කරගන්නා විට එය "අදාල කර ගැනීම" නම් වේ. ඔබ උගන්වන දේ සැබෑ ජීවිතයේ අවස්ථාවන්ට ඔබ අදාල කරයි. බයිබල් සත්‍යය ඉගැන් වූ විට, එය ශ්‍රාවකයාගේ ජීවිතයට හා සේවයට අදාල කර ගත යුතුය. "මෙම සත්‍ය මට බලපාන්නේ කෙසේද?" යන ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුතුය.

යේසුස්වහන්සේ හා ළිඳ ළඟ සිටි කාන්තාව පිළිබඳ උදාහරණයේදී, උන්වහන්සේ ඇයට ජීවන දායක ජලය පිළිබඳ ඉගැන්වූ අතර, ඉන්පසුව පාඩම අදාල කරන ලදි. මෙම ජීවනදායක ජලය ඇය තුළ පැවත ඇගේ ජීවිතය වෙනස් කළ හැකි බව උන්වහන්සේ ඇයට ඉගැන්වූසේක. සැබෑ වූ දෙවියන්වහන්සේව ආත්මයෙනුත් සැබෑකමෙනුත් නමස්කාර කරන්නේ කෙසේදැයි උන්වහන්සේ ඇයට පෙන්වූ සේක.

ඔබ පස්වන සහ හයවන පරිච්ජේදවලදී ඉගෙන ගත් ඕනෑම ඉගැන්වීමේ ක්‍රමවේදයකින් අදාල කර ගැනීම සිදු කර ගත හැක. ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම ඔබ ඉගැන්වූ සත්‍යයන් අදාල කිරීමට ඇති අනර්ඝ මාර්ගයකි. ශිෂ්‍යයන්ට තමා විසින්ම අදාල කර ගැනීමක් සිදු කිරීමටද අවස්ථාව සළසා දෙන්න.

අදාල කර ගැනීම් පාඩම නිරූපනය කරන සැබෑ ජීවිතයේ අත්දැකීම් වලින් උපුටාගත් ඒවා විය යුතුය. ඔබට එවැනි නිරූපනයක් බයිබලයෙන්, ඉතිහාසයෙන්, ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ජීවිත කතා වලින්, උපමා වලින්, ගීතිකා වලින්, පොත් කියවීමෙන් සහ පෞද්ගලික නිරීක්ෂණයන් හා අත්දැකීම් තුළින් සොයාගත හැකිය. මිනිසුන් හොඳින්ම ඉගෙන ගනු ලබන්නේ ක්‍රියාව හා සම්බන්ධ වීමෙනි. ශිෂ්‍යයන් ඉගෙන ගැනීමට නම් ඔවුන් දේවල් ක්‍රියා කළ යුතුය :

> **"ඉදින් මේ දේවල් දන්නා වූ නුඹලා ඒවා කරනවා නම් නුඹලා ආශිර්වාදලද්දෝය."**
> **(යොහන් 13:17) (යාකොබ් 5 ද නැවත බලන්න)**

"කිරීම" යනු අදාල කර ගැනීමයි. පාඩම අදාල කර ගැනීමට ශිෂ්‍යයන්ට උපකාරී වන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වලින් සමන්විත විය හැකිය. ඉගැන්වීමේ කටු සටහන තුළ , ඔබ ඉගැන්වූ සත්‍යයන් ඔබ අදාල කරගන්නේ කෙසේ දැයි ලියන්න. ඔබ පාවිච්චි කරන ක්‍රමවේද හා ක්‍රියාකාරකම්ද ඇතුළත් කරන්න.

**අවසානය :** අවසානය පාඩම නිමා කරයි. පාඩමක අවසානය තුළ පාඩමේ ප්‍රධාන අංගයේදී ඉගැන් වූ ප්‍රධාන කරුණු වල සාරාංශයක් ඇතුළත් විය යුතුය. සාරාංශය නීරස කරුණු දැක්වීමක් විය යුතු නැත. පාඩම නැවත සලකා බැලීමට හයවන පරිච්ජේදය තුළ ඔබ ඉගෙන ගත් ක්‍රමවේදයන්ගෙන් එකක් ඔබට යොදාගත හැකිය. ඔබට නිදර්ශන හෝ උපුටා ගැනීම් ඇතුළත් කළ හැකිය, ප්‍රශ්න ඇසීමට හෝ නිශ්චිත උපදේශයක් දීමට ඔබට හැකිය. නැවත මතක් කිරීම වැදගත් වේ. යේසුස්වහන්සේ බොහෝවිට ආත්මික සත්‍යයන් නැවත පැවසූ සේක. ශිෂ්‍යයන් පාඩම තේරුම් ගන්නා බව දැනගැනීම සඳහා අවශ්‍ය තරම් නැවත නැවත පැවසීම කරන්න.

අවසානය තුළ, ශිෂ්‍යයාගේ ප්‍රතිචාරය සඳහාද අවස්ථාවක් අන්තර්ගත විය යුතුය. යේසුස්වහන්සේ, පාඩම් අවසන් කරන විට, උන්වහන්සේ සෑම විටම ප්‍රතිචාරයකට ආරාධනා කළ සේක. ළිඳ ළඟ, "ගොස් නුඹේ පුරුෂයා කැඳවාගෙන මෙහි වරෙන්න" යැයි යේසුස්වහන්සේ සමාරිය කාන්තාවට පැවසූ සේක. ප්‍රතිචාරයක් සඳහා වූ මෙම කැඳවීම, ඇගේ පව් පිළිබඳ පසුතැවිලි වීමේ ප්‍රතිඵලය ලබා දුන්නේය. එළිදරව් වීමකට ප්‍රතිචාරයක් අවශ්‍යය. ස්වභාව ධර්මයේ අලංකාරය තුළින් දෙවියන්වහන්සේ තමන්වහන්සේ පිළිබඳව එළිදරව් කළ කරුණු වලට පවා මනුෂ්‍යයන්ගේ ප්‍රතිචාරයක් අවශ්‍ය විය :

**මක්නිසාද දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන් දේ ඔවුන් තුළ ප්‍රකාශව තිබේ, කුමක් හෙයින්ද දෙවියන්වහන්සේ එය ඔවුන්ට ප්‍රකාශකළසේක. මක්නිසාද ලෝකය මැව් තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලිකවූ බලය හා දෙවිකම මවන ලද දේ වලින් තේරුම් ගොස්, පැහැදිලි ලෙස පෙනී යන්නේය, එබැවින් ඔවුහු නිරුත්තරව සිටිති. (රෝම 1:19-20)**

පාඩමක් සඳහා වූ ප්‍රතිචාර වලට උදාහරණ නම්. යේසුස්වහන්සේව ගැලවුම්කරු ලෙස පිළිගැනීම, සුවය හෝ ශුද්ධාත්ම බෞතීස්මය ලබා ගැනීමට යාච්ඤාව සඳහා පැමිණීම, පාපය පිළිබඳව පසුතැවිලි වීම හා කිතුණු සේවය පිළිබඳව කැපවීම ආදිය වේ. ප්‍රතිචාරය සඳහා දෙන කැඳවීම හැඟිම්බර ආයාචනයක් නොවිය යුතුය. ශුභාරංචිය සඳහා ප්‍රතිචාර දැක්වීමට මිළයක් ගෙවිය යුතු බව යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. (මාර්ක් 8:34-35 බලන්න)

ඔබ සඳහන් කළ අරමුණු අත්පත් කරගෙන තිබේදැයි පරීක්ෂා කර බලන්නේ කෙසේදැයි තීරණය කරන්න. ඔබ ශිෂ්‍යයන් පරීක්ෂා කරනවාද? ඔවුන් ඉගෙන ගත් දේ පාවිච්චි කළ හැකි ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනවාද? ඔබ පාඩම අවසන් කරන්නේ කෙසේදැයි සාරාංශයක් ලියන්න. ප්‍රතිචාරය සඳහා කැඳවීමක් ඇතුළත් කිරීමට මතක තබා ගන්න. ඔබට අවශ්‍ය වන්නේ ඔබ ඉගැන්වූ පාඩමට ශිෂ්‍යයන් කෙසේ ප්‍රතිචාර දැක්වීමද?

## හයවන පියවර - ක්‍රමවේද හා ආධාරක තෝරාගන්න.

ඔබ පාඩම ඉගැන්වීමට යොදා ගන්නා ක්‍රමවේදය තෝරා ගන්න. ඔබට තෝරාගත හැකි ඔබ ඉගෙන ගත් ක්‍රමවේදයන්ගේ ලැයිස්තුවක් පහත දැක්වේ :

- දන්නා දෙයින් නොදන්නා දෙයට.
- සාමාන්‍ය තත්ත්වයෙන් විශේෂත්වයට.
- වස්තුවකින් පාඩම් කියාදීම/දෘශ්‍ය නිදර්ශන.
- ප්‍රශ්න සහ පිළිතුරු/සාකච්ඡාවන්.
- උපමා.
- සිදුවීමක සවිස්තර වාර්තාව (ඔබේ ඉගැන්වීම් නිරූපනය කරන දේ)
- බයිබල් පද භාවිතය.
- සංසන්දනය කිරීම.
- ගැටලු.
- අවස්ථාවන්.

ඔබ තෝරා ගන්නා ක්‍රමවේද ශ්‍රාවක පිරිසට හා පාඩමට ගැළපෙන බව නිශ්චිතව දැනගන්න. පාඩම කටු සටහන, බයිබලය, ශිෂ්‍යයන් උදෙසා වූ ලිඛිත ද්‍රව්‍ය, ඉගැන්නුම් ආධාරක පිළිබඳව හා ශිෂ්‍ය සහභාගිත්වය ඇතුළත් ක්‍රියාකාරකම් පිළිබඳව සැළසුම් කරන්න.

## හත්වන පියවර - ඉගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍යයන් සංවිධානය කරගන්න.

පාඩම සඳහා ඔබට අවශ්‍ය ද්‍රව්‍යයන් සංවිධානය කරගන්න. මේ තුළ ඔබේ ඉගැන්වීම් කටු සටහන,බයිබලය, ශිෂ්‍යයන් උදෙසා වූ ලිඛිත ද්‍රව්‍ය, ඉගැන්නුම් ආධාරක සහ ඔබ සැලසුම් කරන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් ඔබට ඇතුළත් කළ හැකිය.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

_______________________________________________

_______________________________________________

2. සෑම ඉගැන්වීම් අවස්ථාවකටම පොදු කරුණු මොනවාද?

_______________________________________________

_______________________________________________

3. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද පාඩම් සැළසුමක ප්‍රධාන කොටස් හතර මොනවාද?

_______________________________________________

_______________________________________________

4. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කළ පාඩමක් සැළසුම් කිරීමේ පියවර ලැයිස්තු ගත කරන්න.

පළමුවන පියවර : ______________________________

දෙවන පියවර : ______________________________

තුන්වන පියවර : ______________________________

හතරවන පියවර : ______________________________

පස්වන පියවර : ______________________________

හයවන පියවර : ______________________________

හත්වන පියවර : ______________________________

5. "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ ඇති කටු සටහන පාඩමක් සැලසුම් කිරීමට යොදාගන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යේසුස්වහන්සේව පෞද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීමට ශිෂ්‍යයන් මෙහෙයවීම ඉගැන්වීමේ අරමුණු අතර ප්‍රධාන එකකි. මෙම අරමුණු දරුවන් සමඟ වුවද පැවතිය හැකිය. එතැනදී අවශ්‍ය වන්නේ දරුවා තේරුම් ගැනීමට හා තීරණයක් ගත හැකි වයසක සිටීම පමණි.

- දෙවියන්වහන්සේ වෙත පැමිණි දරුවන් පිළිබඳ බයිබලීය උදාහරණ නම්, යෝසෙප්,සාමුවෙල්,යෙරමියා,දානියෙල්,යොහන් බෞතීස්ත, සහ තිමෝති.
- යටහත් පහත් බව, දරුවන් ළඟ ඇති,ශුභාරංචිය පිළිගැනීම පහසු කරවන ගුණාංගයකි : මතෙව් 18:4
- කුඩා දරුවෙකුට විශ්වාස කළ හැකිය : මතෙව් 18:6
- ආත්මිකව දරුවන් වරදට පත් කිරීම බරපතලය : මතෙව් 18:6,8
- දෙවියන්වහන්සේට දරුවකු ඉතා වටී. මතෙව් 18:10

  නැතිවූ බැටළුවා ගැන කතා කළ අවස්ථාවේදීත් යේසුස්වහන්සේ දරුවන් ගැන කතා කරමින් සිටි සේක : මතෙව් 18:12,13

- එක දරුවකු හෝ නැතිවීම පියාණන්වහන්සේගේ කැමැත්ත නොවේ : මතෙව් 18:14

2. යොහන් 3 සඳහන් යේසුස්වහන්සේ සහ නිකදේමුස් අතර සිදුවීමේදී ඇති ඉගැන්වීම් පිළිබඳ පොදු කරුණු විශ්ලේෂණය කරන්න :

   දිව්‍යමය කර්තෘන් :

---

ගුරුවරයා :

---

ශිෂ්‍යයා :

---

භාෂාව :

---

පරිසරය :

---

පාඩම :

---

ක්‍රමවේද :

---

3. බයිබලයේ වාර්තා කර ඇති යේසුස්වහන්සේගේ පණිවුඩයන්ගෙන් සමහරක ව්‍යුහය විශ්ලේෂණය කරන්න. සෑම එකක් සඳහාම පහත ප්‍රශ්න සලකන්න'

හැඳින්වීම : අවධානය ආරක්‍ෂා කරගැනීම සඳහා උන්වහන්සේ යොදාගත් ක්‍රමවේද මොනවාද? උන්වහන්සේ ඉගැන්වීම හඳුන්වා දෙන්නේ කෙසේද?

පණිවුඩයේ ප්‍රධාන අංගය : උන්වහන්සේ ඉගැන්වූ මූලික ඉගැන්වීම් මොනවාද? ඒවා ඉදිරිපත් කිරීමට උන්වහන්සේ යොදාගත් ක්‍රම වේද මොනවාද?

අදාල කරගැනීම : ශ්‍රාවකයන්ගේ ජීවිතයට හෝ ජීවිත වලට උන්වහන්සේ බයිබලීය සත්‍යයන් අදාල කරනු ලැබුවේ කෙසේද?

අවසානය : යේසුස්වහන්සේ පණිවුඩය අවසන් කළේ කෙසේද? උන්වහන්සේ කැඳවූයේ කවර ආකාරයේ ප්‍රතිචාරයන්ද?

4. ඉගැන්වීමට පාඩමක් සැළසුම් කිරීම සඳහා මීළඟ පිටුවේ ඇති කටු සටහන පාවිච්චි කරන්න.

# පාඩම සැලසුම් කිරීම සඳහා කටු සටහනක්

**පාඩමේ මාතෘකාව :** ________________________________________

**බයිබල් කොටස :** ________________________________________

**ශ්‍රාවක පිරිස :** ඔබ ඉගැන්වීමට සැළසුම් කරන ශ්‍රාවක පිරිස පිළිබඳව ඔබ දන්නා දේ සාරාංශ ගත කරන්න:

________________________________________

________________________________________

**අරමුණු :** මෙම පාඩම අවසන් කිරීම තුළින් ශිෂ්‍යයන්ට :

________________________________________

________________________________________

________________________________________

හැකිවනු ඇත.

## පාඩමේ කටු සටහන

**හැඳින්වීම :** මෙම පාඩම ආරම්භකරන ආකාරය :

________________________________________

**ප්‍රධාන අංගය :** (ප්‍රධාන කරුණු සටහන් කරන්න.)

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

**අදාල කරගැනීම :** මම ශිෂ්‍යයන්ගේ ජීවිත වලට පාඩම අදාල කරන්නේ කෙසේද?

________________________________________

**අවසානය :** පහත සඳහන් සෑම එකක්ම සැලසුම් කරන්න.

පාඩමේ සාරාංශය : මම පාඩම සාරාංශ ගත කරන්නේ කෙසේද?

______________________________________________________________________

ඇගයීම : ශිෂ්‍යයන් අරමුණු අත්පත් කර ගෙන ඇද්ද කියා බැලීමට මම ඇගයීමක් කරන්නේ කෙසේද?

______________________________________________________________________

ප්‍රතිචාරයක් උදෙසා කැඳවීම : මම ශිෂ්‍යයන්ට කරන්න යැයි පවසන්නේ මොනවාද?

______________________________________________________________________

**ඉගැන්වීමේ ක්‍රමවේද:** පාඩම ඉගැන්වීමට මා යොදා ගන්නා ඉගැන්වීමේ ක්‍රම වේද :

(ඔබට තෝරා ගත හැකි ඔබ ඉගෙන ගත් ඉගැන්වීමේ ක්‍රමවේද වල ලැයිස්තුවක් පහත දැක්වේ.)

- දන්නා දෙයින් නොදන්නා දෙයට
- සාමාන්‍ය තත්ත්වයෙන් විශේෂත්වයට
- වස්තුවකින් පාඩමක් කියාදීම/දෘශ්‍ය නිරූපණ.
- ප්‍රශ්න සහ පිළිතුරු/සාකච්ජාවන්.
- උපමා.
- සිදුවීමක සවිස්තර වා¾තාව
- බයිබල් පද භාවිතය
- සංසන්දනය කිරීම්
- ගැටලු
- අවස්ථාවන්

වෙනත් : ______________________________________________________________

**ඉගැන්වීමේ ආධාරක :** මෙම පාඩම ඉගැන්වීමට මම යොදාගන්නා ඉගැන්වීමේ ආධාරක :

______________________________________________________________________

______________________________________________________________________

**අවශ්‍ය අමුද්‍රව්‍ය :** මම පංතියට ගෙන යා යුතු ද්‍රව්‍ය :

____ බයිබලය _____ ඉගැන්වීමට _____ ඉගැන්වීමේ ආධාරක ____ වෙනත් : ____________________

# එකොළොස්වන පරිච්ඡේදය

## ඇගයීමක් කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- "ඇගයීමක් කිරීම" යන්න අර්ථ දැක්වීම,
- ඉගැන්වීමේ ඇගයීම වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කිරීමට,
- බයිබලීය ඉගැන්වීමේ ඇගයීම මනින ක්‍රමවේද හතරක් දැක්වීමට,
- ගුරුවරයා/ශිෂ්‍යයා ඇති ප්‍රශ්න වලට හේතු හඳුනාගැනීමට,
- ගැටලු බාධක ලෙස නොව අවස්ථාවන් ලෙස හඳුනාගැනීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **උතුම්වූ දේවල් ඒත්තුගන්ට නුඹලාට පුළුවන්වෙන්ටත්, ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස්ව සිටින්ටත්, (පිලිප්පි 1:10)**

## හැඳින්වීම

අරමුණු සඳහන් කරන ආකාරයත්, විවිධ ක්‍රමවේද යොදාගෙන බයිබල් පාඩමක් සැළසුම් කරන හා උගන්වන ආකාරයත් ඔබ ඉගෙන ගෙන තිබේ. නමුත් ඔබේ ඉගැන්වීම බලපෑමක් කර ඇතැයිද යන්න ඔබ දැනගන්නේ කෙසේද? ආත්මික අරමුණු ළඟාකරගත් බව සහ ඔබ උගන්වන අයගේ ජීවිතවලට උපකාරයක් හා වෙනසක් අත්දැක තිබේද යැයි ඔබ දැනගන්නේ කෙසේද? මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු ඇගයීමක් කිරීමේදී හමු වේ.

## ඇගයීමක් කිරීම

ඇගයීමක් කිරීම යනු යම් කිසිවක් ප්‍රවේසම් සහිතව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියයි. ඔබ ඔබේ ඉගැන්වීමේ ඇගයීමක් කරන විට, ඔබේ සේවයෙන් බලපෑමක් ඇති වුයේදැයි දැක ගැනීමට ඔබ ප්‍රවේශම් සහිතව ප්‍රතිඵලය පරීක්ෂා කරයි. දෙවියන්වහන්සේ ඔබට දී ඇති දීමනාව වර්ධනය කරගැනීමට නම් ඔබ ඔබේ ඉගැන්වීමේ ඇගයීම මැනීම වැදගත් වේ. ඔබේ විනිශ්චය ඔබ වර්ධනය කරගත යුතු බව පාවුල් පැවසුවේය.

> **උතුම්වූ දේවල් ඒත්තුගන්ට, නුඹලාට පුළුවන්වෙන්ටත්, ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස්ව සිටින්ටත්, (පිලිප්පි 1:10)**

## ඇගයීමේ පදනම

බයිබලීය ඉගැන්වීමේ ඇගයීම පහත කරුණු මත පදනම් වේ :

**අරමුණු :**

ඔබට අරමුණු අනුව ඉගැන්වීමේ ඇගයීම මැනිය හැකිය. සඳහන් කරන ලද අරමුණු ශිෂ්‍යයන් අත්පත් කරගෙන තිබේද? ඔබ මැනිය හැකි අරමුණු සඳහන් කළ යුතුය. එවිට ඒවා ළඟාකරගෙන ඇත්ද කියා ඔබට පැවසිය හැකිය.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට අරමුණු නියමිත කළ අතර, ඔවුන්ගේ ඉගෙනුම් අත්දැකීම් වල ප්‍රතිඵලයන් වලින් ඇගයීමක් කළ සේක :

**එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන ... ප්‍රේරිතයෝ යේසුස්වහන්සේ වෙතට රැස්ව තමුන් විසින් කළාවූද ඉගැන්වූවාවූද සියල්ල උන්වහන්සේට දැන්වූවෝය. (මාර්ක් 6:7,30) (ලූක් 9 ද බලන්න)**

## පරීක්ෂා කිරීම :

පරීක්ෂණයක් යනු උගන්වනු ලැබූ දේ ශිෂ්‍යයා ඉගෙන ගෙන තිබේදැයි තීරණය කරන විභාගයකි. දෙවියන්වහන්සේ ජීවන අත්දැකීම් තුළින් අපට උගන්වන අතර අපව පරීක්ෂාද කරයි. යේසුස්වහන්සේ පරීක්ෂණ මඟින් තම ගෝලයන්ගේ ඇගයීම කළ සේක.

**යේසුස්වහන්සේ ඇස් ඔසවා තමුන් ළඟට මහත් සමූහයක් එන බව දැක, මොවුන්ට කන්ට දෙන්ට අපි කොතැනින් රොටි මිලේට ගනිමුදැයි පිලිප්ගෙන් ඇසූ සේක.තමන් කරන්ට යන්නේ කිමෙක්ද කියා තමන්ම දැනගෙන ඔහු සෝදිසිකරන පිණිස මෙසේ කී සේක. (යොහන් 6:5-6)**

විධිමත් පරීක්ෂණයක් මෙම අත්පොතේ ඇති "ස්වයං පරීක්ෂණය" මෙන් ලිඛිත එකක් විය හැකිය. එය වචනයෙන් ප්‍රශ්න අසා පිළිතුරු දෙන වාචික එකක්ද විය හැකිය. අවිධිමත් පරීක්ෂණයක් ඇතිවන්නේ ශිෂ්‍යයන් සැබෑ ජීවිතයේ හෝ සේවයේ ප්‍රශ්න වලට මුහුණ දෙන විටය. ශිෂ්‍යයන් මෙවැනි අවස්ථාවලදී ප්‍රතිචාර දක්වන ආකාරය විධිමත් පරීක්ෂණයක දී ඔවුන් දක්වන ප්‍රතිචාර වලට වඩා වැදගත් වේ.

## ප්‍රතිචාරය :

ඉගැන්වීමේ ඇගයීම ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාර වලින්ද ගණනය කළ හැකිය :

- ශිෂ්‍යයන් පාඩමට ඇහුම්කන් දුන්නේද?
- ගුරුවරයා කළ ඉල්ලීමට ඔවුන් ප්‍රතිචාර දැක්වූයේද? උදාහරණයක් ලෙස කැදවීම ගැළවීම උදෙසා වූයේ නම් ගැළවීම නොලත් අය ඊට ප්‍රතිචාර දැක්වූයේද? කැදවීම සුවය හෝ ශුද්ධාත්ම බෞතිස්මය උදෙසා වූයේ නම්, ශිෂ්‍යයන් වෙතින් ප්‍රතිචාරයක් පැවතියේද? ඉගැන්වීම සඳහා වූ ප්‍රතිචාරයන්ගෙන් ආත්මික වර්ධනය ප්‍රකාශ වූයේද? මතක තබා ගන්න : ආත්මික වර්ධනය මනිනු ලබන්නේ ශිෂ්‍යයන් අසන දෙයින් නොව ඔවුන් අසන දේ පිළිබඳව ඔවුන් කරන දෙයිනි.

## ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය :

ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වයද ඇගයීමේ කොටසකි. ඔබේ ඉගැන්වීමේ ඇගයීම සඳහා මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසේ ඇති ප්‍රශ්න මාලාව යොදාගන්න.

# ගැටලු විශ්ලේෂණය කරන්න.

ඇගයීමක් කිරීමේදී ඔබේ ඉගැන්වීමේ ගැටලු හෙළිවුවහොත් අධෛර්යමත් නොවන්න. ගැටලු හඳුනාගැනීම ඔබට ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සළසා දෙයි. ගුරු/ශිෂ්‍ය සබධතාවය තුළ යේසුස්වහන්සේ පවා තම ශිෂ්‍යයන් සමඟ ගැටලු අත්දැක තිබුණි. පහත සඳහන් දේ සළකා බලන්න :

- ලූක් 9:54-56 කියවන්න. යාකොබ් සහ යොහන් යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කර ඇති බව දුටු විට, ස්වර්ගයෙන් ගින්නක් එවා මිනිසුන් විනාශ කර දැමීමට ඔවුන්ට අවශ්‍ය විය. යේසුස්වහන්සේ පැවසූ පහත පණිවුඩය ඔවුන්ට අමතක වී තිබුණි.

**මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ ගලවා ගන්ට ආයේය. (ලූක් 19:10)**

- යේසුස්වහන්සේ, තමා මනුෂ්‍ය වර්ගයාගේ පව් උදෙසා මරණයට පත්විය යුතු බව දේශනා කරන්ට පටන් ගත් විට, පේ‍්‍රතෘස් උන්වහන්සේට චෝදනා කළේය. යේසුස්වහන්සේට ඔහුව නිවැරදි කිරීමට සිදු විය. (මාර්ක් 8:31-33)

- යේසුස්වහන්සේ යක්ෂයන් දුරු කිරීමට ආධිපත්‍ය දී ඇති විට පවා, යක්ෂාත්මයක් ආවේශ වූ දරුවකුට සේවය කිරීමට ගෝලයන් අසමත් විය (මාර්ක් 9:13-28)

- මාර්ක් 10:35-45 කියවන්න. යාකොබ් සහ යොහන් යේසුසුවහන්සේගේ පැමිණෙන්ට තිබෙන රාජ්‍යයේදී උන්වහන්සේ අසලින් හිඳගත හැකිදැයි ඇසුවෝය. අනෙකුත් ගෝලයන් මෙය ඇසූ විට ඔවුන් යාකොබ් හා යොහන් පිළිබඳව අප්‍රසන්න වූහ. ඔවුන් සියලු දෙනාම යේසුස්වහන්සේ ඉගැන්වූ පණිවුඩය අතපසුවී තිබුණි :

  **නමුත් නුඹලා අතරේ එසේ නොවෙයි, නුඹලා අතරේ උතුම්වෙන්ට කැමති කවරෙක් නමුත් නුඹලාගේ සේවකයා වන්නේය. නුඹලා අතරේ ප්‍රධානියා වෙන්ට කැමති කවරෙක් නමුත් සියල්ලන්ගේ දාසයා වන්නේය.මක්නිසාද සැබවින් මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවයකරන්නටද බොහෝ දෙනෙකු උදෙසා මිදීමේ මිලයත් කොට තමාගේ ජීවිතය දෙන්ටද ආයේ යැයි කීසේක. (මාර්ක් 10:43-45)**

- යේසුස්වහන්සේට විශාලතම අවශ්‍යතාවය දැනුනු පැයේදී උන්වහන්සේ ගෝලයන්ට යාච්ඤා කරන්න යැයි පැවසූ විට ගෝලයෝ නිදාගත්හ. (මාර්ක් 14:32-42)

- එක් ගෝලයෙක් යේසුස්වහන්සේව පාවා දුන්නේය, එක් ගෝලයෙක් උන්වහන්සේ නොහඳුනන බව පැවසීය, ඉතිරි තැනැත්තා උන්වහන්සේව අත්අඩංගුවට ගත් විට පලා ගියේ ය. (මාර්ක් 14:43-72)

- පොහොසත් තරුණයා ගෝලත්වය උදෙසා වූ යේසුස්වහන්සේගේ කැඳවීම ප්‍රතික්ෂේප කළේය. (මාර්ක් 10:17-22)

යේසුස්වහන්සේ පාප රහිත කෙනෙක් වූ නිසා ගුරු/ශිෂ්‍ය සම්බන්ධතාවයන්ගේ ඇති වන ප්‍රශ්න වලට හේතුව යේසුස්වහන්සේ සමග නොවිය. ගැටළුව පැවතියේ ශිෂ්‍යයන් තුළය. දෙවියන්වහන්සේ අසමත් වන්නේ නැත. උන්වහන්සේගේ වචනය අසමත් වන්නේ නැත. යේසුස්වහන්සේ අසමත් වන්නේ නැත. ඔබේ ගුරු/ශිෂ්‍ය තත්ත්වයේ ප්‍රශ්න තිබේ නම්, පරීක්ෂා කිරීමට ඇත්තේ කරුණු දෙකකි. ගැටලු ගුරුවරයා මත හෝ ශිෂ්‍යයා මත රඳා පවතී.

ගුරු/ශිෂ්‍ය සම්බන්ධතාවයේදී ඇති වන ප්‍රශ්න වලට පොදු හේතු පහත දැක්වේ :

## ගුරුවරයා :

අරමුණු සඳහන් නොකිරීම : සඳහන් නොකල නිසා ඒවා ළඟා කරගත නොහැකි විය.

නිවැරදි ලෙස ශ්‍රාවක පිරිස විශ්ලේෂණය නොකිරීම : ගුරුවරයා නිවැරදි සංස්කෘතික,අධ්‍යාපනික හෝ ආත්මික මට්ටම් වලදී ශිෂ්‍යයාට සම්බන්ධ නොවීම.

නිවැරදි ලෙස සූදානම් නොවීම : පාඩම ගොඩනැඟීමට ප්‍රමාණවත් කාලයක් වැයකර නොතිබීම.

යාච්ඤාව ප්‍රමාණවත් නොවීම : ශිෂ්‍යයන් හා පාඩම උදෙසා ප්‍රමාණවත් කාලයක් යාච්ඤා නොකිරීම.

වැරදි ක්‍රමවේද : ක්‍රමවේදය උගන්වනු ලබන පාඩමට, වයස් කාණ්ඩයට හෝ සංස්කෘතියට නොගැලපීම. ක්‍රමවේදයන් ශ්‍රාවක පිරිසේ අවධානය රඳවා තබා නොගැනීම.

විනය : නියමිත පරිදි විනය පවත්වා නොගැනීම සහ ශිෂ්‍යයන්ට පාඩම කෙරෙහි අවධානය තැබිය නොහැකි වීම.

වැරදි ඉදිරිපත්කිරීම : ගුරුවරයා අධික වේගයෙන්, ඉතා සෙමෙන්, ඇසීමට ප්‍රමාණවත් තරම් ශබ්ද නොකර කතා කරීම හෝ සන්නිවේදනයට බාධා කරන දේවල් පැවතීම.

**ශිෂ්‍යයා :**

අවිශ්වාසය : ශ්‍රාවක පිරිස තුළ පැවති අවිශ්වාසය නිසා යේසුස්වහන්සේට තම නගරයේදී සවිලවත් ලෙස සේවය කළ නොහැකි විය. (මතෙව් 13:58)

දේව වචනය නැමැති බීජය සරු පසෙහි නොවැටීම : මතෙව් 13:1-9, 18-23 හි සඳහන් වපුරන්නාගේ උපමාව කියවන්න. සාතන් වචනය ඩැහැගත්තේය, පරීක්ෂාවන් පැමිණිවිට ඒවා වියළී ගියේය සහ ලෝකයේ කණස්සලුවීම් නිසා ඒවා මැළවී ගියේය.

අවධානය ලබා නොදීම : සිත වෙනත් දෙයක් කෙරෙහි යොමු වීම නිසා හෝ විනය පිළිබඳ ප්‍රශ්න හේතුවෙන් ශිෂ්‍යයන් අවධානයෙන් නොසිටීම. ඔවුන් තම හදවත් වල සරු පසින් වචනය ඩැහැගැනීමට සාතන්ට ඉඩ දීම. (මතෙව් 13:19).

ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කිරීම : ශිෂ්‍යයා වචනය ක්‍රියාත්මක කරන්නෙකු බවට පත් නොවීම. ඔහු වචනය ඇසුවේය. එසේම එය ප්‍රතික්ෂේප නොකළ නමුත් තම ජීවිතය තුළ ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළේය(යාකොබ් 1:22-25 නැවත බලන්න). ගෝලත්වය උදෙසා වූ ස්වාමීන්වහන්සේගේ කැඳවීම ප්‍රතික්ෂේප කළ පොහොසත් තරුණයාට පැවති ප්‍රශ්නය වූයේ මෙය යි.

පණිවුඩය ප්‍රතික්ෂේප කිරීම : ශිෂ්‍යයා පණිවුඩය ප්‍රතික්ෂේප කළේය. යේසුස්වහන්සේගේ ඇතැම් ගෝලයන් උන්වහන්සේව අනුගමනය කිරීම අත්හැර දැමීමට බලපෑ ගැටලුව මෙය විය (යොහන් 6:53-66).

## ගැටලු ප්‍රයෝජනයට ගැනීම

ඉගැන්වීමේ අවස්ථා වලදී ඇති වන ප්‍රශ්න නිසා අධෛර්යට පත්නොවන්න. ඒවා ඉගෙන ගැනීමටත් ඔබේ ඉගැන්වීමේ ක්‍රමෝපායන් වර්ධනය කරගැනීමටත් අවස්ථාවන් කරගන්න. යාච්ඥාව සහ වෙනස්වීම තුළින් ගැටලු නිවැරදි කරගත හැකිය. ඇතැම් ගැටලු නිවැරදි කර ගැනීම සඳහා ගුරුවරයාට වෙනස් විය හැකිය. අනෙක් ගැටලු නිවැරදි කරගැනීම සඳහා ශිෂ්‍යයන්ට වෙනස් විය හැකිය.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වීම අත්හැරියේ නැත. ඔවුන්ගේ වැරදි සහ අසමත්වීම් නිසා උන්වහන්සේ අධෛර්යට පත්වූයේ නැත. යේසුස්වහන්සේ ඔවුන්ව දුටුවේ, ඔවුන්ගේ ජීවිත තුළ ශුද්ධාත්මයාණන්වහන්සේට ක්‍රියාත්මක වීමට ඉඩ දුන්නහොත් ඔවුන්ට පත්විය හැකි තත්වය තුළිනි. අවසානයේදී ඔවුන් එම විශ්වාසය සත්‍ය බව ඔප්පු කළහ. ක්‍රියා පොත තුළ මෙම අවිශ්වාස කරන, බියගුළු, අසමත්වන පුද්ගලයන් පළමු සභාවේ ශ්‍රේෂ්ඨ නායකයන් ලෙස ඉස්මතුවන ආකාරය අපට දැකගත හැකිය.

ඔබට ගැටලු දෙස අවස්ථාවන් ලෙස හෝ බාධක ලෙස බැලිය හැකිය. ඔබ ගැටලු බාධාවන් ලෙස සැළකුවහොත්, ඔබ අධෛර්යට පත් වී හැරයා හැකිය. ඔබ ඒවා අවස්ථාවන් ලෙස සැළකුවහොත් ඔබ ආත්මිකව වර්ධනය වී බයිබලය ඉගැන්වීමේ හැකියාවන් වර්ධනය කරගනු ඇත.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. “ඇගයීම ” යන්න අර්ථ දක්වන්න.

3. ඔබේ ඉගැන්වීම ඇගයීම වැදගත් වන්නේ ඇයි?

4. බයිබලිය ඉගැන්වීමේ ඇගයීම කරන ක්‍රමවේද හතරක් ලියන්න.

5. ගුරු/ශිෂ්‍ය තත්ත්වයේදී ඇතිවන ප්‍රශ්න සඳහා පොදු හේතු සාරාංශගත කරන්න.

6. ඔබට ගැටලු ධනාත්මක ආකාරයකට යොදාගත හැක්කේ කෙලෙසද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

## ඔබගේ ඉගැන්වීම ඇගයීම

ගුරුවරයෙකු ලෙස ඔබේ ඇගයීම කරන්න. සෑම ප්‍රශ්නයක්ම කියවා වඩාත් නිවැරදියැයි ඔබ සිතන අංකය රවුම් කරන්න. රවුම් කරන ලද අංකයන්ගේ එකතුව ගණනය කරන්න. ලකුණු 85 හෝ ඊට වැඩිනම් එය අගනා ලකුණකි. එසේම 40 හෝ ඊට අඩු නම් එය දුර්වල ලකුණකි. අතර මැද (41-60) තරමක් හොඳ වන අතර (61-84) හොඳ අගයකි. අංක මඟින් දැක්වෙන්නේ : 1 = කවදාවත් නොවේ. 2 = කලාතුරකින් 3 = ඇතැම්විට 4 = බොහෝවිට 5 = සෑමවිටම.

### සූදානම්වීම :

| | |
|---|---|
| මම සතියකට හෝ පෙර සිට පාඩම සූදානම් කිරීම ආරම්භ කරමි. | 5 4 3 2 1 |
| මාගේ පාඩමට සූදානම්වීමේදී වැදගත් වන්නේ බයිබලයයි. | 5 4 3 2 1 |
| පාඩමක් අධ්‍යයනය කිරීමට මට ක්‍රමානුකුල සැලසුමක් තිබේ. | 5 4 3 2 1 |
| මම සූදානම් වන විට මාගේ ශිෂ්‍යයන්ගේ විශේෂිත අවශ්‍යතාවයන් මනසේ තබා ගනිමි. | 5 4 3 2 1 |
| මම සෑම පාඩමක් සඳහාම විශේෂිත අරමුණක් ලියා තබමි. | 5 4 3 2 1 |
| මම පාඩමට සැලසුමක් ලියමි. | 5 4 3 2 1 |
| මම මගේ වැඩය පිළිබඳව නිතර යාච්ඤා කරමි. | 5 4 3 2 1 |
| කියවීම, සේවකයන්ගේ රැස්වීම් වලට සහභාගී වීම හෝ පුහුණු පාඨමාලා වලට සහභාගිවීම තුළින් මගේ ඉගැන්වීම දියුණු කරගැනීමට නිතර වෙහෙසෙමි. | 5 4 3 2 1 |

### ඉදිරිපත් කිරීම :

| | |
|---|---|
| ආරම්භයේ පටන් මම ශිෂ්‍යයන්ගේ උනන්දුව ලබා ගනිමි. | 5 4 3 2 1 |
| මම අර්ථාන්විතව බයිබල් කොටස් කියවීම කරනු ලබයි. | 5 4 3 2 1 |
| මම ප්‍රතිචාරයක් සඳහා වූ කැඳවීමකින් අවසන් කරමි. | 5 4 3 2 1 |
| මම විවිධාකාරයේ ඉගැන්නුම් ක්‍රමවේද භාවිතා කරමි. | 5 4 3 2 1 |
| මම වෙනත් අතකට යොමු නොවී පාඩම අවසානය දක්වා ගෙන යාමට සමත්වෙමි. | 5 4 3 2 1 |
| මම වැදගත් සත්‍යයන් වලට සුදුසු අවධානය දක්වමි. | 5 4 3 2 1 |
| මම ඉගැන්වූ දේ ජීවිතයටත් සේවයටත් අදාල කර ගනිමි. | 5 4 3 2 1 |

### ප්‍රතිචාරය :

| | |
|---|---|
| මගේ ශිෂ්‍යයන් තවදුරටත් බයිබල් අධ්‍යයනය සඳහා පෙළඹේ. | 5 4 3 2 1 |
| මගේ ඉගැන්වීම ජීවිතය වෙනස් කිරීමට උදව් වේ. | 5 4 3 2 1 |
| මගේ ඉගැන්වීම නැති වූ අය ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන එයි. (එවැන්ජලිස්ත සේවය) | 5 4 3 2 1 |
| මගේ ඉගැන්වීම ශිෂ්‍යයන් සහාව සමග දක්වන සම්බන්ධතාවයන්ගේදී විශ්වාසවන්ත අය බවට පත් කරයි. | 5 4 3 2 1 |
| මගේ ඉගැන්වීම ආත්මික පරිණත බවට අනුබල දෙයි. | 5 4 3 2 1 |

# දොළොස්වන පරිච්ඡේදය

## අධ්‍යයන විෂය මාලාව තෝරාගැනීම සහ දියුණු කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- " බයිබලීය අධ්‍යයන විෂය මාලාව " යන්න අර්ථ දැක්වීමට,
- බයිබලීය අධ්‍යයන විෂය මාලාවක වටිනාකම පැහැදිලි කිරීමට,
- සුදුසු අධ්‍යයන විෂය මාලාවක් තෝරාගැනීමට,
- ඔබේම බයිබලීය අධ්‍යයන විෂය මාලාවක් ගොඩනැගීමට, ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

## හැඳින්වීම

සභාවේ සියලු ඉගැන්වීම් වල මුලය බයිබලයයි. නමුත් කිතුණු ලේඛකයන් ශිෂ්‍යයන් කණ්ඩායමක් හෝ කණ්ඩායම් කිහිපයක් පුහුණු කිරීම සඳහා යොදාගත හැකි වැදගත් විෂය කරුණු ගොඩනංවා තිබේ. මෙම පාඩම බයිබලීය අධ්‍යයන විෂය මාලාවක් තෝරාගැනීම පිළිබඳව සළකා බලයි.

## බයිබලීය අධ්‍යයන විෂය මාලාව

"අධ්‍යයන විෂය මාලාව" යන වචනය අර්ථ දැක්වෙන්නේ සංවිධානය කරන ලද පාඩම් මාලාවකි. එය පාසලක යොදාගන්නා එක් පාඩම් මාලාවකට හෝ සියලුම පාඩම් මාලාවන්ට යෙදිය හැකිය. "බයිබලීය අධ්‍යයන විෂය මාලාව" යනු බයිබලීය විෂය කරුණු අධ්‍යයනය කරන පාඨමාලාවකි.

## බයිබලීය අධ්‍යයන විෂය මාලාවේ වැදගත්කම

බයිබලීය අධ්‍යයන විෂය මාලාව කිතුණු ඉගැන්වීම් ක්‍රමයේ වටිනා ආයුධයකි. ඊට හේතු කිහිපයක් පහත දැක්වේ :

- ඔබට ඇත්තාවූ කාලය තුළ ලබා ගත හැකි හෝ සූදානම් කර ගැනීමට හැකි ප්‍රමානයට වඩා පර්යේෂනයන් හා පසුබිම් මාධ්‍යයන් විශාල ප්‍රමාණයක් එය සපයා දෙයි.

- එය ශිෂ්‍යයන් උදෙසා ලිඛිත පාඩම් හා ක්‍රියාකාරකම් සපයයි.

- එය පාඩමක් ඉගැන්වීම සඳහා කටු සටහනක් සපයා දෙයි.

- එය පාඩම උගන්වන්නේ කෙසේද යන්න පිළිබඳව යෝජනා සපයා දෙයි.

- බොහෝ අධ්‍යයන විෂය මාලාවන් නිශ්චිත වයස් මට්ටමකට සකස් කර තිබේ. ඒවා ලියා ඇත්තේ එම වයස් මට්ටම සමග කටයුතු කිරීමට පුහුණුව ලත් පුද්ගලයන් විසිනි.

- සංවිධානය කරන ලද අධ්‍යයන වැඩසටහනක් බයිබලීය සත්‍යයන් වැඩි ප්‍රමාණයක් ආවරණය කරයි. බොහෝ ගුරුවරු තමන් කැමති හා ඉගැන්වීමට පහසු යැයි සිතෙන බයිබල් කොටස් කෙරෙහි අවධානය දැක්වීමට කැමතිය. සංවිධානය කරන ලද අධ්‍යයන වැඩසටහන් කාලපරිච්ඡේදයක් තුළදී සම්පූර්ණ බයිබලය ආවරණය කරයි.

- ප්‍රාදේශීය සභාවක් තුළ විවිධ වයස් මට්ටම් සඳහා ඉගැන්වීම් සංවිධානය කරන ආකාරය සපයා දෙයි.

## අධ්‍යයන විෂය මාලාව තෝරා ගැනීම

අධ්‍යයන විෂය මාලාව තෝරාගැනීමේදී මතක තබා ගත යුතු වැදගත් දෙය නම් මිනිසා විසින් රචනා කළ අධ්‍යයන විෂය මාලාව අපේ අවසාන ආධිපත්‍ය නොවන බවයි. කිතුණු ගුරුවරයෙකුට ඇති එකම ආධිපත්‍ය බයිබලය පමණි. අධ්‍යයන ක්‍රමය ධර්මානුකූලව නිවැරදි බව දැනගැනීම සඳහා එය ප්‍රවේශම් සහිතව පරීක්ෂා කළ යුතුය.

අධ්‍යයන විෂය මාලාවක් ලබාගන්නේ හා තෝරාගන්නේ කෙසේදැයි පහත දැක්වේ :

1. ඔබේ ප්‍රාදේශීය සභාව සංවිධානාත්මක නිකායක කොටසක් නම්, ඔවුන් ඔවුන්ගේම අධ්‍යයන විෂය මාලා නිකුත් කර තිබිය හැකිය. ඒවායේ සාම්පලයක් ලබා ගැනීම සඳහා ඔබේ නිකායේ මූලාස්ථානයට ලිපියක් ලියන්න. වැඩිහිටියන් සඳහා වූ ඔබේ පුහුණු වැඩසටහනක් සඳහා හාවස්ටයිම් අන්තර්ජාතික ආයතනයේ මාධ්‍යයන් යොදාගැනීමට මතක තබා ගන්න. තොරතුරු ලබා ගැනීම සඳහා අපට ලිපියක් ලියන්න.

2. ඔබට උගන්වන්නට යන ද්‍රව්‍යයන් ලැබෙන තුරු , ඔබේ සම්පූර්ණ ඉගැන්වීමේ වැඩසටහන සඳහා සාමාන්‍ය අරමුණු ලියා තබන්න (මෙම පාඨමාලාවේ නව වන පරිච්ඡේදයේදී ඉගෙනගත් හැකියාවන් යොදාගන්න). ඔබ විෂය මාලා ලබා ගන්නා කණ්ඩායම් වෙනුවෙන් ඔබට ඇති සාමාන්‍ය ආත්මික අරමුණු මොනවාද? අධ්‍යයන ක්‍රමය ආත්මික අරමුණු ළඟා කර ගන්නේ දැයි දැන එහි ඇගයීමක් කිරීම සඳහා ඔබ මෙම අරමුණු දැන ගත යුතු වේ.

3. ඔබට උගන්වන්නට යන ද්‍රව්‍යයන්ගේ සාම්පල ලැබුණු විට, එහි ඇගයීමක් කිරීම සඳහා මෙම පරිච්ඡේදයේ ඇති ප්‍රශ්න මාලාව යොදාගන්න. මෙම විෂය මාලාව වෙනත් අයත් උගන්වන්නේ නම්, සාම්පල පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ උපකාරයද ලබා ගන්න.

4. ඔබට ඉගැන්වීමට අවශ්‍ය අධ්‍යයන විෂය මාලාව තෝරාගත් පසු, ඇණවුම සකසා තැපැල් කරන්න. සාම්පල් පැකේජය සමග ප්‍රකාශකයා විසින් එවා ඇති ඇණවුම යොදා ගන්න. විෂය මාලා සඳහා නිවැරදි ගෙවීම් ඇතුළත් කිරීමට මතක තබා ගන්න. ඔබ ඇණවුම් කළ දේ ඔබට ලැබී තිබේ දැයි තහවුරු කරගැනීමට ඇණවුමේ පිටපතක් ඔබ සමග තබාගන්න.

5. ඇණවුම ලැබුණු විගසම, ඔබ ඇණවුම් කළ දේවල්ම එවා ඇත්දැයි බලන්න. ඔවුන් ඇත්තටම එවා ඇති දේ ඔබේ මුල් පිටපත සමඟ සංසන්දනය කරන්න. ඔබේ ඇණවුම ලබා දීමේදී වරදක් සිදුවී ඇත්නම්, වහාම ප්‍රකාශකයාට දැනුම් දෙන්න.

6. අධ්‍යයන විෂය මාලාව පාවිච්චි කරන ආකාරය පිළිබඳව ඔබට අන් අයව පුහුණු කිරීමට සිදුවිය හැකිය. මෙය සිදු කිරීමේදී මෙම පාඨමාලාවේ "ගුරුවරුන් පුහුණු කිරීම" යන දහහතර වන පරිච්ඡේදය ඔබට උපකාරී වනු ඇත.

7. ඔබ උගන්වන්නට යන ද්‍රව්‍යයන් පාවිච්චි කිරීමට සූදානම් වන තුරු උගන්වන්නට යන ද්‍රව්‍යයන් ආරක්ෂිත ස්ථානයක ගබඩා කරන්න.

# බයිබලීය අධ්‍යයන විෂය මාලාවක් ගොඩනැංවීම

අධ්‍යයන විෂය මාලාවක් මිළදී ගැනීමට ඔබට මුදලක් නොමැති නම්, ඔබටම එය ගොඩනැංවිය හැක. මෙම පාඨමාලාවේ දහවන පරිච්ඡේදයේදී ඔබ පාඩමක් සැළසුම් කරන ආකාරය ඉගෙන ගත්තේය. මෙවැනි පාඩම් මාලාවක් දියුණු කරගැනීම සඳහා එම හැකියාවන් යොදාගන්න. මෙම පාඩම් විස්තර වශයෙන් සටහන් කර ගන්න. එවිට නොදැනුවත්වම, ඔබ ඔබේම පුහුණු පාඨමාලාවක් ගොඩනගාගෙන තිබේ. ඔබ ලියා ඇති පාඩම් මාලාව ගෙන, මෙම පරිච්ඡේදයේ ඇති ඇගයීම කිරීමේ සටහන යොදා ගෙන ඇගයීමක් කරන්න. ඔබ උගන්වන්නට සූදානම් කර ඇති පාඩම් වැඩි දියුණු කළ හැකි මාර්ග හඳුනා ගැනීමට සටහන ඔබට උපකාරී වනු ඇත.

මෙම උගන්වන්නට යන බයිබලීය අධ්‍යයන පාඩම් මිලදී ගන්නවාට වඩා ගොඩනැංවීමට කාලයක් ගතවේ, නමුත් එහි වාසි කිහිපයකි :

- ඔබ එය භාවිතා කිරීමට අදහස් කරන ශ්‍රාවක පිරිස හෝ සංස්කෘතිය උදෙසා ඔබට එය විශේෂිතව සැළසුම් කරගත හැකිය.
- එහි දේවධර්මය පිළිබඳව ඔබට නිවැරදිව දැන ගත හැකිය.
- නිශ්චිත ආත්මික අරමුණු ළඟාකරගැනීම සඳහා ඔබට එය සූදානම් කරගත හැකිය.

# විෂය මාලාවක් ඇගයීමේදී භාවිතා කළහැකි ප්‍රශ්න මාලාව

අධ්‍යයන විෂය මාලාව නැවත පරීක්ෂා කිරීමේදී මෙම ඇගයීමේ ප්‍රශ්න මාලාව පාවිච්චි කරන්න :

## ගුරුවරයා උගන්වන්නට යන ද්‍රව්‍යයන් :

## අරමුණු :

- සඳහන් කර ඇති අරමුණු මොනවාද?
- ඔබ ඉගැන්වීම/ඉගෙනීම සඳහා සඳහන් කර ඇති අරමුණු වලට ඒවා සමාන වේද?
- ඔබ ඒවා ළගාකරගත් බව දැන ගත හැකි වන ලෙස ඒවා නිශ්චිතව දක්වා තිබේද?

## අන්තර්ගතය :

- අන්තර්ගතය ධර්මානුකූලව නිවැරදිද?
- එය ඔබේ සංස්කෘතියට ගැළපේද?
- බයිබලීය අන්තර්ගතය එය යොදා ගනු ලබන වයස සඳහා ගැලපේද?
- බයිබලීය අන්තර්ගත කොටස් වල අර්ථය එය යොදා ගනු ලබන වයස සඳහා ගැලපේද? (වැඩිහිටි ශ්‍රාවකයන් සඳහා ඉතා සරල හෝ ලාබාල ශ්‍රාවකයන් සඳහා ඉතා අසීරු නොවිය යුතුය)
- එම උගන්වන්නට යන ද්‍රව්‍යයන්, කිතුණු සමාජයේ කොටසක් වීම, එහි නමස්කාරය, ව්‍යුහය, විශ්වාස, ඉතිහාසය හා මෙහෙය පිළිබඳව තේරුම් ගැනීමට ශිෂ්‍යයන්ට උපකාර කරයිද?
- අන්තර්ගතය ඔබේ සභාවේ වැඩසටහන් වලට උපකාර කරයිද?

## ජීවිතයේ අත්දැකීම් :

- මෙම උගන්වන්නට යන ද්‍රව්‍යයන් කිතුණු ජීවිතයේ තේරුම පිළිබඳව දක්වන අදහස කුමක්ද? මෙය කවර සීමාවක් සඳහා ඔබේ අරමුණු සමඟ එකඟවේද?
- මෙම උගන්වන්නට යන ද්‍රව්‍යයන් තුලින් ලබා ගන්නා බයිබලීය දැනුම කිතුණු ජීවිතය සමග සම්බන්ධ කරන්නේ කෙසේද?
- කිතුණු ජීවන රටාවක් හෙළිදරව් කරන ක්‍රියාවන් ක්‍රියාවේ යෙදවීමට සහ ඒ පිළිබඳව ඕනෑකමින් සිතා බැලීමට මෙම උගන්වන ද්‍රව්‍යයන් මගින් අවස්ථාවක් ලබා දෙයිද?
- මෙම මෙම උගන්වන්නට යන ද්‍රව්‍යයන් පවුල, පාසල, සමාජය, ලෝකය සහ පරිසරය තුළ ජීවත්වීම සමග කිතුණුබව සම්බන්ධ කරන්නේ කෙසේද?

## ආකෘතිය :

- පොතේ ආකෘතිය සිත් ගන්නා සුළු ද?
- ඉගැන්වීමේ පියවර ගුරුවරයාට පහසුවෙන් තේරුම්ගත හැකි පරිදි සෑම පාඩමක්ම පැහැදිලිව සාරාංශකර තිබේද?
- කටු සටහන අවබෝධ කරගැනීමට උපකාරීවන විශේෂ ලක්‍ෂණ එහි තිබේද?
- ඉගැන්වීම සඳහා යෝජනා කර ඇති ක්‍රමවේද මොනවාද? මේ සෑම එකක්ම ගුරුවරයාට පහසු වේද? පහසුවෙන් ඉගෙනගත හැකි අළුත් ඒවා මොනවාද?
- ක්‍රියාකාරකම් සඳහා වූ උපදෙස් පැහැදිලි සහ අනුගමනය කිරීමට පහසු ඒවාද?
- පොතෙහි ඇති දෙයින් ඔබ්බට ගොස් පාවිච්චි කිරීමට යෝජනා කර ඇති සම්පත් මොනවාද? මේවායින් අත්‍යවශ්‍ය වන්නේ මොනවාද? පහසුවෙන් ලබාගත හැක්කේ මොනවාද?
- ගුරුවරයාගේ පොත තුළ, පංතියේ සිටින අයගේ වයස් හා ඉගෙනීමේ මට්ටම් පිළිබඳව උපකාරී වන මාධ්‍යයන් අන්තර්ගතව තිබේද?
- ගුරුවරයාගේ තොරතුරු වැඩිවන පරිදි පාඩමේ අන්තර්ගතය පිළිබඳ පසුබිම් මාධ්‍යයන් දක්වා තිබේද?

## ශිෂ්‍යයාගේ මාධ්‍යයන් :

## කියවීම් පොත :

- එය සිත්ගන්නා සුළු ලෙස ඉදිරිපත් කර තිබේද? (දරුවකුගේ දෘෂ්ටි කෝණයේ සිට)
- මුද්‍රණය කර ඇති ආකාරය දරුවකුට කියවීමට පහසුද?
- රටාව සහ භාෂාව දරුවකුගේ උනන්දුව ආකර්ශනය කරගනු ඇතිද?
- කථාන්දරය දරුවකුගේ තේරුම්ගැනීම තුළ පවතිද?

## වැඩ පොත :

- ක්‍රියාකාරකම් දරුවන්ගේ සිත්ගන්නා සුළු වේද?
- ඒවා ඉතා අසීරුද? ඉතා පහසුද?
- ඒවා පාඩම තේරුම්ගැනීම වැඩිදියුණු කරනු ඇතිද? කෙසේද?
- ඒවා වෙනුවෙන් වැය කළ මුදලට ඒවායෙන් ලැබෙන උපකාරය ප්‍රමාණවත්ද? නොඑසේ නම් පංතිය වෙනුවෙන් විශේෂයෙන් ක්‍රියාකාරකම් සූදානම් කිරීම වඩා සුදුසු වේද?

## ක්‍රියාකාරකම් ගොනුව :

- පාවිච්චි කිරීමට වඩා කැමැත්තක් ඇත්තේ කවර ක්‍රියාකාරකම්ද? කොපමණ කාලයක් ඇතුළතද?
- විවේචනාත්මකව කතා කළ විට, පෝස්ටර්, පිංතූර, චිත්‍රපට සේයාපට ආදී සෑම දෙයකම ගුණාත්මක භාවය කෙසේද?
- යෝජනා කර ඇති ක්‍රියාකාරකම් ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් වේද? නොඑසේනම් අඩු වෙහෙසකින් හා මුදලකින් ඒ හා සමානම ක්‍රියාකාරකම් ගොඩනගා ගතහැකිද?

## ගෙදර වැඩ පත්‍රිකා :

- මෙම පත්‍රිකාවේ සැළසුම හා අන්තර්ගතය තුලින් දක්වන ආකාරයට එහි අරමුණ කුමක්ද?
- නිවසේදී පාවිච්චි කළ හැකි බැවින් එමගින් පාඩම තවත් ශක්තිමත් කරයිද?
- පංතියේදී යොදාගත් මාධ්‍යයන් එමගින් තවත් වැඩිදියුණු කරයිද?
- එය පංතියට නොපැමිණි අය සහ පංතිය අතර සම්බන්ධතාවයක් ඇති කරයිද?
- පංතියේ සිටින දරුවන්ගේ පවුල් සමග සම්බන්ධ වීමට එය කොතරම් වටිනවාද?
- ගෙවූ මුදල වෙනුවෙන් එහි වටිනාකමක් තිබේද? තිබේ නම් හෝ නොතිබේනම් ඒ ඇයි?

# අධ්‍යයන විෂය මාලාවක් සඳහා පොදු සැලසුමක් :

- අවුරුදු හයක්, අටක් හෝ දොළහක් සඳහා ඇති අරමුණු මොනවාද?
- අවුරුදු දොළහ සඳහා සෑම පාඩමකටම මූලිකව අන්තර්ගත දෑ ලැයිස්තුගත කරන්න.

- උගන්වන්නට යන ද්‍රව්‍යයන්ගේ “ගලායාම” අවධානයට ලක්කරන්න.
    - බයිබලයෙන් උගන්වන දේ යොදා ගෙන ඇත්තේ කෙසේද? කාලානුරූපීව? මාතෘකානුකූලව? වෙනත්?
    - මෙම සැළසුමේ වාසි/අවාසි මොනවාද?
    - උගන්වන දේ  නැවත නැවතත් දැක්වීමක් ඇත්තේ කොහේද?
    - මෙම ඉගැන්වීම් ශක්තිමත් කරයිද? අභ්‍යන්තරය ගැඹුරු කරයිද? අවකාශයන් පුරවයිද?
    - කාලායත් සමග යම් කරුණු අවධාරනය කරන පරිදි ඒකක සැළසුම් කර තිබේද? ඒවා ප්‍රයෝජනවත්ද?
- වියදම ඔබේ සභාවේ අයවැයට දැරිය හැකිද? වැඩසටහන ඔබේ ගුරුවරුන්ගේ ඉගැන්වීම් හැකියාවන් තුළ පවතිද?
- පාඩම් වල රටාවට  හානියක් නොවන පරිදි යමක් එකතුකිරීමට හෝ යමක් වෙනුවට යමක් යොදාගැනීමට ඉඩකඩ තිබේද? (සේවය කිරීමේ ව්‍යාපෘති, නමස්කාරය, භාරකාරත්වය ආදිය).

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "බයිබලීය අධ්‍යයන විෂය මාලාව " යන්න අර්ථ දක්වන්න.

3. බයිබලීය අධ්‍යයන අධ්‍යයන විෂය මාලාවක වටිනාකම කුමක්ද?

4. ඔබට ඔබේම අධ්‍යයන අධ්‍යයන විෂය මාලාවක් ගොඩනගාගත හැක්කේ කෙසේද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. බොහෝ බයිබල් අධ්‍යයන ප්‍රකාශයන් ඒවා ලිවීමේදී සැළැස්මක් අනුගමනය කරයි. නූතන අධ්‍යයනයන් සැළසුම් කරඇති ආකාරය පිළිබඳව වූ පහත තොරතුරු අධ්‍යයනය කරන්න.

### නූතන අධ්‍යයන විෂය මාලා සැලසුම්

තම පාඩම් ව¾ග කිරීමේදී එවැන්ජලිස්ත ප්‍රකාශකයන් අනුගමනය කරන මූලික සැළසුම් හතර පහත දැක්වේ. අධ්‍යයන විෂය මාලාවක වැදගත්කම ඇගයීම සඳහා සෑම අධ්‍යයන සැළසුමකම වාසි සහ අවාසි ඔබේ අවශ්‍යතා සහ අරමුණු අනුව සලකමින් අධ්‍යයනය කළ යුතුය:

## ඒකාකාරී ලෙස වර්ග කිරීම :

### අධ්‍යයන විෂය මාලාව සංවිධානය කර ඇත්තේ කෙසේද?

සෑම වයස් කාණ්ඩයකටම එකම බයිබල් කොටස උගන්වනු ලබයි.

### වාසි :

1. කුඩා සභාවකට නමස්කාර මෙහෙය සම්බන්ධව සියලු ශිෂ්‍යයන් එකම පාඩමකට එකතු කළ හැකිය.
2. පවුලේ සියලු සාමාජිකයන්ට තම පොදු පාඩම නිවසේදී සාකච්ඡා කළ හැකිය.

### අවාසි :

1. අවු : 5-7 චක්‍රයක් තුළ පාඩම නැවත ඉගැන්වේ, බයිබලයේ සීමිත කොටසක් ආවරණය කරයි.
2. බයිබලීය අන්තර්ගතයන් බොහෝවිට සෑම වයසකම ශිෂ්‍යයන්ට නොගැලපේ.

## එක්සත් වර්ග කිරීම :

### අධ්‍යයන විෂය මාලාව සංවිධානය කිරීම :

තනි තේමාවකින් සම්බන්ධ කරන ලද විවිධ බයිබල් කොටස්, සෑම වයස් මට්ටමකටම උගන්වනු ලබයි.

### වාසි :

1. නමස්කාර මෙහෙයකට සම්බන්ධව වයස් කාණ්ඩ කිහිපයක් එකම තේමාවක් යටතේ එකතු විය හැකිය.
2. නිවසේදී තේමාව පිළිබඳ සාකච්ඡා කිරීම කළ හැකිය.

### අවාසි :

1. සීමිත තේමා ප්‍රමාණයකට සම්පූර්ණ බයිබල් ආවරණයක් සැපයීම අපහසුය.
2. සෑම අංශයකම උගන්වනු ලබන පාඩම්, ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවයට වඩා තේමාවන් මත තීරණයවේ.

## සම වයස් කාණ්ඩ ලෙස වර්ග කිරීම :

### අධ්‍යයන විෂය මාලාව සංවිධානය වී ඇති ආකාරය :

සෑම වයස් කාණ්ඩයක් සඳහා වෙනස් බයිබල් කොටස් සපයා දී තිබේ.

### වාසි :

1. සෑම ක්‍රියාකාරකමක්ම අදාල කණ්ඩායමේ බයිබල් පාඩම් සමග සමීපව සම්බන්ධ වේ.
2. සෑම ශිෂ්‍යයෙකුගේම සාමාජීය, මනෝවිද්‍යාත්මක හැගිම් සහ මානසික මට්ටම් වලට ගැලපෙන පරිදි පාඩම් ඉගැන්විය හැකිය.

### අවාසි :

1. දෙමව්පියන් සහ දරුවන් වෙනස් දේවල් ඉගෙන ගන්නා බැවින්, නිවසේ පොදු සාකච්ජා සීමා සහිත වේ.

## එකම වයස් කාණ්ඩ ලෙස වර්ග කිරීම :

### අධ්‍යයන විෂය මාලාව සංවිධානය වී ඇති ආකාරය :

සෑම වයසකම ශිෂ්‍යයන් සඳහා වෙනස් බයිබල් කොටස් සපයා දී තිබේ.

### වාසි :

1. ශිෂ්‍යයන්ගේ දියුණුවේ අවධියට ගැළපෙන පරිදි අධ්‍යයනය සැළසුම් කළ හැකිය.

### අවාසි :

1. නිවසේදි කරන සාකච්ජා සීමා සහිත වේ.
2. සෑම වයසකටම වෙනස් පාඩමක් ඇති බැවින්, සියලු ක්‍රියාකාරකම් පොදු තේමාවකට සම්බන්ධ කිරීම අසීරුය.

# දහතුන්වන පරිච්ඡේදය

# අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- අකුරු නොදන්නා සිසුන් හඳුනාගැනීමට,
- අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීම සඳහා වූ උපදෙස් මාලාව සාරාංශ කිරීමට, ඔබට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ප්‍රඥාවේ පටන්ගැන්ම නම් ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීමය. ශුද්ධ තැනැන්වහන්සේ දැනගැනීම නුවණ වේ. (හිතෝපදේශය 9:10)**

## හැඳින්වීම

ඇතැම් ගුරුවරු අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීමේ අභියෝගයකට මුහුණ දෙයි. අකුරු නොදන්නා ශිෂ්‍යයෙකු යනු තම භාෂාව කියවීම හෝ ලිවීම සිදු නොකරන අයයි. ඔබ අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීමට අදහස් කරයි නම්, ඔබ මෙම පාඩම අධ්‍යයනය කළ යුතු වේ. ඔබ අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීමට අදහස් නොකරයි නම්, ඔබට මෙම පාඩම අතහැර දහහතරවන පරිච්ඡේදයට යා හැකිය.

## ඔවුන්ට ඉගැන්විය හැකිද?

ඉගෙන ගැනීම සඳහා පුද්ගලයෙකු ලියන හෝ කියවන ආකාරය දැන සිටිය යුතු නැත. උදාහරණයක් ලෙස, භාෂා කුසලතාවය අත්පත් කර ගැනීමට ඉතා අසීරුය, නමුත් දරුවන් ලිවීමට හෝ කියවීමට හෝ නොදැන වුවද තම භාෂාව කතා කරයි. අකුරු නොදන්නා සිසුන්ට දේව වචනය කියවීමට නොහැකි වුවත් ඔවුන්ට එය ඉගැන්වීම කළ හැකිය.

දෙවියන්වහන්සේගේ වචනය අන් අයට දීම සඳහා දුන් මුල් ආඥාව වන්නේ වාචිකව (වචනයෙන්& දීමටය :

> **මා විසින් අද නුඹට අණ කරන මේ වචන නුඹේ සිතේ තිබේවා. ඒවා නුඹේ දරුවන්ට හොඳාකාරයෙන් උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග යන කලද නුඹ සයනයකරන කලද නැඟිටින කලද ඒවා ගැන කථා කරපන්න. (ද්විතිය කතාව 6:6-7)**

යේසුස්වහන්සේ ඉගන්වූයේ ලිඛිත මාධ්‍යයන්ගෙන් තොරවය. උන්වහන්සේ කෙදිනකවත් ලිඛිත පාඩම් ලබා දුන්නේ හෝ තම ශිෂ්‍යයන්ට බයිබල් පද කියවීමට පැවසුවේවත් නැත.

යේසුස්වහන්සේගේ ශ්‍රාවක පිරිස තුළ අධ්‍යාපනය ලබාගැනීමේ හැකියාවක් නොමැති දිළිඳු අයද ඇතුළත් වූ බැවින් උන්වහන්සේ අකුරු නොදන්නා අයට ඉගැන්වූ බව අපට උපකල්පනය කළ හැකිය. එම පුද්ගලයන් සේසුස්වහන්සේ ඉගැන්වූ දේවල් සටහන් කරගත්තේ හෝ කියෙව්වේ නැත. ඉගෙනීම සඳහා ඔවුන් වාචික සන්නිවේදනය මත රඳා පැවතිය.

ඔබේ යුතුකම සෑම පුද්ගලයෙකුටම ශුභාරංචිය පැවසීම නම්, ඔබට අකුරු නොදන්නා පුද්ගලයන් වෙත ළඟා වීමට සැළැස්මක් තිබිය යුතුය. දේව වචනයේ ලිඛිත පණිවුඩයකින් ඔබට සෑම පුද්ගලයෙකුම වෙත ළඟා විය නොහැකි අතර, ඔවුන් වෙත දේව වචනය ළඟා වීමට පෙර ඔවුන් කියවීමට ඉගෙන ගත යුතුයැයි ඔබට සිතිය නොහැකිය.

දෙවියන්වහන්සේ ගැන ඉගෙන ගැනිම හදවතේ ආකල්ප මත තරම් අධ්‍යාපනය මත රඳා නොපවති :

> **ප්‍රඥාවේ පටන්ගැන්ම නම් ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීමය. ශුද්ධ තැනන්වහන්සේ දැනගැනීම නුවණ වේ. (හිතෝපදේශය 9:10)**

## අකුරු නොදන්නා ශිෂ්‍යයන්ට ඉගැන්වීම.

අකුරු නොදන්නා ශිෂ්‍යයන්ට ඉගැන්වීම සඳහා උපදෙස් සමහරක් පහත දැක්වේ :

### සංස්කෘතික නායකයන් තුළින් කටයුතු කරන්න :

අකුරු නොදන්නා පුද්ගලයන් ඔවුන්ගේ නායකයන්ට ඇහුම්කන් දෙන අතර ඔවුන්ට අවනත වේ. ඔබට පණිවුඩය නායකයන්ට පිළිගැනීමට සැළැස්විය හැකිනම්, එය වඩා පහසුවෙන් ජනතාවට සන්නිවේදනය කළ හැකි වනු ඇත. නායකයන් පණිවුඩය පිළිගත් විට, එම නායකයන් ලිඛිත මාධ්‍යයන්ගෙන් තොරව සන්නිවේදනය කිරීමට හුරුව සිටින බැවින් ඒවා ඔවුන්ට පහසුවෙන් සන්නිවේදනය කළ හැකිය.

### පණිවුඩය ඔවුන්ගේ සංස්කෘතියට සම්බන්ධ කරන්න :

පණිවුඩයට අවධානය ලබාගැනීමට, අදාල කිරීමට සහ නියමිත ප්‍රතිචාරය ළඟා කර ගැනීමට පණිවුඩය ශ්‍රාවකයාට සම්බන්ධ කළ යුතු බව ඔබ ඉගෙන ගෙන තිබේ. අකුරු නොදන්නා පුද්ගලයාගේ සංස්කෘතිය අධ්‍යයනය කරන්න. ඔවුන් දෛනික ජිවිතයේ සැළකිලිමත්වන කරුණු මොනවාද? ඔවුන්ගේ සංස්කෘතිය තුළ ඔවුන් මුහුණ දෙන ගැටලු සහ අභියෝග මොනවාද? අවධානය ලබාගැනීමට, නියමිත අදාල කරගැනීමකට හා මිනිසුන්ගෙන් ප්‍රතිචාර ළඟා කර ගැනීමට ඔබේ පණිවුඩය ඉහත කරුණු සමග සම්බන්ධ විය යුතුය.

### ඉගැන්වීමේ ක්‍රම සංස්කෘතියට සම්බන්ධ කරන්න :

බොහෝ සංස්කෘතින් තුළ පුද්ගලයාගෙන් පුද්ගලයාට තොරතුරු හුවමාරු කරන සම්ප්‍රදායානුකුල ක්‍රමවේදයන් තිබේ. ඇතැම් සංස්කෘතින් තුළ කතාන්දර පැවසීම මගින් එය සිදු කරයි. තවත් අය තම පණිවුඩය සන්නිවේදනය කරන්නේ ගීතයන් හා සංගිත තුළින්ය. පණිවුඩයක් හොඳින්ම සන්නිවේදනය කරන ආකාරය දැක ගැනීමට සංස්කෘතිය අධ්‍යයනය කරන්න. ඔවුන්ගේ සංස්කෘතිය තුළ සුලභව යොදා ගන්නා ක්‍රමවේද හඳුනා ගෙන ඒවා බයිබලිය සත්‍යයන් ඉගැන්වීමට යොදා ගන්න.

### පරිසරය භාවිතා කරන්න :

අකුරු නොදන්නා පුද්ගලයාගේ පරිසරය භාවිතා කරන්න. ඉගැන්නුම් ආධාරක ලෙස යොදා ගැනීමට ඔවුන්ගේ සංස්කෘතියේ ඇති සරල වස්තූන් තෝරා ගන්න. යේසුස්වහන්සේ ගල්, මල්, බීජ, පක්ෂීන්, මාළුන්, පහන් සහ ගොඩනැඟිලි යොදාගත් ආකාරය මතකද? සත්‍යයන් නිරූපනය කිරීම සඳහා ඔබට නූතන උපමා යොදාගන්න සිදුවේවි. යේසුස්වහන්සේ තම ශ්‍රාවකයන් තේරුම් ගත්තාවූ මසුන් ඇල්ලීම, වගාව සහ අස්වැන්න නෙළීම ආදිය මත කේන්ද්‍රගත වූ උපමා යොදාගත් සේක. ඔබේ ශ්‍රාවක පිරිසට මෙම නිරූපණයන් තේරුම්ගත නොහැකි විය හැකිය. ඔබ උගන්වන අකුරු නොදන්නා පුද්ගලයාගේ පරිසරය අධ්‍යයනය කරන්න. බයිබලිය සත්‍යයන් නිරූපනය කරන උපමා නිර්මාණය කිරීම සඳහා ඔවුන්ගේ පරිසරය යොදාගන්න.

## සරල ප්‍රතිපත්ති නැවත නැවත පවසන්න :

පාඩම සරලව උගන්වන්න. සරල, මූලික ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න. ශිෂ්‍යයන් මේවා තේරුම් ගෙන ඇති බව දැනගැනීම සඳහා මෙම මූලික ප්‍රතිපත්ති නැවත නැවත පවසන්න. ශිෂ්‍යයන්ට මූලික සත්‍යයන් වාචිකව නැවත පැවසීමට ඉඩලබා දෙන්න.

## සාරාංශගත කරන්න :

ඔබ ඉගැන්වූ ප්‍රධාන සත්‍ය සාරාංශගත කරන කෙටි ප්‍රකාශයක් පාඩම අවසානයේදී ඉදිරිපත් කරන්න. උදාහරණයක් ලෙස, යොහන් 3 හි සඳහන් නැවත ඉපදීමේ අත්දැකීම ඉගැන්වීමේදී මෙලෙස පාඩම අවසන් කළ හැකිය. “ඔබ නැවත ඉපදිය යුතුය. එය ශාරීරික ඉපදීමක් නොව ආත්මික ඉපදීමකි. ඔබේ පව් ගැන පසුතැවී යේසුස්වහන්සේ ඔබේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් ඔබ නැවත ඉපදෙනු ඇත.”

## ප්‍රශ්න අසන්න :

ඔබ පාඩමක් උගන්වා අවසන් වූ විට, පාඩමේ උගන්වන ලද මූලික ප්‍රතිපත්තීන් තේරුම්ගෙන ඇති බව  දැන ගැනීමට ප්‍රශ්න අසන්න.

## ප්‍රතිචාරයක් සඳහා කැඳවීමක් කරන්න :

ශිෂ්‍යයන් පාඩම තේරුම් ගෙන ඇති බව දැනගැනීමට ඇති එක් මාර්ගයක් නම් ප්‍රතිචාරයක් සඳහා කැඳවීමක් ලබා දීමයි. උදාහරණයක් ලෙස, යොහන් 3 පිළිබඳ පාඩම අවසානයේදී, “ඔබෙන් කී දෙනෙකු මෙම නව ඉපදීම අත්දැකීමට කැමතිද?” යි අසන්න.

# බයිබලය : දෙවියන්වහන්සේගේ පොත

බයිබලය යනු, දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ලිවීමට මගපෙන්වූ ලිඛිත පණිවුඩයකි. එය උන්වහන්සේගේ වචනය අන්තර්ගත ග්‍රන්ථයකි. උන්වහන්සේගේ කැමැත්ත සියලුම මිනිසුන්ට එය කියවිය හැකි වීමය. මේ හේතුවෙන්, බොහෝ කිතුණු නායකයන් කියවීමට ඉගැන්වීමේ පුහුණු වැඩසටහන් වල නිරත වේ. මෙය, අකුරු නොදන්නා පුද්ගලයන්ට දෙවියන්වහන්සේගේ පණිවුඩය ඔවුන්ටම කියවිය හැකිවන පරිදි කියවීමට හා ලිවීමට උගන්වන වැඩසටහනකි.

ඔබට මේ සඳහා උනන්දුවක් තිබේනම්, මෙම පරිච්ඡේදයේ “තවදුරටත් අධ්‍යයනය සඳහා” බලන්න. නමුත්, ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීමට පුද්ගලයෙකු කියවීමට හා ලිවීමට දැන සිටීම අවශ්‍ය නොවන බව මතක තබා ගන්න.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. " අකුරු නොදන්නා" යන්න අර්ථ දක්වන්න.

3. අකුරු නොදන්නා සිසුන්ට ඉගැන්වීම සඳහා මෙම පාඩමේ ඇති උපදෙස් සාරාංශගත කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. අකුරු නොදන්නා පුද්ගලයෙකු තෝරා ගෙන, මෙම පරිච්ඡේදය තුළ දී ඇති උපදෙස් යොදාගෙන ඔහු සමග ශුභාරංචිය බෙදා ගන්න.

2. පුද්ගලයන්ට තම භාෂාව ලියන හා කියවන ආකාරය ඉගෙන ගත හැකි වැඩසටහනක් ආරම්භ කිරීමට ඔබ උනන්දු නම්, ඔබේ රටේ ඇති ලෝබක් සාක්ෂරතා සංගමය (Laubauch Literacy Society) අමතා තොරතුරු ලබා ගන්න.

# දහහතරවන පරිච්ඡේදය

# ගුරුවරුන් පුහුණු කිරීම

## අරමුණු :

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්:

- ගුරුවරුන් පුහුණු කිරීමේ මූලික අවශ්‍යතාවයන් දෙකක් හඳුනාගැනීමට,
- ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීමේ පියවර සාරාංශගත කිරීමට,
- ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සඳහා ශිෂ්‍යයන් බඳවා ගන්නා ආකාරය පැහැදිලි කිරීමට,
- ගුරුවරුන් පුහුණු කිරීමේ සැසිවාරයන් මෙහෙයවන ආකාරය පිළිබඳ උපදෙස් සාරාංශගත කිරීමට,
- සභාව තුළ පුහුණු ගුරුවරු තබාගන්නා ආකාරය පිළිබඳව වූ උපදෙස් සාරාංශගත කිරීමට,
- ගුරුවරයෙකු ඇගයීම කරනු ලැබිය හැකි ක්‍රම ලැයිස්තුගත කිරීමට, ඔබට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය :

> **මක්නිසාද ඔබ මට දුන් වචන මම ඔවුන්ට දුනිමි, ඔවුහු ඒවා පිළිගෙන, මා ඔබ වෙතින් ආ බව සැබවින් දැන, ඔබ මා එවූ බව විශ්වාස කළෝය.** (යොහන් 17:8)

## හැඳින්වීම

යේසුස්වහන්සේ ගෝලයන් පුහුණු කළ අතර පුහුණුව අවසානයේදී,

> **මක්නිසාද ඔබ මට දුන් වචන මම ඔවුන්ට දුනිමි..** (යොහන් 17:8) යනුවෙන් පැවසූ සේක.

ආත්මික ගුණනය සඳහාවූ බයිබලීය සැලසුම නම් අන් අයට ඉගැන්වීමේ හැකියාව ඇති විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට ඉගැන්වීමයි (2 තිමෝති 2:2). ඔබ මෙම සැලැස්ම ඉටු කිරීම උදෙසා නිරන්තරයෙන් ගුරුවරු පුහුණු කළ යුතුය. මෙම පාඩම ගුරුවරුන් පුහුණු කිරීමේ විෂය පිළිබඳව සළකා බලයි. මෙම පරිච්ඡේදය තුළ, ගුරුවරුන් පුහුණු කිරීමේ මූලික අවශ්‍යතාවයන් දෙකක් සාකච්ඡා කරන අතර, ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීමේ ප්‍රායෝගික පියවර දක්වා තිබේ. පුහුණුවක් සඳහා ශිෂ්‍යයන් බඳවාගන්නේ කෙසේද, සැසිවාරයක් මෙහෙයවන්නේ කෙසේද සහ සභාව තුළ පුහුණු ගුරුවරු යොදාගන්නා ආකාරය පිළිබඳව උපදෙස් ලබා දී තිබේ.

## පුහුණුවක් සඳහා වූ ප්‍රධාන අවශ්‍යතාවයන් දෙක

සභාව තුළ ගුරුවරු පුහුණු කිරීමේ මූලික අවශ්‍යතා දෙකකි: සේවයට - පෙර ලබන පුහුණුව සහ සේවය - තුළ ලබන පුහුණුවයි.

### සේවයට - පෙර ලබන පුහුණුව :

සේවයට - පෙර ලබන පුහුණුව යනු, ඇදහිලිවන්තයෙකු සභාවේ ගුරුවරයෙකු ලෙස සේවය කිරීම ආරම්භ කිරීමට <u>පෙර</u> ලබා දෙන පුහුණුවයි. එය උගන්වන්නේ කෙසේද යන්න ඉගෙන ගැනීමට ඔහුට උපකාර කරන අධ්‍යයන වැඩසටහනකි.

**සේවය - තුළ ලබන පුහුණුව :**

සේවය - තුළ ලබන පුහුණුව සභාව තුළ ගුරුවරයෙකු ලෙස දැනටමත් සේවය කරන අයට දෙනු ලැබේ. ඔවුන්ගේ ඉගැන්වීමේ දීමනාව තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා පුහුණුව ඔවුන්ට උපකාර කරයි. යේසුස්වහන්සේ තම ගෝලයන්ට මේ දෙආකාරයේම පුහුණුව ලබාදුන් සේක.

## ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම

ඔබේ සභාව තුළ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීමේ පියවර පහත දැක්වේ.

1. දේවගැතිවරයාගේ හෝ සභාවේ ආත්මික නායකයාගේ සහයෝගය ලබා ගන්න.

2. දැනටමත් හොඳින් උගන්වන ගුරුවරුන්ට අන් අයට නායකයන් ලෙස ඉගැන්වීමේ කටයුතු කරන ලෙස පවසන්න.

3. පහත සඳහන් දේ සැලසුම් කිරීම සඳහා මෙම නායකයන් සමග හමුවන්න :

   - පුහුණු කිරීමේ වැඩසටහනක් සඳහා අරමුණු සැලසුම් කිරීමට : වර්තමාන ගුරුවරුන්ගේ හා ගුරුවරු බවට පත්විය හැකි අයගේ අවශ්‍යතාවයන් තීරණය කරන්න. පුහුණු වැඩසටහන තුළ ඔබට ළඟා කරගැනීමට අවශ්‍ය අරමුණු සඳහන් කරන්න.

   - පුහුණුව සඳහා දින, වේලාවන් හා ස්ථාන සැලසුම් කරන්න.

   - වැඩසටහන උගන්වන නායකයන් කවුද යන්න : උගන්වන්නේ කවුද, මොනවාද සහ කවර අවස්ථාවේදීද?

   - වැඩසටහනට ඇතුළුවීම සඳහා අවශ්‍ය සුදුසුකම් : සහභාගීවීමට අවසර ලැබෙන්නේ කාටද? ඔවුන් අනිවාර්යයෙන්ම නැවත ඉපදීම ලද ඇදහිලිවන්තයන් විය යුතුය. නමුත් ඔබට සඳහන් කිරීමට අවශ්‍ය වෙනත් සුදුසුකම් තිබිය හැකිය (මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.)

   - වැඩසටහන සම්පූර්ණ කිරීම උදෙසා අවශ්‍ය ප්‍රමිතියන් : ඔවුන්ට පුහුණුව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන්නේ මොනවාද? (යෝජනා සඳහා, මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.)

පුහුණු කිරීමේ ක්‍රමය : පුහුණු කිරීමේ විවිධ ක්‍රම සඳහා මෙම පරිච්ඡේදයේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න)

   - ගුරුවරු පුහුණු කිරීම සඳහා වූ අයවැය (වියදම්) : එයට කොතරම් මුදලක් දැරීමට සිදුවේද ? මුදල් ලබාගන්නේ කෙසේද?

   - පුහුණුව සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය : මෙම පාඨමාලාව ගුරුවරු පුහුණු කිරීම සඳහා යොදාගත හැකිය. මෙයට අමතරව ඔබේ නිකායට විශේෂිවු ඉගැන්වීමේ පාඩම් /හෝ ඔබගේ විෂය මාලාවන් ඔබට යොදාගත හැකිය.

4. වර්ෂය සඳහා දින දර්ශනයක් සකස් කර සියළුම පුහුණු සැසිවාර එහි ලකුණු කරන්න. දින, වේලාවන් සහ ස්ථාන ඇතුළත් කරන්න.

5. ගුරුවරු සඳහා සේවය පිළිබඳ විස්තරයක් සකස් කරන්න. මෙය, ගුරුවරයෙකු ලෙස සේවය කිරීමට අදහස් කරන අයට ගුරුවරයෙකුගේ වගකීම හඳුන්වා දෙනු ඇත. (සේවය පිළිබඳ විස්තරයකට නිදර්ශනයක් සඳහා මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න)

6. ගුරුවරයන් වීමේ හැකියාව ඇති අයට අත්සන් කිරීමට ප්‍රතිඥාවක් සකස් කරන්න. මෙය ගුරුවරයාගේ කැපවීම හඳුනාගන්නා ලියවිල්ලකි. (ප්‍රතිඥාවක් පිළිබඳ නිදර්ශනයකට මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටස බලන්න.)

## ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා බඳවා ගැනීම

ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් සඳහා පුද්ගලයන් බඳවා ගන්නා ආකාරය පිළිබඳ පියවර පහත දැක්වේ :

1. දැනටමත් උගන්වන ගුරුවරුන්ට සේවය තුළ ලබන පුහුණුව සඳහා ආරාධනා කරන්න.

2. පුහුණුව පිළිබඳ දේව මෙහෙයේදී නිවේදනයක් කරන්න. උනන්දුවක් ඇති හා ගුරුවරුයෙකු වීමේ හැකියාව ඇති අයට ඔබව හමුවන ලෙස පවසන්න.

3. ඉගැන්වීමේ ආත්මික දීමනාව ඇතැයි ඔබ දන්නා හෝ නිරීක්ෂණය කර ඇති සහ එසේ ඇතැයි ඔබ විශ්වාස කරන අය සමග පෞද්ගලික සම්බන්ධතා ඇති කර ගන්න.

4. දැනටමත් ඉගැන්වීම සිදු නොකරන අපේක්ෂකයන් ඔබ විසින් නියම කරන ලද සුදුසුකම් සපුරා ඇත්දැයි සළකා බැලීමට ඔවුන්ගේ අයදුම් පත් නැවත බලන්න.

5. සුදුසුකම් ලද සියලු දෙනාට පළමු පාඩම සඳහා දිනය, වේලාව හා ස්ථානය දැනුම් දෙන්න.

## පුහුණුව මෙහෙයවීම

ගුරුවරුන් පුහුණු කිරීමේ සැසිවාර මෙහෙයවීම සඳහා උපදෙස් පහත දැක්වේ :

1. සෑම සැසිවාරයක්ම නියමිත වේලාවට ආරම්භ කරන්න.

2. ශුද්ධාත්මයාණන්වහන්සේ ගුරුවරුන්ව ආලේප කරන ලෙසත්, ඉගෙන ගැනීම සඳහා ශිෂ්‍යයන්ගේ හදවත් සහ මනස විවෘත කරන ලෙසත් යාච්ඤා කර ආරම්භ කරන්න.

3. පැමිණීම ලකුණු කරන්න. පාඩමාලාව සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන් නිශ්චිත සැසිවාර ප්‍රමාණයකට පැමිණීම අපේක්ෂා කළ යුතුය.

4. ඉගැන්වීමට තිබෙන පාඩමට අදාලව ලිඛිත මාධ්‍යයක පිටපතක් සෑම ශිෂ්‍යයෙකුටම තිබේදැයි දැනගන්න.

5. පාඩම ඉගැන්වීමට අවශ්‍ය සියලු දේ ළග තබා ගන්න. මේ තුළ දෘශ්‍ය ආධාර, ඉගැන්වීම් අත්පොත සහ එවැනි වෙනත් දේ ඇතුළත් විය හැකිය. මෙම පාඩමාලාවේදී ඔබ ඉගෙනගත් ඉගැන්වීමේ ක්‍රමවේද යොදාගන්න.

6. සැසිවාර තුළ ඔබ ඉගැන්වූ දේවල් පිළිබඳ ප්‍රශ්න ඇසීමට හා පිළිතුරු දීමට වේලාව ලබා දෙන්න.

7. ඊලග සැසිවාරයට පෙර සම්පූර්ණ කිරීම සඳහා ශිෂ්‍යයන්ට පැවරුම් ලබා දෙන්න. මේ තුළ, කියවීමේ. ලිවීමේ හෝ ඉගැන්වීමේ පැවරුම් ඇතුළත් විය හැකිය.

8. ශුද්ධාත්මයාණන්වහන්සේ විශේෂ ආකාරයකට ක්‍රියා නොකළේ නම්, පාඩම නියමිත කාලයට පමනක් පවත්වන්න. නියමිත වේලාවට ශිෂ්‍යයන් විසුරුවා හරින්න.

# ගුරුවරු යොදාගැනීම

ඔබ ඉගැන්වූ පුද්ගලයන් ගුරුවරු ලෙස යොදා නොගනිනම්, ගුරුවරුන් පුහුණු කිරීමෙන් බලපෑමක් ඇති නොවේ. සභාවේ අධ්‍යාපනික වැඩසටහන් සඳහා ගුරුවරු යොදා ගැනීම පිළිබඳ උපදෙස් කිහිපයක් පහත දැක්වේ.

## සභාපාලකවරයා හමුවන්න :

ඔහුට ගුරුවරු අවශ්‍යවන්නේ කුමන තැන්වලටද? එක් එක් පුද්ගලයා වඩා බලපෑමක් කළ හැකියැයි ඔහු සිතන්නේ කොතැනද? සභාපාලකවරයා සභාව තුළ දෙවියන්වහන්සේ පත් කර ඇති නායකයාය. සභාව තුළ පවතින ඉගැන්වීමේ වැඩසටහනක් පිළිබඳ වගකීම ඔහු සතුය. එසේම සභාවේ කොටසක් වන අයගේ දීමනා සහ තලෙන්ත මෙහෙයවීමේ වගකීමද ඔහු සතුය.

## කැඳවීම හා හැකියාව අනුව යොදාගන්න :

යොදාගනු ලබන පුද්ගලයාගේ හැකියාවන් පිළිබඳව සැළකිලිමත් වන්න. ඔවුන් ඉගැන්වීමට සිටින කණ්ඩායම් තුළදී ඒවාට බලපෑමක් කළ හැකිද? මෙම නිශ්චිත කණ්ඩායම සඳහා දෙවියන්වහන්සේ ඔවුන්ට විශේෂ කැඳවීමක් දී තිබේද? උදාහරණයක් ලෙස, අපෝස්තුලුවර පාවුල් දෙවියන්වහන්සේ ඔහුට දුන් කැඳවීම නිසාත් ඔහුගේ පෞද්ගලික පසුබිම හා හැකියාවන් නිසාත් අන්‍යජාතීන් අතර වැඩි බලපෑමක් කළේය.

## වයස් මට්ටමේ ආශාවන් අනුව යොදාගන්න :

ඇතැම් පුද්ගලයන්ට දරුවන්ට ඉගැන්වීමට ආශාවක් නැත. තවත් අයට වැඩිහිටියන් සමග අපහසුතා පවතී. සෑම වයසකටම ඉගැන්වීම් ලැබිය යුතුය, නමුත් ගුරුවරයාට නිශ්චිත වයස් මට්ටමක් සමග සේවය කිරීම සඳහා ආශාවක් සහ/හෝ කැඳවීමක් තිබිය යුතුය.

## ඉගැන්වීම පුහුණු වීම සඳහා අවස්ථාවන් ලබා දෙන්න :

නව ගුරුවරුන් මුලින්ම සාමාන්‍ය ගුරුවරුන්ට පැමිණිය නොහැකි විට ඔවුන් වෙනුවෙන් යොදාගන්නා ගුරුවරයෙකු ලෙස සේවය කිරීමට අවස්ථාව දෙන්න. ඉන්පසුව අත්දැකීම් සහිත ගුරුවරයෙකුගේ නිරීක්ෂණය යටතේ ඔවුන්ට පාඩම් කිහිපයක් ඉගැන්වීමට දෙන්න. පාඩමට පසු, නිරීක්ෂකයාට නව ගුරුවරයා සමග පෞද්ගලිකව උපකාරී විය හැකි යෝජනා බෙදා ගත හැකිය.

# ගුරුවරයාගේ ඇගයීම.

ගුරුවරයෙකු සභාවේ සේවය කිරීමෙන් පසු, කලින් කල ඇගයීම් කල යුතුය. යේසුස්වහන්සේ තම ගෝලයන් සේවය සඳහා පිටත් කිරීමෙන් අනතුරුව ඔවුන් සමගද මෙය සිදු කළ සේක. ඔවුන් කළ කී සෑම දේම ඔවුන් නැවත වාර්තා කළහ (මාර්ක් 6:7 සහ 30). ඇගයීම මගින් ඉගැන්වීම තුළ ඇති ගැටලු හඳුනාගැනීමට හා නිවැරදි කර ගැනීමට උපකාරී වේ. එය සභාවේ ආත්මික නායකයන්ට, ගුරුවරුන්ට තව දුරටත් තම ඉගැන්වීමේ ආත්මික දීමනාව වර්ධනය කරගැනීම සඳහා උපකාර කිරීමට අවස්ථාව ලබා දේ.

ගුරුවරයෙකු ඇගයීමට ආකාර කිහිපයක් පහත දැක්වේ :

1. මෙම පාඨමාලාවේ 11 වන පරිච්ඡේදයේදී ඉගෙනගත් ඇගයීමේ ක්‍රම යොදාගෙන ගුරුවරයාගේ ඇගයීම කළ හැකිය. සෑම ගුරුවරයෙකුටම ස්වයං ඇගයීමක් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න, ඉන්පසුව ඔවුන් සමග එම ප්‍රතිඵල නැවත සළකා බලන්න.

2. සේවයේ වගකීම් අනුව ඇගයීම කරන්න : ඔවුන්ගේ ඉගැන්වීමේ සේවය, සේවයේ වගකීම් සම්පූර්ණ කරන්නේද?

3. ඔවුන් අත්සන් කරන ලද ගුරු ප්‍රතිඥාවේ කැපවීම දිගටම පවත්වාගෙන යයිද?

4. ගුරුවරයෙකු සැබවින්ම පාඩමක් උගන්වන අවස්ථාව නිරීක්ෂණය කරන්න. ඔවුන් ශිෂ්‍යයන් වෙත බලපෑමක් කළ හැකි ලෙස දේව වචනය සන්නිවේදනය කරයිද? ඔවුන් පාඩම ඉදිරිපත් කරන ආකාරය දියුණු කරගැනීම සඳහා ඔවුන්ට කළ හැක්කේ මොනවාද? ඇතැම් ධනාත්මක යෝජනා ඔවුන් සමඟ බෙදා ගන්න.

5. "ඵලයේ" ඇගයීමක් කර බලන්න. බයිබලයේ දක්වන පරිදි "ඵලය" (සේවයේ ප්‍රතිඵල) නිරීක්ෂණය කළ හැකිය(ලූක් 6:43-44).

   මතක තබා ගන්න : ඇගයීම හා ගැටලු නිවැරදි කිරීම සැමවිටම ප්‍රේමනීය හා ධනාත්මක ලෙස සිදු කළ යුතුය.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ගුරුවරුන් පුහුණු කිරීමක ප්‍රධාන අවශ්‍යතා දෙක මොනවාද?

3. ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක පියවරයන් සාරාංශගත කරන්න.

4. ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනකට ඔබ ශිෂ්‍යයන් බඳවා ගන්නේ කෙසේද?

5. ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් මෙහෙය වීම සඳහා වූ උපදෙස් සාරාංශගත කරන්න.

6. පුහුණු ගුරුවරු සභාව තුළ යොදාගැනීම සඳහා වූ උපදෙස් සාරාංශගත කරන්න.

7. ගුරුවරයෙකුගේ ඇගයීම කළ හැකි ආකාර පහක් ලියන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

පහත උපදෙස් මෙම පාඩම තුළ ඔබ ඉගෙන ගත් දේ සාරාංශ කර දක්වයි. ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහනක් සැලසුම් කිරීම සඳහා ඔබට එය යොදාගත හැකිය.

1. ඔබේ පුහුණු කිරීමේ වැඩසටහනේ අරමුණු ලැයිස්තුගත කරන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

2. වර්ෂය සඳහා දින, වේලාවන් හා ස්ථානයන් දින දර්ශනයක ලකුණු කරන්න. (මේ සඳහා දින දර්ශනයක් යොදාගන්න.)

3. වැඩසටහන සඳහා **ඇතුළු වීමේ සුදුසුකම්** ප්‍රකාශ කරන්න. අයදුම්කරුවන් :

   - නැවත ඉපදීම ලද ඇදහිලිවන්තයන් විය යුතුය.
   - වතුර බෞතිස්මය පිළිබඳ ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කර තිබිය යුතුය.
   - ශුද්ධාත්මයෙන් පූර්ණව සිටිය යුතුය.
   - සභාවේ මෙහෙයන්ට නිතර සහභාගී විය යුතුය. (සභ/හෝ සභාවේ සාමාජිකයෙකු විය යුතුය.)
   - සභාව සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් තිබිය යුතුය.
   - නායකයන් උදෙසා වූ බයිබලීය සුදුසුකම් සපුරා තිබිය යුතුය.
   - දෛනික ජීවිතය තුළ ශුද්ධාත්ම ඵල සහ ක්‍රිස්තුස්වහන්සේ ලෙස හැසිරීම පෙන්විය යුතුය.

4. **වැඩසටහන සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමිතීන්** ප්‍රකාශ කරන්න. යෝජනා කිහිපයක් පහත දැක්වේ.

අයදුම්කරුවන් :

- අසනීපයක් හෝ පංති නායකයා විසින් අනුමත කරන ලද හදිසි අවස්ථාවක් වැනි හේතු නොමැති නම් සියලුම සැසිවාරයන්ට සහභාගී විය යුතුය.
- සියලුම පංති පැවරුම් සම්පූර්ණ කළ යුතුය.
- නායකයෙකුගේ අධීක්ෂණය යටතේ එක් පාඩමක් හෝ ඉගැන්වීම පුහුණු විය යුතුය.

5. **ගුරුවරු පුහුණු කිරීමේ අවස්ථාවේ වර්ගය** තිරණය කරන්න. යෝජනා කිහිපයක් පහත දැක්වේ :

   - ගුරුවරුන්ගේ රැස්වීම් වල කොටසක් ලෙස කෙටි පුහුණුවීම් සැසි යොදාගන්න : සභාවේ ගුරුවරු නිතර මුණගැසේ නම්, සෑම රැස්වීමකම කොටසක් සේවය තුළදී ලබන පුහුණුවක් සඳහා යොදාගන්න.

   - ඉරිදා පාසල් කාලය තුළ : ඔබේ සභාවේ විශේෂ ඉරිදා පාසල් කාලයක් තිබේ නම්, මෙම කාලය තුළ පවත්වන විශේෂ පංතියක් තුළ නව ගුරුවරු පුහුණු කරන්න.

   - ස්වයං - උපදේශනය : හැකියාවක් ඇති ගුරුවරුන්ට මෙම අත්පොතේ කොටසක් ලබා දී ඔවුන්ට ස්වයං අධ්‍යයනයක් ලෙස පාඩම සම්පූර්ණ කිරීමට ඉඩ දෙන්න.

   - එක් රැයක පුහුණුව : පුහුණු කිරීම සඳහා සතියකට එක් රැයක් හමුවන්න.

- විවේකී ස්ථානයක : පුහුණුව සඳහා ගුරුවරුන්ව කඳවුරකට හෝ විවේකී ස්ථානයකට ගෙන යන්න.

- එක් කෙනෙකු තවත් කෙනෙකුට : එක් කෙනෙක් තවත් කෙනෙකුට ඉගැන්වීමේ පදනම මත නව ගුරුවරයෙකුට ඉගැන්වීම සඳහා අත්දැකීම් සහිත ගුරුවරයෙකු පත් කරන්න.

- එක්සත් පුහුණුව : ඇතැම්විට, නිකායේ සියලු ගුරුවරුන්ට එක්ව සහභාගීකම දැරීමට හා පුහුණුව ලැබීමට හැකිවන පරිදි, සමාජයේ ඇති සභාවන් කිහිපයකටම එක්ව එක්සත් පුහුණුවක් සැලසුම් කිරීමට අවශ්‍ය විය හැකිය.

- ශ්‍රව්‍ය - දෘශ්‍ය පුහුණුව : ඔබට ශ්‍රව්‍ය පට හෝ වීඩියෝ පට පටිගත කිරීමේ හැකියාව පවතී නම්, පුහුණුව පටිගත කර ශිෂ්‍යයන්ට තනිව අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

6. **උගන්වනු ලබන නායකයින් තෝරාගන්න'** ඔවුන් ආවරණය කරනු ලබන ක්ෂේත්‍ර මොනවාද? සහ ඔවුන් උගන්වන්නේ කවර අවස්ථාවේදී ද. පහත මාතෘකා සහිතව වගුවක් පිළියෙල කරන්න.

| නම. | දින. | විෂයන්. |
|---|---|---|

7. පුහුණු කිරීම සඳහා ඔබ යොදා ගන්නා පාඩම් මොනවාද?

පුහුණු කිරීමේ පාඨමාලාවේ නම : ____________________

ප්‍රකාශකයාගේ නම/ලිපිනය : ____________________

(භාවස්ටයිම් ආයතනයේ ගුරුවරු පුහුණු කිරීම් සඳහා වූ මෙම අත්පොත ඔබට යොදාගත හැකි බව අමතක නොකරන්න)

8. අයවැයක් පිළියෙල කරන්න :

වැඩසටහන ප්‍රචාරක කටයුතු සඳහා කොපමණ මුදලක් වැය වේද? රු. __________

පුහුණු කිරීමට උගන්වන පාඩම් සඳහා කොපමණ මුදලක් වැය වේද? රු. __________

වෙනත් වියදම් : රු. __________

9. හැකියාවක් සහිත ගුරුවරුන්ට සේවයේ වගකීම් පිළිබඳ විස්තරයක් පිළියෙල කරන්න. ඔබට අනුගමනය කළ හැකි උදාහරණයක් පහත දැක්වේ.

## සේවය පිළිබඳ විස්තර සඳහා සාම්පලයක්

## වැඩිහිටි පංති ගුරුවරයා

**සේවයේ මාතෘකාව :** වැඩිහිටි පංති ගුරුවරයා

**සේවය පිළිබඳ විස්තරය :** වැඩිහිටි බයිබල් අධ්‍යයන පංතියේ ගුරුවරයෙකුට පහත කරුණු පිළිබඳ පෞද්ගලික වගකීමක් පවතී.

- සතිපතා පංති සැසිවාර සඳහා සූදානම් වීම හා ඉගැන්වීම.

දිනය __________ වේලාව __________ ස්ථානය __________

- පංතියට නව ශිෂ්‍යයන් බඳවා ගැනීම

- නොපැමිණි සාමාජිකයන් සහ ක්‍රියාශීලි නොවන සාමාජිකයන් සමග සම්බන්ධවී ප්‍රශ්න හඳුනාගෙන, අවශ්‍ය සේවය සැපයීම සහ ක්‍රියාශීලි සාමාජිකයෙකු බවට පත් කිරීම.

- ගැළවීම නොලත් සාමාජිකයින් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනා ගැනීම.

- දැනටමත් ඇදහිලිවන්තයන්ව සිටින සාමාජිකයන්ගේ ආත්මික අවශ්‍යතාවයන්ට සේවය කිරීම, ඔවුන් ආත්මිකව දියුණු කිරීම හා වර්ධනය කිරීම, සේවයේ කාර්යයන් සඳහා ඔවුන් යෙදවීම.

- මුළු සභා සහභාගීත්වයේ ක්‍රියාකාරී කොටසක් වීමට පංතියේ සාමාජිකයන් උනන්දු කිරීම.

- පංතියට අදාලව සභාව අපේක්ෂා කරන වාර්තා සම්පූර්ණ කරන්න, එනම්, පැමිණීමේ ලේඛණ වැනි දේ.

**පෞද්ගලික අවශ්‍යතා :**

- මෙම විශේෂිත සේවය සඳහා දේව කැඳවීම.
- බයිබලීය නායකත්ව සුදුසුකම් සම්පූර්ණ කිරීම.
- සභාව මඟින් ලබා දී ඇති ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන සම්පූර්ණ කර තිබීම.
- බලපෑමක් කළ හැකි අයුරින් සන්නිවේදනය කිරීම.
- මෙම සභා සහභාගීත්වයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම.
- මෙම සභාවේ දේවධර්මයන් පිළිබඳ එකගතාවයක් පැවතීම.
- සභාවේ නායකත්වයට උපකාර කිරීම හා සහයෝගයෙන් කටයුතු කිරීම

**වේලාව කැපකිරීම :**

- නිතරම පවත්වන පංති රැස්වීම් සඳහා පෞද්ගලිකව සූදානම් වීමේ කාලයක්.
- සාමාන්‍ය පංති රැස්වීම් වේලාව : සතියකට පැය දෙකක්.
- මාසික කාර්ය මණ්ඩල රැස්වීම.
- වාර්ෂික සේවය - තුළ ගුරුවරුන්ගේ පුහුණු කිරීමේ පංතිය.
- පෞද්ගලික සම්බන්ධතා, සහභාගීත්වයන්, සෝදිසි කිරීම් සහ ශිෂ්‍යයන්ට සේවය කිරීම් සඳහා වූ කාලය.

10. **ගුරුවරුන්ට කැපවීම සඳහා ප්‍රතිඥාවක්** සූදානම් කරන්න. අනුගමනය කිරීමට උදාහණයක් පහත දැක්වේ.

## ගුරුවරුන්ගේ කැපවීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පෞද්ගලික ගැලවුම්කරු ලෙස පිළිගෙන, දැන් උන්වහන්සේ සමග සහභාගීත්වයෙන් ජීවත් වීමෙන්, ක්‍රිස්තුස්වහන්සේට හා උන්වහන්සේගේ වචනය තුළින් අන් අයට සේවය කිරීම උතුම් කැඳවීමක් බව මම තේරුම් ගත්තෙමි. ගුරුවරයෙකු ලෙස මගේ නිලයේ පැවරීම අනුව සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ උපකාරය හා මගපෙන්වීම මත රඳා පවතමින් මෙසේ ප්‍රතිඥා දෙමි :

- මගේ සභාවේ දේව ධර්ම ප්‍රකාශයන් සමග එකග වන අතර ඊට එරෙහි වූ කිසිවක් උගන්වන්නේ නැත.
- මම දිනපතා යාච්ඤා කිරීම සහ බයිබල් අධ්‍යයනය සඳහා වේලාවක් වෙන්කර තබා ගනිමි.
- මම මාගේ ශිෂ්‍යයන්ගේ හැරීම උදෙසා සහ කිතුණු අයගේ ආත්මික වර්ධනය වෙනුවෙන් අවංකව යාච්ඤා කරමි.
- මම අවංකව සෑම පාඩමක් උදෙසා සූදානම් වීමට කාලය ගත කරන අතර, මා උගන්වන සත්‍යයන් අනුව ජීවත් වීම මගින් ආත්මිකව සූදානම් වෙමි.
- ගුරුවරයෙකු ලෙස  සභාව තුළ මාගේ වගකීමට මම විශ්වාසවන්ත වෙමි.

- පංතිය තුළ දේව වචනය උගන්වන අතර, මගේ ශිෂ්‍යයන් තුළින් බයිබල් අධ්‍යයනය ප්‍රචලිත කරමින් පංතිය තුළ ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා ඔවුන් ධෛර්යමත් කරමි.
- අප සභාවේ සේවාවන් සඳහා විශ්වාසවන්තව සහභාගී වෙමින් ඒවා ප්‍රචලිත කරන අතර, මුදල් වලින් සහ මාගේ යාච්ඤාවන් තුළින් සභාවට උපකාර කරමි.
- දෙවියන්වහන්සේ ඉදිරියේ මාගේ හෘද සාක්ෂියට එකඟව පවසා සිටිය හැකි බාධාවන් නොවේ නම් සභාවේ ඕනෑම රැස්වීමකට සහභාගී වෙමි.
- යම් හේතුවක් මත මට මාගේ වගකීම් සම්පූර්ණ කළ නොහැකි වුවහොත්. මම මගේ නායකයන් හමුවී යෝග්‍ය නම් මාගේ පංතිය නැවත භාර දෙමි.

නම:______________________________________________ දිනය:________________________

# පහළොස්වන පරිච්ඡේදය

## දේශනා කිරීම සඳහා හැඳින්වීමක්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින් :

- දේශනා කිරීම අර්ථ දැක්වීමට,
- බයිබලීය දේශනා කේන්ද්‍රගතවිය යුතු කරුණු හඳුනාගැනීමට,
- වචනය දේශනා කිරීමේදී දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීමේ වැදගත්කම පැහැදිලි කිරීමට,
- දේශනාව සම්බන්ධයෙන් වූ බයිබලීය අනතුරු ඇඟවීම් හයක් හඳුනාගැනීමට, ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **එසේනම් ඔවුන් තමුන් විසින් අදහා නොගත්තා වූ කෙනෙකුට යාච්ඤාකරන්නේ කොහොමද? තමුන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනාකරන්නෙක් නැතුව ඔවුන් අසන්නේ කොහොමද? (සමහරු) යවනු ලැබුවොත් මිස දේශනාකරන්නේ කොහොමද? (රෝම 10:14-15)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය බයිබලීය දේශනා කිරීම් සම්බන්ධ විෂය හඳුන්වා දෙයි. එය දේශනා කිරීම අර්ථ දක්වන අතර, බයිබලීය දේශනා කිරීම පිළිබඳ විෂයන් හඳුනාගැනීම, දේශනා කිරීමේදී දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට සහ දේශනා කිරීම හා සම්බන්ධ බයිබලීය අනතුරු ඇඟවීම් හඳුනාගැනීම ආදිය සිදුකරයි. ඊළඟ පරිච්ඡේදය තුළදී බයිබලීය දේශනාවක් සැළසුම් කරන්නේ කෙසේද යන්න ඔබ ඉගෙන ගනු ඇත.

## ඉගැන්වීම හා දේශනාකිරීම

මෙම පාඨමාලාවේ පළමු පරිච්ඡේදයේදී ඔබ "ඉගැන්වීම" යන්නෙහි අර්ථ දැක්වීම ඉගෙන ගත්තේය:

> ඉගැන්වීම යනු, අන් අයට මඟපෙන්වීමේ ක්‍රියාවයි. ඒ තුළ පෙන්වාදීම, විදහා දැක්වීම, දැන්වීම, දැනුම බෙදාගැනීම, පුහුණු කිරීම සහ තවත් කෙනෙකුගේ අධ්‍යයනයන්ට මගපෙන්වීම ඇතුළත් වේ.

"දේශනාකිරීම" සඳහා අර්ථ දැක්වීම පහත දැක්වේ :

> දේශනාකිරීම යනු විධිමත් පිළිවෙළකට අන් අය වෙත කරන්නාවූ අනුශාසනාවකි (දේශනාවක් හෝ විෂයක් පිළිබඳව ක්‍රමානුකූල පරීක්ෂණයක්).

දේශනාකිරීම හා ඉගැන්වීම තුළ දේව වචනයේ සත්‍යයන් අන් අයට සන්නිවේදනය කරන බැවින්, මෙම කාර්යයන් දෙකම සමාන වේ. දේශනාවක් සඳහා සූදානම් වීම ඉගැන්වීම සඳහා පාඩමකට සූදානම්වීමට සමාන බව ඔබ ඊළඟ පරිච්ඡේදයේදී ඉගෙන ගනු ඇත. නමුත් උපදෙස් දීමට යොදා ගන්නා ක්‍රමවේදය හා ඒවා ඉදිරිපත් කිරීමේ ශෛලිය අතින් දේශනාකිරීම හා ඉගැන්වීම සාමාන්‍යයෙන් වෙනස් වේ.

## දේශනාකිරීම හා ඉගැන්වීම ඒකාබද්ධ කිරීම.

බලපෑමක් කළ හැකි අයුරින් ශුභාරංචිය බෙදාගැනීම තුළ දේශනා කිරීම හා ඉගැන්වීම යන දෙකම ඒකාබද්ධ කරයි. යේසුස්වහන්සේ දේශනා කිරීම සහ ඉගැන්වීම සිදු කළ සේක :

> **යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින් ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරමින්ද, සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුව කරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්ද සේක. (මතෙව් 9:35)**

(මතෙව් 4:17,23; 9:35; 11:1,5; මාර්ක් 1:14,38-39; 2:2; ලූක් 4:43-44; 9:6; 20:1; 1 පේත්‍රුස් 3:19; 4:6 ද බලන්න)

දේශනා කිරීම යේසුස්වහන්සේගේ ප්‍රධාන සේවයන්ගෙන් එකක් විය :

> **ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය, මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක...වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද....ස්වාමින්වහන්සේගේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශකරන්ටද උන්වහන්සේ මා එවූ සේක. (ලූක් 4:18-19)**

යේසුස්වහන්සේ මරණයට පත්වූයේ පාපය වෙනුවෙන් පසුතැවීම හා පාපයට සමාව දීම දේශනා කළ හැකිවන පරිදිය :

> **...මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන් වෙනිදා මළවුන්ගෙන් නැඟිටින්ටත්,යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. (ලූක් 24:46-47)**

### දේශනාකිරීම සඳහා වූ ආඥාව

ගෝලයන්ට දේශනාකිරීම සඳහා යේසුස්වහන්සේගෙන් ආඥාවක් ලැබී තිබුණි :

> **උන්වහන්සේ ද තමන් සමඟ සිටින පිණිසත්, දේශනාකරන්ට පිටත්කර අරින පිණිසත්, යක්ෂයන් දුරු කිරීමේ බලය දරන පිණිසත්, දොළොස් දෙනෙකු නියම කළසේක. (මාර්ක් 3:14-15)**
>
> **නුඹලා යමින් ස්වර්ග රාජ්‍ය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. (මතෙව් 10:7) (මතෙව් 10:27 සහ ලූක් 9:2, 60 ද බලන්න)**

මුල්කාලීන සභාවේ ඉලක්කය වූයේ ශුභාරංචිය අසා නොතිබූ අයට ශුභාරංචිය දේශනා කිරීමය :

> **...අපේ අත් වලට සූදානම්ව තිබෙන අනුන්ගේ මායිමේ වැඩගැන පාරට්ටු නොකොට, නුඹලාට එහායින් තිබෙන පළාත් වලත් ශුභාරංචිය දේශනා කරන පිණිස ... (2 කොරින්ති 10:16)**

ඉගැන්වීම මෙන්ම, දේශනාකිරීමද ක්‍රමානුකූල සභාව පරිසරයකට පමනක් සීමා නොවිය :

> **දවස්පතාම දේව මාළිගාවේදීත්, ගෙදරදීත් ඉගැන්වීමෙන්ද යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ යයි දේශනාකිරීමෙන්ද නොනැවතුණෝය. (ක්‍රියා 5:42)**

එසේම දේශනා කිරීම සම්පූර්ණ කාලීන දේවගැතිවරුන්ට හෝ සේවකයන්ට පමණක්ද සීමා නොවිය. මුල් කාලීන සභාවේ ඇදහිලිවන්තයන් පීඩාවන් නිසා විසිරවනු ලැබූ අතර ...

> **එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය. (ක්‍රියා 8:4) (ක්‍රියා 11:19-20 ද බලන්න)**

ඇදහිලිවන්තයන් ලෙස, ලෝකයේ සියලු ජාතීන්ට ශුභාරංචිය දේශනා කිරීමේ ආඥාව අපටද ලැබී තිබේ :

**රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය, එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

**නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාර්ක් 16:15)**

## දේශනා කළ යුතු විෂයන්

ඉගැන්වීම මෙන්ම දේශනාකිරීමද දේව වචනය මත පදනම් විය යුතුය. උදාහරණයක් ලෙස, ක්‍රියා 2 හි පේත්‍රුස්ගේ දේශනාව තුළ පද 23 න් 12 ක්ම ක් පරණ ගිවිසුම් බයිබල් පද පිළිබඳ ප්‍රශ්න විය.

බයිබලීය දේශනා කිරීම් පහත කරුණු මත කේන්ද්‍රගත කළ යුතුය :

### පාපය පිළිබඳව පසුතැවිලිවීම හා පව්සමාව ලැබීම :

**යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. (ලූක් 24:47)**

**ඔව්හු පිටත්ව ගොස් : පසුතැවිලිවෙයල්ලා යයි දේශනා කළෝය. (මාර්ක් 6:12) (ක්‍රියා 13:38; 14:15 ද බලන්න)**

### දෙවියන්වහන්සේගේ රාජ්‍ය පිළිබඳ ශුභාරංචිය :

**රාජ්‍යයේ මේ සුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේ ය, එවිට අන්තිමය පැමිණෙන්නේ ය. (මතෙව් 24:14)**

**(මතෙව් 9:35; 11:15; මාර්ක් 1:14, 16:16; ලූක් 4:18; ක්‍රියා 8:12; 14:7,21; 16:10; 20:25; රෝම 1:15; 15:19-20; 1 කොරින්ති 15:1; 11 කොරින්ති 2:12; 10:14; 11:7; කොලොස්සි 1:23; 1 තෙසලෝනික 2:9 ද බලන්න)**

### මරණයෙන් නැවත නැඟිටීම :

**යේසුස්වහන්සේ කරණකොටගෙන මළවුන්ගෙන් නැඟිටීම ප්‍රකාශකළ ... (ක්‍රියා 4:2) (ක්‍රියා 17:3, 18 ද බලන්න)**

### දෙවියන්වහන්සේගේ වචනය :

**එවිට දොරකඩ ළඟවත් ඉඩ නැති තරමට බොහෝ දෙනෙක් රැස් වූවෝය. උන්වහන්සේ ඔවුන්ට වචනය කීසේක. (මාර්ක් 2:2)**

**නමුත් ස්වාමින්වහන්සේගේ වචනය සදාකාලේටම පවතින්නේය. මේ වනාහි නුඹලාට දේශනාකරන ලද ශුභාරංචි වචනයය. (1 පේත්‍රුස් 1:25)**

**(ක්‍රියා 8:4,25; 13:5; 14:25; 15:35-36; 17:13; 2 තිමෝති 4:2; තිතස් 1:3 ද බලන්න)**

### ඇදහිල්ලේ වචන :

**වාක්‍යය නුඹ ළඟය, නුඹේ මුඛයේ ද නුඹේ සිතේද තිබේය කියාය. එනම් අප විසින් ප්‍රකාශකරන ඇදහිල්ලේ වාක්‍යය. (රෝම 10:8) (ගලාති 1:23 ද බලන්න)**

**යේසුස්වහන්සේ පිළිබඳව වූ සියලු දේ :**

> **... දෙවියන්වහන්සේගේ රාජ්‍ය දේශනාකරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය. (ක්‍රියා 28:31)**
>
> **සියලු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තා වූ මට මේ අනුග්‍රහය දෙන ලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන අන්‍යජාතීන්ට දේශනාකරන්ටත්, (එපීස 3:8)**
>
> **(ක්‍රියා 5:42; 8:5,35; 9:20; 17:3,18; රෝම 16:25; 2 කොරින්ති 1:19; 4:5; කොලොස්සි 1:28 ද බලන්න).**

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලැබෙන සමාදානය :**

> **...සමාදානයේ යහපත් ආරංචිය ප්‍රකාශකරවමින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට එවන ලද වචනය... (ක්‍රියා 10:36) (එපීස 2:17 ද බලන්න)**

**කුරුසිය :**

> **මක්නිසාද කුරුසියේ වචනය විනාශවන්නන්ට මෝඩකමය, නමුත් ගැළවෙන්නා වූ අපට ඒක දෙවියන්වහන්සේගේ බලයය. (1 කොරින්ති 1:18) (1 කොරින්ති 1:17-22 ද බලන්න)**

## බලය විදහා දැක්වීම

ඉගැන්වීමේදී මෙන්ම දේශනා කිරීමේදී ද ඒ සමග දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්විය යුතුය :

> **යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද, රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරමින්ද සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක. (මතෙව් 9:35)**

පාවුලු තුමා මෙසේ පැවසුවේය :

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නා වූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5) (මාර්ක් 1:39; ලූක් 9:6; රෝම 15:19; 1 කොරින්ති 1:17-18 ද බලන්න)**

බලය විදහා දැක්වීම වචනය දේශනා කිරීම ස්ථිර කරන බැවින් එය වැදගත් වේ.

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේ ද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළසේක. (මාර්ක් 16:20)**

## දේශකයා

මෙම පාඨමාලාව ආරම්භයේදී ගුරුවරයෙකුගේ ජීවිතය තුළින් පිළිඹිබු විය යුතු පෞද්ගලික ගුණාංග අපි සාකච්ඡා කළෙමු. ශුභාරංචිය දේශනා කරන්නෙකුගේ ජීවිතය තුළද එම ගුණාංගයම ඇතුළත් විය යුතුය. කොලොස්සි 1 වන පරිච්ඡේදය තුළ ශුභාරංචිය දේශනා කරන්නෙකු සතු විය යුතු අතිරේක ගුණාංග තුනක් හඳුනාගත හැකිය.

**ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයෙකි :**

"ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාස සේවකයෙක්ව" (7 වන පදය). ඔහුගේ සියලු දේශනා තුළ ක්‍රිස්තුස්වහන්සේ ඔසවනු ලැබිය යුතුය.

**ඔහු ශුභාරංචියේ සේවකයෙකි :**

"ශුභාරංචියේ....පාවුල් නම් මම එක් සේවකයෙක් කරනු ලැබීමි" (23 වන පදය)

**ඔහු සභාවේ සේවකයෙකි :**

"සභාවේ සේවකයෙක් කරනු ලැබීමි." (26 වන පදය)

## බයිබලීය අනතුරු ඇඟවීම්

දේශකයන් පිළිබඳව වූ බයිබලීය අනතුරු ඇඟවීම් හතරක් පහත දැක්වේ.

### දේශකයන් තමා දේශනාකරන දේ අනුව ජීවත්විය යුතුය :

> **අනිකෙකුට උගන්වන්නා වූ නුඹ නුඹටම උගන්වාගන්නේ නැද්ද? සොරකම් නොකළ යුතුයයි දේශනාකරන්නා වූ නුඹ සොරකම් කරනවාද? (රෝම 2:21)**
>
> **නමුත් මාගේ ශරීරය දමනය කර වහල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනා කළාට පසු කොයිලෙසකින්වත් මාම එපාකරනු නොලබන පිණිසය. (1 කොරින්ති 9:27)**

### ඔබ දේශනා කිරීම සඳහා කැඳවා තිබේ නම්, ඔබට තෝරාගැනීමක් නැත :

දෙවියන්වහන්සේ විසින් විශේෂයෙන් දේශනාකිරීම සඳහා කැඳවනු ලැබුවන්ට තෝරාගැනීමක් නැත.

> **මක්නිසාද මම ශුභාරංචිය දේශනාකරමි නමුත් පාරට්ටුකරගැනීමට මට කිසිත් නැත, මක්නිසාද එසේ කිරීමට බැඳී සිටිමි, ශුභාරංචිය දේශනා නොකළොත් මට දුක්වේ.**
> **(1 කොරින්ති 9:16)**

### දේශනාකිරීම දේව වචනය මත පදනම් විය යුතුය :

> **නමුත් අප විසින් නුඹලාට ප්‍රකාශකළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේව දූතයෙක්වත් නුඹලාට ප්‍රකාශකරතොත් ඔහු ශාපලද්දෙක් වේවා. නුඹලා පිළිගත් ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් යමෙක් නුඹලාට දේශනාකරතොත් ඔහු ශාපලද්දෙක් වේවා යි අප වරක් කී හැටියටම මම දැන් නැවතත් කියමි. (ගලාති 1:8-9)**
> **(2 කොරින්ති 11:4 ද බලන්න)**

### අභිප්‍රායන් නිවැරදි විය යුතුය :

පාවුල් පිලිප්පි 1:15-18 දක්වා ශුභාරංචිය දේශනා කිරීමේ අභිප්‍රායන් සාකච්ඡා කළේය. ඔබේ බයිබලයේ මෙම පරිච්ඡේදය කියවන්න. පාවුල්, මෙසේ සඳහන් කළේය...

> **සමහරු ඊර්ෂ්‍යාවෙන්ද විවාදයෙන්ද සමහරු හොඳ සිතින්ද ක්‍රිස්තුස්වහන්සේ දේශනා කරති. (පිලිප්පි 1:15)**

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "දේශනා කිරීම" යන්න අර්ථ දක්වන්න.

3. බයිබලිය දේශනා කිරීම කේන්ද්‍රගත විය යුත්තේ කවර විෂයන් මතද?

4. මෙම පාඩම තුළ සාකච්ඡා කරන ලද දේශනා කිරීම හා සම්බන්ධ බයිබලීය අනතුරු ඇඟවීම් හතරක් ලියන්න.

5. වචනය දේශනා කිරීමේ දී දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීම වැදගත් වන්නේ ඇයි?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

දේශනා කිරීම පිළිබඳ බයිබලීය නිර්දේශ අධ්‍යයනය කරන්න :

### දේශනා කිරීම පිළිබඳ පරණ ගිවිසුමේ සටහන්.

ගීතාවලිය 40:9; දේශනාකාරයාගේ පොත 1:1,2,12; 7:27; 11:8-10; යෙසායා 61:1; නෙහෙමියා 6:7;

### පරණ ගිවිසුමේ දේශකයන් පිළිබඳ නව ගිවිසුමේ නිර්දේශයන්.

මතෙව් 12:41; ලූක් 11:32; 2 පේත්‍රුස් 2:5

### දේශනා කිරීම පිළිබඳ නව ගිවිසුමේ සටහන්

මතෙව් 3:1, 4: 17,23: 9:35;10:7,27; 11:1,5; 12:41; 24:14,41; 26:13

මාර්ක් 1:4,7,14,38-39; 2:2; 3:14; 6:12; 14:9; 16:15,20;

ලූක් 3: 3, 18; 4:18-19,43-44

ක්‍රියා 3:20; 4:2; 5:42; 8:4,5,12,25,35,40; 9:20,27; 10:36-37,42; 11:19-20 (13:5,24,38,42; 14:7,15,21,25; 15:21,35-36; 16:6,10; 17:3, 13"18; 19:13; 20:7,9,25.

රෝම 1:15; 2:21; 10:8-15; 15:19-20; 16:25

1 කොරින්ති 1:17-18; 2:4; 9:14-16,18,27; 15:1-2,11,12,14

2 කොරින්ති 1:19; 2:12; 4:5; 10:14; 10:16; 11:4,7

ගලාති 1: 8,9,11,16,23; 2:2; 3:8; 4:13; 5:11

එපීස 2:17; 3:8; පිලිප්පි 1:15-18; කොලොස්සි 1:23,28; 1 තෙසලෝනික 2:9; 1 තිමෝති 2:7; 3:16; 2 තිමෝති 1:11; 4:17; තීතස් 1:3; හෙබ්‍රෙව් 4:2,6; 1 පේත්‍රුස් 1:12,25; 3:19;4:6; 2 පේත්‍රුස් 2:5

# දහසයවන පරිච්ඡේදය

# දේශනාවක් සැලසුම් කිරීම

### අරමුණු :

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීම තුළින්,

- දේශනාවක් සැළසුම් කිරීමේ මූලික පියවර සාරාංශගත කිරීමට,
- මාතෘකානුකූල දේශනා කිරීම අර්ථ දැක්වීමට,
- පාඨයක් පිළිබඳ දේශනා කිරීම අර්ථ දැක්වීමට,
- විවරණාත්මක දේශනාකිරීම අර්ථ දැක්වීමට,
- දේශනා කිරීම සඳහා දේශනාවක් සැලසුම් කිරීමට, ඔබට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය :

> **වචනය දේශනා කරපන්න, කලටත් අකලටත් වෑඩේ යෙදී සිටපන්න, සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටුකර, අවවාදකර, අනුශාසනාකරපන්න කියාය. (2 තිමෝති 4:2)**

## හැඳින්වීම

මෙම පාඩම තුළ බයිබලිය දේශනාවක් දේශනා කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත. බයිබලයේ ඇති ඇතැම් දේශනා අධ්‍යයනය කිරීමෙන්, සහ සභා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ දේශකයන්ගේ බලවත් දේශනා අධ්‍යයනය කිරීමෙන්, දේශනාකිරීම පිළිබඳ මූලික ප්‍රතිපත්ති ඔබ ඉගෙන ගනු ඇත. ඉගැන්වීම හා දේශනා කිරීම බොහෝදුරට සමාන බවත්, ඉදිරිපත් කරන ක්‍රමය සහ කතා විලාශයේ ශෛලිය අතින් වෙනස් වන බවත් ඔබ සොයා ගනු ඇත.

## දේශනා කිරීම හා ඉගැන්වීම : ඒවා වෙනස් වන ආකාරය

දේශනාකිරීම හා ඉගැන්වීම සාමාන්‍යයෙන් පහත සඳහන් ආකාර වලින් වෙනස් වේ :

### ක්‍රමවේදයන් :

ශ්‍රාවක පිරිසට සහභාගිත්වය සඳහා කැඳවීමක් ලබා දෙන ක්‍රමවේද දේශනා කිරීමේදී සාමාන්‍යයෙන් යොදා නොගනී. උදාහරණයක් ලෙස, ඔබ දේශනා කරන විට සාකච්ඡා කිරීමට හෝ ප්‍රශ්න හා පිළිතුරු සඳහා කාලයක් නොමැත. මෙයට හේතුව සාමාන්‍යයෙන් දේශනා කිරීම සිදුවන්නේ විශාල ශ්‍රාවක පිරිසක් සඳහා වීමයි. මේ හේතුවෙන්, ඉදිරිපත් කරන ක්‍රමවේදය වඩා විධිමත් වේ.

### කතා විලාශයේ ශෛලිය :

ඉගැන්වීමේදී, බොහෝවිට පුද්ගලයන් වයස් කාණ්ඩ වලට වෙන්කර තිබේ. පංතියේ සියලුම දෙනා වැඩිහිටියන්, තරුණයන් හෝ දරුවන්ය. දේශනා කිරීමේදී බොහෝ විට විවිධ වයසේ පුද්ගල කණ්ඩායම් අන්තර් ගත වේ. ශ්‍රාවක පිරිස ඉරිදා පාසලේ දී හෝ සභාවේ අධ්‍යයන කණ්ඩායම් වලදී මෙන් වයස් කාණ්ඩ වලට වෙන් කර නැත.

මේ හේතුවෙන්, ඔබේ දේශනා ශෛලිය පොදු මට්ටමකට සකස්කරගත යුතුය. දරුවන්ට හා යෞවනයන්ට තේරුම් ගැනීමට අපහසු වන ලෙස දේශනාව ඉතා අපහසු ලෙස ඉදිරිපත් නොකරන්න. එසේම වැඩිහිටියන් ගේ උනන්දුව අඩු වන ලෙස එය ඉතා සරල ලෙසද ඉදිරිපත් නොකරන්න.

### අධ්‍යයන විෂය මාලාව :

ඉරිදා පාසල් වල හා සභා පාසල් වල බොහෝවිට ඔබ ඉගැන්විය යුතු විෂය පිළිබඳ පාඩමක් හා ඒ පාඩම පිළිබඳ සාකච්ඡාවක් සහිත විෂය මාලා මාර්ගෝපදේශක තිබේ. මෙය බොහෝ විට දේශනාවක් හා සම්බන්ධව මෙය සත්‍යයක් නොවේ. දෙවියන්වහන්සේගේ මගපෙන්වීම සහිතව, ඔබ ඔබේ පණිවුඩයේ වර්ගය හා අන්තර්ගතය තීරණය කළ යුතුය.

## දේශනාවක් සූදානම් කිරීම

දේශනාවක් සූදානම් කිරීමේ මූලික පියවර පාඩමක් සැළසුම් කිරීමට ඔබ ඉගෙනගත් ඉගැන්වීම් හා සමාන වේ. ඔබ :

- ආත්මිකව සූදානම් විය යුතුය.
- ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කළ යුතුය.
- අරමුණු සදහන් කළ යුතුය.

දේශනාවක මූලික සැළැස්ම පාඩමක් ඉගැන්වීමේ සැළැස්ම අනුගමනය කරයි. ඔබේ දේශනාව තුළ පහත දේ අන්තර්ගත විය යුතුය :

- මාතෘකාවක්.
- හැඳින්වීමක්.
- ප්‍රධාන අංගයක්.
- අදාල කර ගැනීමක්.
- අවසානයක්.

(“පාඩම සැලසුම් කිරීම” යන 10 වන පරිච්ජේදය නැවත බලන්න.)

ඉගැන්වීම තුළදී සිදු කරන ලෙසටම, ඔබ ශ්‍රාවක පිරිසේ අවධානය ලබා ගෙන එය රදවාගත යුතුය. ඔබ ක්‍රමානුකූල ආකාරයකින් පාඩම ඉදිරිපත් කළ යුතුය. ඔබ දේශනාව ජීවිතයට හා සේවයට අදාල කළ යුතු අතර දේව වචනයේ එළිදරව් කිරීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට කැඳවීමක් ලබා දිය යුතුය.

## දේශනා වර්ග

බයිබලීය දේශනා හා සභා ඉතිහාසය තුළ සිටින නායකයන්ගේ දේශනාවන් අධ්‍යනය කිරීම තුළින්, දේශනා වර්ග තුනක් හඳුනාගෙන තිබේ :

### පළමු වර්ගය - මාතෘකානුකූල දේශනා :

මාතෘකානුකූල දේශනා ආත්මික ඵල, ආත්මික සටන, ආත්මික දීමනා වැනි විශේෂිත මාතෘකා පිළිබඳව කේන්ද්‍රගත වේ.

### මාතෘකානුකූල දේශනාවක් සැලසුම් කරන්නේ කෙසේද?

1. දේශනාවේ පොදු මාතෘකාව තීරණය කරන්න. උදාහරණයක් ලෙස, ඔබ තෝරා ගන්නා මාතෘකාව “යාච්ඤාව” විය හැකිය.

2. විශේෂිත තේමාවක් තීරණය කරන්න : ඔබ යාච්ඤාව පිළිබඳ කුමන තේමාවක් සම්බන්දව දේශනා කරනවාද? ඔබට තෝරාගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ :

- යාච්ඤාවේ අවශ්‍යතාව.
- යාච්ඤාවේ වටිනාකම.
- යාච්ඤාව සඳහා පිළිතුරු.
- මැදිහත්කාරකමේ යාච්ඤාව.

- යාච්ඤා කළ යුතු වේලාවන්.
- යාච්ඤාවේ බලය.
- යාච්ඤාවේ අරමුණ.
- යාච්ඤාවේ ක්‍රමවේදය.
- යාච්ඤාවේ ප්‍රතිඵල.
- යාච්ඤාව පිළිබඳ කොන්දේසි.
- යාච්ඤාව පිළිබඳ ගැටලු.
- ආත්මයෙන් යාච්ඤා කිරීම.
- යාච්ඤා කිරීමට වීර්ය කිරීම.
- යාච්ඤාවේ විශිෂ්ඨත්වය.
- යාච්ඤාවේ විෂය.
- පවුල් යාච්ඤාව.
- යාච්ඤා කිරීමට ඇති බාධා.
- බයිබලයේ ඇති යාච්ඤාවන්.
- ප්‍රායෝගික යාච්ඤාවන්.
- යාච්ඤා කිරීමේදී තිබිය යුතු ආකල්ප.
- යාච්ඤා කළ යුතු ස්ථාන.
- යාච්ඤාව තුළින් නමස්කාර කිරීම.
- යාච්ඤා කළ යුතු ඉරියව්.
- යාච්ඤාවේ භාග්‍යවන්ත බව
- ඇඳහිල්ල හා යාච්ඤාව.

ඔබ ඔබේ දේශනාව සඳහා විශේෂිත තේමාවක් තීරණය කළ යුතුය. උදාහරණය තුළ ඔබ දුටු පරිදි, බොහෝ බයිබලීය මාතෘකා තුළ තේමාවන් රැසක් ඇති බැවින්, ඔබට මාතෘකාවක සෑම කොටසක්ම ආවරණය කළ නොහැකිය. ඔබ තෝරා ගන්නා තේමාව ඔබේ දේශනාවේ තේමා පාඨය වනු ඇත. උදාහරණයක් ලෙස, ඔබට "යාච්ඤාව සඳහා ඇති බාධාවන්" ගැන කතා කිරීමට තෝරාගත හැකිය.

3. ඔබ තෝරාගත් මාතෘකාව පිළිබඳ බයිබලය පවසන්නාවූ සෑම දෙයක්ම සොයාගන්න. සමපද අකාරාදීන්, අටුවාවන් සහ වචන අධ්‍යයන ග්‍රන්ථ වැනි දේ ඔබට ලබාගත හැකිනම්, ඔබේ අධ්‍යයනයන් තුළ මේවාද යොදාගන්න.

4. පාඩම සැළසුම් කිරීම පිළිබඳව වූ 10 වන පරිච්ඡේදයේදී ඔබ ඉගෙන ගත් සරල කොටස් හතරේ සැළසුම අනුගමනය කරමින් කටු සටහන නිර්මානය කරන්න.

   - හැඳින්වීම.
   - ප්‍රධාන අංගය.
   - අදාල කරගැනීම.
   - අවසානය.

## මාතෘකානුකූල දේශනාවක් සඳහා උදාහරණයක් :

උදාහරණයක් ලෙස, "යාච්ඤාව සඳහා ඇති බාධාවන්" යන තේමාව යොදාගත් විට, ඔබේ කටු සටහන පහත පරිදි විය හැකිය :

## තේමා පාඨය : යාච්ඤාව සඳහා ඇති බාධාවන්

**හැඳින්වීම :** බොහෝ පුද්ගලයන්ට ඇති ගැටලුවක් කේන්ද්‍රගත කරන්න : පිළිතුරු නොලද යාච්ඤාවන් සහ යාච්ඤාව සඳහා පිළිතුරු නොලැබෙන්නේ ඇයි යන්න - පිළිබඳ ගැටලු. බොහෝ අය මෙම ගැටලුව අත්දැක ඇති බැවින් මෙය අවධානය ලබා ගනු ඇත.

**ප්‍රධාන අංගය :** දේව වචනය තුළ හඳුනාගෙන ඇති යාච්ඤාව සඳහා වූ බාධාවන් ගැන සාකච්ඡා කරන්න.

- වැරදි අභිප්‍රායන් සහ ඉල්ලීම් : යාකොබ් 4:2-3.
- කුමන හෝ ආකාරයක පාපයක් : යෙසායා 59:1-2.
- හදවත තුළ ඇති පිළිමවල් : එසකියෙල් 14:1-3.
- සමාව නොදෙන ආත්මය : මාර්ක් 11:25.
- ආර්මාර්ථකාමීබව : හිතෝපදේශය 21:13.
- විවාහක සහකරුට වැරදි ලෙස සැළකීම : 1 පේත්‍රුස් 3:7
- ස්වයං - ධර්මිෂ්ඨ බව : ලූක් 18:10-14.
- අවිශ්වාසය : යාකොබ් 1:6-7.
- ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ වචනයට මත නොපැවතීම : යොහන් 15:7.

අදාල කරගැනීම:

I. පිළිතුරු නොමැති යාච්ඤාවන්ගෙන් ඇතිවන බාධාව පැහැදිලි කරන්න.

A. පවුල් ජීවිතය.
B. අපේ පෞද්ගලික ආත්මික වර්ධනය.
C. අපේ සේවය.

II. මෙම සත්‍යයන් පෞද්ගලිකව අදාල කරගන්නා ලෙස ශ්‍රාවක පිරිසට පවසන්න.

A. ඔබේ යාච්ඤාවට බාධා කරන බාධාවන් මොනවාද?

අවසානය :

I. සාකච්ඡා කරන ලද යාච්ඤාවට ඇති බාධාවන් සාරාංශගත කරන්න.

II. යාච්ඤාවට බාධා කර ඇති දේවල් පිළිබඳව පාපොච්චාරණය කිරීමට හා පසුතැවිලි වීමට කැදවීමක් ලබා දෙන්න.

## දෙවන වර්ගය - පාඨයක් පිළිබඳ දේශනා කිරීම.

පාඨයක් පිළිබඳ දේශනා කිරීමේදී, බයිබල් කොටසක ප්‍රධාන සත්‍යය හෝ පාඩමේ පාඨය ප්‍රධාන බයිබල් කොටසක් මගින් සපයයි. පණිවුඩයේ ඉතිරි කොටස මෙම එක් ප්‍රධාන සත්‍යය මත ගොඩනැගේ.

### පාඨයක් පිළිබඳ දේශනාවක් සැලසුම් කරන්නේ කෙසේද?

1. බයිබල් කොටස තෝරාගන්න.

2. බයිබල් කොටස තුළින් දේශනා මාතෘකාවක් ගොඩනගන්න.

3. බයිබල් කොටස විස්තර සහිතව අධ්‍යයනය කරන්න. ඔබ තෝරාගත් කොටසට සම්බන්ධ වෙනත් බයිබල් කොටස් අධ්‍යයනය කරන්න. සමපද අකාරදිය, අටුවාවන් සහ වචන අධ්‍යයන ග්‍රන්ථ වැනි පොත් පත් ලබා ගැනීමේ හැකියාව ඔබට ඇත්නම් බයිබල් කොටස වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා ඒවා යොදාගන්න.

4. පාඩම සැලසුම් කිරීම පිළිබඳව 10 වන පරිච්ජේදයේදී ඔබ ඉගෙන ගත් සරල කොටස් හතරේ සැලසුම අනුගමනය කරමින් කටුසටහන නිර්මාණය කරන්න.

- හැඳින්වීම.
- ප්‍රධාන අංගය.
- අදාලකර ගැනීම.
- අවසානය.

### පාඨයක් පිළිබඳව වූ දේශනාවකට උදාහරණයක් :

ක්‍රියා 2:14-36 සඳහන් පේත්‍රුස්ගේ දේශනාව මේ සඳහා හොඳ උදාහරණයකි. පේත්‍රුස්ට දේශනාව සඳහා මාතෘකාවක් වුයේ නම්, එය, **නුමුත් මේ වනාහි එය වේ.**

හැඳින්වීම : **පේත්‍රුස් පණිවුඩය ආරම්භ කළේ බයිබල් පදයක් සඳහන් කරමිනි :**

**නමුත් මේ වනාහි අනාගතවක්තෘ වූ යෝවෙල් කරණකොටගෙන කියන ලද කාරණයය. කෙසේදයත්; අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි, නුඹලාගේ පුත්‍රයෝද දුවරුද අනාගත වාක්‍ය කියන්නෝය, නුඹලාගේ තරුණයෝද දර්ශන දකින්නෝය, නුඹලාගේ මහල්ලන්ද ස්වප්න දකිනවා ඇත.එසේය ඒ දවස් වලදී මාගේ දාස දාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි; ඔව්හු අනාගතවාක්‍ය කියන්නෝය. (ක්‍රියා 2:16-18)**

ශ්‍රාවක පිරිස මෙම කොටස සම්පූර්ණ වීම තම දෑස් ඉදිරිපිට දුටු බැවින් මෙම හැඳින්වීම ශ්‍රාවක පිරිසේ අවධානය ලබාගත්තේය!

ප්‍රධාන අංගය. : පේත්‍රුස්ගේ දේශනාව ඉහත බයිබල් කොටස මත කේන්ද්‍රගත විය.

I. එදින සම්පූර්ණ වූ මෙම කොටසේ ඓතිහාසික පසුබිම ඔහු ඉදිරිපත් කළේය.
II. එය ඉශ්‍රායෙල් ඉතිහාසයට හා යේසුස්වහන්සේට සම්බන්ධ වන අන්දම ඔහු පෙන්වා දුන්නේ ය.

අදාල කරගැනීම : ඔහු පෞද්ගලිකව අදාල කර ගැනීමක් සිදු කළේය...

**මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත්, නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවන සේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා. (ක්‍රියා 2:39)**

අවසානය : ඔහු ප්‍රතිචාරය සඳහා කැඳවීමක් දුන්නේය...

**පේත්‍රුස් : නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබාපල්ලා, එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නාහුය. (ක්‍රියා 2:38)**

ශ්‍රාවක පිරිස ප්‍රතිචාර දැක්වූහ...

**එකල ඔහුගේ වචනය පිළිගත් අය බව්තිස්මකරනු ලැබුවෝය. ඒ දවසේදී තුන් දාහක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතුකරනලද්දෝය. (ක්‍රියා 2:41)**

## තුන්වන වර්ගය - විවරණාත්මක දේශනා.

" විවරණාත්මක" යන්න බයිබල් කොටසක් කේන්ද්‍රගත කරමින් සහ පදයෙන් පදය විස්තර සහිතව දේශනා කරන ක්‍රමවේදයක් වේ. " විවරණාත්මක " යන වචනයේ අදහස නම් "යමක කොටස් වෙන් වෙන් වශයෙන් ගෙන පරීක්ෂා කිරීමයි".

" විවරණාත්මක " යන්න මාතෘකානුකූල හෝ පාඨයක් පිළිබඳ දේශනාවන්ට වඩා විස්තර සහිත දේශනා වර්ගයකි. එයට විශේෂිත විෂයක් හෝ බයිබල් කොටසක් කේන්ද්‍රගත කිරීමට හා එය වචනයෙන් වචනය හෝ පදයෙන් පදය විස්තරාත්මකව පැහැදිලි කිරීමට හැකිය. එසේම එය බයිබලයේ පොතක් කේන්ද්‍රගත කර, පරිච්ඡේදයෙන් පරිච්ඡේදය සහ පදයෙන් පදය පොත විස්තරාත්මකව අධ්‍යයනය කිරීම සහ ප්‍රධාන වචන වල තේරුම ගැඹුරින් සාකච්ජා කිරීම හෝ විය හැකිය. " විවරණාත්මක " දේශනාවක් චරිත කතාවක් කේන්ද්‍රගත කළ හැකිය, තෝරාගත් බයිබල් චරිතයක් පිළිබඳව වාර්තාගත සියලු දේ පදයෙන් පදය අධ්‍යයනය කිරීමෙන් මෙය සිදු කළ හැකිය.

" විවරණාත්මක " දේශනා ඉතා විස්තරාත්මක බැවින්, බොහෝවිට එහි ප්‍රතිඵලය දේශනා මාලාවකි. එක් දේශනාවක් තුළදී බයිබල් කොටසක්, පොතක් හෝ චරිතයක් පිළිබඳ සෑම දෙයක්ම විස්තරාත්මකව සාකච්ජා කිරීම කළ නොහැකිය. මාලාව තුළ ඇති සෑම දේශනාවක්ම අනෙක් දේශනා සමග සම්බන්ධ විය යුතුය. ඔබ සෑම දේශනාවක්ම ආරම්භ කරන විට ඊට පෙර දේශනා සමග එය සම්බන්ධ වන ආකාරය ඔබ පෙන්වා දිය යුතුය. කලින් පණිවුඩ සාරාංශ ගත කර ඒවා ඔබ දැන් ඉදිරිපත් කරන දේශනාවට සම්බන්ධ වන ආකාරය පැහැදිලි කිරීමෙන් ඔබට මෙය කළ හැකිය.

මාලාව තුළ ඇති සෑම දේශනාවක්ම අනෙක් ඒවාට සම්බන්ධ විය යුතු අතරම, සෑම දේශනාවක්ව තනිව ගත් කළ සම්පූර්ණ එකක් විය යුතුය. ශ්‍රාවක පිරිසේ සිටින සෑම කෙනෙක්ම දේශනා මාලාවේ සෑම දේශනාවකටම සහභාගී නොවිය හැකිය. ඔවුන්ට අනෙක් දේශනා ඇසීමෙන් තොරව දේශනාව තේරුම් ගැනීමට හැකිවිය යුතුය.

## විවරණාත්මක දේශනාවක් සැලසුම් කරන්නේ කෙසේද?

1. ඔබට ඔබේ පණිවුඩය හෝ පණිවුඩ මාලාව කේන්ද්‍රගත කිරීමට අවශ්‍ය බයිබල් කොටස, විෂය, චරිතය හෝ පොත තෝරා ගන්න.

2. බයිබල් කොටස, විෂය, චරිතය හෝ පොත පිළිබඳව බයිබලය උගන්වන සියලු දේ විස්තරාත්මකව අධ්‍යයනය කරන්න. සමපද අකාරදීන්, අටුවාවන් හෝ වචන අධ්‍යයනය ග්‍රන්ථ වැනි පොත් පත් ලබා ගැනීමේ හැකියාව ඔබට තිබේ නම් වැඩිදුර අධ්‍යයනයන් සඳහා මේවා යොදාගන්න.

3. ඔබේ කරුණ එක් විවරණාත්මක දේශනාවකින් ආවරණය කළ හැකිද නොඑසේනම් ඒ සඳහා දේශන මාලාවක් අවශ්‍ය වේ දැයි තිරණය කරන්න.

4. මාලාවේ සෑම පණිවුඩයක් සඳහාම තේමා පාඨයක් සහ මාතෘකාවක් නිර්මාණය කරන්න.

5. මාලාවේ සෑම පණිවුඩයක් සඳහාම කටුසටහනක් පිළියෙළ කරන්න. සෑම පණිවුඩයක් සඳහාම සරල කොටස් - හතරේ සැළැස්ම අනුගමනය කරන්න :

   - හැඳින්වීම.
   - ප්‍රධාන අංගය.
   - අදාල කරගැනීම.
   - අවසානය.

## “ විවරණාත්මක ” දේශනාවක් සඳහා උදාහරණයක් :

“ විවරණාත්මක ” දේශනාවක කටුසටහනක් සඳහා උදාහරණයක් පහත දැක්වේ :

මාතෘකාව : **බොරු ගුරුවරුන්ගේ ලක්ෂණ.**

බයිබල් කොටස : යුද් 1 වන පරිච්ඡේදය.

හැඳින්වීම : යුද් 1:3-4.

ප්‍රධාන අංගය :

I. ඔවුන්ගේ පසුබිම :

   A. පුරාණ කාලයේදීම මේ දඬුවමට නියම කොට තැබුවා වූ (4වන පදය).

II. ඔවුන්ගේ හැසිරීම :

   A. රහසින් ඇතුළු වී සිටිති. (4 වන පදය)
   B. තමුන්ගේම තෘෂ්ණාවල් අනුව හැසිරෙති. (16 වන පදය)
   C. තමුන්ගේම අභක්තික තෘෂ්ණාවල හැටියට හැසිරෙති (18 වන පදය)

III. ඔවුන්ගේ කථාවන් :

A. උතුම්භාවය පිළිබඳව නපුරු දේ කතා කරති. (8-10 දක්වා පද)
B. ඔවුන් නොදන්නා දේවල් පිළිබඳව නපුරු දේ කතා කරති (8-10 දක්වා පද)
C. කොඳුරන්නෝය. (16 වන පදය)
D. මැසිවිලි කියන්නෝය (16 වන පදය)
E. කටින් මහත් උඩඟු වචන කියති. (16 වන පදය)
F. සරදම් කරන්නෝය. (18 වන පදය)

IV. ඔවුන්ගේ ධර්මය :

A. දෙවියන්වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවා ගනී (4 වන පදය)
B. අපේ එකම අධිපති වූ ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේව එපා කරයි. (4 වන පදය)
C. ආත්මයාණන්වහන්සේ නැතුව සිටී (19 වන පදය)

V. ඔවුන්ගේ මෙහෙයවීම :

A. අභක්තිය (4 වන පදය)
B. නිස්සාර හීන දැක්වීම්ය (8 වන පදය)
C. මාංසය කිලිටුකරගනිති. (8 වන පදය)
D. අධිපතිකම සුළුකරති. (8-10 දක්වා පද)
E. තේරෙන දේවලින් තුමුම විනාශ කර ගනිති. (8-10 දක්වා පද)
F. ප්‍රයෝජනය පිණිස මනුෂ්‍යයන්ගේ තරාතිරම් සළකන්නෝය. (16 වන පදය)
G. භේදකරන්නෝය (19 වන පදය)
H. මාංසිකව ජීවත් වෙති (19 වන පදය)

අදාලකර ගැනීම : මෙවැනි අයට ප්‍රතිචාර වශයෙන් ඔබ කරන්නේ මොනවාද : යූද් 1:20-23

අවසානය : සාරාංශය, ප්‍රතිචාරය සඳහා කැඳවීම.

## සාමාන්‍ය උපදෙස්

ඕනෑම ආකාරයක දේශනාවක් සැළසුම් කිරීම සඳහා ඔබට උපකාර විය හැකි සාමාන්‍ය උපදෙස් කිහිපයක් පහත දැක්වේ :

### බයිබල් පාඨය තෝරා ගැනීම :

"පාඨයක්" (Text) යන පදය ග්‍රීක් භාෂාවේ "ගලපන ලද හෝ රචනා කරන ලද" යන අර්ථය ඇති වචනයකින් බිඳී එන්නකි. බයිබල් පාඨය පණිවුඩය ගලපන ලද හෝ රචනා කරන ලද එකෙන් විය යුතුය. එය දේශනාවේ පදනම විය යුතුය.

දේශනාවේ පදනම වශයෙන් දේව වචනයේ පාඨයක් යොදාගැනීම දේශකයාට තම පණිවුඩය පිළිබඳ ආධිපත්‍ය ලබා දේ. ඔහු දේව වචනය කතා කරන බැවින්, "දෙවියන්වහන්සේ මෙසේ කියන සේක" යි පවසයි. ඔහුට නිර්භීතව හා ආධිපත්‍ය සහිතව එසේ කිරීමේ හැකියාවක් ඇත. බයිබල් පාඨය පණිවුඩයේ බයිබලයට එකගත්වය පවත්වාගන්නා අතර, දේශකයා තමාගේ අදහස් නොව දේව වචනය ප්‍රකාශකරන බවට ශ්‍රාවක පිරිසට සහතික කරමින් ඔවුන්ගේ විශ්වාසය දිනාගනී.

### දේව වචනයෙන් පාඨයක් තෝරාගැනීම පිළිබඳ උපදෙස් කිහිපයක් පහත දැක්වේ :

1. දෙවියන්වහන්සේගේ මග පෙන්වීම උදෙසා යාච්ඤා කරන්න.

2. නිතරම දේව වචනය අධ්‍යයනය කරන්න. ඔබේ අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සේවය උදෙසා අවශ්‍ය බයිබල් පාඨ සහ විෂයන් ඔබට ලැබෙනු ඇත. ඔබේ පෞද්ගලික අධ්‍යයනයන් තුළ ඔබ සොයාගන්නා බයිබල් පාඨ හා කරුණු පිළිබඳ අදහස් වෙනුවෙන් සටහන් පොතක් තබාගන්න. පසුව දේශනාවන් සැළසුම් කිරීම සඳහා මේවා යොදා ගන්න.

3. ඔබ සේවය කිරීමට සැළසුම් කරන ශ්‍රාවක පිරිසේ ආත්මික අවශ්‍යතා පිළිබඳව සැළකිලිමත් වන්න. උදාහරණයක් ලෙස, සේවයේ යෙදී සිටින්නන් පිරිසකට සාමාන්‍යයෙන් ගැලවීම පිළිබඳ බයිබල් පාඨයක් හෝ දේශනාවක් අවශ්‍ය නොවේ (අටවන පරිච්ඡේදයේදී ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම පිළිබඳව ඔබ ඉගෙන ගත් දේවල් මතක තබා ගන්න).

4. ඔබ බයිබල් පාඨයක් දේශනා කිරීමට පෙර, ඔබේ ශ්‍රාවකයන්ගේ මනස අවුල් නොවන පිණිස ඔබට එය හොඳින් වැටහේදැයි දැනගන්න.

5. දෙවියන්වහන්සේගේ සත්‍යයේ සම්පූර්ණ එළිදරව්ව වටහා ගන්න, මිනිසුන් ඇසීමට කැමති ඔබේ ප්‍රියතම පාඨ හෝ විෂයන් පිළිබඳව පමණක් දේශනා නොකරන්න. "මුළු" ලියවිල්ල දේවානුභාවයෙන් ලබා දී ඇති අතර ප්‍රයෝජනවත්ය.

## බයිබල් පාඨයේ අර්ථය පහදා දීම :

ඔබ බයිබල් පාඨයක් තෝරාගත් පසු, ඒ පිළිබඳව බයිබලය උගන්වන සියලු දේ අධ්‍යයනය කරන්න. ඔබට බයිබලයේ විවිධ පරිවර්තනයන් තිබේ නම් වැඩි දුර තේරුම් ගැනීම සඳහා ඒවා අධ්‍යයනය කරන්න. ඔබට බයිබලය පිළිබඳ අටුවාවක් තිබේ නම්, පාඨය පිළිබඳව අන්‍යයන් පවසා ඇති දේවල් කියවන්න. මෙම අධ්‍යයන ක්‍රමයන් ඔබට බයිබල් පාඨය තේරුම් ගැනීමට හෝ "අර්ථය පහදා ගැනීමට" උපකාරී වනු ඇත.

ඔබ පාඨය අධ්‍යයනය කරන විට යොදාගත යුතු දේව වචනයේ අර්ථය පැහැදිලි කරගැනීම පිළිබඳ මූලික නීති කිහිපයක් පහත දැක්වේ.

**දිව්‍යමය ආධිපත්‍ය පිළිබඳ නීතිය :** බයිබලය අවසාන ආධිපත්‍යයයි. ලියවිල්ලේ සෑම කොටසක්ම දේව අනුභාවයෙන් ලියැවී ඇත.

**වචනාර්ථයෙන්ම අර්ථය පැහැදිලි කර ගැනීම පිළිබඳ නීතිය:** සන්දර්භය වෙනත් අර්ථයක් පැහැදිලි කර නොදෙන්නේ නම් බයිබලය අනිවාර්යයෙන්ම එයින් පැවසෙන දේ අදහස් කරයි. ඇතැම්විට බයිබලය තුළ සත්‍යයන් නිරූපනය කිරීම සඳහා යොදාගත් සංකේත සහ උපමා පවතී, නමුත් මේවා ලියවිල්ලේ අන්තර්ගතය තුළ පැහැදිලිව දක්වා තිබේ.

**සන්දර්භය ගැන සැලකිලිමත් වීම පිළිබඳ නීතිය :** සෑම පදයක්ම එහි සංදර්භයට ඇති සම්බන්ධය ඔස්සේ අධ්‍යයනය කළ යුතුය. පාඨයට කලින් හා පසුව ඇති දේවල් අධ්‍යයනය කරන්න. පදයක් සංදර්භයෙන් වෙන් කිරීම තුළින් බොහෝ වැරදි ධර්මයන් නිර්මාණය කර තිබේ. සංදර්භය තුළ සිට පාඨයක් අධ්‍යයනය කිරීමට ඔබෙන් මෙම ප්‍රශ්න අසන්න :

- කතාකරන්නේ හෝ ලියන්නේ කවුද?
- පවසා ඇත්තේ කුමක්ද?
- එය පවසා ඇත්තේ කාටද?
- එය පවසා ඇත්තේ ඇයි?
- එය පවසා ඇත්තේ කවුද?

**පළමුව සඳහන් කිරීමේ නීතිය :** බයිබලය තුළ වචනයක් වාක්‍ය ඛණ්ඩයක්, වස්තුවක් හෝ සිදුවීමක් පළමුව සඳහන් කරන විට, එය බොහෝවිට බයිබලයේ අනෙක් ස්ථාන වලට වඩා එහි තේරුමට වැඩි වැදගත්කමක් ලබා දෙයි.

උදාහරණයක් ලෙස, උප්පත්ති 3 හි "අත්තික්කා කොළ" පිළිබඳ පළමු සඳහන ඇත. මෙහිදී, ආදම් තමාගේම පාපය හා නිර්වස්ත්‍ර බව තම ශක්තියෙන් වසා ගැනීම සඳහා අත්තික්කා කොළ

යොදා ගත්තේය. අත්තික්කා කොළ ස්වයං ධර්මිෂ්ඨ බව, දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කිරීම සහ දෙවියන්වහන්සේ ඉදිරියේ යමෙකු සාධාරණීකරණය කිරීමේ උත්සහය සංකේතවත් කරයි.

මතෙව් 21 සහ මාර්ක් 11 සහ 13 තුළ යේසුස්වහන්සේ එල නැති කොළ පමණක් ඇති ගස් වලට ශාප කළේ මේ හේතුවෙනි. මෙම ක්‍රියාව තේරුම් ගැනීම සඳහා, අප පළමු සඳහන් කිරීම පිළිබඳ නීතිය නැවත මතක් කරමින් උප්පත්ති 3 වෙත යමු. අත්තික්කා කොළ සංකේතවත් කලේ යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කළ සහ, පසුතැවිලි වීමේ සැබෑ එල නොපෙන්වන ඊශ්‍රායෙල් හි ස්වයං - ධර්මිෂ්ඨ ජාතියයි.

**නැවත සඳහන් කිරීමේ නීතිය :** ලියවිල්ල තුළ යමක් නැවත නැවත දක්වා ඇත්තේ වැදගත්කොට පෙන්වීමේ අරමුණ උදෙසාය. එයින් අදහස් වන්නේ, මෙම සත්‍ය නැවත නැවත දැක්වීමට අවශ්‍ය වන තරම් වැදගත් වන බවයි.

**මුළු එළිදරව්වීම පිළිබඳ නීතිය :** කිසියම් කරුණක් පිළිබඳ දේව වචනයේ සම්පූර්ණ සත්‍ය තනි කොටසකින් දැන ගත නොහැක. සත්‍යයක් පිළිබඳ බයිබලය පවසන මුළු එළිදරව්ව සළකා බැලිය යුතුය. මෙහි අදහස නම් යම් කිසි කරුණක් පිළිබඳව බයිබලය උගන්වන සියලුම දේ ඔබ විසින් එකතු කරගත යුතු බවයි. මේ හේතුවෙනි මෙම නීතිය “මුළු” එළිදරව්ව පිළිබඳ නීතිය වශයෙන් හඳුන්වනු ලැබේ. ඔබට කිසියම් කරුණක් පිළිබඳ තනිපද කීපයක් මත ධර්මයක් පදනම් කළ නොහැකිය.

## දේශනාවට අවශ්‍ය කරුණු එකතු කිරීම :

ඔබ පාඩයක් තෝරාගත් පසු දේශනාව සඳහා අවශ්‍ය කරුණු ඔබ එකතු කර ගත යුතුය.
මෙම සිදු කිරීම සඳහා පහත ප්‍රශ්න ඇසීම ඔබට උපකාරී විය හැකිය.

1. මෙම විෂය පිළිබඳව බයිබලය උගන්වන්නේ මොනවාද? ඉතාම වැදගත් අරමුණ වන්නේ විෂය පිළිබඳව දේව වචනය තුළ දෙවියන්වහන්සේ එළිදරව් කර ඇති දේ සන්නිවේදනය කිරීමයි. මෙය ඔබේ දේශනාවේ ප්‍රධාන කොටස් සකස් කළ යුතුය.

2. මෙම කරුණ පිළිබඳව ජීවිතයේදී හා සේවයේදී මා නිරීක්ෂණය කර ඇත්තේ මොනවාද? මෙම කරුණ හා සම්බන්ඳව ජීවිතයේ හා සේවයේ ඇති උදාහරණ කවරක්ද? ඔබ දැක ඇති ආකාරයට දේව වචනයේ සත්‍යයන් සැබෑ ජීවිතය තුළින් නිරූපණය වන්නේ කෙසේද? පණිවුඩය පැහැදිලි කිරීම හා අදාල කර ගැනීම සඳහා ඔබට මෙම උදාහරණ යොදා ගත හැකිය.

3. මෙම කරුණ හා සම්බන්ධව මා කියවා ඇත්තේ මොනවාද? ඔබට බයිබල් අධ්‍යයන පොත් ලබා ගැනීමේ හැකියාවක් පවති නම්, කියවීම හා බයිබල් ශිෂ්‍යයන්ගේ සමීක්ෂණ අධ්‍යයන කිරීමට හැකි නම් දේශනාවට අවශ්‍ය මාධ්‍ය රැස්කර ගැනීමේදී ඔබට උපකාර විය හැකිය.

4. මෙම කරුණ හා සම්බන්ඳව දැනුම ඇතැයි මා සිතන අය කවුද? මෙම පාඩයක් සම්බන්ඳ අත්දැකීමක් ලැබූ යම් කෙනෙක් සිටීද? මෙම කරුණ පිළිබඳව ගැඹුරට අධ්‍යයනය කර ඇති ඔබ දන්නා කෙනෙක් සිටීද? මෙම කරුණ පිළිබඳ දේශානාකිරීමට ඔබේ සූදානම් වීමේ කොටසක් ලෙස ඔවුන් හමු වන්න.

## අවසාන අරමුණ :

*“ඉගැන්වීමේ ක්‍රමවේදයන්”* නම් මෙම පාඩමාලාව මෙම පරිච්ජේදයෙන් අවසන්වේ. නමුත් යථාර්ථය නම් ඔබ තවම ආරම්භ කළා පමණි. මන්ද අවසන් අරමුණ සම්පූර්ණ වන තුරු ඔබ දේශනා කිරීමේ හා ඉගැන්වීමේ නිරත විය යුතුය :

> **අපි නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණකොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද, සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාරයේ ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශකරමුව. (කොලොස්සි 1:28)**

ස්වාමීන්වහන්සේ ඇඳිනගන්න කියා එකිනෙකා තම තමාගේ නුවර වැසියාටත් සහෝදරයාටත් නුගන්වන්නේය. මක්නිසාද ඔවුන්ගේ කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලෝම මා ඇඳින ගන්නෝය. (හෙබ්‍රෙව් 8:11)

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දේශනා කිරීම හා ඉගැන්වීම අතර සම්බන්ධය පහදන්න. ඒවායේ සමාන කම් හා අසමාන කම් මොනවාද?

3. දේශනාවක් සැළසුම් කිරීමේ මූලික පියවර සාරාංශ ගත කරන්න.

4. "මාතෘකානුකූල දේශනාකිරීම" අර්ථ දක්වන්න.

5. "පාඨයක් පිළිබඳ" දේශනා කිරීම අර්ථ දක්වන්න.

6. " විවරණාත්මක දේශනාකිරීම" අර්ථ දක්වන්න.

7. බයිබල් පාඨයක් තෝරා ගැනීම සඳහා ලබා දී ඇති උපදෙස් සාරාංශ ගත කරන්න.

8. පාඨයක අර්ථය පැහැදිලි කිරීම පිළිබඳ උපදෙස් සාරාංශගත කරන්න.

9. දේශනාවට අවශ්‍ය මාධ්‍ය රැස්කර ගැනීම පිළිබඳව මෙම පාඩමේදී දී ඇති යෝජනා සාරාංශගත කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පහත විශිෂ්ඨ බයිබලීය දේශනා අධ්‍යයනය කරන්න.

   - මොසෙස්ගේ අවසන් දේශනාව : ද්විතීය කතාව 29:33.
   - යොෂුවාගේ අවසන් දේශනාව : යොෂුවා 24:2-15.
   - සාමුවෙල් ඉශ්‍රායෙල් ඇමතීම : 1 සාමුවෙල් 12.
   - සාලමොන්ගේ කැපකිරීමේ පණිවුඩය : 1 රාජාවලිය 8:15-61.
   - මංගලයයකදී යෙරමියා ජනතාව ඇමතීම : යෙරමියා 7.
   - යේසුස්වහන්සේගේ දේශනා සඳහා උදාහරණ : මතෙව් 5-7; 11:7-19; 12:25-37;13 15:10-20; 21:28-44; 24:25; යොහන් 3:3-21; 6:26-58; 14-16.
   - පේත්‍රුස්ගේ දේශනා : ක්‍රියා 2:14-36; 3:12-26.
   - පාවුල්ගේ දේශනා : ක්‍රියා 13:16-41; 17:22-31; 20:17-35; 22:1-21; 26:2-23.
   - ස්තේපන්ගේ අවසාන දේශනාව : ක්‍රියා 7:2-53.

2. ඔබ ඇසු දේශනාවක් විශ්ලේෂණය කිරීම සඳහා ඊළග පිටුවේ ඇති පෝරමය යොදාගන්න, ඉන්පසු ඔබේ දේශනාවල වටිනාකම මැන දැක්වීම සඳහා පෝරමය යොදාගන්න.

# දේශනාවක වැදගත්කම මැනීමේ පෝරමය

## සංවිධානය කිරීම

**හැඳින්වීම :**

එය අවධානය ලබා ගත්තේද? _______________ සෘජුව හෝ වක්‍රව එය කිසියම් අවශ්‍යතාවක් ස්පර්ශ කළේද? ______________________

එය කරුණ හෝ ප්‍රධාන අදහස ඔබට දැනුම් දුන්නේද? __________________

එය දිග නියම ප්‍රමාණයද? __________________ එහි විශේෂිත අරමුණක් තිබේද? ____________

**ප්‍රධාන අංගය :**

කරුණු ගොඩනැගූ ආකාරය පැහැදිලිද? _______________ මුළු සැළැස්ම පැහැදිලිද? _________

දේශනාවට මුලික අදහසක් තිබේද? _______________ ඔබට එය සඳහන් කළ හැකිද? ________

මාරුවීම් පහැදිලිද? _____________________ ඒවා නැවත මතක් කරන ලද්ද? _______________

කරුණු අතර තර්කානුකුල සම්බන්ධයක් තිබේද? ___________________________

ප්‍රධාන කරුණු ප්‍රධාන අදහස හා සම්බන්ධ වේද? __________________________

අනු කරුණු පැහැදිලි ලෙස ප්‍රධාන කරුණට සම්බන්ධ කර තිබේද? ______________________

**අදාලකර ගැනීම :**

මෙම කරුණ වැදගත්ද? ______________________ එය ගැළපේද? ______________________

දේශනාව නිවැරදි බයිබලීය අර්ථය පැහැදිලි කරගැනීමක් තුළ ගොඩනගා තිබේද? ____________

දේශකයා පාඨය තුළ තමා සිටින ස්ථානය ඔබට පෙන්වුයේද? ______________________________

විෂය පිළිබද කරුණු විශ්ලේෂණය කිරීම සම්පූර්ණද? ________________________

**අවසානය :**

දේශනාව උච්ච අවස්ථාවක් දක්වා ගොඩනඟා තිබේද? ______________ අදහස් වල ප්‍රමාණවත් සාරාංශගත කිරීමක් තිබේද? ___________________

එහි බලපෑමක් කළහැකි ප්‍රතිචාරයක් සඳහා වූ අවසන් ආයාචන හෝ යෝජනා තිබේද? _________

## ශෛලිය

දේශකයා නිවැරදි ව්‍යාකරණ භාවිතා කරයිද? _______________ වචන නිවැරදි ලෙස උච්චාරණය කරයිද? ____________

ඔහුට විශාල වචන ප්‍රමාණයක් තිබේද? ________ නිවැරදි ලෙස වචන භාවිතා කරයිද? ________

වචන තෝරාගැනීම දේශනාවේ බලපෑම් කිරීමේ හැකියාව වර්ධනය කරයිද? _________________

## කතා විලාශය

### වාචික ඉදිරිපත් කිරීම :

දේශකයාට අසනු ලැබීම අවශ්‍යද? ____________ ඔහු ඔබ සමඟ කතා කරන බව ඔබට තේරෙනවාද? ______________

ඔහු සුහදද? ______________ කතා විලාශය සජීවී කතාබහක් ලෙස වැටහේද? _____________

කටහඬ අසා සිටීමට පහසුද? ______________ එය පැහැදිලිද? __________________

කටහඬ උස්පහත් වීම් තිබේද? ________________ ස්වර මට්ටම් වෙනස් වේද? ______________

දේශකයා බලපෑමක් වන ලෙස නැවතීම් යොදා ගන්නවාද? ________________________

### ශාරීරික ඉදිරිපත් කිරීම :

ඔහුගේ සම්පූර්ණ ශරීරයම කතා විලාශයට අන්තර්ගතව තිබේද? ____________ ඔහු අංග චලනයන් දක්වයිද? __________________

බාධාකාරී අංග චලනයන් තිබේද? _________________

ඉරියව් හොඳද? ______________ දේශකයා සෝදිසියෙන් සිටින බව පෙන්නුම් කරයිද? _________

මුහුණේ හොඳ පෙනුමක් දැකිය හැකිද? ________________________

# ස්වයං - පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය :

1. එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා, මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කී සේක. (මතෙව් 28:19-20)

2. මතෙව් 28:18-19.

3. "උගන්වනවා" යන වචනයෙන් තවත් කෙනෙකුගේ අධ්‍යයනයන්ට උපදෙස්දීම, පෙන්වාදීම, පැහැදිලිකරදීම, කියාදීම, දැනුම බෙදාගැනීම, පුහුණු කිරීම සහ මඟ පෙන්වීම යන දේ අදහස් වේ. "ගුරුවරයා" යනු ඉගැන්වීම කරනු ලබන පුද්ගලයා වේ. "ඉගැන්වීම" යනු අන් අයට උපදෙස් දීම හා පුහුණු කිරීම පිළිබඳ ක්‍රියාවයි.

4. ගුරුවරු නොඇදහිලිවන්තයන්ට (එවැන්ජලිස්ත සේවය) හා ඇදහිලිවන්තයන්ට (ගෝලත්වය) දේව වචනය පැහැදිලි කිරීමට උපකාරී වන බැවින් අපට ගුරුවරු අවශ්‍ය වේ. ගුරුවරු නොමැති වූ විට මිනිසුන් එඬේරකු නැති බැටළුවන් වැනිය.

5. නායකත්ව ස්ථානය දරන "ගුරුවරයෙකු" යනු ඉගැන්වීමට අමතරව සභාවට නායකත්වය දෙමින් මඟපෙන්වන්නෙකුය. ගුරුවරයෙකුගේ කතා කිරීමේ දීමනාව ඇති අය උගන්වයි, නමුත් සභාවේ නායකත්ව තත්ත්වයන් නොදරයි.

6. ප්‍රකාශය සත්‍යයකි.

7. අප සියලු ජාතීන්ට හා අන් අයට ඉගැන්වීමට සමත් විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට ඉගැන්විය යුතුය.

8. ඉගැන්වීමේ ප්‍රධාන අරමුණු දෙක එවැන්ජලිස්ත සේවය හා ගෝලත්වයයි.

9. මෙම පරිච්ඡේදයේ සාකච්ජා කළ බයිබලීය අනතුරු ඇඟවීම් 03 නම්,

- ඉගැන්වීම මනුෂ්‍ය ධර්ම මත නොව දේව වචනය මත පදනම් විය යුතුය.
- ගුරුවරු තමන් උගන්වන දෙයට අනුව ජීවත් විය යුතුය.
- බොරු ගුරුවරුද සිටිනු ඇත.

## දෙවන පරිච්ඡේදය :

1. හෙතෙම රාත්‍රියේ උන්වහන්සේ ළඟට ඇවිත්, රබ්බි, ඔබ දෙවියන්වහන්සේ කෙරෙන් ආවාවූ ගුරුවරයෙකැයි අපි දනිමුව. මක්නිසාද තමා සමඟ දෙවියන්වහන්සේ නැත්නම් ඔබ කරන්නාවූ මේ හාස්කම් කරන්න කිසිවෙකුට නුපුළුවනැයි කී සේක. (යොහන් 3:2)

2. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ජා සමඟ සසඳන්න.

3. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ජාව සමඟ සසඳන්න.

4. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ජාව සමඟ සසඳන්න.

5. යේසුස්ක්‍රිස්තුස්වහන්සේ.

6. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ජාව සමඟ සසඳන්න.

7. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.
8. ඔබේ පිළිතුර දෙවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

9. යොහන් 20:21

10. පියාණන්වහන්සේ යේසුස්වහන්සේ එවූ ලෙස, අපවද එම අරමුණ ළඟාකර ගැනීම උදෙසාම එවා ඇත. උන්වහන්සේගේ දූත මෙහෙය අපගේද දූත මෙහෙයයි.

## තුන්වන පරිච්ඡේදය :

1. නුඹලා යමින් ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය කියා දේශනා කරපල්ලා. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැඟිටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍ර කරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා, නුඹලා නොමිළයේ ලැබුවාහුය. නොමිළයේ දීපල්ලා. (මතෙව් 10:7-8)
2. යේසුස්වහන්සේගේ මූලික පණිවුඩය වූයේ සෑම දෙයක්ම දේව රාජ්‍යයට අදාලව වේ. මේ තුළ රාජ්‍යයට ඇතුළු වන්නේ කෙසේද (එවැන්ජලිස්ත සේවය) සහ රාජ්‍ය තුළ ජීවත් වන්නේ කෙසේද (ගෝලත්වය) යන දේවල් ඇතුළත් වේ.

3. 1 කොරින්ති 15:1-4

4. ප්‍රකාශය සත්‍යයකි.

5. බලය.

6. දේව වචනය, ශුද්ධ බයිබලය.

## හතරවන පරිච්ඡේදය :

හතරවන පරිච්ඡේදයට ස්වයං පරීක්ෂණයක් නොමැත.

## පස්වන පරිච්ඡේදය :

1. යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනයෝග වල උගන්වමින්ද රාජ්‍යයේ සුභාරංචිය දේශනා කරමින් ද සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුව කරමින්ද සියලු නුවර වලද ගම්වලද ඇවිද්ද සේක. (මතෙව් 9:35)

2-11. මෙම ප්‍රශ්න සඳහා ඔබේ පිළිතුරු මෙම අත්පොතේ පස්වන පරිච්ඡේදයේ සෑම කරුණකටම අදාල සාකච්ඡාව සමඟ සසඳන්න.

## හයවන පරිච්ඡේදය :

1. උන්වහන්සේ තමාගේ රටට පැමිණ, ඔවුන්ගේ සිනයෝගයේද ඔවුන්ට ඉගැන්වූ සේක. ඔවුන් විස්මපත්ව: මොහුට මේ ප්‍රඥාව සහ බලවත් ක්‍රියා කොයින්ද? (මතෙව් 13:54)

2-11. මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු මෙම අත්පොතේ හයවන පරිච්ඡේදයේ සෑම කරුණක් පිළිබඳව ඇති සාකච්ඡාව සමඟ සසඳන්න.

## හත්වන පරිච්ඡේදය :

1. උන්වහන්සේ කුඩා දරුවකු ගෙන ඔවුන් මැද සිටුවා, ඔහු වඩා ගෙන,මෙබඳු කුඩා දරුවන්ගෙන් එක්කෙනෙකු මාගේ නාමයෙන් පිළිගන්නාවූ කවරෙකු නමුත් මා පිළිගන්නේය. මා පිළිගන්න කවරෙකු නමුත් මා පිළිගන්නවා නොව, මා එවූ තැනැන්වහන්සේ පිළිගන්නේ යැයි ඔවුන්ට කී සේක. (මාර්ක් 9:36-37)
2. ඉගැන්වීමේ ආධාරකයක් යනු ඉගැන්වීමේදී ඔබට ආධාර වන දෙයකි. එය කිසියම් බයිබල් සත්‍යයක් තේරුම් ගැනීමට ශිෂ්‍යයන්ට උපකාරී වන ක්‍රියාකාරකමක් විය හැකිය. එය දැකිය හැකි, ඇසිය හැකි හෝ ස්පර්ශ කළ හැකි දෙයක්ද (ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරකයක්) විය හැකිය.

3. "ශ්‍රව්‍ය" යන පදයෙන් අදහස්වන්නේ ඇසීමයි. "දෘෂ්‍ය" යන පදයෙන් අදහස් වන්නේ දැකීමයි. "ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරකයක්" යනු ඉගෙනගැනීමට උපකාරී වන දැකිය හැකි සහ/හෝ ඇසිය හැකි දෙයකි.

4. දැකීම, ඇසීම හා කිරීම ඉගෙන ගැනීමේ ප්‍රධාන ආකාරවන බැවින් ඉගැන්වීමේ ආධාරක වැදගත් වේ.

5. උන්වහන්සේ පරිසරයේ ඇති සරල වස්තු යොදාගත් සේක.

## අටවන පරිච්ඡේදය :

1. නමුත් යේසුස්වහන්සේ සියල්ලන් දන්නා බැවින්ද, මනුෂ්‍යා තුළ තිබෙන්නේ කුමක්දැයි දන්න නිසා, මනුෂ්‍යයා ගැන යමෙකුගේ සාක්ෂියෙන් උන්වහන්සේට ඕනෑකමක් නැති බැවින්ද තමන්ම ඔවුන්ට භාර නුවූ සේක. (යොහන් 2:24-25)

2. "ශ්‍රාවක පිරිස" යනු, ඔබ විසින් උගන්වනු ලබන පුද්ගල කණ්ඩායමයි. යමක් "විශ්ලේෂණය කිරීම" යනු, එය විස්තරාත්මකව අධ්‍යයනය කිරීම, එහි චරිත ලක්‍ෂණ ප්‍රවේශම් සහිතව පරීක්‍ෂා කිරීම හා කොටස් වශයෙන් සම්පූර්ණ දෙය අධ්‍යයනය කිරීමයි. ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම යනු, ඔබ ඉගැන්වීමට සැළසුම් කරන පුද්ගලයින් කණ්ඩායමේ චරිත ලක්‍ෂණ ප්‍රවේශම් සහිතව අධ්‍යයනය කිරීමයි.

3. භාෂාව, අධ්‍යාපනය, සංස්කෘතිය, ශාරීරික හැකියාවන්, ආත්මික පරිණතබව, ලිංගිකත්වය, විවාහක අවිවාහක බව, සමාජ හා ආර්ථික මට්ටම, පෞද්ගලික අවශ්‍යතා සහ වයස වැනි කරුණු රැසක් ඉගෙනීම කෙරෙහි බලපෑම් කරන බැවින් ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම වැදගත් වේ. ඔබ ඔබේ පාඩම ඔවුන්ට තේරෙන භාෂාවක් යොදා නොගන්නවා විය හැකිය. ඔබ ඔබේ පාඩම ඔවුන්ගේ සාමාජීය හා ආර්ථික මට්ටමක සහ පෞද්ගලික අවශ්‍යතාවයන්ට සම්බන්ධ නොකරනවා විය හැකිය.

4. ඔබේ සාරාංශය අට වන පරිච්ඡේදයේ සාකච්ජාව සමඟ සසඳන්න.

5. ඔබ ලිවීමට තෝරාගත් වයස් මට්ටම පිළිබඳ දී ඇති දේවල් සමඟ ඔබේ සාරාංශය සසඳන්න.

## නව වන පරිච්ඡේදය :

1. **අපි නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණ කොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු මනුෂ්‍යයන්ට සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශකරමුව. (කොලොස්සි 1:28)**

2. අරමුණක් යනු ඉලක්කයක් හෝ ක්‍රියාවක අවසානයකි. එය අත්කර ගැනීමට බලාපොරොත්තු වන අභිප්‍රායන්, ඉලක්කයක් හෝ තීරණය කරන ලද නිමැවුමකි. ගුරුවරයෙකු අරමුණක්

සඳහන් කරන විට, ඔහු තම ශිෂ්‍යයන්ට ඉලක්කයන් උදෙසා පාඩයක් ලියා දක්වයි. මේවා, ශිෂ්‍යයන්ට පාඩම් අවසන් කළ පසු කළ හැකි දේවල් විස්තර කරනවා වැනිය.

3. - ඒවා ගුරුවරයාගේ යාච්ඤාවන්, සැළසුම්, ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාකාරකම් විශේෂිත ඉලක්කයක් වෙත යොමු කරයි.
   - ඉගැන්වීමේ බලපෑම මැනීමට ඒවා යොදා ගත හැකිය.
   - ඒවා ඔබේ ඉගැන්වීම වර්ධනය කරයි.
   - ශිෂ්‍යයන්ට වචනය අසන්නෝ පමණක් නොවී එය ක්‍රියාවට නංවන්නන්ද වීම කෙරෙහි ඒවා උපකාරී වේ.

4. සාමාන්‍ය අරමුණු යනු, සාමාන්‍ය ලෙස ඔබේ ඉගෙනීමට අදාල කර ගත හැකි ඉලක්කයන් වේ. ඒවා කාලපරිච්ඡේදයක් තුළදී ශිෂ්‍යයන් ළඟා කරගත යුතු වූ අරමුණු වේ. විශේෂිත අරමුණු පාඩමෙන් පාඩමට වෙනස් වේ. ඒවා තනි පාඩමකට විශේෂිත වූ අරමුණුය.

5. **B** අරමුණ නිවැරදිය. ඒවා ශිෂ්‍යයන්ගේ හැසිරීම නිරීක්ෂණය කළ හැකි පරිදි සඳහන් කර තිබේ.

6. බයිබලිය ඉගැන්වීමේ අවසාන අරමුණ කොලොස්සි 1:28 හි සඳහන් වේ.

## දහ වන පරිච්ඡේදය :

1. ප්‍රඥාවන්තයින්ගේ දිව දැනගැන්ම හරිලෙස කියාදෙයි. (හිතෝපදේශ 15:2)

2. ඔබේ ලැයිස්තුව දහවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

3. - හැඳින්වීම.
   - ප්‍රධාන අංගය.
   - අදාල කර ගැනීම.
   - අවසානය.

4. ඔබේ සාරාංශය දහවන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

5. මේ සඳහා නිවැරදි හෝ වැරදි පිළිතුරක් නැත. අරමුණ වන්නේ පරිච්ඡේදය තුළ ඉගෙනගත් හැකියාවන් යොදාගෙන ඔබට පාඩමක් සැළසුම් කළ හැකි වීමයි.

## එකොළොස්වන පරිච්ඡේදය :

1. උතුම් වූ දේවල් ඒත්තු ගන්න නුඹලාට පුළුවන් වෙන්නත්, ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස්ව සිටින්ටත්. (පිලිප්පි 1:10)

2. ඇගයීම යනු යමක් ප්‍රවේසම් සහිතව පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියයි.

3. දෙවියන්වහන්සේ අපට දී ඇති දීමනාව වර්ධනය කරගැනීමට අවශ්‍ය නම්, අපේ ඉගැන්වීම් ප්‍රවේසම් සහිතව ඇගයීම වැදගත් වේ.

4. - අරමුණු.
   - ප්‍රතිචාරය.
   - පරීක්ෂා කිරීම.
   - ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම.

5. ඔබේ සාරාංශය එකොළොස් වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

6. ඔබට ඒවා ආත්මික වර්ධනය හා වෙනස්වීම සඳහා අවස්ථාවන් ලෙස යොදාගත හැකිය. ඔබ ගුරුවරයෙකු ලෙස ඔබේ හැකියාවන් තවදුරටත් වර්ධනය කරගත හැකිය.

## දොළොස්වන පරිච්ඡේදය :

1. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල, ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම්දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)

2. "අධ්‍යයන විෂය මාලාව" යන්නෙන් අදහස් වන්නේ අධ්‍යයනය සඳහා සංවිධානය කරන ලද පාඨමාලාවකි. එය පාසලක යොදාගන්නා එක් පාඨමාලාවකට හෝ පාඨමාලා සියල්ලටම සමාන කළ හැකිය. "බයිබලීය අධ්‍යයන විෂය මාලාවක්" යනු, බයිබලය අධ්‍යයනය කිරීම සඳහා සංවිධානය කරන ලද පාඨමාලාවකි.

3. ඔබේ සාරාංශය 12 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

4. බයිබල් පාඩම් මාලාවක් නිර්මාණය කිරීම සඳහා මෙම පාඨමාලාවේ 10 වන පරිච්ඡේදයේදී ඉගෙනගත් හැකියාවන් යොදාගන්න. විස්තරාත්මකව මෙම පාඩම් ලියා දක්වන්න. නොදැනුවත්වම, ඔබට ඔබේම විෂය මාලාව ගොඩනගා ගත හැකි වේ. ඔබ ගොඩනඟාගත් පාඩම් වැඩිදියුණු කළ හැකි ආකාරය හඳුනාගැනීම සඳහා "විෂය මාලා ඇගයීමේ ප්‍රශ්න මාලාව" යොදා ගන්න.

## දහතුන්වන පරිච්ඡේදය :

1. ප්‍රඥාවේ පටන්ගැන්ම නම් ස්වාමීන් කෙරෙහි භය වීමය. ශුද්ධවූ තැනැන්වහන්සේ දැනගැනීම නුවණ වේ. (හිතෝපදේශ 9:10)

2. සාක්ෂරතාවක් නොමැති ශිෂ්‍යයන් යනු තම භාෂාව ලිවීමට හා කියවීමට නොහැකි අයයි.

3. ඔබේ සාරාංශය දහතුන්වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

## දහහතර වන පරිච්ඡේදය :

1. මක්නිසාද ඔබ මට දුන් වචන මම ඔවුන්ට දුනිමි, ඔව්හු ඒවා පිළිගෙන, මා ඔබ වෙතින් ආ බව සැබවින් දැන, ඔබ මා එවූ බව විශ්වාසකළෝය. (යොහන් 17:8)

2. සේවයට - පෙර ලබන පුහුණුව හා සේවය - තුළ ලබන පුහුණුව.

3. ඔබේ සාරාංශය 14 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

4. බඳවා ගැනීමේ යෝජනා සඳහා දහහතර වන පරිච්ඡේදයේ ඇති ලැයිස්තුව බලන්න.

5. ඔබේ සාරාංශය 14 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

6. ඔබේ සාරාංශය 14 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

7. පහත ආකාරයෙන් ඔබට ගුරුවරයෙකුගේ ඇගයීම කළ හැකිය :

   - මෙම පාඨමාලාවේ 11 පරිච්ඡේදයෙන් ඉගෙනගත් හැකියාවන් යොදාගෙන.
   - සේවය පිළිබඳ විස්තරයට අනුව.

- ගුරු ප්‍රතිඥාව ආරක්‍ෂා කිරීම සම්බන්ධව.
- ඔවුන් උගන්වන ආකාරය නිරීක්‍ෂණය කිරීමෙන්.
- ඔවුන්ගේ ඉගැන්වීම් වල "ඵල" නිරීක්‍ෂණය කිරීමෙන්.

## පහළොස් වන පරිච්ඡේදය :

1. එසේනම් ඔවුන් තමන් විසින් අදහා නොගත්තාවූ කෙනෙකුට යාච්ඤා කරන්නේ කොහොමද? තමන් නොඇසුවාවූ කෙනෙකු කෙරෙහි අදහන්නේ කොහොමද? දේශනාකරන්නෙක් නැතිව ඔවුන් අසන්නේ කොහොමද? (සමහරු) යවනු ලැබුවොත් මිස දේශනාකරන්නේ කොහොමද? (රෝම 10:14-15)

2. දේශනාකිරීම යනු විධිමත් පිළිවෙළකට අන් අය වෙත කරන්නාවූ අනුශාසනාවකි (දේශනාවක් හෝ විෂයක් පිළිබඳව ක්‍රමාණුකූල පරීක්ෂණයක්).

3. ඔබේ සාරාංශය 15 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

4. - දේශනා කරන්නන් තමන් දේශනා කරන දේ අනුව ජීවත් විය යුතුය.
   - ඔබ දේශනා කිරීම සඳහා විශේෂයෙන් කැඳවා තිබේ නම්, එය විකල්පයක් නොවේ.
   - දේශනා කිරීම දේව වචනය මත පදනම් විය යුතුය.
   - අභිප්‍රායන් නිවැරදි විය යුතුය.

5. මක්නිසාද දේව බලය විදහා දැක්වීම උන්වහන්සේගේ වචනය දේශනාකිරීම ස්ථිර කරයි.

## දහසයවන පරිච්ඡේදය :

1. වචනය දේශනා කරපන්න, කලටත් අකලටත් වැඩෙහි යෙදී සිටපන්න, සියලු ආකාර ඉවසිලිවන්ත කමෙන් සහ, ඉගැන්වීමෙන් තරවටු කර, අවවාද කර අනුශාසනා කරපන්න කියා ය. (2 තිමෝති 4:2)

2. දේශනා කිරීම හා ඉගැන්වීම අතර ප්‍රධාන වෙනස්කම් නම් :

   - දේශනා කිරීමේදී යොදාගන්නා ක්‍රමවේද බොහෝවිට ඉගැන්වීමේදී යොදාගන්නා ඒවායින් වෙනස් වේ. දේශනා කිරීමේදී සාමාන්‍යයෙන් විශාල ශ්‍රාවක පිරිසක් සිටින බැවින් ශ්‍රාවක පිරිසේ සහභාගීත්වය අපේක්‍ෂා කරන ක්‍රමවේදයන් බොහෝ දුරට යොදානොගනී.

   - දේශනා කිරීමේදී සාමාන්‍යයෙන් සියලු වයස් වල ශ්‍රාවකයන් සිටින බැවින් කතා විලාශය වෙනස් වේ. කතා විලාශය ළමයින්ට, තරුණයන්ට හා වැඩිහිටියන්ට තේරුම්ගත හැකි වන පරිදි පොදු මට්ටමකට සකස් කරගත යුතුය.

   - ඉරිදා පාසලේදී හෝ සභා පාසල් වලදී මෙන් ඔබව මඟපෙන්වීම සඳහා සාමාන්‍යයෙන් මුද්‍රිත අධ්‍යයන ක්‍රමයක් නොවේ. දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම අනුව ඔබ පණිවුඩයේ වර්ගය හා අන්තර්ගතය තීරණය කළයුතුය.

3. දේශනාවක් සැළසුම් කිරීමේ මූලික පියවර ඉගැන්වීමේ පියවර හා සමාන වේ. ඒ තුළ පහත දේ ඇතුළත් වේ :

   - ඔබ ආත්මිකව සූදානම් වීම.
   - ශ්‍රාවක පිරිස විශ්ලේෂණය කිරීම.
   - අරමුණු සඳහන් කිරීම.
   - හැඳින්වීම, පණිවුඩයේ ප්‍රධාන අංගය, අදාලකර ගැනීම හා අවසානය ඇතුළත් මූලික සැලැස්ම යොදාගනිමින් පණිවුඩය සකස්කර ගැනීම.

4. මාතෘකානුකුල දේශනාකිරීම ආත්මික ඵල, ආත්මික සටන, ආත්මික දීමනා වැනි නිශ්චිත මාතෘකා කේන්ද්‍රගත කරයි. ඔබ මෙම මාතෘකා වලින් කිසියම් තේමාවක් තෝරාගෙන දේශනාව ගොඩනඟයි.

5. පාඨයක් පිළිබඳ දේශනා කිරීමේදී, ප්‍රධාන බයිබල් කොටසක් පාඩමේ ප්‍රධාන සත්‍ය නිර්මාණය කරයි. දේශනාවේ ඉතිරි කොටස මෙම මධ්‍යගත සත්‍ය මත ගොඩනැඟේ.

6. විවරණාත්මක දේශනාව මාතෘකානුකුල හා සංදර්භය පිළිබඳ වූ දේශනාවන්ට වඩා විස්තරාත්මක වේ. එය බයිබලයේ විශේෂිත කරුණක් හෝ කොටස් පිළිබඳව, බයිබලයේ පොතක් පිළිබඳව, හෝ බයිබල් චරිතයක් පිළිබඳව කේන්ද්‍රගත විය හැකිය. එය පදයෙන්, පදය හා වචනයෙන්, වචනය උගන්වා ඇති සියල්ල පැහැදිලි කරයි.

7. ඔබේ පිළිතුර 16 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

8. ඔබේ පිළිතුර 16 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.

9. ඔබේ පිළිතුර 16 වන පරිච්ඡේදයේ සාකච්ඡාව සමඟ සසඳන්න.